# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1816/43 - 2013 ජූනි 28 වැනි සිකුරාදා - 2013.06.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් පාලන නිවේදන

### සම්මත අතුරු ව්‍යවස්ථා

ඌව පළාත් සභාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු (262 වන අධිකාරය වූ) 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ඌව පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයයභාර අමාත්‍ය ශෂීන්ද්‍ර රාජපක්ෂ වන මා විසින් 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ සාදන ලද කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

එකී කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධාන අඩංගු අතුරු ව්‍යවස්ථා සෑදීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තිය සමග කියවිය යුතු 126 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට බලය ලැබී ඇති අතර, එම අතුරු ව්‍යවස්ථා ඉහත කී 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ 3 වන උප වගන්තියෙහි විධිවිධාන වලට යටත්ව පිළිගැනීමට ඌව පළාතේ සියලුම ප්‍රාදේශීය සභාවලට මෙයින් බලය දෙනු ලැබේ.

ශෂීන්ද්‍ර රාජපක්ෂ,
ඌව පළාතේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන,
නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, සංස්කෘතික කටයුතු, ප්‍රවාහන,
ඉඩම්, වාරිමාර්ග, ආර්ථික ප්‍රවර්ධන හා ග්‍රාමීය යටිතල පහසුකම්
සංවර්ධන හා ඉදිකිරීම් කටයුතු පිළිබඳ අමාත්‍ය.

2013 ජූනි මස 24 වැනි දින,
බදුල්ලේ දී ය.

1A - PG 001667—190 (2013/06)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

අතුරු ව්‍යවස්ථා

*1 වැනි කොටස*

*සියලුම සම්මත අතුරු ව්‍යවස්ථා අර්ථ නිරූපනයට අදාළ අතුරු ව්‍යවස්ථාව*

මෙම ගැසට් පත්‍රයේ ප්‍රකාශකර ඇති 2 වැනි කොටසේ සිට 27 වැනි කොටස දක්වා සඳහන් සියලු සම්මත අතුරු ව්‍යවස්ථා අර්ථ නිරූපනය කිරීමේ දී ප්‍රාදේශීය සභාවක් විසින් යථා පරිදි පිළිගනු ලැබූ සම්මත අතුරු ව්‍යවස්ථාවක යෙදෙන –

I. "ප්‍රාදේශීය සභාව" යන්නෙන් එකී ප්‍රාදේශීය සභාව ද,
II. "සභාපතිවරයා" යන්නෙන් එකී ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,
III. "ලේකම්" යන්නෙන් එකී ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා ද,
IV. "ප්‍රාදේශීය සභා ප්‍රදේශ" යන්නෙන් එකී ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය ද,
V. "වෙනත් නිලධාරියා හෝ බලයලත් නිලධාරියා" යන්නෙන් සභාපතිවරයා විසින් බලය පවරන ලද ඕනෑම නිලධාරියකු
VI. "ඉල්ලුම්කරු" යන්නෙන් බලපත්‍රයක්, අවසරපත්‍රයක් හෝ සේවාවක් ලබා ගැනීමට අයදුම්කරන අයෙකු ද අදහස් වන්නේය.

*2 වැනි කොටස*

*ප්‍රාදේශීය සභාව වෙත හෝ සභාවේ පාලනය යටතට පවරා ඇති නිශ්චල දේපළ කළමනාකරණය*

*සම්මන්ත්‍රණශාලා*

01. ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යන හෝ ප්‍රාදේශීය සභාව සතු හෝ ප්‍රාදේශීය සභාවේ පාලනය යටතට පවරනු ලැබ ඇති සම්මන්ත්‍රණශාලා නඩත්තුව, කළමනාකරණය හා ඒවා භාවිතා කිරීම වෙනුවෙන් ගාස්තු පැනවීම පිළිබඳව වූ අතුරු ව්‍යවස්ථාවයි.

02. ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන රැස්වීම්ශාලා හෝ සම්මන්ත්‍රණශාලා පරිහරණය කිරීම සඳහා අවසර පත්‍රයක් ලබා ගැනීමට අදහස් කරන යම් තැනැත්තෙකු විසින් මෙම අතුරු ව්‍යවස්ථාවේ පළමුවන උපලේඛනයේ දැක්වෙන ආකෘතියට අනුකූලව පිළියෙල කළ ඉල්ලුම්පත්‍රයක් සම්පූර්ණ කර ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතුය.

03. (අ) ප්‍රාදේශීය සභා සම්මන්ත්‍රණශාලාව ප්‍රායෝජනයට ගැනීමට අවසර ඉල්ලීම සඳහා වන සෑම ඉල්ලුම් පත්‍රයක්ම ප්‍රාදේශීය සභා කාර්යාලයට ලැබුණු අනුපිළිවෙල අනුව සළකා බැලිය යුතුය. එසේ වුවද සම්මන්ත්‍රණශාලාව පරිහරණය කිරීමට ලැබෙන අයදුම්පත්‍ර අතුරෙන් රාජ්‍ය ආයතන විසින් ඉල්ලුම්කරන ලද අයදුම්පත්‍ර සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දිය යුතුය.

(ආ) ප්‍රාදේශීය සභාව විසින් කලින් කල නියම කරනු ලබන ආකාරයට සම්මන්ත්‍රණශාලා වෙන්කිරීමේ ගාස්තු හා ආරක්ෂිත තැන්පත් මුදල් ගෙවීමෙන් අනතුරුව පමණක් අවසර පත්‍රය නිකුත් කළ යුතුය.

එකී ගාස්තු හා ආරක්ෂිත තැන්පත් මුදල් ප්‍රාදේශීය සභාව විසින් කලින් කල නියම කිරීමේ දී එකී මුදල් ප්‍රමාණයන් වාර්ෂිකව රජයේ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කළ යුතුය.

04. සම්මන්ත්‍රණශාලාව පරිහරණය කිරීම සඳහා වන ඉල්ලුම්පත්‍රයක් ශාලාව අවශ්‍යකරන දිනයට අවම වශයෙන් වැඩකරන දින තුනකට පෙර ඉදිරිපත් කළ යුතුය.

05. සම්මන්ත්‍රණශාලාව අසළ ඇති පාසල්වලට හා ඒ අවට ඇති රජයේ කාර්යාලවලට රාජකාරි කටයුතුවලට හා පෞද්ගලික නිවාසවලට බාධා නොවන අයුරින් කටයුතු කළ යුතුය. ශබ්ද විකාශන හා වෙනත් ශබ්ද විකාශන උපකරණ භාවිතාකරමින් කරනු ලබයි නම් මේ පිළිබඳව විශේෂ අවසරයක් ගත යුතුය.

06. සම්මන්ත්‍රණශාලාව තුළ මත්පැන් හා දුම්වැටි පානය නොකළ යුතු අතර, සූදු ක්‍රීඩා කිරීම හෝ වෙනත් දුරාචාරයන්හී නිරත වීම නොකළ යුතුය. එම සම්මන්ත්‍රණ ශාලාව පාවිච්චි කරන දිනවල දී භාවිතා කරන සැරසිලි ද්‍රව්‍ය හා වෙනත් ඉවතලන ද්‍රව්‍ය නියමිත පරිදි නියමිත ස්ථාන වලට බැහැර කළ යුතුය.

07. සම්මන්ත්‍රණශාලාව වෙන්කරවා ගැනීමෙන් පසු එය අවලංගු කරවා ගැනීමට යම් ඉල්ලුම්කරුවෙකුට අවශ්‍යවන අවස්ථාවක පහත සඳහන් කොන්දේසියට යටත්ව ඉඩදීමට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ලේකම්වරයාට හැකියාව ඇත :

(අ) ඉහත කී ස්ථානය වෙන් කිරීම අවලංගු කිරීමට අවශ්‍ය වුවහොත් තැන්පත් කර ඇති මුදලින් 10%ක් ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතුය.

08. (අ) කිසියම් තැනැත්තෙකු විසින් වෙන්කරනු ලැබූ සම්මන්ත්‍රණ ශාලාව වෙන්කරගත් කාර්යයට හැර වෙනත් කාර්යයකට යොදා ගැනීම නොකළ යුතුය.

(ආ) සම්මන්ත්‍රණ ශාලාව වෙන් කිරීමට නිකුත්කරන ලද අවසර පත්‍රයක් කවර හෝ හේතුවක් මත වෙනත් තැනැත්තෙකුට පැවරීම නොකළ යුතුය.

(ඇ) කවර හෝ තැනැත්තෙකු විසින් සම්මන්ත්‍රණ ශාලාව වෙන්කරවා ගැනීම සඳහා කෙරෙන ඉල්ලීමකට ඉඩ නොදෙන අවස්ථාවකදී එසේ ඉඩ නොදීමට හේතුවන කරුණු සඳහන් කරමින් ඒ බව ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන දිනයේ දී ම එකී ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම්දීම කළ යුතුය.

09. කිසියම් කාර්යක් සඳහා වෙන්කරනු ලැබූ සම්මන්ත්‍රණ ශාලාව එසේ වෙන්කරගත් දිනය වෙනස්කර ගැනීමට අවශ්‍ය නම් ඉල්ලුම්කරු විසින් ඒ පිළිබඳව ලිඛිතව ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකිය. එකී ඉල්ලීම අනුව වෙන්කළ දිනය සංශෝධනය කිරීම 03 වන හා 04 වන වගන්තිවල නියමයන්ට යටත්ව විය යුතුය.

10. කිසියම් කාර්යක් සඳහා වෙන්කරනු ලැබූ සම්මන්ත්‍රණශාලාව හෝ අදාල කාර්ය සඳහා පාවිච්චිකිරීමෙන් අනතුරුව සභාවේ තැන්පත් කරන ලද තැන්පත් මුදලින්,

(අ) සම්මන්ත්‍රණශාලාවේ ඇති උපකරණ හා සවිකිරීම් සම්බන්ධව සිදුවී ඇති යම් අලාභයක් වේ නම් ඒ අලාභයේ වටිනාකම සහ,

(ආ) සම්මන්ත්‍රණ ශාලාව වෙන්කර ගනු ලැබූ කාලසීමාවට වඩා වැඩිපුර යොදාගනු ලැබූ කාලය වෙනුවෙන් අයකර ගත යුතු ගාස්තුව අඩුකර ගැනීමෙන් අනතුරුව ඉතිරිවන යම් මුදලක් පමණක් ඉල්ලුම්කරුට ආපසු ගෙවනු ලැබිය හැකිය.

11. සම්මන්ත්‍රණ ශාලාව පාවිච්චිකරන අවස්ථාවේ දී පැමිණෙන රථවාහන හා පාපැදි, යතුරුපැදි සියල්ල එහි ගොඩනැගිල්ලට අවහිර නොවන පරිදි එම භූමියේ ගාල්කර තැබිය හැකිය.

12. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වෙන්කරගනු ලැබූ සම්මන්ත්‍රණ ශාලාව ප්‍රාදේශීය සභාවේ අත්‍යාවශ්‍ය කාර්යයන් සඳහා අවශ්‍ය වූ විටෙක එහි වෙන් කිරීම අවලංගු කිරීමට ප්‍රාදේශීය සභාවේ සභාපතිට බලය තිබිය යුතුය. ඒ බව ඉල්ලුම්කරුට වෙන්කර ඇති දිනට දින තුනකට පෙර දැනුම් දිය යුතු අතර ඉල්ලුම්කරු විසින් ගෙවන ලද ගාස්තු හා තැන්පත් මුදල සම්පූර්ණයෙන් ම ඔහුට ආපසු ගෙවනු ලැබිය යුතුය.

13. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ විධිවිධානයක් උල්ලංඝනය කිරීම වරදක් වන අතර නිසි බලය ඇති අධිකරණයක් මගින් වරදකරු කරනු ලැබීමෙන් අනතුරුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (2) වගන්තියේ සඳහන් දණ්ඩනයට යටත් වන්නේය.

### *I* වැනි උපලේඛනය

**ප්‍රාදේශීය සභාවේ පිහිටි ........................................................................ සම්මන්ත්‍රණශාලාව**

**පරිහරණය සඳහා අවසර ලබා ගැනීමේ ඉල්ලුම් පත්‍රය**

01. ඉල්ලුම්කරු/ආයතනයේ නම : ........................................................................
........................................................................

02. ලිපිනය : ........................................................................
........................................................................

03. ජාතික හැඳුනුම්පත් අංකය : ........................................................................

04. රැස්වීම්ශාලාව ඉල්ලුම්කරනු ලබන කාරණය : ........................................................................
........................................................................
........................................................................

05. අවශ්‍යකරන දිනය හා වේලාව :

| දින සිට | දිනතෙක් | වේලාව |
|---|---|---|
| ............................................ | ............................................ | ............................................ |

06. ශාලාව භාවිත කිරීමට පිටතින් රැගෙන එන උපකරණ ලීබඩු හා ශබ්දවාහිනී උපකරණ විස්තර :

........................................................................................................................................

........................................................................................................................................

ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මේ ඉල්ලීම අනුව අදාළ රැස්වීම්ශාලාව වෙන්කර දෙනු ලැබුවහොත් එම රැස්වීම් ශාලාවේ ගොඩනැගිලිවලට, ඉදිකිරීම්වලට, උපකරණවලට හා සවිකිරීම් වලට කිසියම් හානියක් සිදුවුවහොත් එහි අලාභය තැන්පත් මුදලින් ප්‍රාදේශීය සභාව විසින් අයකර ගැනීමට එකගවන අතර, එහි තැන්පත් මුදල ඒ අයකිරීම සඳහා ප්‍රමාණවත් නොවන විටෙක තවදුරටත් අවශ්‍ය වන මුදල් ප්‍රාදේශීය සභාවට ගෙවීමට එකග වෙමි. එසේම සම්මන්ත්‍රණශාලාව අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳව අතුරු ව්‍යවස්ථා විධිවිධාන පිළිපැදීමට එකග වෙමි.

| | |
|---|---|
| ..................................................... | ..................................................... |
| දිනය | අත්සන. |

*3 වැනි කොටස*

*ප්‍රාදේශීය සභාව වෙත හෝ සභාවේ පාලනය යටතට පවරා ඇති නිශ්චල දේපළ කළමනාකරණය*

**ප්‍රජා ශාලා**

01. ..................................................... ප්‍රාදේශීය සභාව වෙත හෝ ප්‍රාදේශීය සභාවේ පාලනය යටතට පවරනු ලැබ ඇති ප්‍රජා ශාලා නඩත්තුව, කළමනාකරණය සහ ඒවා භාවිතා කිරීම වෙනුවෙන් ගාස්තු පැනවීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාවයි.

02 ..................................................... ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යන ප්‍රජා ශාලාවක් පරිහරණය කිරීම සඳහා අවසර පත්‍රයක් ලබා ගැනීමට අදහස් කරන යම් තැනැත්තෙකු විසින් මෙම අතුරු ව්‍යවස්ථාවේ පළමුවන උප ලේඛනයේ දැක්වෙන ආකෘතියට අනුකූලව පිළියෙල කළ ඉල්ලුම් පත්‍රයක් සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය.

03. 2 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් පරිදි ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කළ යම් තැනැත්තෙකු වෙත ..................................................... ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන ප්‍රජා ශාලාවක් පරිහරණය කිරීම සඳහා අවසර පත්‍රයක් නිකුත් කිරීමේ දී මෙහි දැක්වෙන කොන්දේසි සම්පූර්ණ කර ඇත්තේ නම් මිස සභාපතිවරයා විසින් අවසර පත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතුය.

(අ) ප්‍රජා ශාලාවක් ප්‍රයෝජනයට ගැනීමට අවසර පත්‍රයක් ඉල්ලීම සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම ..................................................... ප්‍රාදේශීය සභා කාර්යාලයට ලැබුණු අනුපිළිවෙල අනුව සලකා බැලිය යුතුය. එසේ වුවද ප්‍රජා ශාලාව පිහිටා ඇති ප්‍රදේශයේ කිසියම් රාජ්‍ය ආයතනයක රැස්වීමක් හෝ එවැනි සංවිධානයක් විසින් පවත්වනු ලබන පොදු කාර්යයක් වෙනුවෙන් ඉහළ ප්‍රමුඛතාව දිය යුතුය.

(ආ) ..................................................... ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ආකාරයට ප්‍රජාශාලාව වෙන් කිරීමේ ගාස්තුව හා තැන්පත් මුදලක් ගෙවීමෙන් අනතුරුව පමණක් අවසර පත්‍රයක් නිකුත් කළ යුතුය.

(ඇ) ප්‍රජාශාලා වෙන් කිරීමේ ගාස්තු හා තැන්පත් මුදල් ප්‍රමාණයන් කලින් කළ ..................................................... ප්‍රාදේශීය සභාව විසින් නියම කිරීමෙන් අනතුරුව එකී මුදල් ප්‍රමාණයන් වාර්ෂිකව රජයේ ගැසට් පත්‍රය මගින්ම ප්‍රකාශ කර තිබිය යුතුය. ප්‍රජාශාලාව පිහිටා ඇති ප්‍රදේශයේ කිසියම් රාජ්‍ය ආයතනයක රැස්වීමක් හෝ එවැනි සංවිධානයක් විසින් පවත්වනු ලබන පොදු කාර්යයක් වෙනුවෙන් කිසිදු ගාස්තුවක් අය නොකළ යුතුය.

04. පරිහරණය කිරීම සඳහා ප්‍රජාශාලාවක් වෙන්කර ගැනීමට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීම එකී වෙන් කිරීම අපේක්ෂා කරන දිනයට අවම වශයෙන් දින තුනකට පෙර සිදුකළ යුතුය. එසේ වුවද ..................................................... ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජීවත්ව සිටි යම් තැනැත්තෙකුගේ හෝ එවැනි තැනැත්තෙකුගේ ඥාතියෙකුගේ හෝ මෘත දේහයක් මහජන ගෞරවය සඳහා තාවකාලිකව තැන්පත් කර තැබීම සඳහා ප්‍රජා ශාලාවක් වෙන්කර ගැනීමට කෙරෙන ඉල්ලීමක් වෙනුවෙන් මෙම සීමාව අදාල නොවේ. කවර හෝ තැනැත්තෙකු විසින් කෙරෙන ඉල්ලීම ප්‍රජා ශාලාව වෙන්කර ගැනීමට අවශ්‍ය වන දිනට දින තුනකට පෙර ඕනෑම අවස්ථාවක ඉදිරිපත් කළ හැකි අතර, එකී ඉල්ලීමට අනුව කරනු ලබන වෙන් කිරීම 03 වන වගන්තියේ විධිවිධාන වලට යටත් විය යුතුය.

05. මෙම ව්‍යවස්ථාවට අනුව වෙන්කර ගන්නා ලද කිසියම් ප්‍රජාශාලාවක් එකී වෙන්කර ගැනීම අවලංගු කරවා ගැනීමට යම් ඉල්ලුම් කරුවෙකුට අවශ්‍ය වන අවස්ථාවක පහත සඳහන් කොන්දේසි වලට යටත්ව ඉඩදීමට සභාපතිවරයාට හැකිය.

(අ) වෙන් කිරීමක් අවලංගු කිරීමට ඉල්ලීම කරනු ලබන්නේ ප්‍රජා ශාලාව වෙන්කර ගනු ලැබූ දිනට -

I. දින පහලොවකට පෙර වන විට ගෙවනු ලැබූ ගාස්තුවෙන් 10%ක්,
II. දින තුනකට පෙර ගෙවනු ලැබූ ගාස්තුවෙන් 25%ක් ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවීමට යටත් විය යුතුය.

(ආ) වෙන් කිරීම අවලංගු කිරීමට ඉල්ලීමට කරනු ලබන්නේ ප්‍රජා ශාලාව වෙන්කර ගනු ලැබූ දිනට දින තුනකට වඩා අඩු කාලයකදී නම් ගෙවනු ලැබූ ගාස්තුව ආපසු ගෙවනු නොලැබිය යුතු ය.

(ඇ) කිසියම් වෙන් කිරීමක් අවලංගු කර ගනු ලැබූ විටකදී එකී වෙන්කර ගැනීම සඳහා ගෙවනු ලැබූ තැන්පත් මුදල සම්පූර්ණයෙන් ලබා ගැනීමට ඉල්ලුම්කරුට හිමිකම් තිබිය යුතු ය.

(ඈ) කිසියම් තැනැත්තෙකු විසින් වෙන්කර ගනු ලැබූ ප්‍රජා ශාලාවක් වෙන්කර ගත් කාර්යයට හැර වෙනත් කවර හෝ කාර්යයකට යොදා ගැනීම නොකළ යුතු ය.

(ඉ) ප්‍රජා ශාලාවක් වෙන්කිරීමට නිකුත් කරන ලද අවසර පත්‍රයක් කවර හෝ හේතුවක් මත වෙනත් තැනැත්තෙකුට පැවරීම නොකළ යුතු ය.

(ඊ) පරිහරණය සඳහා ප්‍රජා ශාලාව වෙන්කර ගත් අය විසින් විධිමත් බලපත්‍ර රහිතව එම පරිශ්‍රය තුළ ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා නොකළ යුතු ය.

06. කවර හෝ තැනැත්තෙකු විසින් ප්‍රජා ශාලාවක් වෙන්කර ගැනීම සඳහා කෙරෙන ඉල්ලීමකට ඉඩ නොදෙන අවස්ථාවක දී, එසේ නොදීමට හේතුවන කරුණු සඳහන් කරමින් ඒ බව ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ දිනයේදීම ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම් දීම සභාපතිවරයාගේ කාර්යය වන්නේ ය.

07. කිසියම් කාර්යයක් සඳහා වෙන්කර ගනු ලැබූ ප්‍රජා ශාලාවක් එසේ වෙන්කර ගත් දිනය වෙනස් කර ගැනීමට අවශ්‍ය වන්නේ නම් ඉල්ලුම්කරු විසින් ඒ පිළිබඳව ලිඛිතව සභාපතිවරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය. එකී ඉල්ලීම අනුව වෙන්කළ දිනය සංශෝධනය කිරීම 3 වන හා 4 වන අතුරු ව්‍යවස්ථාවේ නියමයන්ට යටත් විය යුතු ය.

08. කිසියම් කාර්යයක් සඳහා වෙන්කරනු ලැබූ ප්‍රජා ශාලාවක් අදාල කාර්යය සඳහා පාවිච්චි කිරීමෙන් අනතුරුව ප්‍රාදේශීය සභාවේ තැන්පත් කරනු ලැබූ තැන්පත් මුදලෙන්,

I. ප්‍රජා ශාලාව හෝ එහි යම් කොටසකට හෝ එහි ඇති උපකරණවලට හෝ සිදු වී ඇති යම් අලාභයක් වේ නම් ඒ අලාභයේ වටිනාකම සහ

II. ප්‍රජා ශාලාව වෙන්කර ගනු ලැබූ කාල සීමාවට වඩා වැඩිපුර යොදා ගනු ලැබූ කාලය වෙනුවෙන් අයකර ගත යුතු ගාස්තුව,

අඩුකර ගැනීමෙන් අනතුරුව ඉතිරිවන යම් මුදලක් පමණක් ඉල්ලුම්කරුට ආපසු ගෙවනු ලැබිය හැකි ය.

09. කවර හෝ තැනැත්තෙක් විසින් .................................................... ප්‍රාදේශීය සභාව සතු කිසියම් ප්‍රජා ශාලාවකට හානි පැමිණිවීම හෝ එසේ හානිවීමට සැලැස්වීම නොකළ යුතු අතර, ප්‍රජා ශාලාව තුළ දුම්පානය, මත් පැන් පානය කිරීම, සූදු ක්‍රීඩාවේ යෙදීම හෝ කිසියම් දුරාචාරයක නිරත වීම නොකළ යුතු ය.

10. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ වෙන්කර ගනු ලැබූ කිසියම් ප්‍රජා ශාලාවක් එසේ වෙන්කර ගනු ලැබූ දිනයේ දී .................................................... ප්‍රාදේශීය සභාවේ කිසියම් අත්‍යාවශ්‍ය කාර්යයන් සඳහා අවශ්‍ය වන විටක එකී වෙන් කිරීම අවලංගු කිරීමට සභාපතිවරයාට බලය තිබිය යුතුය . එසේ වුව ද එවැනි අවලංගු කිරීමක් සිදු කරනු ලබන්නේ නම් එකී අවලංගු කිරීම ප්‍රජා ශාලාව වෙන්කර ගනු ලැබූ දිනට දින තුනකට පෙර ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම් දිය යුතු ය. ඔහු විසින් ගෙවන ලද ගාස්තු සහ තැන්පත් මුදල සම්පූර්ණයෙන් ම ඔහුට ආපසු ගෙවනු ලැබිය යුතු ය. තවදුරටත් එසේම එවැනි අවලංගු කිරීමක්, වෙන්කර ගනු ලැබූ දිනට පෙර දින තුනකට වඩා අඩු කාලයක දී සිදු නොකළ යුතු ය.

11. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කාර්යයන් ක්‍රියාත්මක කිරීමට බලය .................................................... ප්‍රාදේශීය සභාව විසින් නියම කරනු ලබන නිශ්චිත නිළධාරියෙකුට හෝ නිලධාරින් වෙත පැවරීමට හැකි වන්නේ ය.

12. - 11 වන වගන්තියට අනුව බලය පවරනු ලබන නිලධාරියාට හෝ නිලධාරින්ට පරිහරණය සඳහා බලය ලබා දී ඇති එම පරිශ්‍රයට ඇතුලත් වීමට මෙම අතුරු ව්‍යවස්ථාවෙන් බලය පැවරේ.

13. - 11 වන වගන්තියට අනුව බලය පැවරෙන නිලධාරියා හෝ නිලධාරින් ප්‍රජා ශාලාව වෙන්කර ගන්නා ලද පුද්ගලයාට හෝ ඔවුන්ගේ නියමිත කාර්යයන්ට බාධාවක් නොවන ආකාරයෙන් තම රාජකාරිවල නියලිය යුතු ය.

14. ප්‍රජා ශාලාව පරිහරණය සඳහා ලබාගනු ලබන පුද්ගලයන් විසින් අධීක්ෂණ කටයුතු සඳහා පැමිණෙන නිලධාරියාගේ හෝ නිලධාරින්ගේ රාජකාරි සඳහා බාධා නොකළ යුතු ය.

15. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ විධිවිධානයක් උල්ලංඝනය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් වරදකරු කරනු ලැබීමෙන් අනතුරුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (2) වගන්තියේ සඳහන් දණ්ඩනයන්ට යටත් වන්නේ ය.

16. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල :-

"පොදු කාර්යය" යන්නෙන් .................................................... ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ ඇතුලත පදිංචි ජනතාවගේ පොදු යහපත පිණිස හෝ අවශ්‍යතාව පිණිස කිසියම් රාජ්‍ය ආයතනයක් විසින් සංවිධානය කරනු ලබන කිසියම් රැස්වීමක් සාකච්ඡාවක්, වෛද්‍ය සායනයක්, ආධාර පිරිනැමීමේ කාර්යයක් වැනි ස්වභාවයේ වන කිසියම් කාර්යයක් හෝ ආගමික හෝ සමාජයීය කාර්යයක් අදහස් වන අතර, කිසියම් වාණිජ ස්වභාවයේ කාර්යයක් ඊට ඇතුලත් නොවිය යුතු ය.

"ප්‍රජා ශාලාව" යන්නෙන් .................................................... ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන පොදු පරිහරණය සඳහා වෙන්කර ඇති කිසියම් ඉඩමක් හෝ පරිශ්‍රයක් අදහස් වන අතර, ඒ වටා ඉදිකර ඇති තාප්පය හෝ ඒ තුල ඉදිකර ඇති යම් ගොඩනැගිල්ලක් හෝ ඒ කිසියම් ඉදිකිරීමට කොටසක් හෝ කිසියම් සවිකිරීක් හෝ උපකරණයක්ද ඊට ඇතුලත් විය යුතු ය.

"රාජ්‍ය ආයතන" රජයේ හෝ පළාත් සභාවේ හෝ පළාත් පාලන ආයතනයක පරිපාලනයට හා අධීක්ෂණයට යටත් ඕනෑම ආයතනයක් අදහස් වන්නේ ය.

*පළමුවන උපලේඛනය*

**ඉල්ලුම්පත්‍රය**

.................................................... ප්‍රාදේශීය සභාවේ ........................................................................ පිහිටි ප්‍රජා ශාලාව
පරිහරණය සඳහා අවසර ලබා ගැනීමේ ඉල්ලුම් පත්‍රය

01. ඉල්ලුම්කරු/ආයතනයේ නම : ........................................................................................................................
ලිපිනය : ........................................................................................................................
ජාතික හැඳුනුම්පත් අංකය : ........................................................................................................................

03. ප්‍රජා ශාලාව ඉල්ලුම්කරනු ලබන කාරණය : ........................................................................................................

04. අවශ්‍යකරන දිනය හා වේලාව :

| දින සිට | දිනතෙක් | වේලාව |
|---|---|---|
| .................................................... | .................................................... | .................................................... |
| .................................................... | .................................................... | .................................................... |
| .................................................... | .................................................... | .................................................... |
| .................................................... | .................................................... | .................................................... |

ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මේ ඉල්ලීමට අනුව අදාළ ප්‍රජා ශාලාව වෙන්කර දෙනු ලැබුවහොත් එම ප්‍රජා ශාලාවේ ගොඩනැගිල්ලට ඉදිකිරීම්වලට, උපකරණ වලට හා සවිකිරීම් වලට කිසියම් හානියක් සිදුවුවහොත් එහි අලාභය තැන්පත් මුදලින් .................................................... ප්‍රාදේශීය සභාව විසින් අයකර ගනු ලැබීමට එකඟවන අතර, එහි තැන්පත් මුදල ඒ අයකිරීම සඳහා ප්‍රමාණවත් නොවන විට තවදුරටත් අවශ්‍ය වන මුදල් .................................................... ප්‍රාදේශීය සභාවට ගෙවීමටද එකඟ වෙමි. එසේම ප්‍රජාශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන පිළිපැදීමට ද එකඟ වෙමි.

| | |
|---|---|
| .................................................... | .................................................... |
| දිනය | අයදුම්කරුගේ අත්සන. |

(රාජ්‍ය ආයතනයක් නම ප්‍රධානියාගේ අත්සන සමග නිලමුද්‍රාව තැබිය යුතු ය)

*4 වන කොටස*

*ප්‍රාදේශීය සභාව වෙත හෝ සභාවේ පාලනය යටතට පවරා ඇති නිශ්චල දේපල කළමනාකරණය*

ක්‍රීඩා පිටි

01. ප්‍රාදේශීය සභාව වෙත පවරනු ලැබ ඇති හෝ සභාවේ පාලනයට පවරනු ලැබ ඇති ක්‍රීඩා පිටි හා ක්‍රීඩාගාර නඩත්තුව හා කළමනාකරණය සහ ඒවා භාවිතා කිරීම වෙනුවෙන් ගාස්තු අයකිරීම පිළිබඳව වූ අතුරු ව්‍යවස්ථාවයි.

02. ප්‍රාදේශීය සභාව සතු ක්‍රීඩා භූමි හා ක්‍රීඩාගාර පරිහරණය කිරීම සඳහා අවසර පත්‍රයක් ලබාගැනීමට අදහස් කරන යම් තැනැත්තකු මෙහි පළවන උපලේඛනයේ දැක්වෙන ආකෘතියට අනුව පිළියෙල කළ ඉල්ලුම් පත්‍රයක් ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතු ය.

03. ක්‍රීඩා භූමිය හා ක්‍රීඩාගාරය ප්‍රයෝජනයට ගැනිමට අවසර ඉල්ලීම සඳහා වන සෑම ඉල්ලුම් පත්‍රයක් ම ප්‍රාදේශීය සභා කාර්යාලයට ලැබුණු අනුපිළිවල අනුව සලකා බැලිය යුතු ය. එසේ වුව ද ක්‍රීඩාභූමිය හා ක්‍රීඩා ගාරය පරිහරණය කිරීමට ලැබෙන අයදුම්පත්‍ර අතුරින් කිසියම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩාවකට සම්බන්ධ යම් කාරණයක් සම්බන්ධයෙන් වන අයදුම් පත්‍රයකට ඉහල ප්‍රමුඛතාවය දිය යුතු ය.

04. ප්‍රාදේශීය සභාව විසින් කලින් කල නියමකරනු ලබන ආකාරයට ක්‍රීඩාභූමිය හා ක්‍රීඩාගාරය වෙන් කිරීමේ ගාස්තු සහ ආරක්ෂිත ඇප තැන්පත් මුදල් ගෙවීමෙන් අනතුරුව පමණක් අවසරපත්‍රය නිකුත්කළ යුතු ය. එකී ගාස්තු හා ආරක්ෂිත තැම්පත් මුදල් ප්‍රාදේශීය සභාව විසින් කලින් කල නියම කිරීමේ දී එකී මුදල් ප්‍රමානයක් වාර්ෂිකව *රජයේ ගැසට්පත්‍රය* මගින් ප්‍රකාශයට පත්කළ යුතු ය.

05. ක්‍රීඩාභූමි හෝ ක්‍රීඩාගාරය පරිහරණය කිරීම සඳහා ඉල්ලුම්පත්‍රයක් එකී වෙන් කිරීම අපේක්ෂාකරන දිනයට අවම වශයෙන් වැඩකරන දින තුනකට පෙර ඉදිරිපත් කළ යුතු ය.

06. ක්‍රීඩාපිටි අසල ඇති පාසැල්වලට හා ඒ අවට ඇති රජයේ කාර්යාලවල රාජකාරි කටයුතුවලට බාධා නොවන අයුරින් සංවිධාන කටයුතු සිදුකළ යුතු ය.

07. ක්‍රීඩාපිටිය හෝ ක්‍රීඩාගාරය තුළ මත්පැන් පානය නොකළ යුතු අතර, උත්සව දිනවලදී භාවිතා කරනු ලබන සැරසිලි ද්‍රව්‍ය සහ වෙනත් ඉවතලන දෑ විධිමත් පරිදි නියමිත ස්ථානවලට බැහැරකළ යුතු වේ.

08. ඉහත වෙන්කරගත් ක්‍රීඩාපිටිය හෝ ක්‍රීඩාගාරය එකී වෙන්කරවා ගැනීම අවලංගුකරවා ගැනීමට යම් ඉල්ලුම්කරුවකුට අවශ්‍යවන අවස්ථාවක පහත සඳහන් කොන්දේසිවලට යටත්ව ඉඩ දීමට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ලේකම්වරයාට හැකියාව ඇත.

(අ) ක්‍රීඩාගාරය හා ක්‍රීඩාභූමිය වෙන් කිරීම වෙනුවෙන් ගෙවන ලද ගාස්තු එදිනම ප්‍රාදේශීය සභා අරමුදලට බැර කරන බැවින්, එම මුදල් ආපසු ගෙවනු නොලැබේ.

(ආ) තැම්පත් වශයෙන් ගන්නා ලද මුදල පමණක් ඉල්ලුම්කරුට ආපසු ගෙවනු ලැබේ.

09. (අ) කිසියම් තැනැත්තකු විසින් වෙන්කරගනු ලැබූ ක්‍රීඩාභූමිය හා ක්‍රීඩාගාරය වෙන්කරගත් කාර්යයට හැර වෙනත් කවර හෝ කාර්යයකට යොදාගැනීම නොකළ යුතු ය.

(ආ) ක්‍රීඩාභූමිය හා ක්‍රීඩාගාරය වෙන්කිරීමට නිකුත් කරන ලද අවසර පත්‍රයක් කවර හෝ හේතුවක් මත වෙනත් තැනැත්තෙකුට පැවරීම නොකළ යුතු ය.

10. කවර හෝ තැනැත්තෙකු විසින් ක්‍රීඩාභූමිය වෙන්කර ගැනීම සඳහා කෙරෙන ඉල්ලීමකට ඉඩ නොදෙන අවස්ථාවක දී එසේ ඉඩ නොදීමට හේතුවන කරුණු සඳහන් කරමින් ඒ බව ඉල්ලුම්පත්‍රය ඉදිරිපත්කළ දිනයේදීම එකී ඉල්ලුම්කරුට ලිඛිතව දැන්වීම් කළ යුතු ය.

11. කිසියම් කාර්යයක් සඳහා වෙන්කරගනු ලැබූ ක්‍රීඩා භූමියක් එසේ වෙන්කරගත් දිනය වෙනස් කර ගැනීමට අවශ්‍ය වන්නේනම් ඉල්ලුම්කරු විසින් ඒ පිළිබඳව ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය. එකී ඉල්ලීම අනුව වෙන්කළ දිනය සංශෝධනය කිරීම 03 වන හා 04 වන අතුරු ව්‍යවස්ථාවල නියමයන්ට යටත් විය යුතු ය.

12. මෙම අතුරු ව්‍යවස්ථාවල දැක්වෙන විධිවිධාන අනුව ක්‍රීඩාභූමි කිසියම් කාර්යයක් සඳහා වෙන්කර නොමැති කවර හෝ අවස්ථාවක එකී ක්‍රීඩා භූමිය ක්‍රීඩා කිරීම් හෝ ක්‍රීඩා පුහුණුවීම් කටයුතු සඳහා යොදා ගැනීමට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද වෙනත් නිලධාරියෙකුගේ අවසරය ලබාගත යුතු ය.

13. කිසියම් කාර්යයක් සඳහා වෙන්කරනු ලැබූ ක්‍රීඩා භූමිය අදාල කාර්යය සඳහා පාවිච්චිකිරීමෙන් අනතුරුව සභාවේ තැන්පත්කරනු ලැබූ තැන්පත් මුදලින්,

(අ) ක්‍රීඩාභූමිය හෝ ක්‍රීඩාගාරය හෝ එහි යම් කොටසකට හෝ සිදුවී ඇති යම් අලාභයක් වේනම් ඒ අලාභයේ වටිනාකම සහ

(ආ) ක්‍රීඩාභූමිය වෙන්කර ගනුලැබූ කාල සීමාවට වඩා වැඩිපුර යොදාගනු ලැබූ කාලය වෙනුවෙන් අයකරගත යුතු ගාස්තුව.

අඩුකර ගැනීමෙන් අනතුරුව ඉතිරිවන යම් මුදලක් පමණක් ඉල්ලුම්කරුට ආපසු ගෙවනු ලැබිය හැකිය.

14. කවර හෝ තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභාව සතු ක්‍රීඩාභූමියට හා ක්‍රීඩාගාරයට හානි පැමිණවීම, එසේ හානිවීමට සැලැස්වීම නොකළයුතු අතර ක්‍රීඩාභූමිය තුළට ගවයන්, ඌරන්, අශ්වයන්, පෝනියන්, කොටළුවන් හෝ බල්ලන් ඇතුලු කිරීම නොකළ යුතු ය. එසේම තවදුරටත් ප්‍රාදේශීය සභාවේ සභාපති/වෙනත් නිලධාරියකුගෙන් ලබාගත් අවසරයක් නොමැතිව කිසිදු වාහනයක් කවර හෝ ක්‍රීඩාභූමියකට ඇතුල්කිරීම නොකළ යුතු ය.

15. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ වෙන්කර ගනු ලැබූ ක්‍රීඩාපිටිය ප්‍රාදේශීය සභාවේ අත්‍යවශ්‍ය කාර්යයක් සඳහා අවශ්‍යය වූ විටක එකී වෙන් කිරීම් අවලංගු කිරීමට ප්‍රාදේශීය සභාවට බලය තිබිය යුතු ය. ඒ බව ඉල්ලුම්කරුට වෙන්කර ඇති දිනට දින තුනකට පෙර දැනුම්දිය යුතු අතර ඉල්ලුම්කරු විසින් දෙන ලද ගාස්තුව හා තැන්පත් මුදල සම්පූර්ණයෙන් ම ඔහුට ආපසු ගෙවිය යුතු ය.

16. මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් කවර හෝ විධිවිධානයක් උල්ලංඝනය කරන තැනැත්තෙකු වරදක් කරන අතර නිසි බලය ඇති අධිකරණයක් මගින් වරදකරු කරනු ලැබීමෙන් අනතුරුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (2) වගන්තියේ සඳහන් දඬයන්ට යටත් විය යුතු ය.

17. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස,

(i) "ක්‍රීඩාව" යන්නෙන් 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ ඊට දී ඇති අර්ථය ද,

(ii) "ක්‍රීඩාපිටිය" යන්නෙන් සභාව විසින් ක්‍රීඩාපිටියක් ලෙස නම්කරන ලදුව විධිමත් නාම පුවරුවක් සවිකිරීම මගින් මහජනයාගේ දැනගැනීමට සලස්වන ලද ස්ථානයක් ද,

(iii) "ක්‍රීඩාගාරය" යන්නෙන් නම් කරන ලද ක්‍රීඩා පිටිය තුළ තනා ඇති ගෘහස්ථ ක්‍රීඩාගාර, නැරඹුම් මැදිරි, ගොඩනැගිලි, ජලතටාක හා වෙනත් ගොඩනැගිලි පරිශ්‍රයන් අදහස් වේ.

*පළමුවන උපලේඛනය*

**ප්‍රාදේශීය සභාවේ ක්‍රීඩාභූමිය පරිහරණය සඳහා අවසර ලබා ගැනීමේ ඉල්ලුම්පත්‍රය**

01. ඉල්ලා සිටින ක්‍රීඩාභූමිය පිහිටි ස්ථානයේ නම :......... ...............................................................

02. ඉල්ලුම්කරුගේ නම : ...............................................................

03. ලිපිනය : ...............................................................

04. ජාතික හැඳුනුම්පත් අංකය : ...............................................................

05. ක්‍රීඩාභූමිය ඉල්ලුම්කරන කාරණය : ...............................................................

06. අවශ්‍යකරන දිනය හා වේලාව :

| දින සිට | දිනතෙක් | වේලාව |
|---|---|---|
| .................................................... | .................................................... | .................................................... |

ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මේ ඉල්ලීමට අනුව අදාළ ක්‍රීඩාභූමිය වෙන්කර දෙනු ලැබුවහොත් එම ක්‍රීඩාභූමියේ ගොඩනැගිලිවලට, ඉදිකිරීම්වලට, උපකරණවලට හා සවිකිරීම්වලට කිසියම් හානියක් වුවහොත් එහි අලාභය තැන්පත් මුදලින් ප්‍රාදේශීය සභාව විසින් අයකර ගැනීමට එකඟවන අතර, එකී තැන්පත් මුදල ඒ අයකිරීම සඳහා ප්‍රමාණවත් නොවන විටක තවදුරටත් අවශ්‍ය වන මුදල් ප්‍රාදේශීය සභාවට ගෙවීමට ද එකඟ වෙමි. එසේම ක්‍රීඩාභූමි විධිමත් කිරීම පාලනය කිරීම හා අධීක්ෂණය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා විධිවිධාන පිළිපැදීමට ද එකඟ වෙමි.

| | |
|---|---|
| .................................................... | .................................................... |
| දිනය | අයදුම්කරුගේ අත්සන. |

*5 වන කොටස*

*ප්‍රාදේශීය සභාව වෙත හෝ සභාවේ පාලනය යටතට පවරා ඇති නිශ්චල දේපළ කළමනාකරණය*

ආදාහනාගාර

01. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි සභාව සතු ආදාහනාගාර විධිමත් කිරීම, පාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවයි.

02 .සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද අවසරපත්‍රයක් නොමැතිව සභාව සතු ආදාහනාගාරයේ කිසිදු මෘත ශරීරයක් ආදාහනය නොකළ යුතු ය.

03. 2 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් අවසරපත්‍රයක් ලබාගැනීමට අපේක්ෂා කරන මෙහි මින් මතු ඉල්ලුම්කරු යැයි සඳහන් කරනු ලබන තැනැත්තෙකු විසින් 1 වන උපලේඛනයට සාරානුකූලව පිළියෙල කරන ලද ඉල්ලුම්පත්‍රයක් සභාපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

04. අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ඉල්ලුම්කරු මියගිය තැනැත්තාගේ ආසන්නතම ඥාතියෙකු විය යුතු අතර, මියගිය තැනැත්තාගේ මරණ සහතිකයේ මුල් පිටපත හා එහි ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතු ය. මරණ සහතිකයේ ආදාහනය කරනු ලබන ස්ථානය ලෙසට ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරයෙහි නම සඳහන් විය යුතු ය.

05. මියගිය තැනැත්තාගේ මරණය සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය යටතේ පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම්, පරීක්ෂණය පවත්වන ලද මහෙස්ත්‍රාත්වරයා විසින් හෝ මරණ පරීක්ෂකවරයා විසින් මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා අවසර දෙමින් නිකුත් කරන ලද සහතිකය අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ය.

06. අජීවී උපතකින් බිහිකරන ලද මෘත ශරීරයක් නම් මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ නිකුත් කරන ලද සහතිකය ඉදිරිපත් කළ යුතු ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය කාර්යාලය වෙත ලැබීමෙන් අනතුරුව ලැබුණු අනුපිළිවෙල අනුව ලේඛන ගත කිරීම කරනු ලැබිය යුතුයි. අයදුම්පතක් ප්‍රතික්ෂේප කිරීමට සිදුවුවහොත් එයට හේතු ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැන්විය යුතු ය. මෘත ශරීර ආදාහනය කිරීමේදී ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය හෝ බල ප්‍රදේශයෙන් පිටත පදිංචිකරුවන්ගේ මෘත ශරීර ආදාහනය කළ හැකි අතර, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමාව තුළ පදිංචිව සිටින පදිංචිකරුගේ මෘත ශරීරයක් ආදාහනය කිරීමට සහ බල ප්‍රදේශයෙන් පිටත පදිංචිව සිටින අයෙකුගේ මෘත ශරීරයක් ආදාහනය කිරීමට ප්‍රාදේශීය සභාව විසින් කලින් කල වෙන් වෙන්ව නියම කරන ලද ගාස්තු ගෙවිය යුතුය. මෙම ගාස්තු ප්‍රාදේශීය සභාව විසින් වාර්ෂිකව රජයේ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

08. සතියේ සෑම දිනකම ආදාහනය කළ හැකි අතර, ලැබෙන අයදුම්පත්‍රවල අනුපිළිවෙල අනුව වේලාවන් වෙන්කර දිය යුතු ය. ආදාහනය කරනු ලබන වේලාව පෙ. ව. 6.00 ප.ව. 8.00 අතර කාලය විය යුතු අතර, අවසර පත්‍රයේ සඳහන් වේලාවට විනාඩි 30 කට පෙර ආදාහනාගාර භාරකරුවන්ට මෘත දේහය භාරදිය යුතු අතර, පෙ.ව. 6.00 සිට ප.ව. 8.00 අතර කාලයට අමතරව වෙනත් විකල්ප වේලාවක් තුළ මෘත ශරීරයක් ආදාහනය කරනු ලබන්නේ නම් ඒ සඳහා සභාපතිවරයාගේ විශේෂ අවසරයක් තිබිය යුතු ය. එක් දිනකට ආදාහනය කරනු ලබන උපරිම මෘත ශරීර ගණන සභාව විසින් තීරණය කර ආදාහනාගාරයෙහි දැන්වීම් පුවරුවක ප්‍රදර්ශනය කල යුතු ය.

09. විධිමත් අවසර පත්‍රයකින් ආදාහනය කිරීම සඳහා අවසර ලබාදී ඇති මෘත ශරීරයක් එම අවසර දී ඇති වේලාව තුළ ආදාහනය කිරීම අත්හිටුවීම කළ හැක්කේ අධිකරණය විසින් හෝ පොලිස් ස්ථානාධිපතිවරයාගේ ලිඛිත නියෝගයක් මත පමණි. මෙහිදී වෙන් කරන ලද වේලාවට විකල්ප වේලාවක් ලබා දීමට හෝ ඒ වෙනුවට ගෙවන ලද ගාස්තුව ආපසු ගෙවීමට ප්‍රාදේශීය සභාව වගකීමට බැඳී නොමැති අතර, ඒ වෙනුවෙන් ඔහුට ඉල්ලීම් කිරීමේ කිසිදු හිමිකමක්ද නොමැත.

10. ආදාහනාගාරයේ මෘත ශරීරයක් ආදාහනය සිදු කරන අවස්ථාවකදී සිදුවන කාර්මික දෝෂයක් හේතුවෙන් සුළු වේලාවක් තුළ නැවත යථා තත්ත්වයට පත්කර ගත නොහැකි අවස්ථාවකදී එම මෘත දේහය හෝ මෘත දේහයේ කොටසක් ගෞරවාන්විතව මිහිදන් කිරීමේ හිමිකම ප්‍රාදේශීය සභාව සතුවනු ඇත.

11. මෘත ශරීරයේ භස්මාවශේෂ ආදාහනය කළ වේලාවෙහි සිට පැය 24 ක් ඇතුලත ලබා ගැනීමට ඉල්ලුම්කරු ඉදිරිපත් විය යුතු අතර, නියමිත වේලාව තුළ ලබා නොගන්නා භස්මාවශේෂ මිහිදන් කිරීමට ප්‍රාදේශීය සභාවට බලය ඇත්තේය.

12. සභාව සතු සොහොන් භූමියේ භස්මාවශේෂ තැන්පත් කිරීමට ප්‍රාදේශීය සභාවේ විධිමත් අවසරය ලබා ගත යුතු අතර, ඒ සඳහා නියමිත ගාස්තුවක් ගෙවිය යුතු අතර, එය සභාව විසින් කලින් කල තීරණය කොට රජයේ ගැසට් පත්‍රය මගින් වාර්ෂිකව ප්‍රකාශයට පත්කර ඇති පරිදි විය යුතු ය.

13. ආදාහනාගාර භූමියට අනවසරයෙන් ඇතුළත්වීම වරදක් වන අතර, ආදාහනාගාර භූමියට ඇතුල්විය හැක්කේ ආදාහනය සිදු කරනු ලබන අවස්ථාවේ මෘත දේහය සමග පැමිණි පිරිසට පමණි. ආදාහනාගාර භූමියේ ප්‍රධාන දොරටුවෙන් මෘත ශරීරය රැගෙන එන වාහනයට හා තවත් එක් වාහනයකට පමණක් ඇතුළු වීමට අවසර හිමි වන්නේය.

14. ආදාහනාගාරයේ කටයුතු සඳහා යෙදවිය හැක්කේ සභාවේ විධිමත් බලය පැවරූ පුද්ගලයෙකු හෝ පුද්ගලයින් පමණි.

15. ආදාහනාගාර භූමිය තුළ සාමය කඩවන ආකාරයෙන් හැසිරීම හෝ ආදාහනාගාරයේ සේවයේ නියුතු සේවකයින්ගේ රාජකාරි කටයුතු සඳහා බාධා කිරීම සහ ආදාහනාගාර පරිශ්‍රය තුළ සැරසිලි කිරීම නොකළ යුතු අතර ආදාහන භූමිය තුළ රැස්වීම් පැවැත්වීම මත්පැන් හෝ මත්ද්‍රව්‍ය භාවිතා කිරීම නොකල යුතු අතර ආදාහනාගාර භූමියේ ආගමික වතාවත් සිදු කිරීම කළ හැකිය.

16. ආදාහනාගාරයේ ආදාහනය කුටීරයට මෘත දේහය ඇතුලත්කර එහි ආරක්ෂිත දොර වසා තැබීමෙන් පසුව කුටීරය ආවාරණය කොටසට ආදාහනාගාර භාරකරු හෝ ඔහුගේ සහයකයන් හැර වෙනත් යම් තැනැත්තකු ඇතුලත්වීම නොකල යුතු ය.

17. මෙම අතුරු ව්‍යවස්ථාවේ නොකල යුතු යැයි සඳහන් ක්‍රියාවන් සිදු කිරීම වරදක් වන අතර ඒ සඳහා නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබුවේ නම් රු. 750/- කට නොඅඩු දඩයකට වරද කරන තැනැත්තා යටත් විය යුතු ය. එම වරද දිගින් දිගටම සිදුකරන්නේ නම් දිනකට රු.250/- ක් බැගින් වූ අතිරේක දඩයක් ගෙවීමට බැඳී සිටිය යුතු ය.

18. සභාව සතු ආදාහනාගාරය තුළ හෝ භූමිය තුළ ඇති දේපළ වලට හානියක් සිදු කළහොත් එම හානිය සම්බන්ධයෙන් වූ අලාභය සභාව වෙත ගෙවීමට ඉල්ලුම්කරු බැඳී සිටිය යුතු ය.

19. මෙම අතුරු ව්‍යවස්ථාවේ "ආසන්න ඥාතියා" යනු මියගිය තැනැත්තාගේ කලත්‍රයා හෝ දරුවන් හෝ දෙමාපියන් හෝ සහෝදර සහෝදරියන් හෝ භාරකරුවකු.

"ආදාහනාගාර භාරකරු" යනු ප්‍රාදේශීය සභාව විසින් එහි සේවයට යොදවා ඇති තැනැත්තාද අදහස් වේ.

පළමුවන උපලේඛනය

3 වන වගන්තිය

ආදාහනාගාරයේ මෘත දේහයක් ආදාහනය කිරීමට අවසර ලබා ගැනීම සඳහා වූ අයදුම්පත්‍රය

01. පළාත් පාලන ආයතන බල ප්‍රදේශ :..........................................................................................................

02. ඉල්ලුම්කරුගේ විස්තර : :..........................................................................................................

*(අ)* නම :..........................................................................................................
*(ආ)* ලිපිනය :..........................................................................................................
*(ඇ)* ජාතික හැඳුනුම්පත් අංකය :..........................................................................................................
*(ඈ)* දුරකථන අංකය :..........................................................................................................
*(ඉ)* ආදාහනය කිරීමට අවශ්‍ය දිනය :..........................................................................................................
*(ඊ)* මියගිය තැනැත්තාට ඇති නෑකම :..........................................................................................................

03. මියගිය තැනැත්තාගේ විස්තරය : :..........................................................................................................

(අ) නම : ..........................................................................................................
(ආ) පදිංචිව සිටි ලිපිනය : ..........................................................................................................
(ඇ) මියගිය දිනය : ..........................................................................................................
(ඈ) වයස අවුරුදු : ........................................... මාස : ..........................................
(ඉ) මරණ සහතිකයේ අංකය : ...................................................... දිනය : ..........................................
(ඊ) මරණයට හේතුව : ..........................................................................................................

ඉල්ලුම්කරුගේ ප්‍රකාශය

ඉහත සඳහන් තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවත් මෘත දේහය ආදාහනය කිරීමට වෙන්කර දෙන ලද වේලාවට විනාඩි 30 කට පෙර මෘත දේහය ආදාහනාගාරයට භාර දෙන බවත්, ආදාහනාගාරයේ හෝ එම භූමියේ ඇති නිශ්චල හෝ චංචල දේපල ආරක්ෂා කරන බවටත්, එම දේපලවලට යම් අලාභ හානියක් සිදු වුවහොත් එහි වගකීම බාර ගන්නා බවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

| | |
|---|---|
| ..................................................... | ..................................................... |
| දිනය | අයදුම්කරුගේ අත්සන. |

*6 වැනි කොටස*

*ප්‍රාදේශීය සභාව වෙත හෝ සභාවේ පාලනය යටතට පවරා ඇති නිශ්චල දේපල කළමනාකරණය කිරීම*

**පුස්තකාල සහ කියවීම් ශාලා**

01. ප්‍රාදේශීය සභාව වෙත හෝ ප්‍රාදේශීය සභාවේ පාලනය යටතට පවරනු ලැබ ඇති පුස්තකාල නඩත්තුව හා කළමනාකරණය හා එහි භාවිතය උදෙසා ගාස්තු පැනවීම පිළිබඳව වූ අතුරු ව්‍යවස්ථාවයි.

02. (අ) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස පුස්තකාල පිළිබඳ මෙම අතුරු ව්‍යවස්ථාවල "පුස්තකාලයාධිපති" යන යෙදුමෙන් පුස්තකාලය භාරව සිටීමට ප්‍රාදේශීය සභාව විසින් පත්කරනු ලබන තැනැත්තෙක් අදහස් වේ.

(ආ) ප්‍රාදේශීය සභාව විසින් පිහිටුවා පවත්වාගෙන යන මහජන පුස්තකාලය -

I. බැහැරදෙන අංශය,
II. විමර්ෂණ අංශය,
III. ළමා අංශය,
IV. පුවත්පත් කියවීමේ අංශය,
V. පරිගණක අංශය යන අංශවලින් සමන්විත වේ.

03. මහජන පුස්තකාලය අධීක්ෂණය හා සාමාන්‍ය පරිපාලනය මෙහි මින්මතු "පුස්තකාල කමිටුව" යනුවෙන් අදහස්කරනු ලබන පුස්තකාල කමිටුවක් වෙත පැවරෙන්නේ ය. එම කමිටුව පහත සඳහන් පුද්ගලයන්ගෙන් හා තැනැත්තන්ගෙන් සමන්විත වේ.

(අ) මෙහි මින්මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන තත්කාලයෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිධුරය දරන තැනැත්තා,

(ආ) ප්‍රාදේශීය සභාව විසින් ප්‍රාදේශීය සභාවේ සභිකයින් අතරින් තෝරාගනු ලබන සාමාජිකයින් දෙදෙනෙකු හා,

(ඇ) ප්‍රාදේශීය සභාව විසින් යෝජනා සම්මතයක් මගින් තෝරාපත්කරගනු ලබන බල ප්‍රදේශයේ විශිෂ්ඨ තැනැත්තෙක් හා සභාවේ සේවයේ නියුක්ත ප්‍රජා සංවර්ධන නිලධාරී හෝ වෙනත් නිලධාරියකු, හා පුස්තකාලය ඇතුළු ඉහත අංශ නියෝජනය කරන සාමාජිකයින් පස් දෙනෙකු,

04. පුස්තකාලය ක්‍රමවත්ව පවත්වාගෙන යාම විධිමත් කිරීම, පාලනය කිරීම හා අධීක්ෂණය කිරීම පුස්තකාලයාධිපතිවරයාගේ වගකීම වන්නේ ය.

05. (i) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා නිලබලයෙන් කමිටුවේ සභාපතිවරයා විය යුතු අතර, කමිටුවේ සෑම රැස්වීමකම ඔහු මුලසුන දැරිය යුතුය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විටක පැමිණ සිටින සාමාජිකයන් විසින් කමිටුවේ සාමාජිකයින් අතුරෙන් තෝරාපත්කර ගන්නා අයෙකු එම කමිටුවේ මුලසුන දැරිය යුතුය.

(ii) කවර හෝ රැස්වීමක මුලසුන දරන සාමාජිකයාට එක් මූලික ඡන්දයක් ද යම් ප්‍රශ්නයක් සම්බන්ධව පක්ෂ හෝ විපක්ෂ ඡන්ද සංඛ්‍යාවට සමාන වුවහොත් තීරක ඡන්දයක් ද ඇත්තේ ය.

06. සාමාජිකයන් පස්දෙනෙකුගේ සණපූර්ණයක් ඇත්නම් මිස කමිටු රැස්වීමක දී කිසි කටයුත්තක් නොකළ යුතු අතර, මෙම කමිටුව මාස තුනකට වරක් රැස්විය යුතුය.

07. කමිටුව විසින් අවශ්‍ය යැයි සැළකෙන කොන්දේසිවලට යටත්ව යම් තැනැත්තෙකුට මහජන පුස්තකාල පරිශ්‍රයෙහි යම් කොටසක් පාවිච්චි කිරීමට ඉඩදීමට හෝ යම් තැනැත්තෙකු විසින් පුස්තකාලය පිළිබඳව වන මෙම අතුරු ව්‍යවස්ථාව අතුරෙන් යමක් උල්ලංඝණය කර ඇත්නම්, ඒ තැනැත්තාට ඒ පරිශ්‍රයෙහි යම් කොටසක් පාවිච්චි කිරීමට ඉඩදීම ප්‍රතික්ෂේප කිරීමට කමිටුවට බලය ඇත්තේය.

*බැහැරදෙන අංශය*

08. (i) යම් තැනැත්තෙක් -

(අ) වයස අවුරුදු 12 ට අඩුවන්නේ නම් මිස,

(ආ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචිව සිටිනම් හෝ ප්‍රාදේශීය සභාබල ප්‍රදේශය තුළ කාර්යාලයක්, ව්‍යාපාරයක් ඇතිව තිබේ නම් මිස,

(ඇ) පුස්තකාලයාධිපතිවරයා වෙත රුපියල් 100ක මුදලක් තැන්පත් කර ඇත්තේ නම් මිස,

(ඈ) ප්‍රාදේශීය සභාව වෙත බදු ගෙවන්නෙකු වෙත නිර්දේශකර ඇත්නම් මිස, ඒ තැනැත්තා බැහැරදෙන අංශයේ සාමාජිකයකු ලෙස ඇතුලත් කර නොගත යුතුය.

(ii) බැහැරදෙන අංශයේ සාමාජිකයෙකු ලෙස ඇතුලත්වීමට අපේක්ෂා කරන සෑම තැනැත්තෙකුම පුස්තකාලයාධිපතිවරයාගෙන් ලබාගත හැකි ආකෘතිපත්‍රයක් මත ඒ සඳහා ඉල්ලුම් කළයුතු අතර, ඔහු විසින් එම ඉල්ලුම්පත්‍රය මෙහි පහත සඳහන් තැනැත්තෙකු ලවා සහතික කරවාගත යුතුය.

(අ) සභාවේ සභිකයකු,
(ආ) පුස්තකාල කමිටුවේ සාමාජිකයෙකු,
(ඇ) ආගමික පූජකවරයෙකු,
(ඈ) සාමදාන විනිශ්චයකාරවරයෙකු,
(ඉ) පාසලක විදුහල්පතිවරයකු,
(ඊ) රුපියල් 21000.00 කට නොඅඩු ආරම්භක වැටුපක් ලබන රජයේ නිලධාරියකු
(උ) ප්‍රාදේශීය සභාබල ප්‍රදේශයේ ග්‍රාමසේවා නිලධාරිවරයෙකු.

(iii) බැහැර දෙන අංශයේ සාමාජිකයෙකු හට පොත් බැහැරගෙන යාම සඳහා කාඩ්පත් දෙකක් ලබාගැනීමට හිමිකම් ඇත්තේ ය.

09. බැහැර දෙන අංශයේ සාමාජිකයෙකු හට නිකුත්කරන ලද කාඩ්පතක් මත ඔහු විසින් රැගෙන යන ලද යම් පොතක් සම්බන්ධයෙන් ඔහු වගකිව යුතු වන්නේ ය.

10. බැහැර දෙන අංශයේ සාමාජිකයෙකු හට නිකුත් කරන ලද කාඩ්පතක් ඔහු අතින් නැති වූ අවස්ථාවක එසේ නැතිවීම ගැන ඔහු විසින් පුස්තකාලයාධිපතිවරයාට දැනුම්දිය යුතුය. එම කාඩ්පතට බැහැර දෙන අංශයෙන් පොතක් ලබාගෙන නොමැති බවට පුස්තකාලයාධිපතිවරයා සෑහීමකට පත්වුවහොත් ඔහු විසින් එම සාමාජිකයාට කාඩ්පතේ අනුපිටපතක් නිකුත්කල හැකිය. කාඩ්පතක් නැතිවී ඇති බව දැනුම්දෙනු ලැබූ දිනයේ සිට යටත් පිරිසෙයින් දින 30ක කාලයක් ඉකුත් වී ඇත්නම් මිස පුස්තකාලයාධිපතිවරයා විසින් අනුපිටපතක් නිකුත් නොකළ යුතුය.

11. බැහැර දෙන අංශයේ සාමාජිකයෙකු විසින් ලබාගන්නා ලද පොතක් ලබාගත් දින සිට දින 14ක කාලයක් තුළ පුස්තකාලයාධිපතිවරයා වෙත ආපසු භාර දිය යුතුය.

12. එවැනි යම් පොතක් වෙනත් සාමාජිකයකු විසින් ඉල්ලා නොමැති නම් එම පොත නැවත එම සාමාජිකයාටම දින 14 ක් සඳහා ලබා දීමට පුස්තකාලයාධිපතිවරයාට බලය ඇත්තේ ය.

13. 11 වැනි වගන්තියේ සඳහන් දින 14 ක කාළ සීමාව ඇතුලත යම් පොතක් පුස්තකාලයාධිපතිවරයාට ආපසු භාර දීම සාමාජිකයෙකු විසින් පැහැර හැරලැබ ඇති අවස්ථාවක ඒ පොත ආපසු භාර දිය යුතු දිනය ඉක්මවා යන එක් එක් දවස වෙනුවෙන් රු. 5 බැගින් දඩයක් ගෙවීමට සාමාජිකයා යටත් වන්නේ ය.

14. බැහැර දෙන අංශයේ සාමාජිකයෙකු විසින් ලබා ගන්නා පොතක් 11 වන වගන්තියේ සඳහන් දින 14 ක කාලය ඉකුත් වීමෙන් දින 30 ක් ඇතුලත ආපසු භාර දීම සාමාජිකයෙකු විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක එම පොත නැති වූවා ලෙස සැළකිය යුතුය.

15. සාමාජිකයෙකු විසින් ලබා ගන්නා ලද පොතක් නැති වී ඇති හෝ නැති වී ඇති බව සළකනු ලැබූ අවස්ථාවක එම පොත ආපසු සපයා ගැනීමේ වියදම එම සාමාජිකයා විසින් ගෙවිය යුතු වන්නේය.

16. කිසියම් සාමාජිකයෙකු විසින් බැහැර දෙන අංශයෙන් ලබා ගන්නා පොතකට හානි කිරීම හෝ කවර හෝ ආකාරයකින් විරූප කිරීම නොකළ යුතුය.

17. බැහැර දෙන අංශයෙන් තමා ලබා ගැනීමට අපේක්ෂා කරන පොතකට සිදු වී ඇති හානියක් හෝ විරූප කිරීමක් පිළිබඳව පුස්තකාලයාධිපතිවරයාට දැනුම් දීම සෑම සාාමජිකයාගේම යුතුකම වන්නේ ය.

18. එවැනි හානියක් හෝ විරූප කිරීමක් පිළිබඳව පුස්තකාලයාධිපතිවරයාට දැනුම් දීම සාමාජිකයකු විසින් පැහැර හැර ඇති අවස්ථාවක ඒ පොත ඔහුට හානියක් හෝ විරූප කිරීමකින් තොරව නිකුත් කරන ලද සේ සැලකිය යුතුය.

19. සාමාජිකයෙකු විසින් ආපසු භාරදෙන පොතක් තව දුරටත් නිකුත් කිරීමට නුසුදුසු වන තරමට ඔහු විසින් හානිකර හෝ විරූප කර ඇති බවට පුස්තකාලයාධිපතිවරයාට සෑහීමකට පත්වන්නා වූ අවස්ථාවක, එම පොත නැවත සපයා ගැනීමේ වියදම දැරීමට එම සාමාජිකයා බැඳී සිටින්නේය. එම පොත නැවත සපයා ගැනීමෙන් පසුව හානි වූ පොත "මහජන පුස්තකාලය හානි වූ පොතක් ලෙස විකුණන ලදී" යනුවෙන් මුද්‍රා තබා එම සාමාජිකයාට දෙනු ලැබේ.

20. (අ) බැහැර දෙන පුස්තකාලයෙන් ලබාගත් පොතක් කිසිදු සාමාජිකයෙකු විසින් කිසිදු තැනැත්තෙකුට භාර නොදිය යුතුය.

(ආ) මෙම වගන්තියේ (අ) වන ඡේදයේ විධිවිධාන උල්ලංඝණය කරන කවර හෝ සාමාජිකයෙකුගේ තැන්පත් මුදල් අහිමි නොකර බැහැර දෙන අංශයේ ඔහුගේ සාමාජිකත්වය අහෝසි වන්නේය.

21. (අ) ආසාදන හෝ ස්පර්ශක රෝගයකින් යම් තැනැත්තෙකු විසින් පාවිච්චි කළ බව තමා දන්නා කිසිම පොතක් සාමාජිකයෙකු විසින් බැහැරදෙන අංශයට ආපසු භාර නොදිය යුතුය.

(ආ) බැහැර දෙන අංශයේ සාමාජිකයෙකු විසින් ලබා ගන්නා ලද පොතක් ආසාධන හෝ ස්පර්ශක රෝගයකින් පෙලෙන තැනැත්තෙකු විසින් පාවිච්චි කර ඇති විටක එම පොත විනාශ කළ යුතු අතර, එය නැවත සපයා ගැනීමේ වියදම එම සාමාජිකයා විසින් පුස්තකාලායධිපතිවරයාට ගෙවිය යුතුය.

22. කිසියම් පොතක් බැහැර දිය යුත්තේ කවර සාමාජිකයෙකුටද යන්න පිළිබඳ මතභේදයක් බැහැර දෙන අංශයේ සාමාජිකයන් දෙදෙනෙකු හෝ වැඩි ගණනක් අතර උද්ගත වූ විට එම මතභේදය පුස්තකාලයාධිපතිවරයා විසින් විසඳිය යුතුය.

23. වෙනත් සාමාජිකයෙකු විසින් ලබාගෙන ගොස් ඇති යම් පොතක් ලබා ගැනීමට යම් සාමාජිකයෙකු අපේක්ෂා කරන විටදී තමාගේ නම හා පොතේ නම එම කාර්යය සඳහා තබා ඇති රෙජිස්ටරයක සටහන් කළ යුතුය. එම පොත ගෙන ගොස් ඇති සාමාජිකයා එය ආපසු භාර දුන් විට පුස්තකාලයාධිපතිවරයා විසින් එය රෙජිස්ටරයේ නම සටහන් කර ඇති සාමාජිකයාට නිකුත් කළ යුතුය. යම් පොතක් සඳහා සාමාජිකයන් එක් අයෙකුට වඩා වැඩි සංඛ්‍යාවක් රෙජිස්ටරයකින් නම සටහන් කර ඇති අවස්ථාවක ඔවුන් නම් සටහන් කළ අනුපිළිවෙල අනුව එම පොත ඔවුන්ට නිකුත් කළ යුතුය.

24. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි හෝ කාර්යාලයක් හෝ ව්‍යාපාරික ස්ථානයක් තබා ගැනීම නතර කරන යම් සාමාජිකයෙකු බැහැර දෙන අංශයේ සාමාජිකයෙකු ව සිටීම නතර වන අතර, 08 වන වගන්තිය යටතේ ඔහු වෙත නිකුත් කර ඇති කාඩ්පත් 02 පුස්තකාලාධිපතිවරයාට ආපසු භාර දිය යුතුය.

25. යම් තැනැත්තෙකු විසින් 8(1) (ඇ) අතුරු වගන්තිය යටතේ ගෙවා ඇති රු. 100 වන තැන්පත් මුදල බැහැර දෙන අංශයට ඔබගෙන් අයවිය යුතු යම් මුදලක් වෙතොත් එය අඩුකර එම තැනැත්තාගෙන් සාමාජිකත්වය අවසන් වීමේදී ඔහුට ආපසු ගෙවිය යුතුය.

26. බැහැර දෙන අංශය ඉරිදා දින ප්‍රසිද්ධ නිවාඩු දින හා යටත් පිරිසෙයින් සාමාජිකයන්ට දින 07ක දැණුම් දීමකින් පසුව තොග ගණන් ගැනීම සඳහා කමිටුව විසින් නියම කරන වෙනත් යම් දිනයන් හි හැර දිනපතා පෙ.ව. 9.00 හා ප.ව. 5.00 අතර කාලය තුල විවෘතව තැබිය යුතුය.

*විමර්ශන අංශය*

27. (අ) විමර්ශන අංශය පාවිච්චි කිරීම සඳහා පුස්තකාලයාධිපතිවරයාගේ අවසරය ලබාගෙන ඇත්තේ නම් මිස, සහ

(ආ) විමර්ශන අංශයේ තබා ඇති රෙජිස්ටරය අත්සන් කර ඇත්නම් මිස කිසිම තැනැත්තෙකු විසින් විමර්ශන අංශය පාවිච්චි කරනු නොලැබිය යුතුය.

28. පුස්තකාලයාධිපතිවරයා විසින්,-

(අ) කියවීමට හා ලිවීමට හැකි ;

(ආ) ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුල පදිංචි ;

(ඇ) වයස අවුරුදු 12 ට නොඅඩු කවර හෝ තැනැත්තෙකුට විමර්ශන අංශය පාවිච්චි කිරීමට අවසර දිය හැකිය.

29. කියවා බැලීම සඳහා තමා වෙත නිකුත් කරන ලද කිසිම පොතක් කිසිදු තැනැත්තෙකු විසින් විමර්ශන අංශයෙන් පිටතට ගෙන නොයා යුතුය.

30. (I) මෙම අතුරු ව්‍යවස්ථාවේ 26 වන වගන්තියේ දැක්වෙන විධිවිධාන වලට යටත්ව විමර්ශන අංශය පෙ. ව. 9.30 සිට මධ්‍යහන 12.00ත් ප. ව. 1.00 සිට 4.30 දක්වා විවෘතව තැබිය යුතුය.

(II) ප්‍රාදේශීය සභාව විසින් යෝජනා සම්මතයකින්

(අ) මෙම වගන්තියේ පළවන ඡේදයේ නිශ්චිය කොට දැක්වෙන වේලාවන් දීර්ඝ කළ හැකිය.

(ආ) එම යෝජනා සම්මුතිය නිශ්චය කොට දක්වනු ලැබිය හැකි වේලාවන් තුළ ඉරු දිනයන් හි සහ ප්‍රසිද්ධ නිවාඩු දිනයන්හි විමර්ශන අංශයන් හි කාලය විවෘතව තබන ලෙස කමිටුවෙන් ඉල්ලා සිටිය හැකිය.

(ඇ) තොග ගණන් ගැනීමේ කාර්යය සඳහා ප්‍රාදේශීය සභාව විසින් නියම කරනු ලැබිය හැකි දිනවල විමර්ශන අංශය වසා තබන ලෙස ඉල්ලා සිටිය හැක.

*ළමා අංශය*

31. ළමා අංශය පාවිච්චි කිරීම සඳහා පුස්තකාලාධිපතිවරයාගේ අවසරය ලබාගෙන ඇත්තා වූ ද, වයස අවුරුදු 5ත් 12 ත් අතර අයෙකු මිස කිසිම තැනැත්තෙකු විසින් ළමා අංශය පාවිච්චි නොකළ යුතුය.

32. පොත් බැහැර දීම සම්බන්ධයෙන් වන කටයුතු සඳහා බැහැර දෙන අංශය සඳහා වන විධිවිධාන අදාල කරගත යුතුය.

*පුවත්පත් කියවීමේ අංශය*

33. මෙම අතුරු ව්‍යවස්ථාවේ 26 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව කියවීම් ශාලාව පෙ.ව. 9.00 සිට ප.ව. 5.00 දක්වා විවෘතව තැබිය යුතුය.

34. තොග ගණන් ගැනීමේ කාර්යය සඳහා ප්‍රාදේශීය සභාව විසින් නියම කරනු ලැබිය හැකි දිනවල කියවීම් ශාලාව වසා තබන ලෙස කමිටුවෙන් ඉල්ලා සිටිය හැකිය.

35. කියවීම් ශාලාවේ තබා ඇති හෝ කියවීම් ශාලාවට අයත් කිසිම පුවත්පතක්, වාර ප්‍රකාශයක්, සඟරාවක් සිතියමක්, ලියවිල්ලක්, අත්පිටපතක් හෝ වෙනත් යම් ලිපියක් කිසිම තැනැත්තෙකු විසින් කියවීම් ශාලාවෙන් ඉවත් කරගෙන නොයා යුතුය.

*පරිගණක අංශය*

36. පරිගණක අංශය භාවිතා කිරීමට අදහස් කරන සෑම සාමාජිකයෙකුම පුස්තකාලයාධිපතිගෙන් ලිඛිත ඉල්ලීමක් කළ යුතු වන්නේය.

37. එසේ ඉල්ලුම්කරන සෑම සාමාජිකයෙකුම වයස අවුරුදු 15ට නොඅඩු විය යුතුය.

38. පරිගණක අංශය සඳහා රුපියල් 500 ක සාමාජික ගාස්තුවක් ගෙවා වෙනම සාමාජිකත්වය ලබා තිබිය යුතුය.

39. පරිගණක යන්ත්‍රයක් එක් දිනයකදී එක් අයෙකුට භාවිතා කළ හැක්කේ උපරිම පැයක පමණ කාලයකි.

40. පරිගණකය භාවිතා කරන සෑම සාමාජිකයෙකුම පරිගණක භාවිතා කිරීමට පෙර එහි ඇති දෝෂ හා හානි පිළිබඳ සොයා බලා භාවිතා කළ යුතුය.

41. යම් අයුරකින් පරිගණක යන්ත්‍රයක් එවැනි දෝෂයක් හෝ හානියක් සිදු වී ඇත්නම් ඒ බව පුස්තකාලයාධිපතිට දැනුම් දිය යුතුය.

42. එසේ දැනුම් දීමෙන් අනතුරුව පරිගණක යන්ත්‍රයේ පවතින දෝෂය හා හානිය පිළිබඳව පුස්තකාලාධිපතිවරයා සොයා බැලිය යුතුය.

43. එසේ සොයා බැලීමෙන් අනතුරුව දෝෂය හෝ හානිය භාවිතාකරුට පෙර පැවතියක්ද, නොඑසේ නම් භාවිතාකරු විසින් වූ දෝෂයක් ද යන්න තීරණය කිරීම පුස්තකාලයාධිපති විසින් සිදුකළ යුතුය.

44. එම දෝෂය යථා තත්ත්වයට පත් කිරීම හෝ අවශ්‍ය පියවර පුස්තකාලයාධිපතිවරයා විසින් ගත යුතුය.

*සාමාන්‍ය*

45. යම් ආසාදනස්පර්ශක හෝ චර්මගත රෝගයකින් පෙළෙන හෝ මෑතකදී පෙළුණු නැතහොත් ඒ රෝගයකින් පෙළෙන තැනැත්තෙකුට මැත දී උපස්ථානයේ යෙදුණු කිසිම තැනැත්තෙකු රෝග බෝවීමේ කාලය හා බීජ පෝෂණ කාලසීමාව ඉකුත්වන තෙක් මහජන පුස්තකාලයට ඇතුළු නොවිය යුතුය.

46. කිසියම් තැනැත්තෙකු -

(i) මහජන පුස්තකාල පරිශ්‍රය තුළ හෝ අවට නොහික්මුණු ආකාරයෙන් හැසිරීම හෝ එවැනි හැසිරීමක් ඇති කිරීමක් නොකළ යුතුය.
(ii) මහජන පුස්තකාලයේ හෝ ඒ අවට ප්‍රාදේශීය සභාවේ යම් ගොඩනැගිල්ලක කොටසකට හෝ යම් දේපළකට අලාභ කිරීම හෝ විරූප කිරීම නොකළ යුතුය.
(iii) මහජන පුස්තකාලය වැසූ පසු පුස්තකාල පරිශ්‍රය තුළ රැඳී සිටීම හෝ නිකරුණේ ගැවසීම නොකළ යුතුය.
(iv) මහජන පුස්තකාල පරිශ්‍රය තුළ දුම්බීම හෝ කෙළ ගැසීම නොකළ යුතුය.
(v) ඝෝෂා කිරීම හෝ ගී ගැයීම හෝ වෙනත් ශබ්ද නැඟීම නොකළ යුතුය.
(vi) අපිරිසිදු තත්ත්වයකින් මහජන පුස්තකාල පරිශ්‍රයට ඇතුළු නොවිය යුතුය.
(vii) මහජන පුස්තකාල පරිශ්‍රය තුළ ජංගම දුරකථන භාවිතය සපුරා තහනම්ය.

47. පුස්තකාලාධිපතිවරයාට හෝ පුස්තකාලාධිපතිවරයාගේ නියමය යටතේ ක්‍රියාකරන වෙනත් යම් තැනැත්තකුට මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ඔහුගේ බලතල නිත්‍යානුකූලව ක්‍රියා කිරීමෙහිලා බාධා නොකළ යුතු ය.

48. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ විධිවිධානයක් උල්ලංඝනය කිරීම වරදක් වන අතර, ඒ සඳහා නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකරු කරුනු ලැබුවේ නම් රු. 750කට නොඅඩු දඩයකට වරද කරන තැනැත්තා යටත් විය යුතුය. එම වරද දිගින් දිගටම සිදුකරන්නේ නම් දිනකට රු. 250 ක් බැගින් වූ අතිරේක දඩයක් ගෙවීමට බැඳී සිටිය යුතු ය.

*07 වන කොටස*

*මාර්ගවල ගමන් කරන වාහනවල බර සහ වේගය සීමා කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව*

01. ප්‍රාදේශීය සභාව සතු මාර්ගයන්හි රථ වාහනවල බර සහ වේගය සීමා කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවයි.

02. ප්‍රාදේශීය සභාව සතු මාර්ගයන්හි නියම කරනු ලබන උපරිම බරකින් සහ වේගයකින් යුත් රථ වාහන ධාවනය කිරීම, පාලනය කිරීම සහ එකී මාර්ගවලට සිදුවන අලාභහානි හා මාර්ග භාවිතය සඳහා ගාස්තු නියම කිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

03. ප්‍රාදේශීය සභාව සතු මාර්ගයක මෙහි තුන්වන උපලේඛනයේ සඳහන් බර ප්‍රමාණයට වැඩියෙන් යුත් වාහන ධාවනය සඳහා අවශ්‍ය කරන සෑම තැනැත්තෙක් විසින්ම අවම වශයෙන් එකී ගමනාගමනය කිරීමට අදහස් කරන දිනට වැඩකරන දින 03 කට පෙර මෙහි පළමු උපලේඛනයේ සඳහන් ආකෘතියට සාරානුකූලව පිළියෙළ කරගත් අයදුම්පත්‍රයක් ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතු ය.

04. මෙහි දෙවන උපලේඛනයේ සඳහන් ආකෘතිය අනුව විධිමත් අවසර පත්‍රයක් ලබාගෙන ඇත්තේනම් මිස කිසිදු පුද්ගලයෙකු එම සීමාව ඉක්මවා යන පරිදි එකී මාර්ගවල රථ වාහන ධාවනය නොකළ යුතු ය.

05. අවසර පත්‍රය ලබා ගැනීමට ඉල්ලුම්කරන තැනැත්තා විසින් පහත දැක්වෙන කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස සභාපතිවරයා විසින් හෝ බලය පවරන ලද නිලධාරියා විසින් කවර හෝ තැනැත්තෙකුට ගමනාගමනය සඳහා අවසර පත්‍ර නිකුත් නොකළ යුතු ය.

(i) මාර්ගවල පනවා ඇති බර සීමා යටතේ ගමනාගමනය සිදුකළ හැකි විය යුතු ය.
(ii) මාර්ගවලට හානි ගෙන නොදෙන වාහනයක් විය යුතු ය.
(iii) සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන මාර්ග ආරක්ෂිත ඇප තැන්පත් මුදල සභාවේ තැන්පත් කර තිබිය යුතු ය.

06. අවසර පත්‍රය වාර්ෂිකව, මාසිකව, සති හා දින වශයෙන් නිකුත් කරන අතර, එම අවසර පත්‍ර සඳහා ගාස්තු, අවසරපත්‍ර ලාභීන් විසින් සභාවට ගෙවිය යුතු අතර, අවසර පත්‍ර ගාස්තුව ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කරන ලදුව, වාර්ෂිකව *රජයේ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත්කර තිබිය යුතු ය.

07. එම අවසර පත්‍රයේ සඳහන් දිනය හා කාලය තුල පමණක් ගමනාගමනයේ යෙදිය යුතු අතර, එකී බලපත්‍රයේ සඳහන් ද්‍රව්‍ය පමණක් ප්‍රවාහනය කළ යුතු ය.

08. ඉහත 06 වන වගන්තියේ සඳහන් අවසරපත්‍ර ගාස්තුවට අමතරව ගමනාගමනයේදී මාර්ගවලට සිදුවිය හැකි අලාභහානි පියවීම උදෙසා සභාව විසින් කලින් කල තීරණය කරනු ලදුව වාර්ෂිකව *රජයේ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත්කර ඇති පරිදි ආරක්ෂිත ඇප මුදලක් සභාවට ගෙවිය යුතු ය.

09. අවසර පත්‍රයේ කාලය අවසන් වූ පසු අවසරපත්‍රලාභියා විසින් මාර්ග ආරක්ෂිත ඇප මුදල් ලබා ගැනීම සඳහා ඉල්ලුම් කළ යුතු අතර, මාර්ගයේ හානි සිදු නොවීම තහවුරු කර ගැනීමෙන් පසු මාර්ග ආරක්ෂිත ඇප මුදල නිදහස් කරනු ලබයි.

10. මාර්ගයට හානි සිදු වූ බව තහවුරු වුවහොත් ඇප මුදල සභාව සතුවන අතර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 70 වගන්තිය ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.

11. සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියකු විසින් හෝ සභාපතිවරයා විසින් පිළිගනු ලබන යම් සංවිධානයක් විසින් අවසර පත්‍රය පරීක්ෂා කිරීම නීත්‍යානුකූල විය යුතුවාත් හැර කවර හෝ අවසරපත්‍රලාභියකු විසින් එකී පරීක්ෂාව හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

12. මාර්ගවල පනවා ඇති වේග සීමාව ඉක්මවා ධාවනයේ නොයෙදිය යුතු ය.

13. විධිමත් අවසරපත් රහිතව මාර්ග ආරම්භවන ස්ථානවල ප්‍රදර්ශනයකර ඇති ගමන් කළ හැකි වාහන බර සීමාව ඉක්මවා මාර්ගයන් හි වාහන ධාවනයේ නොයෙදිය යුතු ය.

14. පහත සඳහන් වාහන මෙම අතුරු ව්‍යවස්ථාව මගින් පනවා ඇති සීමාවන්ගෙන් නිදහස් කරනු ලැබේ.

(i) අත්‍යාවශ්‍ය සේවා සඳහා ගමන් ගන්නා වාහන ;
(ii) ස්වාභාවික ආපදා අවස්ථාවන්හිදී ගමන් ගන්නා වාහන.

15. මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් කවර හෝ විධිවිධානයක් උල්ලංඝනය කිරීම වරදක් වන අතර, එම තැනැත්තාට නිසි බලය ඇති අධිකරණයක් ඉදිරියේ වරදකට වරදිකරු කරනු ලැබුවිට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) වගන්තියේ සඳහන් සීමාවන්ට අනුකූල වන දඩයකට යටත් විය යුතු ය.

16. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

(i) "මාර්ගය" යන්නෙන් ප්‍රාදේශීය සභාව සතු කිසියම් මාවතක්, මාර්ගයක්, මහා මාර්ගයක්, පටු මාවතක්, වීදියක්, පාලමක් ද ප්‍රාදේශීය සභාව සතු කිසියම් මංමාවතකට, මාර්ගයකට, මාහා මාර්ගයකට, පටු මගකට, වීදියකට, පඩිපෙලකට සම්බන්ධ පාලමක් කවර හෝ ආකාරයක බෝක්කුවක්, දිය පැන්නුමක්ද අදහස්වන අතර,

(ii) "වාහනය" යන්නෙන් රථ වාහන ආඥාපනතේ ඊට දී ඇති අර්ථකථනය අදහස් විය යුතු අතර, කරත්තයක්, පාපැදියක් හෝ රෝද සවිකරන ලද යාන්ත්‍රිකව හෝ වෙනත් අයුරකින් ක්‍රියාත්මක කරන උපකරණයක් ද අදහස් වේ.

පළමුවන උපලේඛනය

**03 වන වගන්තිය**

ප්‍රාදේශීය සභා මාර්ගවල ගමනාගමනය සඳහා අයදුම් පත්‍රය

01. අයදුම්කරුගේ නම :..........................................................................................................................

02. ලිපිනය :.........................................................................................................................
03. ජාතික හැඳුනුම්පත් අංකය :..........................................................................................................
04. දුරකථන අංකය :.....................................................................................................................
05. වාහන අංකය :.....................................................................................................................
06. වාහනයේ බර :.....................................................................................................................
07. ප්‍රවාහනය කරනු ලබන ද්‍රව්‍ය :..............................................................................................
08. ද්‍රව්‍ය පැටවූ පසු සම්පූර්ණ බර :..........................................................................................
09. ගමන් කරන මාර්ගය පිළිබඳ විස්තර :......................................................................................

රූප සටහන් මගින්

| |
|---|
| |

10. අයදුම්කරන අවසර පත්‍රය වලංගුවිය යුතු කාලසීමාව :
ආරම්භක දිනය :.......................................................................................
අවසාන දිනය :.......................................................................................

11. ප්‍රාදේශීය සභා මාර්ගවල ගමනාගමනය පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල නියමයන් සියල්ලම පිළිපදින බවටත්, අවසර පත්‍රය මගින් ලැබී ඇති අවසරය පරිදි ක්‍රියා කරන බවටත් මෙයින් පොරොන්දු වෙමි.

.................................................... ....................................................
දිනය අයදුම්කරුගේ අත්සන.

දෙවැනි උපලේඛනය

**04 වන වගන්තිය**

නියමිත බර සීමාව ඉක්මවා වාහන ධාවනය කිරීමේ අවසර පත්‍රය

01. සභාවේ නම :...........................................................................................................

02. බලපත්‍රධාරියාගේ නම :...........................................................................................................

03. බලපත්‍රධාරියාගේ ලිපිනය :...........................................................................................................

04. වාහනයේ අංකය :...........................................................................................................

05. ප්‍රවාහනය කරනු ලබන ද්‍රව්‍ය :...........................................................................................................

06. උපරිම මුළු බර ප්‍රමාණය :...........................................................................................................

07. අවසරපත්‍රය වලංගු කාලසීමාව.

| දිනයන් | ආරම්භක වේලාව | අවසන් වේලාව |
|---|---|---|
| 1. ............................................. | ............................................. | ............................................. |
| 2. ............................................. | ............................................. | ............................................. |
| 3. ............................................. | ............................................. | ............................................. |
| 4. ............................................. | ............................................. | ............................................. |
| 5. :............................................. | ............................................. | ............................................. |

අවසරපත්‍රය වලංගු මාර්ගයන්

1. ...........................................................................................................
2. ...........................................................................................................
3. ...........................................................................................................
4. ...........................................................................................................
5. ...........................................................................................................

...................................................... ......................................................

දිනය සභාපති

........................... ප්‍රාදේශීය සභාව

(නිල මුද්‍රාව)

සභාව

තුන්වැනි උපලේඛනය

............................. ප්‍රාදේශීය සභාව

| | *මාර්ගයේ නම* | *දුර ප්‍රමාණය* | *උපරිම බර සීමාව* | *උපරිම වේග සීමාව* |
|---|---|---|---|---|
| 1 | | | | |
| 2 | | | | |
| 3 | | | | |
| 4 | | | | |
| 5 | | | | |
| 6 | | | | |
| 7 | | | | |
| 8 | | | | |
| 9 | | | | |
| 10 | | | | |

*08 වැනි උප කොටස*

*පාරවල් හා මංමාවත්වල බාධක, අවහිර කිරීම් හා අලාභහානි කිරීම් වැලැක්වීම*

01. ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගවලට අලාභහානි කිරීම හා මාර්ගවල ගමනාගමනයට බාධා කිරීම හා මාර්ග අවහිර කිරීම වැලැක්වීම, නැති කිරීම හා අධීක්ෂණය කිරීම පිළිබඳව වූ අතුරු ව්‍යවස්ථාවයි.

02. කවර හෝ තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභාව සතු යම් මාර්ගයකට හානි පැමිණවීම නොකළ යුතු අතර, මාර්ගයේ ගමන් ගන්නා වාහනවලට හෝ පදිකයන්ට බාධාවන අයුරින් මාර්ගයේ -

(අ) වෙළඳාම් කිරීම ;

(ආ) ඉවත්කරගෙන යාම සඳහා පනගැන්වීමට හෝ වෙනත් ආපදාවක් හේතුවෙන් බැහැරට පදවාගෙනයාමට නොහැකිවන කිසියම් හේතුවක් වන්නේනම් මිස ප්‍රාදේශීය සභාව විසින් වාහන නතර කිරීමට ඉඩදීමට තීරණය කරනු ලැබූ කිසියම් කොටසක් නොවන ස්ථානයක වාහන නතර කර තැබීම ;

(ඇ) වාහන අළුත් වැඩියා කිරීම හෝ වාහන සේදීම ;

(ඈ) කිසියම් මාර්ගයක කෙරෙන යම් අළුත්වැඩියාවක් සඳහා ප්‍රාදේශීය සභාවේ හෝ සභාපතිවරයාගේ තීරණයක් මත කෙරෙන කාර්යයකදී හැර ගල්, වැලි, බොරළු, පස්, ගඩොල් හෝ ලී කොට බෑම හෝ රඳවා තැබීම ;

(ඉ) ගර්භිත වාහන කොටස් හෝ කිසියම් ද්‍රව්‍ය හෝ භාණ්ඩ හෝ උපකරණ රඳවා තැබීම නොකළ යුතුය.

03. නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ 19 වැනි වගන්තියේ විධිවිධාන යටතේ පළලින් අඩි පනහකට (මීටර් 16.7කට) වැඩියෙන් වන මාර්ගයක් සඳහා වීථිරේඛා නියම කරනු නොලැබූ යම් මාර්ගයක මධ්‍ය රේඛාවේ සිට අඩි විසිපහක් (මීටර් 3.18ක්) ඇතුලත කවර හෝ ආකාරයක ඉදිකිරීමක් කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු අතර, වෙනත් යම් ඉදිකිරීමක් සඳහා ගෙන එන ලද කවර හෝ ඉදිකිරීම් ද්‍රව්‍යයක් කිසියම් මාර්ගයක හෝ එහි යම් කොටසක තැබීම නොකල යුතුය.

04. 02 වැනි වගන්තියේ සඳහන් නියමයන් උල්ලංඝණය කරමින් කවර හෝ තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභාව සතු යම් මාර්ගයක හෝ එහි කොටසක කිසියම් ද්‍රව්‍යයක් තබනු ලැබ ඇති යම් අවස්ථාවක සභාපතිවරයා විසින් හෝ බලයලත් නිලධාරියකු විසින් එකී ද්‍රව්‍ය එකී ස්ථානයෙන් ඉවත් කිරීමට හෝ ප්‍රාදේශීය සභාවේ සන්තකයට ගැනීමට ක්‍රියා කිරීම හෝ නීත්‍යානුකූල වන්නේය. සභාපතිවරයා විසින් හෝ බලයලත් නිලධාරියකු විසින් හෝ ඉහත ආකාරයෙන් ක්‍රියාකිරීම හේතුවෙන් එකී ද්‍රව්‍ය මාර්ගයේ තබන ලද හෝ තැබීමට සලස්වනු ලැබූ තැනැත්තාට සිදුවන යම් පාඩුවක් හෝ අලාභයක් හෝ හානියක් සම්බන්ධයෙන් එකී ද්‍රව්‍ය ඉවත් කිරීමට ක්‍රියාකළ තැනැත්තා හෝ ප්‍රාදේශීය සභාව වගකීමට යටත් නොවනු ඇත. එසේම තව දුරටත් එසේ ඉවත්කළ යුතු ද්‍රව්‍ය වෙනුවෙන් කවර හෝ ප්‍රමාණයක වන්දියක් ගෙවීමට ප්‍රාදේශීය සභාව හෝ සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා යටත් නොවනු ඇත.

05. ප්‍රාදේශීය සභාව සතු කිසියම් මාර්ගයක් නඩත්තු කිරීම හෝ අලුත් වැඩියා කිරීම සඳහා අවශ්‍ය කරන කාර්යයක් සඳහා -

(අ) එකී මාර්ගය සම්පූර්ණයෙන් හෝ මාර්ගයෙන් කොටසක් නඩත්තු කිරීම හෝ මාර්ගයේ කිසියම් දිශාවකට ධාවනය වන යම් මංතීරුවක් කිසියම් කාලයකට වාහන ගමනාගමනයට වසා තැබීමට ;

(ආ) කිසියම් ඉදිකිරීම් ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍ය එකී මාර්ගයේ කිසියම් කොටසක ගොඩගැසීමට ;

(ඇ) එකී මාර්ගයට යාබද ඉඩමකට ඇතුළුවීමට හා ඉදිකිරීම් ද්‍රව්‍ය කිසිවක් එකී ඉඩමේ තැම්පත් කිරීමට ;

(ඈ) එකී මාර්ගයට යාබද ඉඩමේ යම් දේපලකට හානියක් නොවන ආකාරයෙන් එකී ඉඩමෙන් වාහන ධාවනය සඳහා ඉඩ සැලැස්වීමට ;

නියෝග කිරීම සඳහා සභාපතිවරයාට බලය තිබිය යුතුය.

06. 05 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ සභාපතිවරයා විසින් කරනු ලැබූ යම් නියෝගයකට පටහැනි ආකාරයෙන් ක්‍රියා කිරීම හෝ එකී යම් නියෝගයකට අනුව ක්‍රියාකරන කිසියම් තැනැත්තෙකුට බාධා කිරීම හෝ එසේ කිරීමට සැලැස්වීමට කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

07. සභාපතිවරයා විසින් නිකුත්කරනු ලැබූ ලිඛිත අවසරයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභාව සතු කිසියම් මාර්ගයක රැඳී තිබෙන ගල්, බොරළු, වැලි, පස්, හෝ වෙනත් කිසියම් ද්‍රව්‍යයක් එකතු කිරීම හෝ ගොඩ ගැසීම හෝ ඉවතට ගෙනයාම නොකළ යුතුය.

08. කිසියම් ඉඩමකට හෝ ඉඩමක පිහිටා ඇති ගොඩනැගිල්ලක වහලයට පතිත වන වර්ෂා ජලය හැර වෙනත් කිසියම් ආකාරයකින් එකී ඉඩමේ හෝ ඉඩමේ පිහිටා ඇති ගොඩනැගිල්ලේ පවතින ජලය හෝ පාවිච්චියෙන් පසු බැහැර කෙරෙන අප ජලය, උරා ගන්නා වලකට ගලා යාමට සැලැස්විය යුතු අතර, ප්‍රාදේශීය සභාව සතු මාර්ගයකට හෝ මාර්ගයක් ඔස්සේ ඇති කාණුවකට බැහැර කිරීම නොකළ යුතුය.

09. ප්‍රවාහනය කරනු ලබන ද්‍රව්‍යයන් හෝ දූවිලි හෝ වැලි හෝ කුඩා කැබලි වශයෙන් විසිරීම වලක්වන ආවරණයකින් ආවරණය කර ඇත්තේනම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් එවැනි ද්‍රව්‍යයක් ප්‍රාදේශීය සභාව සතු මාර්ගයක කිසියම් වාහනයකින් ප්‍රවාහනය කිරීම නොකළ යුතුය.

10. කිසියම් මාර්ගයක් ඔස්සේ ඇති කාණුවක් ගොඩ කිරීම හෝ ඊට හානි කිරීම හෝ එකී කිසියම් කාණුවක් දිගේ ගලා යන ජලය පහසුවෙන් ගලා යාමට බාධා කිරීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතුවාත් හැර එකී කාණුවක් හරහා කිසියම් ඉඩමකට ඇතුල් වීමට අවශ්‍ය වන්නේ නම් දිගින් මීටර් 01 ට නොඅඩු වන පාළමක්, වේදිකාවක් හෝ ආරක්කුවක් තැනීම එකී ඉඩමේ අයිතිකරුගේ හෝ පදිංචිකරුගේ කාර්යය විය යුතුය.

11. කොන්ක්‍රීට් කරන ලද හෝ කුට්ටිගල් අතුරන ලද මාර්ගවල ටොන් පහකට වඩා වැඩි බරකින් යුත් වාහන ගමනාගමනය නොකළ යුතුය.

12. විකිණීම සඳහා ටොන් පහකට වැඩි බරකින් යුත් දැව ප්‍රමාණයන් ප්‍රවාහනය කිරීමේදී ප්‍රාදේශීය සභා මාර්ග භාවිතා කරන්නේ නම් එකී මාර්ගවලට අලාභ හානි සිදු වීම උදෙසා කළින් කල සභාව විසින් නියම කර වාර්ෂිකව රජයේ *ගැසට්පත්‍රය* මගින් ප්‍රකාශ කරනු ලබන ගාස්තුවක් ගෙවා විධිමත් අවසර පත්‍රයක් ලබාගත යුතුය.

13. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ විධිවිධානයක් උල්ලංඝණය කිරීම වරදක් වන අතර නිසි බලය ඇති අධිකරණයක් මගින් වරදකරු කරනු ලැබීමෙන් අනතුරුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) වගන්තියේ සඳහන් දණ්ඩනයට යටත් වන්නේය.

14. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේනම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවල,

(i) "මාර්ගය" යන්නෙන් ප්‍රාදේශීය සභාව සතු කිසියම් මංමාවතක්, මාර්ගයක්, මහා මාර්ගයක්, පටු මාවතක්, වීථියක්, දෙවැටක් පඩිපෙලක්, ඒ දණ්ඩක් හෝ මඟී පාලමක් අදහස් වන අතර ප්‍රාදේශීය සභාව සතු කිසියම් මංමාවතකට මාර්ගයකට මහා මාර්ගයකට, පටු මගකට, වීථියකට, දෙවැටකට, පඩිපෙලකට සම්බන්ධව සවිකර හෝ සිටුවා ඇති කිසියම් දුර පෙන්වන සළකුණක් මායිම්ගලක්, මායිම් කණුවක්, පහන් කණුවක්, පාලමක් කවර හෝ ආකාරයක බෝක්කුවක් දිය පැන්නුමක් තාප්පයක්, ආරුක්කුවක්, වේල්ලක්, කාණුවක්, සොරොව්වක්, ආධාරක බැම්මක්, අත්වැලක්, දම්වැලක්, වැටක්, සංඥා පුවරුවක්, මාර්ග නාමපුවරුවක් හෝ මාර්ගයට යාබද පදික වේදිකාවක් ද ඊට ඇතුලත් විය යුතුය.

(ii) "වාහනය" යන්නෙන් රථ වාහන ආඥාපනත යටතේ ඊට දී ඇති අර්ථ නිරූපනය අදහස් විය යුතු අතර කරත්තයක්, පාපැදියක් හෝ රෝද සවිකරන ලද යාන්ත්‍රිකව හෝ වෙනත් අයුරකින් ක්‍රියාත්මක කරන උපකරණයක් ද අදහස් වේ.

(iii) "හානි පැමිණවීම" යන්නෙන් විනාශ කිරීම, ගලවා දැමීම, විකෘති කිරීම, පෙරලාදැමීම, බැහැර කිරීම, වෙනත් කවර හෝ ආකාරයකින් හානි පැමිණවීම කිසියම් කොටසක් මත පෝස්ටරයක් හෝ අත් පත්‍රිකාවක් ඇලවීම, හෝ තීන්ත හෝ වෙනත් යම් ලාටු වර්ගයක් හෝ තාර ගෑම අදහස්වන අතර කිසියම් නාම පුවරුවක අකුරු වෙනස් කිරීම මකා දැමීම සූරාදැමීම, හෝ ගලවා දැමීම ඊට ඇතුලත් විය යුතු අතර ප්‍රාදේශීය සභාව විසින් හෝ සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයාගේ බලයලත් යම් නිලධාරියකු විසින් කිසියම් මාර්ගයක් අලුත් වැඩියාවක් සඳහා කරවනු ලබන යම් කාර්යයක් ඊට ඇතුලත් නොවිය යුතුය.

### *09 වැනි කොටස*

#### පාරවල් හා මංමාවත් සහ යාබද ස්ථාන සැරසිලි කිරීම

01. ප්‍රාදේශීය සභා සීමාව තුළ ඇති පාරවල් සහ මංමාවත් සහ යාබද ස්ථාන සැරසිලි කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

02. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පාරවල්, මංමාවත් සහ යාබද ස්ථාන සැරසිලි කිරීම එමගින් මහජනයාට සිදු වන අවහිරතා සහ පරිසරයට සිදුවන හානි වැලැක්වීම සහ ඒවා පාලනය කිරීම හා ඒ පිළිබඳව අවසරපත්‍ර නිකුත් කිරීම හා ගාස්තු අයකිරීම පිළිබඳව විධිවිධාන යෙදීමට පනවනු ලැබේ.

03. මෙහි මින්මතු කවර හෝ මංමාවතකට යාබද යම් පොදු පරිශ්‍රයක්, මංමාවතක් හෝ පාරක් සඳහා උපලේඛන අංක දෙකෙහි දක්වා ඇති ආකෘතිය ප්‍රකාරව අවසරපත්‍රයක් ලබාගෙන ඇතොත් මිස එම පොදු ස්ථානය, මංමාවත හෝ පාර කිසියම් ආකාරයකින් සැරසිලි කිරීම නොකළ යුතුය.

04. 03 වැනි වගන්තියේ සඳහන් ප්‍රකාරව අවසරපත්‍රයක් ලබාගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම අයදුම්පතක්ම මෙහි පළවන උපලේඛනයෙහි දක්වා ඇති ආකෘතියට සාරානුකූලව සකස් කර ඉදිරිපත් කළ යුතුය.

05. ඉදිරිපත් කරන සෑම ඉල්ලුම්පත්‍රයක්ම සැරසිලි කිරීමට අදහස් කරන දිනයට යටත් පිරිසෙන් දින හතකට කලින් සභාපති හෝ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ වුව ද මෙම අතුරු ව්‍යවස්ථාවේ නිශ්චය කොට ඇති කාල සීමාව ඇතුලත ඉදිරිපත් කරනු නොලැබූ එවැනි ඉල්ලුම්පත්‍රයක් විශේෂ අවස්ථානුගත කරුණු යටතේ සලකා බලා සභාපති හෝ ලේකම් විසින් භාරගෙන ඒ සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ය.

06. ඉහත තුන්වැනි වගන්තියෙහි සඳහන් පළමුවැනි උපලේඛනයෙහි ඇතුලත් ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් සියලුම විස්තර ද ඊට අමතරව ඉල්ලුම්පත්‍රය සම්බන්ධයෙන් තීරණය කිරීම සඳහා සභාපති හෝ ලේකම් විසින් ඉල්ලා සිටිනු ලබන වෙනත් යම් තොරතුරු ද ඇතිනම් ඒ සියලු විස්තර ද සෑම ඉල්ලුම්කරුවකු විසින් ම සැපයිය යුතුය.

07. සභාව විසින් ඉදිරිපත් කරන සෑම අවසර පත්‍රයක්ම,

(අ) මෙහි දෙවන උපලේනයේ ආකෘතියේ ප්‍රකාර විය යුතු ය.
(ආ) යම් අත්හිටුවීමකට හෝ අවලංගු කිරීමකට යටත්ව නිකුත්කරනු ලබන කාර්යය හා කාලය සඳහා පමණක් වලංගු විය යුතු ය.

08. සභාපතිවරයා පහත සඳහන් කරුණු ගැන එනම්,

(අ) නිකුත් කරනු ලබන අවසරපත්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් යම් විධිවිධානයන් කඩ කිරීම සඳහා යොදාගනු නොලබන බවට,
(ආ) අවසරපත්‍රයක් මගින් බලය ලැබෙන ක්‍රියා නිසා මහජනතාවට හෝ පරිසරයට හෝ පොදු දේපළවලට අලාභ හෝ හානි හෝ යම් උපද්‍රවයක් හෝ සිදු නොවන බවට හා,
(ඇ) පරිසරය ආරක්ෂා කිරීම සඳහා ඉල්ලුම්කරු විසින් ප්‍රමාණවත් පියවරගෙන ඇති බවට සෑහීමකට පත්වුවහොත් පමණක් අදාල අවසරපත්‍රය නිකුත්කළ යුතු ය.

09. අවසරපත්‍රය නිකුත් කිරීම සඳහා ගාස්තු වශයෙන් සභාව විසින් කලින් කළ යෝජනා සම්මුතියක් මගින් සම්මත කර ගනු ලබන ගාස්තු ප්‍රමාණයන් නියම කළ හැකි අතර, එකී ගාස්තු වාර්ෂිකව රජයේ ගැසට්පත්‍රය මගින් සභාව විසින් ප්‍රකාශයට පත් කළ යුතුය. අවසරපත්‍රය නිකුත් කිරීමට පෙර එකී ගාස්තු අයදුම්කරු විසින් සභාවට ගෙවිය යුතු ය.

10. අතුරු ව්‍යවස්ථාවේ අංක 09 සඳහන් වගන්තියේ සඳහන් ගාස්තු ප්‍රමාණයට අමතරව අවසරපත්‍රයට අදාලව කරනු ලැබූ සැරසිලි බලපත්‍රලාභියා විසින් නියමිත කාලය තුළ ඉවත් කරනු නොලැබුවහොත් එම සැරසිලි ඉවත් කිරීමට වැය වෙතැයි සැලකෙන මුදලට සමාන මුදලක් බලපත්‍රය නිකුත් කිරීමට පෙර තැන්පතුවක් වශයෙන් බලපත්‍රලාභියා විසින් සභාවට ගෙවිය යුතු ය. අවසර පත්‍රලාභියා කරනු ලැබූ සැරසිලි නියමිත කාලය තුළ ඉවත් කරනු නොලැබුවහොත් අදාල තැන්පත් මුදල සභා අරමුදලට බැරකරනු ලැබිය යුතු අතර, අදාල සැරසිලි සභාව විසින් ඉවත් කිරීම ද නිත්‍යානුකූල වන්නේ ය.

11. අතුරු ව්‍යවස්ථාවේ අංක 10 වගන්තියේ සඳහන් වන්නාවූ තැන්පතු මුදල කොපමණ ද යන්න වාර්ෂිකව රජයේ ගැසට්පත්‍රය මගින් සභාපති විසින් ප්‍රකාශයට පත්කළ යුතු ය.

12. අවසරපත්‍රලාභියා විසින් කරනු ලබන සියලුම සැරසිලි මංමාවත්වල ගමන් කරනු ලබන යම් පුද්ගලයෙකුට, පුද්ගල කණ්ඩායමකට හෝ දේපළකට අවහිර වන හෝ හානිවන ආකාරයට නොකළ යුතු අතර, එමගින් යම් හානියක් සිදුවුවහොත් එම හානිය නිසා සිදුවන අලාභය අවසරපත්‍රලාභියා විසින් දැරිය යුතු ය.

13. අවසරපත්‍රලාභියා විසින් කරනු ලබන සියලුම සැරසිලි මංමාවත්වල ගමන් කරනු ලබන යම් පුද්ගලයෙකුට, පුද්ගල කණ්ඩායමකට හෝ ධාවනය කරනු ලබන කවර හෝ වාහනයකට ගමනාගමනයට බාධාවන පරිදි නොකළ යුතු ය.

14. කරනු ලබන සැරසිලි කිසියම් පුද්ගලයෙකුට, පුද්ගල කණ්ඩායමකට අපහාසවන අයුරින් නොවිය යුතු ය.

15. සැරසිලි කිරීමේ දී ඉවතලන සියලුම ද්‍රව්‍ය පරිසරයට හානි නොවන ආකාරයට බැහැරකරලීම අවසරපත්‍රලාභියා විසින් කළ යුතුය.

16. මෙම අතුරු ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීම පිළිබඳව ඒ උල්ලංඝණය ස්ථාපිතවන යම් එක් ක්‍රියාවක් හෝ නොකර හැරීම සඳහා රු.750කට නොවැඩි දඩයකින් සහ එම උල්ලංඝණය නොකඩවා තව දුරටත් කරගෙන යන විට නිසි බලය ඇති අධිකරණයක් විසින් ඒ පිළිබඳ වරද කරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝණය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව උල්ලංඝණය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනක් සඳහාම රු. 250 කට නොවැඩි අතිරේක දඩයකට යටත් විය යුතු ය.

17. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල,

I. "පාරවල් හෝ මංමාවත්" යනුවෙන් 193 වැනි අධිකාරිය වන මංමාවත් ආඥාපනතේ පිළිවලින් ඒවාට දී ඇති අර්ථය ද,
II. "පොදු දේපල" යනුවෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල සියලුම පාරවල් හා මංමාවත් දෙපස පිහිටියා වූ දුරකථන හා විදුලිකණු ද, මහජනයා පොදුවේ භාවිතා කරන සියලුම ස්ථාන හා දේපළ ද,
III. "සැරසිල්ලක්" යන්නෙන් ස්වාභාවික, කෘතිම හෝ ඕනෑම ද්‍රව්‍යකින් හෝ ආලෝක සංඥා මගින් කරනු ලබන කිනම් හෝ ආකාරයක සැරසිල්ලක් ද අදහස් වේ.

අංක 01 උපලේඛනය

**පාරවල් හා මංමාවත් සහ යාබද ස්ථාන සැරසිලි කිරීම**
**ඉල්ලුම්පත්‍රය**

01. ඉල්ලුම්කරුගේ නම :.......................................................................................................................

02. ලිපිනය :........................................................................................................................

03. ජාතික හැඳුනුම්පත් අංකය :........................................................................................................................

04. දුරකථන අංකය :........................................................................................................................
05. සැරසිලි කරනු ලබන උත්සවයේ/කාරණයේ ස්වභාවය :...........................................................................
.......................................................................................................................................................
.......................................................................................................................................................
06. සැරසිලි කිරීමට උපයෝගී කරගන්නා ද්‍රව්‍ය පිළිබඳ විස්තර :....................................................................
.......................................................................................................................................................
.......................................................................................................................................................
07. සැරසිලි කරනු ලබන ස්ථානය පිළිබඳ විස්තර :
(අ) පාරක් නම් පාරේ නම හා සැරසිලි සිදුකරනු ලබන ප්‍රමාණයේ දිග/බිම් මට්ටමේ සිට උස
:......................................................................................................................................................
(ආ) පොදු ස්ථානයක්/දේපළක් නම් ඒ පිළිබඳ විස්තර )
.......................................................................................................................................................
08. සැරසිලි කිරීම ආරම්භ කරන හා අවසන් කරන දිනය :.............................................................................
(අ) සැරසිලි ප්‍රදර්ශනය කිරීම කරනු ලබන කාලය : ......................................................................................
09. සැරසිලි ගලවා ඉවත් කරනු ලබන දිනය :.............................................................................................
10. ඉවතලන දෑ බැහැරලන ආකාරය පිළිබඳ විස්තර :....................................................................................
.......................................................................................................................................................
ප්‍රාදේශීය සභාව විසින් කරනු ලබන නියමයන්ට එකඟ වන බවට සහතික වෙමි.

* සැරසිලි කරනු ලබන ආකාරය පිළිබඳ සැලැස්මක් සමග අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

| | |
|---|---|
| ..................................................... | ..................................................... |
| දිනය | ඉල්ලුම්කරුගේ අත්සන. |

උපලේඛනය - අංක 02

*පාරවල් හා මංමාවත් සහ යාබද ස්ථාන සැරසිලි කිරීම*

*අවසරපත්‍රය*

01. අවසරපත්‍රලාභියාගේ නම :........................................................................................................
02. ලිපිනය :.....................................................................................................................................
03. සැරසිලි සඳහා බලය ලැබෙන පොදු ස්ථානය හා වීදියේ/වීදිවල/මංමාවත්වල නම් :
:......................................................................................................................................................
.......................................................................................................................................................
04. සැරසිලි කිරීමට උපයෝගී කරගන්නා ද්‍රව්‍ය පිළිබඳ විස්තර :...................................................................
.......................................................................................................................................................
05. සැරසිලි සිදුකිරීම සඳහා අවසර ලබා දෙනු ලබන කාලය :.........................................................................
.......................................................................................................................................................
06. (අ) සැරසිලි ආරම්භ කරන දිනය හා වේලාව :.......................................................................................
(ආ) සැරසිලි ඉවත් කළයුතු දිනය හා වේලාව :........................................................................................
07. මෙම අවසරපත්‍රය නිකුත් කරනු ලබන්නේ මතු දැක්වෙන කොන්දේසිවලට යටත්වය.
(අ) අවසරපත්‍රයේ සඳහන් කාල සීමාවේදී පමණක් සැරසිලි කිරීම කළ යුතුය ;
(ආ) කරනු ලබන සියළුම සැරසිලි කිසිඳු පොදු දේපලකට හෝ පෞද්ගලික දේපලකට හානි හෝ අවහිර නොවන අන්දමින් සිදුකළ යුතුය ;
(ඇ) කරනු ලබන සියළුම සැරසිලි, සැරසිලි කරනු ලබන මාර්ගයේ හෝ වීදියේ ගමන් කරන කිසිම වාහනයකට හෝ පුද්ගලයෙකුට හෝ බාධා නොවන අයුරින් තිබිය යුතුය ;

(ඈ) බලපත්‍රය පරීක්ෂා කිරීම සඳහා සභාපති හෝ බලය ලත් නිලධාරියෙකු හෝ පොලිස් නිලධාරියකු ඉල්ලා සිටිවිට එය ඉදිරිපත් කළ යුතුය.

(අදාල ස්ථානයේ ✓ලකුණ යොදා සලකුණු කරන්න)

* මාවතක තනි පැත්ත
* මාවතක දෙපැත්ත
* මාවතක් හරහා ඉහලින්
  දේපල පරිශ්‍රය තුළ-මාවතට යාබදව

ස්ථානය -

.....................................................
අවසරපත්‍රය නිකුත්කරනු ලබන
නිලධාරියාගේ අත්සන.

පදවිය .....................................................,
නිල මුද්‍රාව,
සභාවේ නම හා ලිපිනය.

.....................................................
දිනය.

10 වැනි කොටස

**දඩාවතේ යන සතුන්**

01. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දඩාවතේ යන සතුන්ගෙන් වන හානි වලක්වා ගැනීම සඳහා එකී සතුන් ගාල්කර තැබීම හා ඊට අනුශාංගික අනිකුත් කරුණු පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාවයි.

02. දඩාවතේ යන සතුන් සම්බන්ධයෙන් මෙම අතුරු ව්‍යවස්ථාව මගින් දක්වා ඇති විධිවිධාන වලට අනුව කටයුතු කිරීම සඳහා දඩාවතේ යන සතුන් අල්ලා ගැනීමෙන් පසු ප්‍රාදේශීය සභාව විසින් සකස් කර ඇති ගාලතුළ තාවකාලිකව ගාල්කර තැබීමට ප්‍රාදේශීය සභාවට බලය ඇත.

03. බලයලත් තැනැත්තකු හෝ රැකවලෙකු හෝ වෙත මෙම අතුරු ව්‍යවස්ථාව මගින් හෝ සභාපතිවරයා හෝ ලේකම්වරයා විසින් පවරන රාජකාරීන් වන අතර, කිසිවෙකු විසිනුත් එකී රාජකාරීන් කිරීමට බාධා කිරීම, අවහිර කිරීම, රාජකාරියෙන් වලක්වාලීම හෝ ඔවුන් බියවැද්දවීම, ඔවුනට තර්ජනය කිරීමද වරදක් වන්නේය.

04. බලයලත් තැනැත්තකු විසින් පොදු ස්ථානයක දඩාවතේ යන සතෙකු අල්ලා ගැනීම, එම සතා තමන් භාරයට ගැනීම සුදුසු යැයි තමන් විසින් තීරණය කරනු ලබන මාර්ගයක් ඔස්සේ ගාල වෙත ගෙන ඒම නීත්‍යානුකුල වන්නේය.

05. බලයලත් තැනැත්තකු අල්ලාගනු ලබන සෑම සතෙකුම හැකිතාක් ඉක්මනින් ගාලට ගෙනවිත් රැකවලාට භාරදිය යුතුය.

06. බලයලත් තැනැත්තා විසින් අල්ලා ගනු ලැබූ සතෙකු ගාලට භාරදෙන විට සතා අල්ලාගත් දිනය, වේලාව, ස්ථානය, සතාගේ වර්ගය, ගැහැණු පිරිමිබව, පාට, හම් අඩයාලම් වෙනත් විශේෂ කරුණු ලේඛනයක ඇතුලත්කර, එම සතුන් ගාලතුළට භාරගත්බවට රැකවලාගේ අත්සන ලබාගෙන එසේ භාරදුන් බවට තමාද අත්සන් කළ යුතුය. මෙම ලේඛනයේ සතුන් පිළිබඳ සටහන් කර ඉක්බිතිව එළඹෙන කාර්යාල වේලාව තුළදී ලේඛනය සභාවේ ලේකම්ගේ අධීක්ෂණයට ඉදිරිපත්කර අත්සන් ලබාගත යුතුය.

07. ගාලතුළට රැකවල්කරු විසින් භාරගන්නා ලද ගවයින් පිළිබඳ ඉහත 6 අතුරු ව්‍යවස්ථාව පරිදි විස්තරයක් ද ලේකම්ගේ නිදහස් කිරීමේ නියෝගය ලැබුණු දිනය හා වේලාවද, නිදහස්කළ වේලාවද ඇතුලත් ලේඛනයක්ද රැකවල්කරු විසින් පවත්වාගෙන යා යුතු අතර, සතා භාරගත් අයගේ අත්සන ලබාගත යුතුය.

08. ලේකම්වරයා නිකුත් කරනු ලබන සතුන් නිදහස් කිරීමේ නියෝගයක් නොමැතිව කිසිම සතෙකු නිදහස් නොකළ යුතු අතර, නියෝගයේ සඳහන් අයටම සතා භාරදිය යුතුය.

09. ගාල්කර ඇති සතෙකු නිදහස් කිරීම සඳහා ලේකම් විසින් නිදහස් කිරීමේ නියෝගයක් දීමට ප්‍රථම සතා අල්ලා ගැනීමට අදාල ගාස්තුවද, ආහාර හා රැකවල් ගාස්තුව වශයෙන් නියම කරන මුදලද සතාගේ හිමිකරු විසින් ප්‍රාදේශීය සභාවට ගෙවා කුවිතාන්සිය

තබාගෙන ඇති බවට හා ඉල්ලුම්කරු සතාගේ නියම හිමිකරු බවටද ලේකම්ට පිළිගත හැකි අන්දමින් ලිඛිත පෞද්ගලික සාක්ෂි මත සනාථ කර ඇති බවටද සෑහීමකට පත්විය යුතුය.

10. බලය ලත් තැනැත්තෙකු සතෙකු අල්ලාගත් අවස්ථාවේ සිට ගාලෙන් නිදහස් කරන අවස්ථාව අතර කාලය තුළ කවර හෝ සතෙකු රෝගාතුරවීම, මියයාම පිළිබඳ ප්‍රාදේශීය සභාව හෝ ඒ වෙනුවෙන් කටයුතු කරන කිසිවෙකු වගකීමට බැඳී නැති අතර, එවැනි කරුණක් වෙනුවෙන් වන්දියක් අලාභයක් ගෙවීමට සභාව යටත් නොවන්නේය.

11. (අ) අල්ලාගනු ලබන කවර වර්ගයේ සතෙකු සඳහා වුවද අල්ලා ගැනීමේ ගාස්තු වශයෙන් එක් සතෙකු වෙනුවෙන් කලින් කල සභාව විසින් නියම කරනු ලබන මුදලක් ගාස්තුවක් වශයෙන් සතාගේ හිමිකරු හෝ භාරකරු විසින් ප්‍රාදේශීය සභාවට ගෙවන තෙක් කිසිම සතෙකු නිදහස් නොකල යුතුය. එසේ නියම කරනු ලබන මුදලෙන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන ප්‍රමාණයක් බලය ලත් අයටද, රැකවල්කරුටද ගෙවා ශේෂය සභා අරමුදලට බැරකල යුතුය.

(ආ) සතුන් අල්ලා ගැනීමේ ගාස්තු සහ ආහාර හා රැකවල් ගාස්තු කලින් කල ප්‍රාදේශීය සභාව මගින් නියමකර වාර්ෂිකව රජයේ *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත්කර තිබිය යුතුය.

12. අල්ලාගත් සෑම සතෙකුම ආරක්ෂාකර ගැනීම, ආහාර සැපයීම, නියමිත අවස්ථාවලදී ප්‍රතිකාර කිරීම ආදී සියළු කාර්යයන් ප්‍රාදේශීය සභාවේ වගකීම වන අතර, ඒ සම්බන්ධයෙන් වන වියදම් සතාගේ හිමිකරු හෝ භාරකරු වෙතින් අයකර ගැනීමද නීත්‍යානුකූල වන්නේය.

13. හිමිකරුවකු හෝ භාරකරුවකු ඉදිරිපත් නොවන්නා වුවද, නියමිත ගාස්තු ගෙවා නොමැති වූද, අල්ලාගත් දින සිට දින දාහතරකට (14) නොඅඩු කාලයක් ගාලතුළ තබා සිටියා වූද කවර හෝ සතෙකුගේ හිමිකම් එනයින්ම සභාව සතුවන අතර, සභාපතිවරයා විසින් තීරණය කරනු ලබන අන්දමකින් දැන්වීම් ප්‍රචාරය කර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමද, මිලට ගත් අයට සතාගේ අයිතිය පැවරීමද අවශ්‍යවන්නා වූ අනෙකුත් කාර්යයන් කිරීමද නීත්‍යානුකූල වන්නේය.

14. වෙන්දේසි කිරීමෙන් ලබාගන්නා මුදලින් ප්‍රාදේශීය සභාවට අයවිය යුතු ගාස්තු පියවාගෙන සතාගේ නියම හිමිකරු ඉල්ලා සිටිය හොත් ශේෂවන මුදල එකී අයට ගෙවිය හැකිය. වෙන්දේසියෙන් මාස 06ක කාලයක් ඉකුත්වූ ඉල්ලීම් භාර නොගත යුතුය. එවැනි අවස්ථාවන් හිදී ශේෂ වූ මුදල පොදු අරමුදලට බැරකළ යුතුය.

15. මෙම අතුරු ව්‍යවස්ථාවල යම් අතුරු ව්‍යවස්ථාවක සෑම කඩකිරීමක්ම වෙනුවෙන් රුපියල් 750කට නොවැඩි දඩයකින්ද නොකඩවා කරන එවැනි වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කිරීමෙන් පසු හෝ ඒ කඩ කිරීම ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයාගෙන් හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරියෙකුගෙන් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසු නොකඩවා දිගටම වරද කරගෙන යෑම වෙනුවෙන් දිනක් සඳහා රුපියල් 250 කට නොවැඩි දඩයකට යටත් විය යුතුය.

16. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවෙහි -

I. "සතා", "සතකු", "සතුන්" යන යෙදුම්වලට යම් ගවයෙකු, මී ගවයකු, අශ්වයෙකු, බැටළුවෙකු, පෝනියෙකු, එළුවෙකු හෝ ඌරකු ඇතුලත් වන අතර, එකී සෑම වර්ගයකම ගැහැණු සතුන් හා පිරිමි සතුන්ද ඇතුලත් වේ. තවද, ඒක වචනයෙන් දක්වා ඇති යම් යම් තැන්වලට අදාලවන පරිදි බහු වචන අර්ථයද ආදේශ විය යුතුය.

II. "පොදු ස්ථානයක්" යන්නට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි යම් මාර්ගයක්, වැව්තාවුල්ලක්, පොදු බස් නැවතුම් පළක්, ක්‍රීඩා භූමියක්, උද්‍යානයක්, පොදු ගොඩනැගිලි පරිශ්‍රයක් හෝ මහජනයාට පොදුවේ ඇතුළු විය හැකි වෙනත් ස්ථානයක් යන අර්ථයද ඇතුලත් වන්නේය.

III. "දඩාවතේ යන සතුන්" යන යෙදුමෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් පොදු ස්ථානයක ඇවිද කන, සිටින, ලැග සිටින, බැඳ සිටින හෝ දිගේලිකර සිටින හෝ වෙනත් යම් ආකාරයකින් සිටින සතුන් අදහස් වන අතර, බඩු බෑම හා පැටවීම සඳහා නතර කර තිබෙන කරත්තයකට බැඳ සිටින ගවයෙකු හෝ මී ගවයෙකු හෝ කිසියම් පුද්ගලයෙකු රැහැනකින් බැඳ දක්කාගෙන යන්නා වූ සතෙකු ඇතුලත් නොවන්නේය.

IV. "බලය ලත් තැනැත්තා" යනුවෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දඩාවතේ යන සතුන් අල්ලා තමන් බාරයට ගැනීමටත්, ගාලට ගෙන ඒමටත් සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරනු ලැබූවාවූද, එම බලය වලංගුව පවතින්නා වූද අයෙකු අදහස් වන්නේය.

V. "ගාල" යනුවෙන් දඩාවතේ යමින් සිටි අල්ලාගනු ලබන සතුන් ගාල්කර තැබීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් වරින් වර පිහිටුවනු ලබන පවත්වාගෙන යනු ලබන සත්ව ගාලක් හෝ සත්ව ගාල් අදහස් වන්නේය.

VI. "රැකවල්කරු" යනුවෙන් ගාල හෝ ඒ තුළ ගාල්කර සිටින සතුන් හෝ රැකබලා ගැනීම, පාලනය කිරීම සඳහා සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරනු ලැබූවා වූද, එම බලය වලංගුව පවතින්නා වූද අයෙකු අදහස් වන්නේය.

*II වැනි කොටස*

*ගොඩනැගිලි තැනීම සහ වැඩ කටයුතු*

1. (i) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ගොඩනැගිලි ඉදිකිරීමේ ප්‍රදේශ නිර්ණය කිරීම.

(ii) ස්ථාවරත්වය ඇති කිරීම, ගිණිගැනීම වැලැක්වීම, සෞඛ්‍යය ආරක්ෂා කිරීම අරමුණු කර ගනිමින් එකී ගොඩනැගිල්ල තනන ද්‍රව්‍ය පාලනය කිරීම ;

(iii) බාධාවකින් තොරව වාතය සංසරණය වීමට සහ කසළ ශෝධනයට ඉඩ ලැබෙන පරිදි ගොඩනැගිලි අතර ඉඩ අවකාශ තැබීම ;

(iv) දොර ජනෙල්වල දිග, පළල, පොළවේ මට්ටම, වහලයේ උස, සාමාන්‍ය වාතාශ්‍රය සහ ජලාපවාහන ක්‍රම විධිමත් කිරීම ;

(v) අලුත් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා හෝ පවතින ගොඩනැගිලි වෙනස් කිරීම සඳහා සැලසුම් පරීක්ෂා කිරීම සහ සලකා බැලීම සඳහා සේවා ගාස්තු අය කිරීම ;

(vi) වැසිකිලිවල සංඛ්‍යාව සහ ස්වභාවය නිර්ණය කිරීම ;

(vii) ගොඩනැගිලි අභිමුඛයේ රේඛා නිර්ණය කිරීම.

පිළිබඳ අතුරු ව්‍යවස්ථාවයි

(2) මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ උපලේඛනගත අංක 01හි සඳහන් මාර්ගයකින් මාර්ගයක මධ්‍යයේ සිට දෙපසට (එකී උපලේඛනයෙහි) නියමිත මීටර් ප්‍රමාණයක සීමාවක් තුළ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා බල පැවැත්වේ.

(3) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ අනුමත සීමාව තුළ ඉදිකිරීම් කටයුතු කිරීමේදී පහත සඳහන් කොන්දේසිවලට අනුකූලව ගොඩනැගිලි ඉදිකිරීම කළ යුතු ය :-

(i) ඉහත සඳහන් බල සීමාව තුළ මොනයම් හෝ ඉදිකිරීමක් සිදු කිරීමට පෙර ඒ සඳහා වූ සැලසුම් සහ අදාල ලියවිලි ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කර අනුමත කරවා ගත යුතු ය ;

(ii) ගොඩනැගිලි අත්තිවාරම් සකස් කිරීමට කොන්ක්‍රීට් හෝ කළුගල් සහිත සිමෙන්ති බදාම පමණක් යොදාගත යුතු යි. මේ සඳහා යොදන සිමෙන්ති බදාමවල සිමෙන්ති හා වැලි මිශ්‍රණය 1:5 අනුපාතයෙන් ගත යුතු ය ;

(iii) බිත්ති ඉදිකිරීම සඳහා සිමෙන්ති, ගඩොල් සහ පිළිස්සූ ගඩොල් පමණක් භාවිතා කළ යුතු ය ;

(iv) වහල සඳහා උළු, ගැල්වනයිස් තහඩු, හෝ ඇස්බැස්ටස් තහඩු පමණක් යොදාගත යුතු ය ;

04. (i) බාධා රහිතව වාතාශ්‍රය ලැබීම පිණිස පදිංචිය සඳහා තනන ගොඩනැගිලි 02ක් අතර පරතරය අවම වශයෙන් මීටර් 4ක් විය යුතු ය ;

(ii) අපද්‍රව්‍ය විධිමත් පරිදි බැහැර කළ යුතු අතර ජලය බැසයාම සඳහා විධිමත් කාණු පද්ධතියක් සැකසිය යුතු ය ;

(iii) ගොඩනැගිලි අභ්‍යන්තරයට ප්‍රමාණවත් පරිදි ආලෝකය සහ වාතාශ්‍රය ලැබෙන පරිදි දොර ජනෙල් හා ගොඩනැගිල්ලේ බිත්තිවල උස අනුමත ප්‍රමිතියට අනුකූල විය යුතු ය. ගොඩනැගිල්ලේ එක් එක් මහලක බිත්තිවල උස අවම මීටර් 03ක් වියයුතු අතර ජනෙල්වල මුලු වර්ගඵලයෙන් ගොඩනැගිල්ල පදිංචිය සඳහා නම් බිමෙහි වර්ගඵලයෙන් හයෙන් එකකටද ගොඩනැගිල්ල ව්‍යාපාරික කටයුතු සඳහා නම් බිමෙහි වර්ගඵලයෙන් පහලොවෙන් එකකටද නොඅඩු විය යුතු ය ;

05. ගොඩනැගිල්ලේ ගැවසෙන ජනගහනයට ප්‍රමාණවත් පරිදි වැසිකිළි හා කැසිකිළි පහසුකම් තිබිය යුතු ය. පොදු ස්ථාන 10 දෙනෙකු ට වැසිකිළි 01 බැගින් ගැහැණු පිරිමි වෙන් වෙන් වශයෙන් වැඩිවන සෑම 10 දෙනෙකු ට 01 බැගින් ගැහැණු පිරිමි වෙන් වෙන් වශයෙන් සංක්‍රමික සෑම 100 දෙනකුට 01 බැගින් ගැහැණු පිරිමි වෙන් වෙන් වශයෙන් විය යුතු ය ;

06. ලිං ජලය භාවිතා කරන්නේ නම් ලඳ පිහිටි ස්ථානය සහ මළ අපද්‍රව්‍ය බැහැර කරන ස්ථානය අතර අවම දුර ප්‍රමාණය මීටර් 15ක් විය යුතු ය.

07. ප්‍රධාන මාර්ගයේ මධ්‍ය ලක්ෂ්‍ය රේඛාවේ සිට ගොඩනැගිලි සීමාව පහත පරිදි විය යුතු ය.

| | *ගොඩනැගිලි සීමාවේ මීටර්* |
|---|---|
| (i) ඒ ශ්‍රේණියේ මාර්ග | 16 |
| (ii) බී ශ්‍රේණියේ මාර්ග | 13 |
| (iii) සී සහ ඩී ශ්‍රේණියේ මාර්ග | 10 |
| (iv) අනෙකුත් මාර්ග | 05 |

08. ගොඩනැගිලි අත්තිවාරම සඳහා මැටි සහ පස් භාවිතයෙන් වැලකී සිටිය යුතු ය.

09. සෙවිලි ද්‍රව්‍ය ලෙස පොල් අතු, පිදුරු, මානම්, ඉලුක්, දැව, පොලිතීන් වැනි ගිනි අනතුරුවලට ලක්විය හැකි ද්‍රව්‍ය භාවිතා නොකළ යුතු ය.

10. බිත්ති ඉදිකිරීම සඳහා ලෑලි කටුමැටි සහ තහඩු වැනි ද්‍රව්‍ය භාවිතා නොකළ යුතු ය.

11. අපද්‍රව්‍ය අපජලය සහ වෙනත් කැළි කසළ බැහැර කරන ආකාරය සැලැස්මේ සඳහන් විය යුතු ය.

12. මදුරුවන් කෘමීන් හා රෝග වාහක සතුන් බෝවීම වැලැක්වීමට විධිවිධාන යෙදිය යුතු ය.

13. තාවකාලික ගොඩනැගිලි ඉදිකිරීමේ දී මංගල අවමංගල ආගමික හා උත්සව කටයුතු නිමවී දින 07ක් ඇතුළත ඉදිකිරීම් ඉවත් කළ යුතු ය.

14. ස්ථිර හෝ තාවකාලිකව ඉදිකරන ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිලි පරිශ්‍රයක් වෙත පිවිසීමටත් පරීක්ෂා කිරීමටත් නිලධාරියකුට අවශ්‍ය යැයි හැඟෙන තොරතුරු ලබාගැනීමටත් සභාපතිවරයා හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරියකුට පෙ. ව. 6.00 සිට ප. ව. 6.00 දක්වා කාලය තුළ බලය ඇත්තේ ය.

15.තාවකාලික ඉදිකිරීමක් සඳහා පහත කොන්දේසි බල පැවැත්වේ-

(i) තාවකාලික ඉදිකිරීමකදී අත්තිවාරම යොදා බිත්ති බැඳීම හෝ ස්ථිර සෙවිල්ලකින් ආවරණය නොකළ යුතු ය.
(ii) විධිමත් පරිදි අපද්‍රව්‍ය බැහැර කිරීම කළ යුතු යි.
(iii) එම ස්ථානයේ ගැවසෙන ජන සංඛ්‍යාවට අදාලව ජලය වැසිකිළි කැසිකිළි පහසුකම් ප්‍රමාණවත් පරිදි සැපයිය යුතු ය.

16. ස්ථිර ගොඩනැගිල්ලක් සඳහා සැලසුම් අනුමත කිරීමේ දී සභාව විසින් කලින් කල නියම කරණ පරීක්ෂණ හා සේවා ගාස්තු හා අයදුම් පත්‍ර ගාස්තු සභාවට ගෙවිය යුතු ය. මෙම ගාස්තු සභාව විසින් වාර්ෂිකව රජයේ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කළ පරිදි විය යුතු ය.

17. (i) මහල් ගොඩනැගිල්ලක් වන විට එක් එක් මහලේ වර්ග අඩි ප්‍රමාණයන් අනුව මෙම ගාස්තු නියම කෙරේ. (සෑම ගොඩනැගිල්ලකටම ගෘහස්ථ කාර්යය සඳහා ජලය හා විදුලිය ලබාගන්නා ආකාරය සනාථ කළ යුතු ය).

(ii) මහල් 03ට වැඩි වන විට හදිසි දොරටු සවිකර ගිනි ආරක්ෂක පියවරයන් යොදා තිබිය යුතු ය. මහල් 05ක් හෝ ඊට වැඩි වන විට විදුලි සෝපානයක් සවි කළ යුතු ය.

18. මංගල අවමංගල හා පුන්‍ය කටයුතු සඳහා තනන තාවකාලික ගොඩනැගිලිවලට කිසිදු ගාස්තුවක් අය කරනු නොලැබේ.

19. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ විධිවිධානයක් උල්ලංඝනය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් වරදකරු කරනු ලැබීමෙන් අනතුරුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) වගන්තියේ සඳහන් දණ්ඩනයන්ට යටත් වන්නේ ය.

20. මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස

(i) වාණිජ කටයුත්තක් යන්නෙන් - කාර්මාන්තයක්, වෙළඳ ව්‍යාපාරයක්, නිවාඩු නිකේතනයක්, සංචාරක බංගලාවක්, උත්සව ශාලාවක්, නේවාසිකාගාරයක්, පෞද්ගලික අධ්‍යාපන ආයතනයක්, හෝ මුදල් අයකර යම් සේවාවක් හෝ ව්‍යාපාරයක් කරනු ලබන ස්ථානයක් අදහස් වේ.

(ii) ඉදිකිරීමක් යන්නට, අළුතින් තැනීමක්, අළුත් කොටසක් එකතු කිරීමක්, වෙනස් කිරීමක්, දීර්ඝ කිරීමක්, සම්බන්ධ කිරීමක් අදහස් වේ.

උපලේඛනය 01

**04 වැනි වගන්තිය**

| *මාර්ග වර්ගය* | *අනුමැතිය රහිතව ගොඩනැගිලි ඉදිකිරීම් කල නොහැකි සීමාව පාර මධ්‍යයේ සිට දෙපසට මීටර්* |
|---|---|
| ඒ ශ්‍රේණියේ මාර්ග | 500 |
| බී ශ්‍රේණියේ මාර්ග | 400 |
| සී ශ්‍රේණියේ මාර්ග | 300 |
| වෙනත් මාර්ග | 200 |

***12 වැනි කොටස***

**මළාපවාහනය**

01. ප්‍රාදේශීය සභාවේ නිශ්චිත බල ප්‍රදේශයක් තුළ ස්ථාපනය කර ඇති මළාපවාහන පද්ධතිය පාලනය කිරීම හා විධිමත් කිරීම සහ ඒ සඳහා ගාස්තු අය කිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාවයි.

02. මෙම අතුරු ව්‍යවස්ථාවේ I වැනි උපලේඛනයේ සඳහන් ප්‍රදේශය තුළ දැනට පවතින හා ඉදිවෙමින් පවතින ගොඩනැගිලි සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන බල පැවැත්වේ.

03. අප ද්‍රව්‍ය හා අපවිත්‍ර ජලය බැහැර කිරීමේ මළාපවාහන පද්ධතිය ඕනෑම ගොඩනැගිල්ලක හෝ එහි කොටසක සිට අලුතින් සකස් කරන ලද ප්‍රධාන නළ පද්ධතිය වෙත සම්බන්ධ කරණු ලැබිය යුතු ය.

04. (i) සභාවේ සභාපති වරයා වෙත දැනට පවතින ගොඩනැගිල්ලක අපද්‍රව්‍ය හා අපවිත්‍ර ජලය බැහැර කිරීමේ පද්ධතිය අසතුටුදායක බවට මතයක් හෝ පැමිණිල්ලක් ලැබුණු විට ඔහු විසින් ලිඛිත අවසරයක් මගින් බලය පවරන ලද සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් නිලධාරියකු ඔහු වෙනුවෙන් ස්ථානය පරීක්ෂා කර ලිඛිත වාර්තාවක් ලබා දිය යුතු ය.

(ii) එකී වාර්ථාව සුපරීක්ෂාකාරීව සලකා බලා අවශ්‍යතාවය පිළිබඳව සෑහීමකට පත් වන්නේනම් සභාපති විසින් මාස 06ක කාල සීමාවක් හෝ එම කාලය තුළ කාර්මික අවශ්‍යතාවයක් වශයෙන් නිෂ්චය කර ප්‍රධාන නල පද්ධතියට සම්බන්ධ කිරීම කෙරෙහි ඉඩ ප්‍රස්ථා සලසනු ලැබේ. මේ සඳහා සම්බන්ධතා ගාස්තුව සභාව විසින් කලින් කල නියම කර වාර්ෂික රජයේ ගැසට් පත්‍රයෙහි පළකරණු ලබන පරිදි විය යුතු ය.

05. (i) ඕනෑම පුද්ගලයකු විසින් අපද්‍රව්‍ය හා අපවිත්‍ර ජලය බැහැර කිරීමේ පද්ධතිය ප්‍රධාන නළ පද්ධතියට සම්බන්ධ කිරීම කෙරෙහි කැමැත්තක් දක්වන්නේ නම් ඒ වෙනුවෙන් අතුරු ව්‍යවස්ථාවෙහි 4 (ii) වැනි කොටසේ සඳහන් ගාස්තු සමඟ අයදුම්පතක් සභාපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(ii) සභාපති වෙත එම අයඳුම්පත ලැබීමෙන් අනතුරුව ඇස්තමේන්තුව හා එම අවශ්‍යතාවයේ සත්‍යතාවය පිළිබඳව සලකා නිශ්චය කර සෑහීමකට පත් වන්නේ නම් එය ප්‍රධාන නළ පද්ධතියට සම්බන්ධ කිරීම සඳහා අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබේ.

(iii) මෙම වගන්තියේ (i) ඡේදයේ සඳහන් පරිදි නළ පද්ධතිය සම්බන්ධ කිරිම පිළිබඳව තිශ්චය කර එහි සැකසුමෙහි යෝග්‍යතාවය සහ ප්‍රවේශ වීම උදෙසා දැරිය යුතු ඇස්තමේන්තු ගත වියදම අයදුම්කරු වෙත අයදුම් කළ දින සිට දින 07ක් තුළ දන්වනු ලැබේ. එකී ඇස්තමේන්තු වියදම් අයදුම්කරු සභාවට ගෙවනතුරු අවසර පත්‍රය නිකුත් කරනු නොලැබේ.

(iv) අපද්‍රව්‍ය හා අපවිත්‍ර ජලය ප්‍රධාන මළාපවහන නල මාර්ගය වෙත සම්බන්ධ කිරීම සඳහා වූ අයදුම්පත් සඳහා අනුමැතිය ලැබීමෙන් අනතුරුව එකී අයිතිකරු හෝ පදිංචිකරු විසින් සභාපති හෝ ඔහු වෙනුවෙන් බලය පවරන ලද නිලධාරියකු විසින් අනුමත කරන ලද වර්ගය සඳහන් ප්‍රමාණය සහිත නල සහ උපකරණ භාවිතා කළ යුතු ය.

06. (i) නල පද්ධතිය ඇතිරීම සහ නඩත්තු කිරීම සඳහා ඕනෑම යෝග්‍ය පුද්ගලයෙකු කැමැත්තක් දක්වන්නේ නම් ඔහු විසින් ප්‍රාදේශීය සභාව විසින් ස්ථාපනය කර ඇති කාර්මික ඇගයීම කමිටුවේ ලියාපදිංචි වී විධිමත් බලපත්‍රයක් ලබා තිබිය යුතු ය.

(ii) කාර්මික ඇගයීම් කමිටුව විසින් තෝරා ගන්නා ලද සෑම පුද්ගලයකු විසින් ම ඒ වෙනුවෙන් සභාව විසින් කලින් කල නියමකර වාර්ෂිකව ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරනු ලබන ගාස්තු ගෙවිය යුතු ය.

07. අතුරු ව්‍යවස්ථාවේ 05 වැනි වගන්තියෙහි සඳහන් පරිදි ඒ වෙනුවෙන් බලපත්‍රයක් ලබාගත් පුද්ගලයෙකු හැර වෙනත් කිසිවෙකුට ප්‍රධාන නල පද්ධතියට සම්බන්ධ කර නල එලීමට අවසර දෙනු නොලැබේ.

08. (i) අපද්‍රවය බැහැර කිරීම සඳහා නල එලීම විධිමත් කිරීම සඳහා ඕනෑම ක්‍රමවේදයකින් හෝ වෙන් කරන ලද හෝ බිංගෙයක් සඳහා සැලසුම් කරන පාෂාණයක් හෝ ආරක්ෂක නිවසක් හා වට කරන ලද වෙනත් ඉඩමක් සම්බන්ධයෙන් සභාව විසින් ලිඛිත දැන්වීමක් ලබා දී අයිතිකරුවකු හෝ පදිංචිකරුවෙකු වෙත අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා වූ නල එලීමේ යෙදී සිටිය දී දේපළ සඳහා ඇති වීමට ඉඩ ප්‍රස්ථා ඇති පාඩුව හා අලාභය අවම කිරීම පිණිස අවශ්‍ය වන්නා වූ පියවර සභාව විසින් ගනු ලැබේ.

(ii) මෙහි 08 1 වැනි වගන්තියෙහි සඳහන් පරිදි අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා නල එලීමේ දී සිදුවන අලාභය හෝ පාඩුව වෙනුවෙන් සභාව විසින් තක්සේරු කර මුදල් ගෙවනු ලැබේ.

(iii) ඉහත සඳහන් පරිදි කිසියම් පුද්ගලයෙකු හට එවැනි අලාභයක් හෝ පාඩුවක් සිදුවී ඇත්නම් එම අයිතිවාසිකම් වෙනුවෙන් සිද්ධිය සිදු වී දින 14ක් ඇතුළත සභාව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය.

(iv) එවැනි ඉල්ලීමක් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා පනතේ සලසා ඇති විධිවිධානවලට අනුකූලව වෙනස් කළ යුතු දේ වෙනස් කර එම ඉල්ලීම පිළිබඳව තක්සේරු කළ අලාභය සභාව විසින් ගෙවනු ලැබේ.

09. අපද්‍රව්‍ය සහ අපවිත්‍ර ජලය බැහැර කිරීම සඳහා පහසුකම් සැලසීම පිණිස සභාව විසින් සුදුසු ස්ථානවල පොම්පාගාර ඉදිරකරනු ලැබේ.

10. පෞද්ගලික දේපළක් හරහා නල එලීම අවශ්‍ය වූ විටක දී ප්‍රාදේශීය සභා පනත යටතේ සලසා ඇති විධිවිධානවලට අනුව පහත පරිදි කටයුතු කරනු ලැබේ.

(i) අවශ්‍ය වූ විටක දී සභාව විසින් අපද්‍රව්‍ය සහ අපවිත්‍ර ජලය බැහැර කිරීම සඳහා නල එලනු ලබන අතර, එවැනි එලීම් කටයුතු මංමාවතක් හෝ මාර්ගයක් හරහා හෝ ඊට පහළින් හෝ සැලසුම් කරන ලද ඕනෑම ස්ථානයක් හෝ එසේ අදහස් කරනු ලබන මාර්ගයක් හෝ ගොඩනැගිල්ලක පහතින් හෝ බිංගෙය කුටියක් හරහා හෝ අවට පිහිටා ඇති වෙනත් ඉඩමක් හරහා විය හැකිය. එවැනි කාර්යන්හි දී ඉඩමක අලාභ හානියක් සම්බන්ධයෙන් සභාවේ අරමුණු සඳහන් කරමින් නිවේදනයක් සභාව විසින් සති දෙකක කාල සීමාවක් තුළ අයිතිකරු හෝ එහි පදිංචිකරුවෙත ලබා දෙන අතර, ඒ සඳහා විරුද්ධතාවයක් පැන නගින බවට හෝ අසතුටුදායක තත්ත්වයක් පෙනී ගිය හොත් සභාවේ අණ පරිදි අපද්‍රව්‍ය ඉඩම හරහා හෝ ඉඩමට පහළින් බැහැර කර ලීමට සිදුසු බවට අදහස් කරන්නේ නම් එම ඉඩමේ අයිතිකරු වෙත ලිඛිතව ඒ බව නියෝග කරනු ලැබිය යුතු ය.

(ii) එවැනි ඕනෑම කාර්යක් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව සභාව විසින් නිශ්චය කරනු ලබන සාධාරණ වූ වන්දි මුදලක් එම අලාභය දරන අයිතිකරු හෝ පදිංචිකරු වෙත ගෙවනු ලැබිය යුතු ය.

(iii) ගෙවන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධයෙන් එකඟ නොවන්නේ නම් පීඩාවට පත් වූ පාර්ශවය විසින් ඒ සඳහා අභියාචනයක් සභාපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(iv) එවැනි අභියාචනයක් සම්බන්ධයෙන් සභාපති විසින් සතියක් ඇතුළත ඔහුගේ තීරණය දන්වනු ලබන අතර, සභාපතිගේ තීරණය අවසාන තීරණය වේ.

11. (i) යම්කිසි පුද්ගලයෙකුහට හෝ අයිතිකරුවකුහට අයත් ඉඩම හරහා හෝ ඉඩමක පහතින් හෝ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා වඩාත් ප්‍රායෝගික වන්නේ කාණු පද්ධතිය නම් සභාව විසින් පූර්වෝක්ත ඉඩමේ අයිතිකරු වෙත ඔහු අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා කටයුතු නොකරන්නේ මන්ද ? යනුවෙන් විමසා හේතු දැක්වීම පිණිස සාධාරණ අවස්ථාවක් දෙනු ලැබිය යුතු ය. ඒ සඳහා විරුද්ධත්වයක් පැන නගින බවට හා අසතුටුදායක තත්ත්වයක් පෙනීගියහොත් සභාවේ අණ පරිදි ඉඩම හරහා හෝ ඉඩමට පහළින් අපද්‍රව්‍ය බැහැර කිරීම සුදුසු බවට එම ඉඩමේ අයිතිකරු වෙත ලිඛිතව නියෝග කළ හැකි ය.

(ii) යම්කිසි පුද්ගලයෙකු විසින් හෝ ඔහු විසින් සේවයේ යොදවනු ලබන නියෝජිතයකුහට එම කාර්යය සඳහා නිකුත් කරනු ලබන එවැනි සෑම නියෝගයක් ම වලංගු අවසරයක් වන අතර, ඔහුගේ අභිමතය පරිදි එය ක්‍රියාවෙහි යෙදවීම සඳහා පෙ. ව. 6.00 සිට ප. ව. 6.00 දක්වා ඔහුගේ සහයකයින් හා සේවකයින් සමග අදාළ ඉඩමට ඇතුළු වීම සඳහා අවසරය තිබිය යුතු ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවල සැලසී ඇති විධිවිධානයන්ට යටත්ව ඉඩමේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් අපද්‍රව්‍ය බැහැර කිරීමේ කාර්ය සඳහා යොදවා ඇති නියෝජිතයෙකු හෝ ඔහු විසින් සේවයේ යොදවා ඇති පුද්ගලයෙකු අදාළ ඉඩම අයිතිකරුට ලබා දීමෙන් පසුව අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා නීත්‍යානුකූලව ගොඩනගන ලද කාණු පද්ධතිය යුක්තිසහගත බව දන්වමින් ලිඛිතව දැනුම්දීමෙන් අනතුරුව එය අළුත්වැඩියා කිරීමේ හා පිරිසිදු කිරීමේ කාර්යය සඳහා පෙ. ව. 6.00 සිට ප. ව. 6.00 දක්වා ඕනෑම අවස්ථාවක ඔහුගේ සහයකයින් හා සේවකයින් සමග අදාළ ඉඩමක ඇතුල් විය හැකි ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථා යටතේ ඕනෑම කාර්යයක් ක්‍රියාවේ යෙදවීම සඳහා සභාව විසින් අදාළ ඉඩම සම්බන්ධයෙන් ඇති විය හැකි අලාභ හානියක් අවම කිරීම පිණිස අවශ්‍ය වන්නා වූ උපායන් ක්‍රියාවේ යොදවනු ලබන අතර, ඉඩමේ අයිතිකරු හෝ පදිංචිකරුගේ යහපත සඳහා පහත ක්‍රියා මාර්ග ගත යුතු ය.

(i) කාර්යයන් ක්‍රියාවේ යෙදවීමේ දී අවම ප්‍රමාදයන් වැළැක්වීම ;
(ii) අදාළ කාර්යය ක්‍රියාවට නැංවීමේ දී කණින ලද ඉඩම ඔහුගේ වියදමින් නැවත සකස් කිරීම ; සහ
(iii) වෙළඳපලේ පතින් භාණ්ඩවල වටිනාකම සැලකිල්ලට ගනිමින් එසේ ඉඩමේ කාර්යයන් ක්‍රියාවට නැංවීමේ දී ඔහුගේ ඉඩමට සිදුවන අලාභය වෙනුවෙන් අදාළ ඉඩම යථා තත්ත්වයට පත් කිරීම සඳහා වන්දි ගෙවීම.

(v) මෙම අතුරු ව්‍යවස්ථාව අනුව ඕනෑම ඉඩමක අයිතිකරු විසින් කාර්යක් ඉටු කිරීම සඳහා අවශ්‍ය වූ විටක සාධාරණ වූ හේතුවක් සභාව වෙත දැන ගැනීමට සැලැසීමකින් තොරව එය ප්‍රතික්ෂේප කිරීම සහ වැළැක්වීම නොහැකි වේ. ප්‍රාදේශීය සභා පනතේ 94 වැනි ඡේදයේ සැලසී ඇති විධිවිධානවලට අනුව එවැනි කාර්යයක් කිරීම නීතිය උල්ලංඝණය කිරීමකි.

(vi) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ඉඩමේ අයිතිකරු විසින් අපවිත්‍ර ජලය ඉඩම හරහා හෝ ඉඩමට පහළින් බැහැර කිරීමට එකඟව එවැනි ඉඩමක ගොඩනැගිල්ලක් ඉදිකිරීම සම්බන්ධයෙන් ඔහුගේ අදහස ප්‍රකාශ කර සභාව වෙත දැන්වීමේ දී සභාව විසින් ලිඛිත අවසරයක් ලබාදිය යුතු ය.

12. සභාව විසින් ලිඛිත නියෝගයක් මත බලය පවරන ලද නිලධාරියෙකු හට හෝ සේවකයින් හට එහි අයිතිකරු හෝ පදිංචිකරු දැනුවත් කිරීමෙන් අනතුරුව ඕනෑම පෞද්ගලික ඉඩමක හෝ දේපලක නල පද්ධතිය පරීක්ෂා කිරීමේ, අලුත්වැඩියා කිරීමේ, පිරිසිදු කිරීමේ, නඩත්තු කිරීම සඳහා පෙ. ව. 6.00 සිට ප. ව. 6.00ත් අතර ඕනෑම වේලාවක ඇතුලුවීම නීත්‍යානුකූල වේ.

13. සභාව වෙනුවෙන් බලය පවරන ලද ඕනෑම නිලධාරියෙකුහට අපද්‍රව්‍ය හා අපවිත්‍ර ජල ව්‍යාපෘතියට අදාළ සභාවේ නඩත්තු කටයුතු, කැණීම් පස් ඉවත් කිරීම වැනි කටයුතුවල යෙදී සිටිය දී බාධා කිරීම් නොකළ යුතු ය. ප්‍රාදේශීය සභා පනතේ 94 වැනි ඡේදයේ සැලසී ඇති විධිවිධානයන්ට අනුකූලව එසේ බාධා කිරීම නීතිය උල්ලංඝනය කිරීමට අදාළ වේ.

14. කිසිවෙකු විසින් මෙම ව්‍යාපෘතියේ නලවලට හෝ පොම්පගාරවලට හෝ (මැන් හෝල්) වලට අලාභ හානි නොකළ යුතු ය.

15. ඕනෑම පුද්ගලයෙක් අතුරු ව්‍යවස්ථාවේ 13 වැනි වගන්තිය උල්ලංඝනය කළහොත් නළ පද්ධතිය, පොම්පාගාර හෝ ටැංකිය (මැන් හෝල්) අළුත්වැඩියා කිරීම සඳහා වැය වූ අලාභය ගෙවිය යුතු අතර, එය පැහැර හැරියහොත් සභාපති විසින් ඒ සඳහා වැය වූ මුදල අවසන් කරන තුරු ඔහු වෙත සපයා ඇති අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා වූ සේවාව විසන්ධි කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.

16. අපද්‍රව්‍ය හා අපවිත්‍ර ජලය බැහැර කිරීමේ සේවාව සඳහා අපද්‍රව්‍ය සහ අපවිත්‍ර ජලය බැහැර කිරීමේ ව්‍යාපෘතියේ නිලධාරීන් සමග සේවය ලබා ගෙන ඇති සෑම පුද්ගලයෙක් සඳහා මුදල් අය කරනු ලබන අතර, එම මුදල මාසික ජල බිල්පත සමග ගණනය කරනු ලබන අතර, සභාව විසින් නිශ්චය කරනු ලබන මුදල මාසික ජල බිල්පතෙහි සඳහන් කරනු ලබන අතර එම මුදල දින 30ක් ඇතුළත නිරවුල් කළ යුතු ය. එය පැහැර හැරීම හෝ ගෙවීම ප්‍රමාද කරනු ලැබුවහොත් ඒ සඳහා වරෙන්තු ගාස්තුවකට යටත් වන අතර, බිල්පත් ලැබී දින 30ක් තුළ ගෙවීමට අපොහොසත් වුව හොත් සේවාව විසන්ධි කිරීම කරනු ලැබේ.

17. කිසිවෙකු විසින් නළ මාර්ගයේ පහත සඳහන් දේ ගොඩනගා තිබීම, මුද්‍රා හැරීම, අතහැර තිබීම, ගලායෑමට සැලැස්වීම, ස්ථානගත කිරීම නොකළ යුතු ය.

(i) ඕනෑම සල ජලයක්, කෘෂි නාශක, වැසි ජලය සහ අපවිත්‍ර ජලය, අපද්‍රව්‍ය පද්ධතියේ නළ සඳහා සුදුසු නොවන රසායනික ද්‍රව්‍ය හෝ වෙනත් ද්‍රව්‍යක් ;

(ii) කාණු පද්ධතිය මගින් නිදහසේ ජලය ගලා යෑමට සහ අපද්‍රව්‍ය බැහැර කිරීමට අදාළ පීඩා විය හැකි සහ බලපෑ හැකි උණු වතුර, වාෂ්ප වැනි දෑ ;

(iii) නල මාර්ගය අවහිර විය හැකි පස්, ගඩොල් හෝ ගඩොල් කුඩු හෝ නළ මාර්ගය අවහිර කරනු ලබන ද්‍රව්‍ය හෝ එයට සම්බන්ධ කරන ලද වෙනත් නළ මාර්ගයක්.

18. කිසිදු පුද්ගලයෙකු විසින් සභාවේ ලිඛිත අවසරයක් මත හැර නළ මාර්ග වෙනස් කිරීම සවිකරන ලද ස්වාභාවය, පිහිටීම හෝ ඉවත් කිරීම, අවහිර කිරීම, වසා දැමීම, නැවත ස්ථාන ගත කිරීම හෝ ඕනෑම කාණුවක්, වැසිකිළියක් පිට කිරීමේ නළ හෝ වෙනත් ඕනෑම උපකරණයක් හෝ ඒ සඳහා සවිකරන ලද වෙනත් දෑ වෙනස් කිරීම නොකළ යුතු ය.

19. කිසිඳු පුද්ගලයෙකු විසින් අපද්‍රව්‍ය බැස යන කාණුවක හානි වන පරිදි එම ඉඩමේ ගොඩනැගිලි නැංවීම, නැවත නගා සිටුවීම, වැසිකිළි හෝ එවැනි ගොඩනැගිලි සඳහා සපයන ලද ද්‍රව්‍ය හෝ වෙනත් ගොඩනැගිල්ලක් තැනීම නොකළ යුතු ය.

20. (i) අපද්‍රව්‍ය බැහැරලීමේ පද්ධතීන් සඳහා ඕනෑම සම්බන්ධ කිරීමක් හෝ සම්බන්ධ කිරීමට සැලැස්වීම ;

(ii) ඕනෑම අභ්‍යන්තර නළ පද්ධතියක් අළුත්වැඩියා කිරීමට සැලැස්වීම ;

(iii) ප්‍රධාන නළ පද්ධිතියෙන් හෝ පොම්පාගාරයෙන් හෝ (මැන් හෝල්) කිසිවක් ඉවත් කිරීම.

සභාව විසින් නිකුත් කරන ලද ලිඛිත අවසරයක් මත හෝ ඒ වෙනුවෙන් බලය පවරන ලද නිලධාරියෙකු විසින් හැර කිසිම අයෙකු විසින් නොකළ යුතු ය.

21. කිසිදු පුද්ගලයෙකු විසින් මෙම අතුරු ව්‍යවස්ථාවල 16, 17, 18, 19 වගන්ති වලින් සලසා ඇති විධිවධාන උල්ලංඝනය නොකළ යුතු ය. ප්‍රාදේශීය සභා පනතේ 94 වැනි වගන්තිය යටතේ සැලසී ඇති විධිවිධාන එවැනි උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් අදාළ වේ.

22. ඕනෑම පුද්ගලයෙකු විසින් අතුරු ව්‍යවස්ථාවේ 23 වගන්තියෙහි සඳහන් පරිදි, අප ද්‍රව්‍ය පද්ධතිය අවහිර කරනු ලැබුවහොත් එවැනි අවහිරතාවයන් සඳහා වැය කරන ලද මුදල් සභාව වෙත ගෙවිය යුතු වේ. එවැනි මුදලක් ගෙවීම පැහැර හැරීම ප්‍රාදේශීය සභා පනත යටතේ පනවන ලද අප ද්‍රව්‍ය ගාස්තුවක් වශයෙන් සලකා එය අයකර ගැනීමට ක්‍රියා කළ හැකි ය.

23. (i) සෑම පුද්ගලයෙකු විසින්ම සභාවට පළමුව ලබාගත් ලිඛිත අවරයකින් තොරව පොදු අපද්‍රව්‍ය නළ මාර්ග (ප්‍රධාන නළ මාර්ගය) මත ගොඩනැගිල්ලක් තැනීම හෝ ඉදි කිරීම හෝ එවැන්නක් සැලැස්වීමක් නොකළ යුතු ය. එය ප්‍රාදේශීය සභා පනත යටතේ 94 වැනි අධිකාරය යටතේ සැලසී ඇති විධිවිධාන පරිදි එකී නීතිය උල්ලංඝනය කිරීමක් ලෙස සැලකේ.

(ii) සභාවේ අවසරයකින් තොරව ඕනෑම ගොඩනැගිල්ලක් බිඳීම හෝ ගොඩනැගීම අතුරු ව්‍යවස්ථාවේ (i) ඡේදයේ සඳහන් පරිදි කළ නොහැකි වන අතර, එහි සැලසී ඇති විධිවිධාන ප්‍රකාරව එය බිඳ හෙලීම, වෙනස් කිරීම හෝ නොඑසේ නම් ඒ පිළිබඳව හානි කළහොත් එය ප්‍රතිසංස්කරණයට වැය වූ මුදල, සභාවේ අවසරය නොමැතිව එය, එකී කාර්යය කිරීමට සැලැස්වූ පුද්ගලයා විසින් ගෙවිය යුතු අතර, එසේ ගෙවීම පැහැර හැරියහොත් එය, සභාව විසින් පනවන ලද ගාස්තුවක් සේ සලසා අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

24. (i) නළ මාර්ගය සම්බන්ධයෙන් යම් කාර්යයක් ගොඩනැගීම, සිවි කිරීම, වෙනස් කිරීම හෝ පෞද්ගලික අප ද්‍රව්‍ය නළ මාර්ග තැනීම හෝ ද්‍රව්‍ය උපකරණ සවි කිරීම හෝ පෞද්ගලික අප ද්‍රව්‍ය නළ මාර්ග සමඟ පොදු අප ද්‍රව්‍ය නළ මාර්ගය සම්බන්ධ කිරීම මෙම අතුරු ව්‍යවස්ථාවේ සැලසී ඇති විධිවිධාන අනුව කළ යුතු අතර එය පවත්ගෙන යා හැක්කේ සභාව විසින් බලය පවරන ලද සහ සභාවේ ලියාපදිංචි සමග ඉඩම වෙත අප ද්‍රව්‍ය සේවාව සපයන ලද අයිතිකරුගේ වියදමෙන් පමණි.

(ii) මෙම අතුරු ව්‍යවස්ථා යටතේ සභාව විසින් බලය පවරන ලද නිලධාරීන් හට දවසේ ඕනෑම සාධාරණ වූ මොහොතක ඕනෑම කාර්යයක් පරීක්ෂා කිරීමේ හැකියාව ඇත්තේ ය.

25. (i) අප ද්‍රව්‍ය හා අපවිත්‍ර නළ පද්ධතියක් සවිකර තිබූ අවස්ථාවක ඒ පිළිබඳව සභාපති සෑහීමකට පත්වන්නේ නම් අතුරු ව්‍යවස්ථාවල ස්වභාවය අනුව එය පරිහරණය කිරීම සඳහා අවසර දෙනු ලැබේ.

(ii) සභාව වෙනුවෙන් බලය පවරන ලද නිලධාරියෙකු විසින් අපද්‍රව්‍ය හා අපවිත්‍ර ජලය බැහැර කිරීමේ නළ පද්ධතිය පිළිබඳ නිර්දේශ කර මෙම අතුරු ව්‍යවස්ථාවේ හෝ වෙනත් ලිඛිත නීතියක සැලසී ඇති ස්වාභානය අනුව සපුරාලිය යුතු කරුණු අනුව සෑහීමකට පත්වන්නේ නම්, එවැනි නිර්දේශ ලැබීමෙන් අනතුරුව පමණක් සභාපති විසින් අවසර ලබාදෙනු ලැබේ.

26. මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානයන් උල්ලංඝනය කිරීම වරදක් වන අතර බලය ඇති අධිකරණයක් මගින් වරදකරු කරනු ලැබීමෙන් අනතුරුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) වගන්තියෙහි සඳහන් දණ්ඩනයන්ට යටත් වන්නේ ය.

*13 වැනි කොටස*

*කසල ශෝධනය*

01. ප්‍රාදේශීය සභාව විසින් නිශ්චිත කරනු ලබන ප්‍රදේශය තුළ කසල ශෝධනය විධිමත් කිරීම, පාලනය කිරීම හා ඒ සඳහා ගාස්තු අයකිරීම පිළිබඳව වූ අතුරු ව්‍යවස්ථාවයි.

02. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් මෙම ව්‍යවස්ථාවේ I වැනි උපලේඛනයේ සඳහන් ප්‍රදේශය තුළ දේපළ හිමිකරුවන් හෝ ඒවා පරිහරණය කරන්නන් විසින් ව්‍යාපාර හා පදිංචි නිවාස සඳහා කසල එකතු කිරීමේ ගාස්තු සහ කසල බහාලුම් වෙනුවෙන් පිරිවැය මුදලක් ප්‍රාදේශීය සභාවට මසකට වරක් ගෙවිය යුතු ය. ගෙවීම් දිනය මාසයේ පළවන දින සිට දින 07ක් ඇතුළත විය යුතු ය. මෙම කසල බහාලුම් පිරිවැය ගාස්තුව සභාව විසින් කලින් කළ තීරණය කොට වාර්ෂිකව රජයේ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත පරිදි විය යුතු ය.

03. 1 වැනි උපලේඛනයේ සඳහන් බල ප්‍රදේශය තුළ පදිංචිකරුවන් විසින් කසල ශෝධනය සම්බන්ධව පහත පරිදි ක්‍රියා කළ යුතු ය.

(1) ප්‍රාදේශීය සභාව විසින් මාර්ගය දෙපස කොකු සහිත යකඩ කණු සිටුවා එම කණුවල තැඹිලි වර්ණය ආලේප කර හඳුනාගැනීම් පුවරු යොදා ඇත. එම සභාව සපයා ඇති බහාලුම් තුළ කසල දමා නියමිත දිනයන්හි උදේ 6.00 සිට සවස 5.00ට පෙර එකී කසල බහාලුම් අදාළ කණුවල එලා තැබිය යුතු ය. කසල දිරන සහ නොදිරන ලෙස වර්ග කර පාට දෙකෙන් දී ඇති බහාලුම් තුළ දැමිය යුතු ය. රතු පාටින් ඇති බහාලුම් තුළ නොදිරන කසල ද, කළු පාට බහාලුම් තුළ දිරන කසල ද වෙන් කර දැමිය යුතු ය. බහාලුම්වල දැමිය නොහැකි ගස්වල අතු වැනි දෑ ලකුණු කර පෙන්වා ඇති ස්ථානවලට ගෙනවිත් දමා තිබිය යුතු ය. නියමිත දිනය සභාව පිහිටුවා ඇති යකඩ කණුවල ප්‍රදර්ශනය කර ඇති පරිදි විය යුතු ය.

(2) කසල බහාලුම් මාර්ගයන්ට හා ප්‍රජාවට අවහිරයක් නොවන පරිදි පෙන්වා දී ඇති කාණුවල කොකු මත එල්ලා තැබිය යුතු ය.

(3) යකඩ කණුවල ප්‍රදර්ශනය කර ඇති නියමිත වේලාවන්ට ප්‍රථම අදාළ දිනයන්හිදී කසල රැගෙන විත් සතුන්ගෙන් වන හානිය වැළැක්වෙන පරිදි පෙන්වා දී ඇති ස්ථානවලම එල්ලිය යුතු ය.

(4) කුණු කසල කිසිදු අවස්ථාවක ප්‍රසිද්ධ ස්ථානවල හෝ කාණුවල හෝ මාර්ගයේ බැහැර නොකළ යුතු ය.

(5) කුණු කසල අනිසි ලෙස තැනින් තැන හෙලීමෙන් සිදුවන පරිසර හානිය සඳහා නීතිමය පියවර ගැනීම සභාව විසින් ක්‍රියා කරනු ලැබිය හැකිය.

(6) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇති පාසල්, කාර්යාල, රෝහල්, බස් නැවතුම් ස්ථාන, සති පොල, පොදු වෙළඳපොල ආදී පොදු ස්ථානයන් සඳහා ද පන්සල්, පල්ලි, කෝවිල වැනි ආගමික ස්ථානවලද කසල බැහැර කිරීම සඳහා සිමෙන්ති ටැංකි ස්ථාපනය කර ඇති අතර, වෙළඳ ස්ථානවල සහ හෝටල් සඳහා ද කසල බඳුන් ස්ථානගත කර ඇති බැවින්, කුණු කසල ලබා දී ඇති භාජනවලට බැහැරලිය යුතු ය. කර්මාන්ත ශාලාවල කසල සඳහා එම ස්ථානවල පෙන්වා දී ඇති විශාල ප්‍රමාණයේ සිමෙන්ති බහාලුම්වලට අපද්‍රව්‍ය සියල්ල බැහැර කළ යුතු ය.

(7) ඉහත කාර්යය පරීක්ෂා කිරීම උදෙසා බලය පැවරෙන පුද්ගලයා වන්නේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ තත්කාර්යය සඳහා පොදුවේ හෝ විශේෂයෙන් ලිඛිතව බලය පවරනු ලබන ලද යම් නිලධාරියෙකු වන අතර, ඕනෑම දිනක ඔරලෝසු වේලාවෙන් උදේ 6.00 සිට සවස 6.00 පැය දක්වා කාලය තුළ පරීක්ෂාවට ලක් කිරීම සඳහා නිවෙස් වලට පැමිණීම කල හැකිය. එසේ පරීක්ෂාවට ලක් කරනු ලබන්නේ පහත කරුණු වේ-

(i) ඒ ඒ පදිංචිකරුවන් විසින් අතුරු ව්‍යවස්ථාවේ පෙන්වා දී ඇති නියමයන් පිළිපැද තිබේද යන වග ;
(ii) අදාළ ස්ථානවලම කසල නිසියාකාරයෙන් බැහැර කර ඇත්ද යන්න ;
(iii) ගෙවතුවල අක්‍රමවත් ලෙස පොලිතීන්, පොල්කටු, ටයර්, ටින්, යෝගට් කෝප්ප හා වෙනත් කසල දමා ඇති ද යන්න ;
(iv) ජලය එක්රැස් වන පරිදි ටින්, යෝගට් කෝප්ප, ටයර් හෝ වෙනත් යමක් තැනින් තැන දමා ඇතිද යන්න.

(8) ඉහත පරීක්ෂාවන්හිදී පදිංචිකරුවන් විසින් අතුරු ව්‍යවස්ථාවේ පනවා ඇති කාර්යයන් පැහැර හැර ඇත්නම් මෙම අතුරු ව්‍යවස්ථාව උල්ලංඝනය කළ ලෙස සලකනු ලැබිය යුතු ය.

(9) මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ විධිවිධානයන් උල්ලංඝනය කරන සෑම තැනැත්තෙක්ම වරදක් සිදුකරන අතර, එම තැනැත්තා නිසි බලයක් ඇති අධිකරණයක් ඉදිරියේ වදරකරු කරනු ලැබීමෙන් පසු ප්‍රාදේශීය සභා පනතේ 122(2) වගන්තියෙන් දණ්ඩනයන්ට යටත් වන්නේ ය.

*I වැනි උපලේඛනය (I වැනි වගන්තිය)*

*අතුරු ව්‍යවස්ථාව බල පැවැත්වෙන බල ප්‍රදේශය*

(1)

(2)

(3)

(4)

*14 වැනි කොටස*

**කාණු පද්ධති**

01. ප්‍රාදේශීය සභාව විසින් මෙහි I වැනි උපලේඛනයෙහි දැක්වෙන දියුණු කළ ගම්මණ්ඩිවලට අයත් බල ප්‍රදේශය තුළ පවත්නා මාර්ග හා මංමාවත්වලට යාබද සියළුම පොදු ජලාපවහන කාණු පද්ධති පරීක්ෂා කිරීම, පාලනය කිරීම, නඩත්තු කිරීම සහ ඒ සම්බන්ධ විධිවිධාන යෙදීම පිළිබඳව වූ අතුරු ව්‍යවස්ථාවයි.

02. ඉහත I වැනි වගන්තියෙන් ප්‍රකාශිත බල ප්‍රදේශය තුළ ඉදිකර ඇති සියළුම පොදු කාණු පද්ධති සම්බන්ධයෙන් බල ප්‍රදේශයේ දේපළ හිමිකරුවන්, දේපළ පරිහරණය කරන්නන් සහ ව්‍යාපාරික හෝ සේවා කටයුතු සපයන්නන් සහ පදිංචිකරුවන් පහත සඳහන් විධිවිධාන සැලසිය යුතු ය :-

(i) පොදු කාණු පද්ධති සම්බන්ධ වන්නා වූ කිසිදු ජලාපවහන කාණුවක් හෝ වැසි ජලය මුදා හැරීමේ කාණුවක්, ප්‍රාදේශීය සභාවේ අවසරය රහිතව ඉදි නොකල යුතු ය ;

(ii) ඉහත I අතුරු වගන්තියේ අවසරය ලබා ගැනීම සඳහා ගොඩනැගිලි අයදුම්පත්‍රයක් ඉදිරිපත් කර සභාව විසින් කලින් කල නියම කර *රජයේ ගැසට් පත්‍රයෙහි* වාර්ෂිකව ප්‍රකාශ කර ඇති ගාස්තු ගෙවීමෙන් අවසර පත්‍රය ලබා ගත යුතු ය.

03. අපද්‍රව්‍ය මුදා හරින කාණු ඔස්සේ ගලා බසින අපජලය සෘජුව පොදු කාණු පද්ධතියට කිසිවිටෙකත් යොමු නොකළ යුතු ය. එම ජලය පොළවට උරා ගන්නා ආකාරයට වලවල් සකස් කර පිරිසිදු කිරීමෙන් අනතුරුව ප්‍රධාන වැසි ජල කාණු පද්ධතියට යොමු කළ යුතු ය.

04. කිසියම් ඉඩමකට හෝ ඉඩමක පිහිටා ඇති ගොඩනැගිල්ලකට පතිතවන වර්ෂා ජලය හැර වෙනත් කිසියම් ආකාරයකින් එකී ඉඩමේ හෝ ඉඩමේ පිහිටා ඇති ගොඩනැගිල්ලේ හෝ පරිශ්‍රය තුළ පාවිච්චියෙන් පසු බැහැරලන අපජලය අපද්‍රව්‍ය උරා ගන්නා වලකට ගලා යාමට සැලැස්විය යුතු අතර, ප්‍රාදේශීය සභාව සතු මාර්ගයකට හෝ මාර්ගය ඔස්සේ ඇති කාණුවකට බැහැර කිරීම නොකළ යුතු ය.

05. එමෙන්ම එකී ජලය උරා ගන්නා වල වාතයට නිරාවරණය කර නොතිබිය යුතු ය. ආසන්නයේ ඇති පොදු ජල මාර්ගයක සිට හෝ ඉදිකර ඇති ලිඳක සිට මීටර් 15කට නොඅඩු දුරකින් පිහිටා තිබිය යුතු ය. තවද, කවර හෝ කර්මාන්ත ශාලාවක පාවිච්චියෙන් පසු බැහැර කරනු ලබන අපජලය කවර හෝ අවස්ථාවක පොදු ජල මාර්ගයකට හෝ වැසි ජල කාණු පද්ධතියට මුදා හැරීම නොකළ යුතු ය.

06. ඉදිකරනු ලබන කාණු පොදු කාණු පද්ධතියට සම්බන්ධ කිරීමේදී විධිවත් බෑවුමක් සහිතව සුදුසු පරිදි කොන්ක්‍රීට් කාණු හෝ කොන්ක්‍රීට් නල යෙදීමෙන් සම්බන්ධ කළ යුතු ය.

07. කාණු පද්ධතියට පහත දැක්වෙන ද්‍රව්‍ය එක් නොකළ යුතු වේ :-

(i) මල අපද්‍රව්‍ය ;
(ii) කැළි කසල ;
(iii) ජෛවාහන අපද්‍රව්‍ය ;
(iv) පොලිතීන් ;
(v) ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය ;
(vi) වීදුරු ;
(vii) නිෂ්පාදනය සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය.

මෙම අපද්‍රව්‍ය වැසි ජල කාණු පද්ධතියට බැහැර කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් වන්නේ ය.

08. තවද, එකී කාණු පද්ධතිය පිහිටා ඇති ස්ථානය මත මෝටර් වාහන නතර කිරීමට අවසර දී ඇත්නම් මිස එකී වාහන කාණු පද්ධතියේ යම් කොටසක් මත කවර හේතුවක් නිසාවත් නතර කර තැබීම නොකළ යුතු ය

09. කාණු පද්ධති ආශ්‍රිතව සතුන් බැඳීමෙන්, ගාල් කිරීමෙන් වැළකිය යුතු ය.

10. කාණුවලට අවහිර වන පරිදි ගොඩනැගිලි ද්‍රව්‍ය රැස් කර තිබීම නොකළ යුතු ය.

11. ප්‍රාදේශීය සභාව මගින් ඉදිකරන ලද කිසිදු කාණුවක් මත තාවකාලික හෝ ස්ථිර ගොඩනැගිලි හෝ වෙනයම් ඉදිකිරීමක් නොකළ යුතු ය.

12. මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන උල්ලංඝනය කරන කවර වුව ද තැනැත්තෙක් වරදක් කරන අතර, එසේ කරන ලද ක්‍රියාව හෝ කාර්යය සභාව විසින් කඩා බිඳ දැමීමට, වෙනස් කිරීමට, නැවත සෑදීමට හෝ ප්‍රාදේශීය සභාව සුදුසු යැයි සිතිය හැකි අයුරින් ඒ සම්බන්ධව අන්‍යාකාරයෙන් ක්‍රියා කිරීමට සැලැස්විය හැකිය. තව ද, ප්‍රාදේශීය සභාව විසින් ඒ සඳහා දරණ ලද සියළු වියදම් වරදට වරදකරු කරනු ලැබූ තැනැත්තා විසින් ගෙවිය යුතු ය.

13. මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් කවර හෝ විධිවිධානයක් උල්ලංඝනය කරන සෑම තැනැත්තෙක්ම වරදක් සිදු කරන අතර, එම තැනැත්තා නිසි බලයක් ඇති අධිකරණයක් ඉදිරියේ වරදකරු කරනු ලැබීමෙන් පසු රු. 750කට නොවැඩි දඩයකට යටත් විය යුතු අතර, එම වරද ඉන්පසුව ද දිගින් දිගටම කරගෙන යන විටක එසේ කරනු ලබන සෑම දිනයකටම රු. 250 බැගින් වූ අතිරේක දඩයකට යටත් විය යුතු ය.

## I වැනි උපලේඛනය (1 වැනි වගන්තිය)

### අතුරු ව්‍යවස්ථා බල පවත්වන දියුණු කළ ගම්මණ්ඩි ප්‍රදේශ

1.

2.

3.

4.

5.

6.

7.

8.

9.

10.

## 15 වැනි කොටස

### පොදු හෝ පෞද්ගලික වෙළඳපළවල්

1. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පොදු හෝ පෞද්ගලික වෙළඳපොලවල් පිහිටුවීම, නඩත්තු කිරීම, පරිපාලනය, කඩපිල්, වෙළඳ මැහි, ආසන හෝ ඉඩකඩ වෙන් කර දීම හෝ ගොඩනැගිලි හෝ පරිශ්‍රය හෝ ඉන් යම් කොටසක් භාවිතා කිරීම වෙනුවෙන් ගාස්තු හෝ කුලී නියම කිරීම හා අයකර ගැනීම, පෞද්ගලික වෙළඳපොළවල් සඳහා බලපත්‍ර ලබා දීම, බලපත්‍ර කොන්දේසි හා බලපත්‍ර ගාස්තු නියම කිරීම සහ ඉහත කී සියළුම කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාවයි.

2. ප්‍රාදේශීය සභාව විසින් ඉදි කර පවත්වාගෙන යනු ලබන කිසියම් පොදු වෙළඳපොළක් සම්බන්ධයෙන් මෙම අතුරු ව්‍යවස්ථාවේ පහත සඳහන් නියමයන් පිළිපැදීම ප්‍රාදේශීය සභාව විසින් කළ යුතු ය. එනම්, එකී පොදු වෙළඳපොළෙහි–

(i) ස්ථිර ගොඩනැගිලි සියල්ලම ගඩොලින්, සිමෙන්ති ගලින් හෝ කබුක් ගලින් තනා තිබිය යුතු අතර, බිත්තිවල උස අවම වශයෙන් පොළොව මට්ටමේ සිට මීටර් 03ක් උසින් යුක්ත විය යුතු ය ;

(ii) වහළය කිසියම් ස්ථිර ද්‍රව්‍යයකින් තනා නිම කර තිබිය යුතු ය ;

(iii) ඇතුළත කඩ කාමරවල වහළයට සිවිලිමක් සවි කර තිබිය යුතුවා මෙන්ම එකී සිවිලිම පොළොව මට්ටමේ සිට මීටර් 2.85ක් උසින් පිහිටා තිබිය යුතු ය ;

(iv) ගොඩනැගිල්ල ඇතුළත කඩ කාමරවල ඉදිරිපස අවම වශයෙන් මීටර් 2.5ක පළලින් යුතු කොරිඩෝරයකින් යුක්ත විය යුතුවා මෙන්ම සෑම කඩ කාමරයක්ම කොරිඩෝරයට සම්බන්ධ වන ස්ථානයේ අකුළන දොරකින් හෝ පළු වශයෙන් ගලවා විවෘත කළ හැකි දොරකින් යුක්ත විය යුතු ය ;

(v) කඩ කාමර සහිත ගොඩනැගිල්ලේ බිත්තිවල පිටත මායිමේ සහ කොරිඩෝව පිටත මායිමේ අවම වශයෙන් මීටර් එකක පළලින් විය යුතු වේදිකා බැම් සහ වැසි ජලය බැස යාමේ කාණු තනා තිබිය යුතු ය ;

(vi) ගොඩනැගිල්ලේ කඩකාමරවලින් යුතු කොටසෙන් බැහැරව තාවකාලික වෙළෙඳුන් සඳහා වෙළඳ මැහි තනා තිබිය හැකිය ;

(vii) ඇතුළත ඉදි කරනු ලබන සෑම වෙළඳ මැස්සක්ම ගඩොලින් හෝ සිමෙන්ති ගලින් හෝ කබුක් ගලින් ඉදිකළ බැම්මක් මත කොන්ක්‍රීට් තහඩුවකින් හෝ මළ නොබැඳෙන ලෝහ තහඩුවකින් නිම කළ තට්ටුවකින් යුක්ත විය යුතු ය. කෙසේ වුව ද කොන්ක්‍රීට් තහඩුවකින් තට්ටුව නිම කර ඇති විටක එකී තට්ටුව කපරාරු කර සිමෙන්තියෙන් ඔප දමා හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය. ඒ ආකාරයෙන් වෙළඳ මැහි තැනීමට නොහැකි යම් අවස්ථාවක, පොළොව මත සමතලා ආකාරයෙන් වූ ඉඩ කොටස් තනා තිබිය යුතු අතර, එකී කොටස් ගඩොලින්, සිමෙන්ති ගලින් හෝ කබුක් ගලින් නිම කර සිමෙන්තියෙන් කපරාරු කර තිබිය යුතු අතර එක් එක් කොටස වෙන් කෙරෙන ඉරි සළකුණු සුදු පාටින් ලකුණු කර තිබිය යුතු ය ;

(viii) සෑම වෙළඳ මැස්සකම වර්ගඵලය අවම වශයෙන් වර්ග මීටර් 02ට නොඅඩු විය යුතු ය ;

(ix) සෑම වෙළඳ මැස්සක්ම ආවරණය වන සේ ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබුක් ගලෙන් හෝ ගැල්වනයිස් කළ යකඩ බටවලින් හෝ වැර ගැන්වූ ඇළුමිනියම් බට යෙදූ කණු මත අවම වශයෙන් පොළොව මට්ටමේ සිට මීටර් 2.25ක උසකින් යුක්ත වහළයක් තනා තිබිය යුතු අතර අගුව අවම වශයෙන් පොළොව මට්ටමේ සිට මීටර් 2.1ක උසකින් යුක්ත විය යුතු ය. එසේම එකී කණු ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබුක් ගලෙන් තනා ඇත්තේ නම් කපරාරු කර තීන්ත ආලේප කර තිබිය යුතු අතර, ගැල්වනයිස් කර යකඩයෙන් නිම කර ඇත්තේ නම් එකී කණුවල තීන්ත ආලේප කර තිබිය යුතු ය ;

(x) සෑම වහළයක්ම ස්ථිර ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු අතර, වැහි පීලි හා වැහි පීලිවල රැස්වන ජලය පහළට බැස යාමට ප්‍රමාණවත් බට සවි කර තිබිය යුතු ය ;

(xi) සෑම වෙළඳ මැස්සක් වටා පොළොවේ අවම වශයෙන් මීටර් එකක පළලින් යුක්ත වේදිකා බැම් තනා තිබිය යුතු අතර, වැසි ජලය ගලා යාමට ප්‍රමාණවත් කාණු තනා තිබිය යුතු ය ;

(xii) පාවිච්චියට ගන්නා ජලය මනුෂ්‍ය පරිභෝජනය සඳහා සුදුසු වන බවට ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ තත්ව සහතිකයක් ලබාගෙන තිබිය යුතුවාක් මෙන්ම අවම වශයෙන් සෑම මාස හයකට වරක් බැගින් මෙම තත්ත්ව සහතිකය ලබා ගත යුතු ය. ස්ථානයේ පාවිච්චිය සඳහා ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය යොදා ගන්නේ නම් එකී තත්ත්ව සහතික ලැබී ඇති සේ සලකනු ලැබිය යුතු ය ;

(xiii) ස්ථානයේ කාර්යයන්ට යොදා ගන්නා ජලය ගබඩාකර තබන්නේ නම් එසේ ගබඩාකර තබන ජලය අපවිත්‍ර වීමෙන් වළක්වා ගැනීමට ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන සලස්වා තිබිය යුතු ය ;

(xiv) ස්ත්‍රී හා පුරුෂ පක්ෂයට වෙන වෙනම වෙන් වූ වැසිකිලි හා කැසිකිලි ප්‍රමාණවත් සංඛ්‍යාවක් තනා තිබිය යුතු අතර, එකී සෑම වැසිකිලියකම බිම ද අවම වශයෙන් පොළොව මට්ටමේ සිට මීටර් 2ක් උසට බිත්තිවල ද පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය ;

(xv) සියලුම කඩකාමරවලට, වෙළඳ මැහි අසලට, වැසිකිලි හා කැසිකිලි තුළට හා කොරිඩෝව ඇතුළුව සියලුම පොදු කොටස් ඇතුළත ප්‍රමාණවත් විදුලි ආලෝකය සපයා දී තිබිය යුතු අතර, සෑම විදුලි පරිපථයක්ම විදුලි සන්නායක ද්‍රව්‍යයකින් තැනූ ආවරණයකින් ආවරණය කර තිබිය යුතු ය ;

(xvi) සෑම කඩ කාමරයකටම විදුලි මනුවක් බැගින් සවිකර තිබිය යුතු අතර පොදු ස්ථාන ආලෝකකරණය සඳහා වැය වන විදුලි ඒකක ගණන මැනීම සඳහා වෙනම මනුවක් සවි කර තිබිය යුතු ය ;

(xvii) පරිශ්‍රය ඇතුළත පොදු ජල කරාම සවිකර තිබිය යුතු ය ;

(xviii) එළවළු හෝ පළතුරු සේදීම සඳහා වෙනම ස්ථානයක් වෙන් කර තිබිය යුතු ය ;

(xix) වෙළඳාමේ ස්වභාවය අනුව ජලය පාවිච්චි කිරීම අවශ්‍ය කරන සෑම කඩ කාමරයකටම ජල සම්බන්ධතාවයක් බැගින් ලබා දී තිබිය යුතු ය. එකී එක් එක් ජල සම්බන්ධතාවය වෙනුවෙන් වෙන වෙනම වූ ජල මනුවක් බැගින් සවිකර තැබිය යුතු අතර පොදු ජල කරාමවල සහ එළවළු සහ පළතුරු සේදීම සඳහා වෙන් කළ ස්ථානයේ ජල පරිභෝජනය මැනීම සඳහා වෙනම ජල මනුවක් බැගින් සවිකර තිබිය යුතු ය ;

(xx) ඇතුළට එක එල්ලේ හා වහළය මතට පතිත වන වාර්ෂා ජලය, එළවළු හා පළතුරු සේදීම සඳහා වෙන් කළ ස්ථානයෙන් බැහැර කෙරෙන ජලය නිසි ආකාරයෙන් ගලා යාමට ප්‍රමාණවත් කාණු පද්ධතියක් තනා තිබිය යුතු අතර එකී අප ජලය බාධාවකින් තොරව ගලා යාමට සලස්වා තිබිය යුතු ය ;

(xxi) ඇතුළත ප්‍රමාණවත් ගිනි ආරක්ෂක වැඩ පිළිවෙලක් සකස් කර තිබිය යුතු අතර විදුලි බලය හේතුවෙන් ඇති වන ගිනි, ඉන්ධන මගින් ඇති වන ගිනි හා වෙනත් ආකාරයකින් ඇතිවන ගිනි මැඩ පැවැත්වීම සඳහා අවශ්‍ය කරන වෙන් වෙන් වූ වර්ගයේ ගිනි නිවීමේ උපකරණ සවි කර තිබිය යුතු ය ;

(xxii) පාරිභෝගිකයන් විසින් මිලදී ගනු ලබන ද්‍රව්‍යයන් වල බර කිරා තහවුරුකර ගැනීමට සම්මත පොදු තරාදියක් ඒ සඳහා වෙන් වූ සහ පැහැදිලිව පෙනෙන ස්ථානයක් තබා තිබිය යුතු ය ;

(xxiii) පොදු වෙළඳ පොළෙහි කඩ කාමරවල පිහිටීම සැලකිල්ලට ගනිමින් ප්‍රාදේශීය සභාව විසින් මස්, මාළු, එළවළු, පළතුරු, සිල්ලර බඩු හා වෙනත් වෙළෙඳ ද්‍රව්‍ය විකිණීම සඳහා වෙළෙඳ පොළ කොටස්වලට බෙදා වෙන් කිරීම ද ඒ ආකාරයෙන් ම වෙළඳ මැහි ද කොටස්වලට වෙන් කිරීමද ප්‍රාදේශීය සභාවේ කාර්යය විය යුතු ය ;

(xxiv) පරිශ්‍රය තුළ ජනනය වන අප ද්‍රව්‍ය-

(i) ජෛවභායන අපද්‍රව්‍ය ;
(ii) වීදුරු ;
(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය ;
(iv) පොලිතීන් හෝ ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය සහ රිජිෆෝම් ;
(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ සම්මිශ්‍රණ කොටස් ;
(vi) අන්තරායකර අපද්‍රව්‍ය.

වෙන වෙනම රැස්කළ හැකි බක්කි හෝ භාජන හෝ ටැංකි හෝ එකී පොදු වෙළෙඳ පොළෙහි වෙනම ස්ථානයක තනා තිබිය යුතු අතර ජෛවභායන අපද්‍රව්‍ය බහාලීම සඳහා තනනු ලැබූ බක්කිය හෝ භාජනය හෝ ටැංකි මීයන්ට, මැස්සන්ට, වෙනත් කෘමීන්ට හෝ කවර හෝ පක්ෂියෙකුට ඇතුළත් වීමට නොහැකි වන ආකාරයෙන් හොඳින් වසා තැබිය හැකි පියනක් සවිකර තිබිය යුතු ය.

(xxv) පා පැදි හා යතුරු පැදි නතර කර තැබීමට ස්ථානයක් සකස් කර තිබිය යුතු ය ;

(xxvi) වෙළඳ පොළට පැමිණෙන පාරිභෝගිකයින්ගේ සහා භාණ්ඩ ප්‍රවාහන වාහන නතර කර තැබීමට ප්‍රමාණවත් ඉඩකඩක් වෙන්කර තිබිය යුතු ය.

3. (i) පොදු වෙළඳ පොළෙහි ඇති කිසියම් කඩ කාමරයක බදුකරු හෝ කිසියම් වෙළඳ මැස්සක් පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට ටිකට් පතක් ලබාගෙන ඇති කිසියම් තැනැත්තෙකු හෝ වෙළඳාමේ නියුක්ත කඩ කාමරය හා ඒ අසල හෝ වෙලඳ මැස්ස මත හෝ ඒ අසල ජනනය වන සියලු අපද්‍රව්‍ය

(i) ජෛවභායන අපද්‍රව්‍ය ;
(ii) වීදුරු ;
(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය ;
(iv) පොලිතීන් හෝ ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය සහ රිජිෆෝම් ;
(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස් ;
(vi) අන්තරායකර ද්‍රව්‍ය

යන වර්ග යටතේ වර්ග කර ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට ප්‍රාදේශීය සභාව විසින් තනා ඇති වෙන් වෙන් වූ බක්කිවලට හෝ භාජනවලට හෝ ටැංකිවලට දැමීම එකී බදුකරුගේ හෝ එකී වෙළෙඳ මැස්සේ ටිකට් පතක් ලබාගෙන ඇති තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

(ii) පොදු වෙළඳ පොළට පැමිණෙන තැනැත්තන් විසින් බැහැර කරනු ලබන අපද්‍රව්‍ය බහාලීම සඳහා (i) ඡේදය යටතේ වර්ග කර බැහැරලීම පහසු කරවන කුඩා ප්‍රමාණයේ භාජන පොදු වෙළෙඳ පොළෙහි සුදුසු ස්ථානවල තැබීමට සැලැස්වීම සභාපති වරයාගේ විය යුතු අතර එකී භාජන ප්‍රමාණවත් කාලාන්තරයෙන් (i) ඡේදය සඳහන් අපද්‍රව්‍ය වලට අදාළ බක්කියට හෝ භාජනයට හෝ ටැංකියට දැමීමට සැලැස්විය යුතු ය ;

(iii) පොදු වෙළඳ පොළෙහි තබා ඇති අපද්‍රව්‍ය රැස්කරන කවර හෝ භාජනයක, බක්තියක හෝ ටැංකියක බහාලීමට වෙන් කළ වර්ගයේ අපද්‍රව්‍ය හැර වෙනත් වර්ගයක අපද්‍රව්‍ය එකී භාජනයට, බක්කියට හෝ ටැංකියට දැමීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය ;

(iv) 2 වැනි වගන්තියේ xxiv වැනි ඡේදයේ නියමයන් යටතේ ජෛවභායන අපද්‍රව්‍ය බහාලීම සඳහා තනා ඇති බක්කියට හෝ භාජනයට හෝ ටැංකියට අපද්‍රව්‍ය බහාලන අවස්ථාවේ හෝ අපද්‍රව්‍ය ඉන් පිටතට ගන්නා අවස්ථාවේදී හැර වෙනත් සෑම අවස්ථාවකදී ම එකී බක්කියේ හෝ භාජනයේ හෝ ටැංකියේ පියන හොඳින් වසා තැබීම කළ යුතු ය ;

4. (i) කවර හෝ පොදු වෙළෙඳ පොළක වෙළෙඳාම සඳහා වෙන් කළ ඉඩ ප්‍රමාණය යන්නෙන්,

(අ) කඩ කාමරයක් වන විට, එකී කඩ කාමරයේ පිටුපස බිත්තියේ සිට 2 වැනි වගන්තියේ (iv) වැනි ඡේදයේ සඳහන් දොර සවිකර ඇති සීමාව දක්වා කොටස ද ;

(ආ) වෙළඳ මැස්ස වන විට, එකී වෙළෙඳ මැස්සේ මතුපිට වර්ග ප්‍රමාණය සහ වෙළෙඳාමේ යෙදෙන තැනැත්තාට රැඳී සිටීමට ඉඩ දී තිබෙන එකී වෙළෙඳ මැස්ස පිටුපස භූමි ප්‍රමාණය ද,

අදහස් විය යුතු ය.

(ii) විකිණීම සඳහා පොදු වෙළෙඳ පොළ වෙත රැගෙන එනු ලබන කවර හෝ ද්‍රව්‍යයක් හෝ භාණ්ඩයක් හෝ වෙළෙඳාමක් සඳහා යොදාගන්නා කිසියම් උපකරණයක් හෝ වෙනත් යම් කවර හෝ දෙයක් එකී ද්‍රව්‍ය හෝ භාන්ඩ වෙළෙඳ පොළ තුළට රැගෙන එනු ලබන අවස්ථාවකදී හෝ ඉන් බැහැරට ගෙන යනු ලබන අවස්ථාවකදී හැර වෙනත් කවර හෝ අවස්ථාවකදී කිසියම් කොරිඩෝරයක හැර වේදිකා බැම්මක හෝ රඳවා තැබීම හෝ එසේ කිරීමට ඉඩ දීම හෝ නොකළ යුතු ය ;

(iii) පොදු වෙළඳ පොළ කවර හෝ කොරිඩෝවයක් මත හෝ වේදිකා බැම්මක් මත හෝ කවර හෝ ආකාරයක වෙළෙඳාමක් නොකළ යුතු අතර, එකී කොරිඩෝව හෝ වේදිකා බැම් මතින් ගමන් ගන්නා තැනැත්තන්ට බාධා වන කවර හෝ ක්‍රියාවක් නොකළ යුතු ය ;

5. පොදු වෙළඳපල ඇතුළත පිහිටි හෝටලයක්, බත් කඩයක්, ආපන ශාලාවක් හෝ තේ හෝ කෝපි කඩයක් නොවන වෙනත් කවර හෝ ස්ථානයක ඉවුම් පිහුම් කිරීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

6. ප්‍රාදේශීය සභාව සතු කිසියම් පොදු වෙළඳපලක-

(i) ඇතුළත අසංවරව හැසිරීම හෝ කලහෝලාහල කිරීම හෝ අසභ්‍ය වචන පාවිච්චි කිරීම හෝ හිඟමන් ඉල්ලීම ;

(ii) දෛනික කටයුතු අවසානයේ වෙළඳපොල වසා දැමීමෙන් අනතුරුව එහි පරිශ්‍රය ඇතුළත රැඳී සිටීම ;

(iii) කිසියම් ගොඩනැගිල්ලකට, ඉදිකිරීමකට සවි කිරීමකට හෝ අලංකරණය පිණිස වවා ඇති හෝ තබා ඇති කිසියම් මල් පඳුරකට හෝ නාම පුවරුවකට හෝ වෙනත් ද්‍රව්‍යකට හෝ හානි කිරීමට හෝ අලාභ කිරීම හෝ විකෘති කිරීම හෝ විරූපී කිරීම ;

(iv) පාවිච්චිය සඳහා සපයා ඇති ජලය අපිරිසිදු කිරීම හෝ අපතේ යැවීම හෝ අපතේ යාමට ඉඩ හැරීමට හෝ වෙනත් කිසියම් ආකාරයකින් නාස්ති කිරීම හෝ එකී ජලය ස්නානය කිරීම හෝ රෙදි හෝ සතුන් සේදීම හෝ එළවළු සහ පළතුරු සේදීමට වෙන් කළ ස්ථානයේ හැර වෙනත් යම් ස්ථානයක එළවළු හෝ පළතුරු සේදීම ;

(v) සභාපතිවරයා විසින් විධිමත් ආකාරයෙන් අවසරයක් දී ඇත්තේ නම් මිස, තම කඩ කාමරයේ නාම පුවරුව නොවන වෙනත් කවර හෝ ආකාරයක ප්‍රචාරක දැන්වීම් පුවරු සවිකිරීම, බැනර් ඇද තැබීම හෝ වෙනත් කවර හෝ ආකාරයක ප්‍රචාරක කාර්යය කිරීම ;

(vi) විදුලිය සම්බන්ධතාවය ලබා දී ඇති ප්‍රධාන යතුරු පුවරුව අසලට ලඟා වීමට බාධා කරන ආකාරයෙන් බඩු භාණ්ඩ තැබීම හෝ ප්‍රධාන යතුරු පුවරුවට හානි කිරීම ;

(vii) විදුලිය සම්බන්ධතාවය ලබා දීම සඳහා ගොඩනැගිල්ල තුළ ඇද ඇති ප්‍රධාන විදුලි රැහැනින් හෝ වෙනත් කිසියම් විදුලි රැහැනකින් වංචනිකව හෝ අනවසරයෙන් විදුලිය සම්බන්ධතා ලබා ගැනීම ;

(viii) ජල සම්බන්ධතාවය ලබා දීම සඳහා ගොඩනැගිල්ල තුළ රඳවා ඇති ප්‍රධාන ජල නළයෙන් හෝ වෙනත් කිසියම් ජල නළයකින් වංචනිකව හෝ අනවසරයෙන් ජල සම්බන්ධතාවයක් ලබා ගැනීම ;

(ix) ගොඩනැගිල්ලේ සවිකර ඇති ගිනි නිවීම් උපකරණ අසළට ලඟා වීමට බාධා කරන ආකාරයෙන් බඩු භාණ්ඩ තැබීම හෝ එම උපකරණවලට හානි කිරීම ;

(x) තත් කාර්ය සඳහා වෙන්කල ස්ථානයක හැර කවර හෝ වර්ගයක එලවළු, මස් හෝ මාළු විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ එසේ කිරීමට සැලැස්වීම ;

(xi) පරිශ්‍රය ඇතුළට පාපැදි හෝ යතුරුපැදි රැගෙන ඒම හෝ එසේ කිරීමට ඉඩ දීම ;

(xii) කිසියම් වෙළඳ ස්ථානයකින් ඉවත් කරනු ලබන අපද්‍රව්‍ය තුන්වන අතුරු ව්‍යවස්ථාවේ නියමයන්ට අනුකූල ප්‍රාදේශීය සභාව විසින් සපයා දී ඇති යම් බක්කියකට හෝ ටැංකියකට හැර පොදු වෙළඳපල ඇතුළත වෙනත් කවර හෝ ස්ථානයක දැමීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

7. (i) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙලෙන හෝ මෑතකදී එවැනි රෝගයකින් පෙලෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙලෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමේ යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාලසීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස, පොදු වෙළඳපොලෙහි කවර හෝ ආකාරයක වෙළඳාමෙහි හෝ එසේ වෙළඳාමේ නියුක්ත යම් තැනැත්තෙකුගේ සහයකයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කර වීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩ දීම හෝ නොකළ යුතු ය.

(ii) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් ඇඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් පොදු වෙළඳපොලෙහි කවර හෝ ආකාරයක වෙළඳාමක නියුක්තවීම හෝ නියුක්තවීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

8. පොදු වෙළඳපොලෙහි කිසියම් කඩ කාමරයක් හෝ වෙළඳ මැස්සක් පාවිච්චි කරන හෝ පරිහරණය කරනු ලබන සෑම තැනැත්තෙක්ම දෛනික කටයුතු ආරම්භයේ සහ අවසානයේ දී අවශ්‍ය වන්නේ නම්, ඒ අතර තුර අවස්ථා එකකදී හෝ ඊට වැඩි වාර ගණනකදී එකී කඩ කාමරය ඇතුළත සහ එහි ඉදිරිපස කොරිඩෝරය හා වේදිකා බැම්ම නැතහොත් වෙළඳ මැස්ස මත සහ ඒ අවට ද අතුගා පිරිසිදු කිරීම සහ එසේ අතුගෑමෙන් පසු එකතුවන අපද්‍රව්‍ය තුන්වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට ප්‍රාදේශීය සභාව විසින් සපයා ඇති බක්කියට හෝ ටැංකියට දැමීම හෝ දැමීමට සැලැස්වීම සෑම කඩ කාමරයකම බදුකරුගේ සහ වෙළඳ මැස්සකම පාවිච්චි කරන හෝ පරිහරණය කරන තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

9. පොදු වෙළඳපොලෙහි එළවළු, පළතුරු, මස්, මාළු හෝ වෙනත් ආහාර හෝ පාන වර්ග විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කරනු ලබන සෑම කඩ කාමරයක්ම හා වෙළඳ මැස්සක්ම සහ සෑම හෝටලයක්, බත් කඩයක්, ආපන ශාලාවක් ද ඇතුළුව සෑම තේ හෝ කෝපි කඩයක්ම දෛනික කටයුතු අවසානයේ එකී වෙළඳ ස්ථානයේ විකිණීම සඳහා ද්‍රව්‍ය ප්‍රදර්ශනය කරනු ලබන සෑම කඩකාමරයක්ම, මේසයක්ම, බංකුවක්ම, භාණ්ඩ තබන ලෑල්ලක්, අල්මාරියක්ම අවස්ථානෝචිත පරිදි සෝදා හෝ සූරා පිරිසිදු කිරීම හෝ එසේ කිරීමට සැලැස්වීම එකී යම් ස්ථානයක වෙළඳ කාර්යයේ නියුක්ත වන තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

10. කවර හෝ පොදු වෙළඳපලක කිසියම් කඩා කාමරයක් හෝ යම් වෙළඳ මැස්සක වෙන්කර දී ඇත්තේ කිනම් වර්ගයක භාණ්ඩ හෝ ද්‍රව්‍ය වෙළෙඳාමක් සඳහා ද, එසේ වෙන් කරන ලද වර්ගයේ භාණ්ඩ හෝ ද්‍රව්‍ය හැර වෙනත් කවර හෝ ආකාරයක භාණ්ඩ හෝ ද්‍රව්‍ය විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

11. පොදු වෙළඳ පොලොහි කඩ කාමර වලින් බැහැරව ඉදිකරනු ලැබූ කිසියම් වෙළෙඳ මැස්සක දෛනික කටයුතු අවසානයේ කිසිදු භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයක් හෝ අප ද්‍රව්‍ය රඳවා තැබීම කවර හෝ තැනැත්තකු විසින් නොකළ යුතු ය.

12. ගෝ ඝාතක ආඥාපනතේ නියමයන් යටතේ විධිමත් බලපත්‍රයක් ලබා ඇති ගෝ ඝාතාකාගාරයක දී මරනු ලැබූ කිසියම් සතෙකුගේ මස් වන්නේ නම් මිස, පොදු වෙළෙඳ පොළෙහි මස් වෙළඳ ස්ථානයක අලෙවි කිරීම සඳහා හෝ අලෙවි කිරීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ ගබඩා කිරීම කවර හෝ තැනැත්තකු විසින් නොකළ යුතු ය.

13. කවර හෝ ගෝ ඝාතකාගාරයක් කිසියම් දිනයකදී මස් පිණිස සතුන් මැරීම තහනම් කරමින් ගෝ ඝාතක ආඥාපනතේ 17 වැනි වගන්තියේ බලතල ප්‍රකාර නිසි අධිකාරිය විසින් නියමයන් *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති අවස්ථාවක, පොදු වෙළඳපොළ ඇතුළත පවත්වාගෙන යනු ලබන කවර හෝ මස් කඩයක වෙළෙඳාම් පිණිස මස් ප්‍රදර්ශනය කිරීම හෝ ගබඩා කිරීම නොකළ යුතු ය.

14. කවර හෝ නැතැත්තෙකු විසින් පොදු වෙළඳ පොළ පරිශ්‍රය ඇතුළට සුනඛයෙකු හෝ බළලෙකු හෝ වෙනත් කවර හෝ සතෙකු හෝ පක්ෂියෙකු රැගෙන ඒම හෝ රැගෙන ඒමට ඉඩදීම හෝ නොකළ යුතුය. මේ නියමය කිසියම් පරීක්ෂණ කාර්යයන් සඳහා යම් පොලිස් නිලධාරියෙකු විසින් පොලිස් නිල සුනඛයෙකු පොදු වෙළෙඳ පොළ ඇතුළත රැගෙන එනු ලැබීම වළක්වන නියමයන් ලෙස තේරුම් නොගත යුතු ය.

15. පොදු වෙළඳ පොළෙහි වෙළෙඳාම් අවසන් කර පොදු වෙළඳපොළ සම්පූර්ණයෙන්ම වසා තබන අවස්ථාවක සහ පොදු වෙළෙඳපොළෙහි කිසියම් කඩ කාමරයක් වසා දමා බැහැරට යන සෑම අවස්ථාවක දී ම එකී කඩ කාරමයේ සියළු විදුලි පහන්, විදුලි පංකා සහ වෙනත් විදුලි උපකරණ අක්‍රීය කර දැමිය යුතු අතර, දල්වා තිබෙන කිසියම් ගිනි හෝ පොල්තෙල් පහන් නිවා දැමීමට සැලැස්වීම බදුකරුගේ කාර්යය වන්නේ ය. එසේ වුව ද ආහාර හෝ පාන වර්ග කල් තබා ගැනීමට පාවිච්චි කරන ශීතකරණ හෝ අධි ශීතකරණ මේ යටතට ඇතුළත් නොවිය යුතු ය. එසේම තවදුරටත් පොදු වෙළඳපොළෙහි ආරක්ෂාවට තර්ජනයක් විය හැකි කවර හෝ ආකාරයේ ගිනි දැල්ලක් දැල්වීම හෝ දැල්වීමට සැලැස්වීම හෝ පොදු වෙළඳපොල පරිශ්‍රය ඇතුළත කවර හෝ ස්ථානයක රතිඤ්ඤා දැල්වීම හෝ දැල්වීමට සැලැස්වීම හෝ කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

16. කිසියම් පොදු වෙළෙඳ පොළකින් බැහැර ස්ථානයක තිබෙන කවර හෝ අපද්‍රව්‍යක් එකී පොදු වෙළෙඳ පොළෙහි ජනනය වන අප ද්‍රව්‍ය බහාලීමට තනා ඇති කිසියම් බක්කියකට, භාජනයකට හෝ ටැංකියකට දැමීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

17. පොදු වෙළෙඳ පොළෙහි ඇති සෑම වැසිකිළියක් හා කැසිකිළියක්ම අවම වශයෙන් දිනකට තුන් වාතවක් බැගින් විෂබීජ නාශක යොද සෝදා හැරීමෙන් පිරිසිදු කිරීමටත්, ජලය ගලා යාමට ඉදිකර ඇති සෑම කාණුවක්ම අවම වශයෙන් දිනකට දෙවතාවක් බැගින් සෝදා පිරිසිදු කිරීමට සැලැස්වීම සභාපති වරයාගේ කාර්යය විය යුතු ය.

18. 2 වැනි වගන්තියේ xxiv වැනි ඡේදයේ නියමකර ඇති ආකාරයෙන් තනා ඇති සෑම බක්කියක, භාජනයක, හෝ ටැංකියක ම රැස්කරනු ලබන අපද්‍රව්‍ය, අවම වශයෙන් දිනකට එක් වතාවක් හෝ අවශ්‍ය වන්නේ නම් ඊට වැඩි වාර ගණනකින් එකී ස්ථානයෙන් ඉවත් කිරීමට සැලැස්වීම සභාපතිවරයාගේ කාර්යය විය යුත්තේ ය. එසේම එකී අපද්‍රව්‍ය එකී ස්ථානයෙන් ඉවත් කිරීමේ දී අප ද්‍රව්‍ය පැට වූ කොටස සම්පූර්ණයෙන්ම ආවරණය කළ වාහනයකින් ප්‍රවාහනය කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

19. එළවළු හෝ පළතුරු සේදීම සඳහා වෙන්කළ ස්ථානයේ රැස්වන පස් හෝ වැලි හෝ වෙනත් ද්‍රව්‍ය අවම වශයෙන් දිනකට එක් වතාවක් බැගින් ඉවත් කිරීමටත් එම ස්ථානයේ ජලය ගලායාමට ඇති වන බාධා වැළැක්වීමට අවශ්‍ය විධිවිධාන සැලැස්වීමත් සභාපති වරයාගේ කාර්යය විය යුතු ය.

20. පොදු වෙළෙඳපොළෙහි සවිකර කර ඇති ගිනි නිවීම් උපකරණවල ක්‍රියාකාරිත්වය නිසි පරිදි පවතින්නේ ද යන්න අවම වශයෙන් හය මසකට එක් වතාවක් බැගින් පරීක්ෂා කරවා ගැනීමත් අක්‍රිය වූ ගිනි නිවීමේ උපකරණ වෙනුවට අලුත් උපකරණ සවිකිරීමටත් සැලැස්වීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

21. පොදු වෙළඳ පොළෙහි -

(අ) කඩ කාමරවල ඇතුළත බිත්ති හැර සෙසු බිත්ති, සෑම වෙළෙඳ මැස්සකම සිමෙන්තියෙන් කපරාරු කළ කොටස්, ගැල්වනයිස් කළ යකඩයෙන් නිම කර ඉදිකිරීම් සහ කඩ කාමරවල ඇතුළත සීලිම හැර සීලීමේ සෙසු කොටස් අවම වශයෙන් වර්ෂයකට එක් වරක් බැගින් තීන්ත ආලේප කිරීමට සැලැස්වීම සභාපති වරයාගේ කාර්යය විය යුතු ය.

(ආ) කඩ කාමරවල ඇතුළත බිත්ති හැර සෙසු බිත්ති, කඩ කාමර ඇතුළත ගැල්වනයිස් කළ යකඩයෙන් නිම කර ඇති ඉදිකිරීම් සහ කඩ කාමර ඇතුළත සීලිම අවම වශයෙන් වර්ෂයකට එක් වරක් තීන්ත ආලේප කිරීම එකී කඩ කාමරයේ බදුකරුගේ කාර්යය විය යුතු ය.

22. පොදු වෙළෙඳ පොළෙහි කිසියම් වෙළෙඳ මැස්සක් පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට 27 වැනි වගන්තිය යටතේ ටිකට් පතක් ලබාගෙන ඇති කවර හෝ තැනැත්තෙකු විසින් එකී ටිකට් පත අන් සතු කිරීම හෝ එකී ටිකට් පත නිකුත් කරනු ලැබ ඇත්තේ කිනම් වෙළෙඳ මැස්සක් සඳහා ද එකී වෙළෙඳ මැස්ස නොවන වෙනත් කිසියම් ස්ථානයක වෙළෙඳාම් කිරීම හෝ නොකළ යුතු අතර කවර හෝ තැනැත්තෙකු එසේ ක්‍රියාකර තිබෙන බවට සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා සෑහීමට පත් වී ඇති අවස්ථාවක ඔහු නියමිත ස්ථානයේ වෙළෙඳාම් සඳහා යොමු කිරීමට නැතහොත් එකී දිනයේ වෙළෙඳාම් කටයුතුවලින් වළක්වා පොදු වෙළෙඳ පොළෙන් ඉවත් කිරීම හෝ ඔහු වෙත නිකුත් කරනු ලැබූ ටිකට් පත අවලංගු කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියාට බලය තිබිය යුතු ය.

23. කිසියම් පොදු වෙළඳපොළක කඩ කාමරයක් බද්දට ගෙන ඇති කවර හෝ තැනැත්තකු විසින් හෝ කිසියම් වෙළෙඳ මැස්සක් පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට ටිකට් පතක් ලබාගෙන ඇති කවර හෝ තැනැත්තෙකු විසින් තමාගේ වෙළෙඳ කාර්යය සඳහා වෙන්කර ගත් එකී කඩ කාමරයේ හෝ වෙළෙඳ මැස්සේ ඉඩකඩ නැතහොත් ඉන් කිසියම් කොටසක්, කවර හෝ භාණ්ඩ හෝ ද්‍රව්‍ය වෙළෙඳාම් කිරීමට හෝ වෙළෙඳාම් කිරීම සඳහා ප්‍රදර්ශනය කිරීමට හෝ වෙනත් කවර හෝ කාර්යයකට වෙනත් තැනැත්තෙකුට ඉඩ දීම නොකළ යුතු ය.

24. ප්‍රාදේශීය සභාව විසින් කලින් තීරණය කර ගත් කාර්යය සඳහා බලය දී ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් පොදු වෙළෙඳ පොළෙහි කිසියම් කඩ කාමරයක නිර්මිත සැලැස්ම වෙනස් කරන හෝ එකී සැලැස්මට හානි කරන හෝ ආකාරයේ කිසිදු ඉදිකිරීමක් හෝ සවි කිරීමක් හෝ වෙනස් කිරීමක් හෝ කොටු කිරීමක් නොකළ යුතු ය.

25. ප්‍රාදේශීය සභාව විසින් කලින් තීරණය කර ගත් කාර්යය සඳහා බලය දී ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් පොදු වෙළෙඳ පොළෙහි කිසියම් කඩ කාමරයක නිර්මිත සැලැස්ම වෙනස් කරන හෝ එකී සැලැස්මට හානි කරන හෝ ආකාරයේ කිසිදු ඉදිකිරීමක් හෝ සවි කිරිමක් හෝ වෙනස් කිරීමක් කිරීම සහ පොදු වෙළෙඳ පොළ ඇතුළත කවර හෝ ස්ථානයක වෙළෙඳ මැස්සක් ඉදිකිරීම හෝ තහඩු කිරීමක් නොකළ යුතු ය.

26. ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන කිසියම් පොදු වෙළෙඳ පොළක් විවෘතව තැබිය යුතු දිනයන් හා වේලාවන් කලින් කල ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලැබිය හැකිය. ප්‍රාදේශීය සභාව විසින් එසේ තීරණය කරනු ලැබූ ආකාරයට පොදු වෙළඳ පොළ විවෘතව තබන දිනයන් සහ වේලාවන් කවරේද යන්න භාෂාත්‍රයෙන්ම වූ දැන්වීමක් හෝ දැන්වීම් ප්‍රකටව පෙනෙන ආකාරයෙන් පොදු වෙළඳ පොළට ඇතුලුවීමේ දොරටුව අසල ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම සභාපති වරයාගේ කාර්යය විය යුතු ය.

27. (i) පොදු වෙළෙඳපොළෙහි කඩ කාමරවලින් බැහැර කොටසේ තනා ඇති කිසියම් වෙළෙඳ මැස්සක් පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම අවශ්‍ය කරන සෑම තැනැත්තෙකු ම මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ ප්‍රාදේශීය සභාවේ අධිකාරය මත හෝ ඒ යටතේ නිකුත් කළ වලංගු ටිකට් පතක් ලබා ගත යුතු ය.

(ii) (i) ඡේදයේ නියමය යටතේ නිකුත් කරනු ලබන ටිකට් පත මෙහි පළමුවැනි උපලේඛනයේ සඳහන් ආකෘතියට සාරානුකූලව පිළියෙල කරගත යුතු ය.

28. 27 වැනි වගන්තියෙහි නියමය යටතේ නිකුත් කරනු ලැබූ වලංගු ටිකට් පතක් දරන්නෙකු හෝ ඔහුගේ සේවකයෙකු හෝ අනුයෝජිතයෙකු හෝ වන්නේ නම් හා මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන්ට හා කොන්දේසි වලට අනුකූල වන්නේ නම් මිස පොදු වෙළෙඳ පොළෙහි ගොඩනැගිල්ලේ කඩ කාමරවලින් යුතු කොටසෙන් බැහැරව තනා ඇති වෙළෙඳ මැස්සක් පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම නොකළ යුතු ය.

29. 27 වැනි වගන්තියෙහි නියමය යටතේ පොදු වෙළෙඳ පොළෙහි ගොඩනැගිල්ලේ කඩ කාමර වලින් යුතු කොටසෙන් බැහැරව තනා ඇති වෙළෙඳ මැහි සඳහා ගෙවිය යුතු ගාස්තු ප්‍රාදේශීය සභාව විසින් කලින් කළ තීරණය කරනු ලබන ආකාරයට නියම කළ හැකිය. ඒ ආකාරයටම එකී ගාස්තු ප්‍රමාණයන් ප්‍රාදේශීය සභාව විසින් කලින් කළ වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම ද කරනු ලැබිය හැකිය.

30. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් යටතේ ප්‍රාදේශීය සභාව සමඟ අත්සන් කළ බදු ගිවිසුකමකට එළැඹ ඇති තැනැත්තෙකු හෝ ඔහුගේ සේවකයෙකු හෝ අනුයෝජිතයකු හෝ වන්නේ නම් සහ මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල සහ එකී බදු ගිවිසුමේ සඳහන් නියමයන්ට හා කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස කවර හෝ කඩ කාමරයක් පාවිච්චි කිරීම හෝ පරිහරණය කරනු නොලැබිය යුතු ය.

31 (i) පොදු වෙළෙඳ පොළෙහි ගොඩනැගිල්ලේ මස් කඩයක් නොවන කිසියම් කඩ කාමරයක් පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට බදුකරුවෙකු තෝරා එකී කඩ කාමරය තෝරා ගනු ලැබූ බදුකරුට බද්දට දීමේ කාර්යය ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවීම මඟින් සිදු කිරීම ප්‍රාදේශීය සභාවේ කාර්යය විය යුතු ය ;

(ii) ඉහත I ඡේදය යටතේ කිසියම් කඩ කාමරයක් බද්දට දීම සඳහා ටෙන්ඩර් කැඳවීමේ දී එකී කඩ කාමරය සඳහා ගෙවිය යුතු මාසික බදු කුලිය, තීරණය කිරීම, ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුවට අනුව විය යුතු ය ;

(iii) ඉහත I ඡේදය යටතේ බදුකරුවෙකු තෝරා ගැනීමට ටෙන්ඩර් කැඳවිය යුතු අවස්ථා වශයෙන් -

(අ) බදුකරු විසින් ස්වකීය කැමැත්තෙන්ම බදු ගිවිසුම අවලංගු කරවා ගනු ලැබ ඇති අවස්ථාවක් ; හෝ

(ආ) මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් කඩ කිරීම හෝ බදු ගිවිසුමේ කොන්දේසි කඩ කිරීම හේතුවෙන් බදු ගිවිසුම අවලංගු කර ඇති හෝ අවලංගු වී ඇතැයි සැලකෙන අවස්ථාවක් ; හෝ

(ඇ) කිසියම් බදුකරුවෙකුගේ කලත්‍රයා හෝ දරුවෙකු නොමැතිව සිටියදී බදුකරු මිය ගිය අවස්ථාව ; හෝ

(ඈ) අලුතින් පොදු වෙළඳසැලක් සභාව විසින් ඉදිකර ඇති අවස්ථාව.

සැළකිය යුතු අතර 35 වැනි වගන්තියෙහි සඳහන් නියමය පරිදි කිසියම් බදුකරුවෙකු විසින් යම් ඉදිරි වර්ෂයක් සඳහා එකී බදු ගිවිසුම වලංගු කරවා ගනු ලැබීම ප්‍රතික්ෂේප කර ඇත්තේ නම් හෝ එකී වලංගු කරවා ගැනීම උවමනාවෙන් මඟහැර සිටින්නේ නම් මිස ප්‍රාදේශීය සභාව සහ එකී බදුකරු එකඟ වී අත්සන් කරනු ලැබූ බදු ගිවිසුම අවලංගු වී ඇති සේ සැළකිය යුතු ය.

32. 31 වැනි වගන්තියෙහි නියමයන් යටතේ ටෙන්ඩර් කැඳවීම මඟින් කිසියම් කඩ කාරමයක් පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම සඳහා තෝරා ගනු ලැබූ බදුකරු ප්‍රාදේශීය සභාව සමඟ ගිවිසුමකට ඇතුළත් විය යුතු ය.

33. 31 වැනි අතුරු ව්‍යවස්ථාවේ කුමක් සඳහන්ව තිබුනේ වුව ද මේ කොටසේ අතුරු ව්‍යවස්ථා බලාත්මක වන විට ප්‍රාදේශීය සභාව සතුව තිබෙන කිසියම් පොදු වෙළෙඳ පොළක එක් එක් කඩ කාමරය සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව සමඟ අවසන් වරට අත්සන් කරන ලද බදු ගිවිසුමේ සඳහන් බදුකරු එකී බලාත්මක දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි 31 වැනි අතුරු

ව්‍යවස්ථාව යටතේ එකී කඩ කාමරය පාවිච්චි කිරිමට හෝ පරිහරණය කිරිමට තෝරා ගනු ලැබූ බදුකරු වශයෙන් සැලකීම නීත්‍යානුකූල වන්නේ ය. එසේම තව දුරටත් මේ අතුරු ව්‍යවස්ථාව අදාළ වන කවර හෝ බදුකරුවෙකු මේ කොටසේ අතුරු ව්‍යවස්ථා බලාත්මක වන දිනයේ සිට මාස 03ක කාලයක් ඇතුළත 32 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයට අනුව නව බදු ගිවිසුමකට ඇතුළත් විය යුතු ය.

34. (i) 32 වැනි සහ 33 වැනි අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ, ප්‍රාදේශීය සභාව සමඟ අත්සන් කරනු ලැබූ යම් ගිවිසුමක් එක් වර්ෂයක කාලයක් සඳහා පමණක් වලංගු විය යුතු අතර එකී වර්ෂයක කාලය අවසන් වීමට මාසයකට පෙර ඉදිරි වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව සමඟ අලුත් ගිවිසුමකට එළඹීමෙන් පසුව තවත් එක් වර්ෂයකට කාලයක් සඳහා එකී කඩ කාමරයේ බදු කාලය වලංගු කරවා ගනු ලැබිය හැකි ය. ඒ ආකාරයෙන්ම යම් අනුගාමී වර්ෂයක් සඳහා එකී කඩ කාමරයේ බදු කාලය වාර්ෂිකව වලංගු කරවා ගෙන එකී කඩ කාමරය පාවිච්චි කිරිමට හෝ පරිහරණය කිරීමට එකී බදුකරුට හිමිකම තිබිය යුතු ය ;

(ii) කෙසේ වුවද ඉහත I ඡේදය යටතේ කිසියම් බදුකරුවකු විසින් අනුගාමී වර්ෂය සඳහා බදු කාලය වලංගු කරවා ගෙන එකී කඩ කාමරය පාවිච්චි කරන හෝ පරිහරණය කිරීම සඳහා එකී අනුගාමී වර්ෂය තුළ ගෙවිය යුතු මාසික බදු කුලිය ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව හෝ පළාත් පාලන සේවයේ තක්සේරු කරුවෙකුගේ තක්සේරුව අනුව තීරණය කිරීම සභාපතිවරයාගේ කාර්ය විය යුතු ය ;

(iii) යටත් පිරිසෙයින් පස් වසරකට වරක් හෝ සභාව තීරණය කරන පස් වසරකට අඩුවන කාලයකට වරක් තස්කේරු බදු මුදල රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත සංශෝධනය කළ යුතු ය.

35. කිසියම් කඩ කාමරයක බදු කාලය අවසන් වන දින සිට එක් මාසයක කාලයක් ගතවීමට මත්තෙන් 34 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඉදිරි වර්ෂය සඳහා බදු කාලය වලංගු කරවා ගෙන ඇත්තේ නම් මිස කවර හෝ බදු කරුවෙකුට, පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට දී ඇති එකී කඩ කාමරය එකී මාසය අවසන් වන දිනෙක් පසුව පාවිච්චි කිරිමට හෝ පරිහරණය කිරීමට හිමිකමක් නොතිබිය යුතු ය.

36. පොදු වෙළඳපොළෙහි කිසියම් කඩ කාමරයක් අතුරු බදු ගැනීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය. කිසියම් තැනැත්තෙකු විසින් කිසියම් කඩ කාමරයක් අතුරු බදු ගනු ලැබීම හේතුවෙන් එකී කඩ කාමරය බදුකරු සමඟ ප්‍රාදේශීය සභාව එළැඹ ඇති ගිවිසුම අවලංගු කිරීම හේතුවෙන් එකී කඩ කාමරය ආපසු ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම හේතුවෙන් එකී අතුරු බදුකරුට සිදුවන කිසියම් අලාභයක් හෝ හානියක් හෝ පාඩුවක් එකී අතුරු බදුකරු වෙතම පැවරෙන අතර ප්‍රාදේශීය සභාව හෝ සභාපතිවරයා හෝ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියා හෝ ඒ පිළිබඳ වගකීම ට යටත් නොවනු ඇත.

37. ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන කිසියම් පොදු වෙළඳ පොළක යම් කඩ කාමරයක බදුකරු විසින් එකී කඩ කාමරය අතුරු බදු දීම හෝ කුලියට දීම හෝ නොකළ යුතු අතර යම් බදුකරුවකු විසින් එකී කඩ කාමරය අතුරු බදුදීමකට හෝ කුලියට දීමකට ලක් කර ඇති බවට හෝ මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් හෝ එකී කඩ කාමරය බදු දීමට අදාළ බදු ගිවිසුමේ සඳහන් නියමයන් හෝ කඩකර ඇති බවට සෑහීමට පත්වන තරම් ප්‍රමාණවත් කරුණු ඇතැයි සභාපති වරයාගේ මතය වන විට අදාළ බදුකරු ඒ පිළිබඳව ලිඛිතව කරුණු දක්වමින් එකී අතුරු බදු දීම හෝ කුලියට දීම අවසන් කරන ලෙස දන්වා යැවීමේ සභාපති වරයාගේ කාර්යය වන්නේ ය.

38. 37 වැනි වගන්තියෙහි සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ තැනැත්කෙතු විසින් එකී දැන්වීමේ සඳහන් කරුණුවලට එරෙහිව යම් විරෝධතාවයක් හෝ විරෝධතා ඉදිරිපත් කිරීමට තමා වෙත කරුණු ඇත්නම් එකී දැන්වීමේදින සිට දින 14ක කාලයක් ඇතුළත, එකී විරෝධතාවය හෝ විරෝධතා පිළිබඳ තමාට ඉදිරිපත් කිරීමට ඇති කරුණු ලිඛිතව සඳහන් කරමින් සභාපතිවරයාට අභියාචනයක් ඉදිරිපත් කිරීම සඳහා බදුකරුට හිමිකම ඇත්තේ ය. එසේම එකී බදුකරු විසින් ලිඛිතව ඉදිරිපත් කරනු ලැබූ විරෝධතාව හෝ විරෝධතා ඇතුළත් කරුණු සඳහන් දැන්වීම සභාපතිවරයාට ලැබුන දින සිට දින 14ක කාලයක් ඇතුළත එකී විරෝධතාව හෝ විරෝධතා පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වීම සභාපති වරයාගේ කාර්යය විය යුතු ය.

39. 38 වැනි වගන්තියෙහි අනුව සභාපති වරයා විසින් පවත්වන ලැබූ විරෝධතා පරීක්ෂණයකදී 37 වැනි අතුරු ව්‍යවස්ථාවේ නියමයන් පරිදි සභාපතිවරයා විසින් යවනු ලැබූ ලිපියේ සඳහන් කරුණු නිවැරදි බවට තහවුරු වී ඇති අවස්ථාවක හෝ එකී විරෝධතා පරීක්ෂණ දිනය වන තෙක්ම එකී අතුරු බදු දීම හෝ කුලියට දීම නිවැරදි කිරීමට බදුකරු අපොහොසත් ව ඇති අවස්ථාවක ප්‍රාදේශීය සභාව සමඟ එකී බදුකරු අත්සන් කරනු ලැබ ඇති බදු ගිවිසුම අවලංගු වී ඇති ලෙස සැලකිය යුතුවාත් හැර එකී විරෝධතා පරීක්ෂණය පැවැත්වූ දිනයේ සිට දින 07ක් ඇතුළත එකී කඩ කාමරය ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීම සභාපති වරයාගේ කාර්යය විය යුතු ය. එසේම තවදුරටත් ආපසු පවරා ගනු ලැබූ කිසියම් කඩ කාමරයක් නැවත බදු දීම සඳහා සභාපතිවරයා විසින් 31 වැනි වගන්තියෙහි නියමයන් අනුගමනය කළ යුතු ය.

40. 36 වැනි වගන්තියේ සිට 39 වැනි වගන්තිය දක්වා වන අතුරු ව්‍යවස්ථාවල කුමක් සඳහන්ව තිබුණ ද ප්‍රාදේශීය සභාව සතු කිසියම් කඩ කාමරයක බදුකරුවෙකුගේ ඉල්ලීමක් මත හෝ බදුකරුවෙකු මියගිය අවස්ථාවක හෝ එකී බදුකරුගේ කලත්‍රයා හෝ දරුවෙකුට එකී කඩ කාමරයේ බදු අයිතිය බවරා දීමට එකී අතුරු ව්‍යවස්ථාවල බාධාවක් නොවිය යුතු ය. එසේ පවරා දෙන ලද තැනැත්තා සභාව සමඟ නව බදු ගිවිසුමකට එළඹිය යුතුයි.

41. (i) ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙයන යනු ලබන කවර හෝ පොදු වෙළෙඳ පොළක කඩ කාමරයක් පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට ටෙන්ඩර් මගින් තෝරා ගනු ලැබූ සෑම බදුකරුවෙකු විසින් ම ;

(අ) බදුකරුවන් තෝරා ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවන අවස්ථාව වන විට ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලැබ වටිනාකමකින් යුතු හා ආපසු ගෙවනු ලැබිය හැකි ඇප තැන්පත් මුදලක් ;

(ආ) 32 වැනි වගන්තියෙහි හෝ 33 වැනි වගන්තියෙහි නියමය යටතේ අත්සන් කරනු ලැබූ ගිවිසුමේ සඳහන් මාසික බදු කුලිය මෙන් තුන් ගුණයකට සමාන තැන්පත් මුදලක් ;

(ඇ) සභාවේ තීරණය අනුව එකවිට කෙරෙන ආපසු නොගෙවනු ලබන ගෙවීමක් ලබාගත යුතු යැයි තීරණය කර ටෙන්ඩර් කැඳවන ලද නම් ටෙන්ඩරයේ සඳහන් එකී එකවිට කෙරෙන ගෙවීමට අදාළ මුදල සභාවට ගෙවිය යුතු ය.

(ii) ඉහත I (අ) සහ (ආ) ඡේදයේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකුට ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන කිසියම් පොදු වෙළඳපොළක කඩ කාමරයක් පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට ඉඩ දීම නොකළ යුතු ය ;

(iii) පැරණි වෙළඳපොළ ගොඩනැගිල්ලක් ඉවත් කර එම ස්ථානයෙහිම නව වෙළඳසැල ඉදිකර ඇති අවස්ථාවක දී පැරණි වෙළඳසැලහෙි බදුකරුවන්, විසින් නව වෙළඳසැලෙහි කඩ කාමර ඉල්ලා සිටින්නේ නම් සභාව විසින් නියම කරන එකවර ගෙවන මුදලක් හා 31(ii) වගන්තිය යටතේ නියම කළ මාසික බදු කුලිය මෙන් තුන් ගුණයකට සමාන මුදලක් සභාව නියම කරන දිනයකට පෙර සභාවට ගෙවා 32 වැනි වගන්තියෙහි සඳහන් ගිවිසුමට එළඹෙන්නේ නම් තරඟකාරී ටෙන්ඩර් කැඳවීමකින් තොරව කඩ කාමර බදු අයිතිය පවරා දිය හැකි ය ;

(iv) 33 වැනි වගන්තිය අදාළ වන කිසියම් බදුකරුවෙකු එකී අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් ප්‍රාදේශීය සභාව සමඟ පිවිසුම් අත්සන් කළ දිනයේ සිට මාස 06ක කාලයක් ගත වීමට මත්තෙන් ඉහත I (අ) සහ (ආ) ඡේදයේ නියමයන් සම්පූර්ණ කර ඇත්තේ නම් මිස එකී මාස 06 කාලය ඉකුත් වීමෙන් අනතුරුව එකී කඩ කාමරය පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම නීත්‍යානුකූල නොවන්නේ ය ;

42. (i) පොදු වෙලඳපොළෙහි කිසියම් කඩ කාමරයක් සඳහා බදුකරුවන් විසින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු එක් එක් මාසයේ බදු කුලිය ගෙවිය යුතු දිනය එකී කඩ කාමරය බදු දීමට අදාළ ගිවිසුමෙහි නිශ්චිතව සඳහන් කර තිබිය යුතුවාත් හැර එකී දින හෝ එදිනට පෙර එකී බදු මුදල ප්‍රාදේශීය සභාවට ගෙවීම බදුකරුගේ කාර්යය වන්නේ ය ;

(ii) කවර හෝ බදුකරුවෙකු විසින් 42.1 ඡේදයේ නියම කර ඇති ආකාරයෙන් අත්සන් කළ ගිවිසුමට අනුව එකඟ වූ දිනයේ හෝ ඊට පෙර අදාළ මාසික බදු කුලිය ප්‍රාදේශීය සභාවට ගෙවීමට අපොහොසත් වන අවස්ථාවක නියමිත දින සිට ගෙවීමට ඇති සෑම මාසයක් හෝ ඉන් කොටසක් වෙනුවෙන් අදාළ මාසික කුලියෙන් 10%ක ප්‍රමාද ගාස්තුවක් ගෙවීමට බදුකරු යටත්විය යුතුවාත් හැර මෙකී නියමයන් අදාළ ගිවිසුමේ ඇතුළත් කර තිබිය යුතු ය ;

(iii) කිසියම් බදුකරුවෙකු විසින් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු වන මාසික බදු කුලිය නොගෙවා පැහැර හැර ඇති හා එකී හිඟ බදු කුලිය මාස තුනක කාලයකට වඩා වැඩිවන යම් අවස්ථාවක, මෙහි (iv) ඡේදය සහ (v) ඡේදයේ සඳහන් ප්‍රතිවිපාකයන් ද සඳහන් කරමින් එකී හිඟ මුදල සහ (ii) ඡේදයේ සඳහන් ප්‍රමාද ගාස්තුව ගෙවන ලෙස බදුකරුට ලියවිල්ලකින් වන දැන්වීමක් භාරදීම ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය. එසේම මේ දැන්වීමට අනුව හිඟ බදු මුදල හා ප්‍රමාද ගාස්තු ගෙවීම තවදුරටත් පැහැර හරින්නේ නම් කඩ කාමරය මුද්‍රා තැබීමෙන් පසුව එහි තුළ ඇති බදුකරුට අයත් කවර හෝ දේපළක් විකිණීම සඳහා ක්‍රියා කරනු ලබන ඉදිරි දිනය කෙදිනක ද යන්නත් එකී දැන්වීමේ සඳහන් කර තිබිය යුතු ය.

(iv) ඉහත iii ඡේදය යටතේ වන දැන්වීමක් ලැබූ කවර හෝ බදුකරුවකු විසින් තමාට ඒ දැන්වීම ලැබුණු දින සිට දින 07ක් ඇතුළත එකී හිඟ බදු මුදල සහ ප්‍රමාද ගාස්තු ප්‍රාදේශීය සභාවට ගෙවීමට අපොහොසත් වන්නේ නම්, අදාළ කඩ කාමරය මුද්‍රා තැබීම ලේකම්ගේ කාර්යය විය යුතු ය ;

(v) ඉහත iv ඡේදයේ නියමයන් යටතේ ක්‍රියාකර එක් දිනක් ඉකුත් වීමෙන් පසුව හා දින හතක් ඉකුත් වීමට මත්තෙන් අදාළ එකී හිඟ බදුකරු හෝ ඔහුගෙන් ලියවිල්ලකින් බලය පවරන ලද වෙනත් කිසියම් නියෝජිතයකු එකී ස්ථානයට පැමිණ සිටී නම්, ඔහු ඉදිරියේ දී බදුකරු හෝ ඔහුගේ නියෝජිතයා පැමිණ නැත්නම් ප්‍රාදේශීය සභාවේ වෙනත් යම් නිලධරයන් දෙදෙනෙකු ඉදිරිපිට දී එකී කඩ කාමරයේ දොරට හෝ දොරවල්වලට තබනු ලැබූ මුද්‍රා කඩා දොරවල් විවෘත කර එකී කඩ කාමරය ඇතුළත වූ බදුකරුට අයත් යම් දේපළක් ප්‍රසිද්ධියේ විකුණා එකී හිඟ බදු මුදල ප්‍රමාද ගාස්තුව ද සහ කඩ කාමරය මුද්‍රා තැබීමට හා බදුකරුට අයත් යම් දේපළක් විකිණීමට වැය වූ කිසියම් මුදලක් අයකරගෙන ප්‍රාදේශීය සභාවේ අරමුදලට බැර කිරීමට ලේකම්වරයාට බලය තිබිය යුතුවාත් හැර එසේ කිරීමට නීත්‍යානුකූලව වන්නේ ය ;

(vi) ඉහත (vi) ඡේදයේ සහ (v) ඡේදයේ කුමක් සඳහන්ව තිබුන ද, එකී ඡේදවල සඳහන් ආකාරයෙන් ක්‍රියා කිරීමට සූදානම් වන කිසියම් අවස්ථාවක දී හෝ ඒ අවස්ථා 02ක අතරට යෙදෙන කවර හෝ අවස්ථාවක දී එකී හිඟ බදු මුදල, ප්‍රමාද ගාස්තුව සහ එසේ ක්‍රියා කිරීමට යාම නිසා ඒ වන විට ප්‍රාදේශීය සභාවට දරන්නට සිදු වූ යම් මුදල් ප්‍රමාණයක් වේ නම් ඒ මුදල ද ප්‍රාදේශීය සභාවට ගෙවා දැමීමෙන් (iv) ඡේදයේ හෝ (v) ඡේදයේ සඳහන් යම් ආකාරයකින් ක්‍රියා කිරීම නතර කර ගැනීමට බදුකරුට හිමිකම තිබිය යුතුවාත් හැර එකී මුදල් සම්පූර්ණයෙන් ම අයකර ගැනීමෙන් පසුව එසේ ක්‍රියා කිරීමෙන් වැළකී සිටීම ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය ;

(vii) මේ වගන්තියේ ඉහත (iii) ඡේදයේ සිට (vi) ඡේදය දක්වා වන කවර හෝ ඡේදයක් යටතේ හෝ ඉන් කිහිපයක් යටතේ හෝ ඒ ඡේද සියල්ලම යටතේ හෝ ක්‍රියා කිරීම හේතුවෙන් එකී කඩ කාමරය බදු දීමට අදාළව අත්සන් කළ ගිවිසුම් අවලංගු වීම සිදු වී ඇති ලෙස තේරුම් නොගත යුතු ය ;

(viii) ඉහත (vii) ඡේදයේ කුමක් සඳහන්ව තිබුණ ද කිසියම් බදුකරුවකු විසින් යම් කඩ කාමරයක බදු මුදල් ගෙවීම පැහැර හරිනු ලැබීම හේතුවෙන් එක් වර්ෂයක් තුළ දී ඉහත (iv) ඡේදයේ නියම කළ ආකාරයෙන් එකී කඩ කාමරය මුද්‍රා තැබීම් අවස්ථා දෙකකට පසුව තවදුරටත් බදු මුදල් ගෙවීම පැහැර හරිනු ලබන්නේ නම්, ලේකම්වරයා විසින් ඒ පිළිබඳ එකී බදුකරුට ලියවිල්ලකින් දන්වා යැවීම කළ යුතුවාත් හැර එකී දැන්වීම බදුකරුට ලැබුණු දිනයේ සිට ප්‍රාදේශීය සභාව සමග එකී බදුකරු විසින් අත්සන් කරනු ලැබූ ගිවිසුම අවලංගු විය යුතු ය.

43. පොදු වෙළෙඳ පොළ ඇතුළත සෑම කඩ කාමරයක්ම වෙනුවෙන් ලබාගෙන ඇති ජල සම්බන්ධතාවය සහ විදුලි සම්බන්ධතාවය මගින් කිසියම් බදුකරුවකු විසින් පරිභෝජනය කරනු ලබන ජල ඒකක ප්‍රමාණය සහ විදුලිය ඒකක ප්‍රමාණය වෙනුවෙන් මාසිකව ගෙවිය යුතු බිල්පත්වල වියදම එකී බදුකරු විසින් දැරිය යුතු ය.

44. පොදු වෙළෙඳපොළ පරිශ්‍රයෙහි පොදු පරිභෝජනය සඳහා යොදවා ඇති කිසියම් විදුලි පරිපථයකින් හෝ පොදු ජල කරාමයකින් කවර හෝ කඩ කාමරයකට විදුලි සැපයුමක් හෝ ජල සැපයුමක් ලබා ගැනීම හෝ එසේ ලබා ගැනීමට ඉඩ දීම හෝ නොකළ යුතු ය.

45. පොදු වෙළෙඳ පොළෙහි කඩ කාමරය හැර වෙළඳ මැහි පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට අවශ්‍ය කරන යම් තැනැත්තන්ට ටිකට් පත් නිකුත් කිරීමට හා එකී ටිකට්පත් සඳහා මුදල් අය කිරීමටත් ලේකම්වරයාගෙන් බලය ලත් යම් නිලධාරියකු යොදවනු ලැබිය හැකි ය. එසේ ම යම් බලයලත් නිළධාරියකු විසින් එකී ටිකට් පත් නිකුත් කිරීමෙන් දිනපතා එකතු කරනු ලබන මුදල් එදින පස්වරු 3.00 පැයට පෙර ප්‍රාදේශීය සභාවේ පොදු අරමුදලට බැර කිරීමෙන් පසුව, පොදු වෙළෙඳ පොළෙහි ටිකට් පත් නිකුත් කිරීමෙන් එකතු කරනු ලැබූ යම් මුදලක් වේ නම් එය අනුගාමී වැඩ කරන දිනයේ ප්‍රාදේශීය සභාවේ පොදු අරමුදලට බැර කිරීම කළ යුතු ය.

46. පොදු වෙළෙඳ පොළෙහි කඩ කාමර හැර වෙළෙඳ මැහි පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට යම් තැනැත්තන්ට ටිකට් පත් නිකුත් කිරීම සහ ඒ සඳහා මුදල් එකතු කිරීම, 45 වැනි වගන්තියෙහි නියම කර ඇති ආකාරයෙන් ලේකම්වරයාගෙන් බලයලත් යම් නිළධාරියකු යෙදවීමට නොහැකි වන්නේ නම්, එකී කාර්යය ප්‍රසිද්ධ ටෙන්ඩර් මගින් තෝරා ගනු ලබන (මෙහි මින්මතු "ගාස්තු එකතු කරන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තකුට පැවරීමට ප්‍රාදේශීය සභාවට බලය තිබිය යුතු ය.

47. 46 වැනි වගන්තිය යටතේ තෝරාගනු ලැබූ කිසියම් ගාස්තු එකතු කරන්නකුට එකී කාර්යය පැවරීම එක් වර්ෂයක් සඳහා පමණක් වලංගු විය යුතු අතර, අනුගාමී වර්ෂය සඳහා නැවත ටෙන්ඩර් කැඳවීමක් මගින් ගාස්තු එකතු කරන්නකු තෝරා ගත

යුතු ය. එසේ වුව ද කලින් වර්ෂය සඳහා තෝරාගනු ලැබූ කිසියම් ගාස්තු එකතු කරන්නෙකුට අනුගාමී වර්ෂය සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කිරීමටත් සහ එකී ටෙන්ඩර් අයදුම්පත්‍රය පිළිගැනීමට සභාව තීරණය කරන්නේ නම් ඔහු අනුගාමී වර්ෂය සඳහා ගාස්තු එකතු කරන්නා වශයෙන් තෝරා ගැනීමටත් මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් මගින් වළක්වා ඇති ලෙස තේරුම් නොගත යුතු ය.

48. (i) 45 වැනි වගන්තියෙහි නියමයන් යටතේ ගාස්තු එකතු කරන්නෙකු තෝරා ගනු ලැබූ විට ඔහු විසින් -

(අ) එකී තෝරා ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවන අවස්ථාව වන විට ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලැබ ඇති වටිනාකමින් යුතු හා ආපසු ගෙවනු ලැබිය හැකි ඇප තැන්පත් මුදලක් ප්‍රාදේශීය සභාවේ තැන්පත් කිරීමට ;

(ආ) එකී ටිකට් පත් නිකුත් කිරීම හා ගාස්තු එකතු කිරීම පිළිබඳව ප්‍රාදේශීය සභාව සමග ගිවිසුමකට එළඹීම ;

(ඇ) ඉහත I ආ ඡේදයේ නියමය යටතේ අත්සන් කරනු ලැබූ ගිවිසුමෙන් එකඟ වී ඇති වාර්ෂික ගාස්තුවෙන් තුනෙන් පංගුවකට සමාන හෝ ඊට වැඩි තැන්පත් මුදලක් ප්‍රාදේශීය සභාවේ තැන්පත් කිරීමට.

(ii) ඉහත I ඡේදයේ සඳහන් නියමයන් ඒ අකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකුට ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන කිසියම් පොදු වෙළෙඳ පොළක වෙළෙඳ මැහි පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට තැනැත්තන්ට ටිකට් පත් නිකුත් කිරීමට හා ඒ ටිකට් පත් වෙනුවෙන් මුදල් එකතු කිරීමට බලය නොතිබිය යුතු ය.

49. 29 වැනි වගන්තියේ නියමයන් යටතේ කිසියම් පොදු වෙළෙඳ පොළක වෙළෙඳ මැහි පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලැබ ඇති ගාස්තුව ඉක්ම වූ ප්‍රමාණයක ගාස්තුවක් හෝ ගාස්තු අය කිරීම කවර හෝ ගාස්තු එකතු කරන්නකු විසින් නොකළ යුතු ය.

50. 48 වැනි වගන්තියේ I (අ) ඡේදයේ නියමයන්ට අනුව කිසියම් ගාස්තු එකතු කරන්නෙකු සමග ප්‍රාදේශීය සභාවේ අත්සන් කරනු ලබන ගිවිසුමෙහි-

(අ) වෙළෙඳ මැහි පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම සඳහා ටිකට් පත් නිකුත් කළ යුතු ආකාරය ;

(ආ) එකී ටිකට් පත් සඳහා මුදල් අය කරන ආකාරය සහ අය කළ හැකි උපරිම මුදල් ප්‍රමාණය ;

(ඇ) ගාස්තු එකතු කරන්නා විසින්, ගිවිස ගන්නා වර්ෂය වෙනුවෙන් ප්‍රාදේශීය සභාව ගෙවිය යුතු සම්පූර්ණ මුදල ;

(ඈ) එකී වාර්ෂික මුදල සමාන වාරික 12කින් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව සහ එක වාරිකයක වටිනාකම ;

(ඉ) එක් එක් මාසය වෙනුවෙන් ගෙවිය යුතු මුදල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු දිනය ;

(ඊ) නියමිත දිනයේ දී මාසික මුදල ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් එකී මුදලේ ප්‍රමාණයෙන් 10% ප්‍රමාණයකට සමාන මුදලක් ප්‍රමාද ගාස්තු වශයෙන් ප්‍රාදේශීය සභාවට ගෙවීමට ගාස්තු එකතු කරන්නා යටත් වන බව ;

(උ) ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු ගාස්තුව මාස 03කට වඩා වැඩි කාලයක් ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් 51 වැනි අතුරු ව්‍යවස්ථාවේ නියමයන් අනුව ගිවිසුම අවලංගු කිරීමට යටත්වන බව සහ එකී ගිවිසුම අවලංගු කරන ලද බව ලේකම්වරයාගෙන් ලියවිල්ලකින් යුතු දැන්වීමක් ලැබුණු දිනයේ සිට එකී වෙළෙඳ පොළෙහි වෙළෙඳ මැහි පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීමට තැනැත්තන්ට ටිකට් පත් නිකුත් කිරීම සහ ඒ ටිකට් පත් වෙනුවෙන් මුදල් අයකර ගැනීමට ගාස්තු එකතු කරන්නාට පැවරී තිබුණු බලය අවසන් වන බව.

ගිවිස ගත් කොන්දේසි වශයෙන් ඇතුළත් කිරීම ප්‍රාදේශීය සභාවේ කාර්යය වන්නේ ය.

51. (i) ගාස්තු එකතු කරන්නා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු වන මාසික ගාස්තුව නොගෙවා පැහැර හැර ඇති හා එකී හිඟ ගාස්තුව මාස 03ක ගාස්තුවකට වඩා වැඩි වන යම් අවස්ථාවක, එකී හිඟ මුදල සහ ප්‍රමාද ගාස්තුව ගෙවන ලෙස ගාස්තු එකතු කරන්නාට ලියවිල්ලකින් වන දැන්වීමක් භාර දීම ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය.

(ii) ඉහත (i) ඡේදය යටතේ වන දැන්වීම ලැබූ කවර හෝ ගාස්තු එකතු කරන්නෙකු විසින් තමාට ඒ දැන්වීම ලැබුණු දින සිට දින 07 ක් ඇතුළත එකී හිඟ මුදල සහ ප්‍රමාද ගාස්තුව ප්‍රාදේශීය සභාවට ගෙවීමට අපොහොසත් වන්නේ නම්, එකී දැන්වීම ඔහුට ලැබුණු දිනෙන් දින 07ක් ඉකුත් වූ දින සිට එකී ගාස්තු එකතු කරන්නා සමඟ ප්‍රාදේශීය සභාව අත්සන් කළ ගිවිසුම අවලංගු විය යුතුවාත් හැර ඒ අවලංගු වීම නීත්‍යානුකූල වන්නේ ය. එසේම එකී ගිවිසුම අවලංගු වූ ලෙස සැළකෙන දිනයේම එකී ගාස්තු එකතු කරන්නා වෙත ඒ බව ලියවිල්ලකින් දන්වා යැවීම ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය.

(iii) ඉහත (ii) ඡේදයේ නියමයන් යටතේ කිසියම් ගිවිසුමක් අවලංගු වූ දිනයෙන් පසුව කවර හෝ අස්ථාවක එකී ගිවිසුමේ පාර්ශවකරුවෙකු වන ගාස්තු එකතු කරන්නා විසින් එකී පොදු වෙළඳ පොළෙහි වෙළෙඳ මැහි පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට කවර හෝ තැනැත්තෙකුට ටිකට් පතක් නිකුත් කරනු ලැබීම හෝ එකී ටිකට් පතක් නිකුත් කිරීම වෙනුවෙන් මුදල් එකතු කරනු ලැබීම හෝ නොකළ යුතු ය.

(iv) ඉහත (ii) ඡේදයේ නියමයන් යටතේ කිසියම් ගිවිසුමක් අවලංගු වූ දිනයෙන් පසුව එළැඹෙන දිනයේ සිට එකී දිනයේ පොදු වෙළෙඳ පොළෙහි වෙළඳ මැහි පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට ටිකට් පත් නිකුත් කරනු ලැබීමට සහ එකී ටිකට් පත් වෙනුවෙන් මුදල් එකතු කරනු ලැබීමටත් ප්‍රාදේශීය සභාවේ කිසියම් බලයලත් නිලධාරියෙකු ලවා එකී කාර්යය තවදුරටත් කරගෙන යැමට නොහැකි වන බව ලේකම්වරයාගේ මතය වන විට 46 වැනි වගන්තියෙහි සඳහන් නියමයන් අනුව ක්‍රියා කිරීම සඳහා තමාගේ මතය සභාපතිවරයා මගින් ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතුය. ඒ ආකාරයෙන් ලේකම්වරයාගේ මත මගින් ප්‍රාදේශීය සභාව වෙත වාර්තා වී ඇති අවස්ථාවක දී 46 වැනි අතුරු ව්‍යවස්ථාව අනුව ක්‍රියාකිරීමට ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලැබිය හැකිය.

(v) ඉහත iv ඡේදයේ සඳහන් ආකාරයෙන් 46 වැනි අතුරු ව්‍යවස්ථාව අනුව ක්‍රියා කිරීමට ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලැබ ඇති යම් අවස්ථාවක, එකී ටෙන්ඩර් කැඳවීමට අනුව ටෙන්ඩර් අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීමට අවලංගු වී ඇති ගිවිසුමේ පාර්ශවකරු වූ ගාස්තු එකතු කරන්නාට හිමිකම් නොතිබිය යුතු ය.

52. සභාපතිවරයා විසින් තත්කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ පෞද්ගලික වෙළෙඳ පොළක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

53. (i) මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවන් යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් විය යුතු ය ;

(ii) ඉහත 52 වගන්තිය යටතේ බලපත්‍රයක් ඉල්ලුම් කරන සෑම තැනැත්තෙකුම ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කර වාර්ෂිකව රජයේ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත ගාස්තුව සභාව වෙත ගෙවිය යුතු ය.

54. 2 වැනි වගන්තියෙහි සඳහන් පොදු වෙළඳපොළකට අදාළ නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස සභාපතිවරයා විසින් කවර හෝ පෞද්ගලික වෙළෙඳපොළකට බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

55. කවර හෝ පෞද්ගලික වෙළෙඳ පොළක ඇතුළත කඩ කාමරවල සහ වෙළෙඳ මැහිවල වෙළෙඳාමේ යෙදෙන සෑම තැනැත්තෙකුම 57 වැනි වගන්තියෙහි නියමයන්ට යටත් වූ වෙනස් කිරීම් සහිතව 02 වැනි වගන්තියේ සිට 21 වැනි වගන්තිය දක්වා වන වගන්තිවල නියමයන් පිළිපැදීම කළ යුතුවාත් හැර එකී තැනැත්තන් විසින් ඒ නියමයන් පිළිපදිනු ලබන බවට වග බලා ගැනීම එකී වෙළෙඳ පොළෙහි බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

56. 57 වැනි වගන්තියෙහි නියමයන් යටතේ වූ වෙනස් කිරීම් සහිතව 02 වැනි වගන්තියේ සිට 21 වැනි වගන්ති දක්වා වන වගන්තිවල නියමයන් පිළිපැදීම සෑම පෞද්ගලික වෙළෙඳ පොළකම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

57. කවර හෝ පෞද්ගලික වෙළෙඳ පොළකට අදාළව 55 වැනි වගන්තියේ කාර්යය සඳහා 02 වැනි වගන්තියේ සිට 21 වැනි වගන්තිය දක්වා වන අතුරු ව්‍යවස්ථාවල සඳහන්-

(අ) "පොදු වෙළඳ පොළ" යන්න වෙනුවට එකී පෞද්ගලික වෙළෙඳ පොළ ද,

(ආ) "බදුකරු" යන්න වෙනුවට එකී පෞද්ගලික වෙළෙඳ පොළෙහි කිසියම් කඩ කාමරයක වෙළෙඳාමේ යෙදෙන තැනැත්තා හෝ ඔහුගේ අනුයෝජිතයා හෝ ඒ අස්ථාවේ එකී කඩ කාමරයේ පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු ද ;

(ඇ) "සභාපතිවරයා" හෝ "ප්‍රාදේශීය සභාව" යන්න වෙනුවට එකී පෞද්ගලික වෙළෙඳපොළහි බලපත්‍රලාභියා අදහස් විය යුතු අතර ඔහුගේ අනුයෝජිතයා හෝ ඒ අවස්ථාවේ එකී පෞද්ගලික වෙළෙඳ පොළෙහි බලපත්‍රලාභියාගේ කාර්යය හෝ කර්තව්‍ය භාරව සිටින යම් තැනැත්තෙකු ද අදහස් විය යුතු ය.

අදහස් විය යුතු ය.

58. කිසියම් පෞද්ගලික වෙළෙඳ පොළක් විවෘතව තබන දිනයන් සහ වේලාවන් කවරේ ද යන්න භාෂාත්‍රයෙන්ම වූ දැන්වීමක් හෝ දැන්වීම් මගින් ප්‍රකටව පෙනෙන ආකාරයෙන් එකී පෞද්ගලික වෙළෙඳ පොළකට ඇතුල්වීමේ දොරටු අසළ ප්‍රදර්ශනය කිරීමට සැළැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

59. සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් පොදු වෙළෙඳපොළක හෝ පෞද්ගලික වෙළෙඳ පොළක විකිණීමට තබා ඇති හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කර ඇති හෝ ගබඩාකර ඇති කිසියම් ආහාර ද්‍රව්‍යයකින් සාම්පලයක්, එහි මිළ ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතුවාත් හැර කවර හෝ තැනැත්තෙකු විසින් එකී මිලදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

60. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වල නියමයන් පරීක්ෂා කිරීමට සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට, කිසියම් පොදු වෙළෙඳ පොළක් හෝ පෞද්ගලික වෙළෙඳපොළක් වෙළඳාම් කටයුතු සඳහා විවෘත කර තබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

61. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් පෞද්ගලික වෙළෙඳපොළක් පවත්වාගෙන යනු ලබන ස්ථාන, 57 වැනි වගන්තිය සමඟ කියවිය යුතු දෙවැනි වගන්තියෙහි කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට හෝ නියමයන්ට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියළු දේ ඉටුකරන ලෙසට බලපත්‍රලාභියාට නියම කෙරෙන දැන්වීමක් සභාපතිවරයා විසින් එකී බලපත්‍රලාභියා වෙත භාරදෙනු ලැබීමට සැළැස්විය යුතු ය.

62. 61 වැනි වගන්තියේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්විමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට සභාපතිවරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින 14කට නොවැඩි විය යුතු ය.

63. 62 වැනි වගන්තියෙහි සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය නැතහොත් දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය සභාපතිවරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

64. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටස් අතුරු ව්‍යවස්ථාවල-

(i) "කලත්‍රයා" යන්නෙන්, කිසියම් බදුකරුවෙකුගේ නීත්‍යානුකූල භාර්යාව හෝ ස්වාමි පුරුෂයා ද ;

(ii) "පොදු වෙළඳ පොළ" යන්නෙන් වෙළෙඳාමක නියුක්ත වීම සඳහා ඉදිකළ කඩ කාමර හා තම තමන්ගේ ගෙවත්තේ හෝ නිවසෙහි නිෂ්පාදනය කරනු ලබන එළවළු හෝ පළතුරු ද ඇතුළු වෙනත් ද්‍රව්‍ය හෝ භාණ්ඩ විකිණීමට ස්ථාන ඇතිකර තිබෙන්නාවූ ද ප්‍රාදේශීය සභාව විසින් ඉදිකර පවත්වාගෙන යනු ලබන කිසියම් ස්ථානයක් අදහස් වන අතර කිසියම් නිෂ්පාදනයක් තොග වශයෙන් මිළදී ගැනීම හෝ විකිණීම කරනු ලබන ස්ථානයක් ද ඊට ඇතුළත් විය යුතු ය ;

(iii) "පෞද්ගලික වෙළඳපොළ" යන්නෙන් ප්‍රාදේශීය සභාව නොවන හෝ එහි පරිපාලනයට පැවරී නොමැති වෙනත් කවර හෝ තැනැත්තෙකු විසින් හෝ තැනැත්තාගේ මණ්ඩලයක් විසින් පොදු වෙළෙඳපොළක කාර්යයට සමාන කාර්යයක් හෝ කාර්යයන් පවත්වාගෙන යනු ලබන කිසියම් ස්ථානයක් අදහස් විය යුතු ය ;

(iv) "ප්‍රධාන තක්සේරුකරු" යන්නෙන්, තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරු අදහස් වන අතර, ප්‍රාදේශීය සභාව අයත් වන පරිපාලන දිස්ත්‍රික්කය වෙනුවෙන් එකී දෙපාර්තමේන්තුව විසින් පත් කරනු ලැබ ඇති යම් නිලධාරියෙකු ද ඊට ඇතුළත් විය යුතු ය.

(v) "බදුකරු" යන්නෙන්, ප්‍රාදේශීය සභාව සමග ඇතිකර ගත් ගිවිසුමක් සහිතව කිසියම් පොදු වෙළඳපොළක යම් කඩ කාමරයක් පවත්වාගෙන යනු ලබන තැනැත්තෙකු අදහස් විය යුතු ය.

(vi) "වෙළඳ මැස්ස"යන්නෙන්, කිසියම් පොදු වෙළඳපොළක කඩ කාමරවලින් වෙන්වූ හා එකී පොදු වෙළෙඳපොළ ඇතුළත එදිනෙදා වෙළෙඳාම් කිරීම සඳහා ඉදිකරනු ලැබ ඇති කිසියම් බංකුවක් හෝ ලෑල්ලක් හෝ පෙට්ටියක් අදහස් වන අතර, එකී පොදු වෙළෙඳපොළෙහි පොළව ඉරි සළකුණු ඇඳීමෙන් වෙළඳාම් කටයුතු සඳහා වෙන් කරනු ලැබ ඇති කවර හෝ ස්ථානයක් ද ඊට ඇතුළත් විය යුතු ය.

**පළමුවන උපලේඛනය**

27 වැනි වගන්තිය
(උප පත්‍රිකා පොතක් වශයෙන් සකසා ගත යුතුය)

......................................සභාව ..........................................පොදු වෙළෙඳ පොළ
වෙළෙඳ මැස්සක් පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම සඳහා වන

ටිකට් පත්‍රය

ටිකට්පත හිමියාගේ නම :...........................................................................................................
ජාතික හැඳුනුම් පත්‍රයේ අංකය :.....................................................................................................
වෙන්කළ වෙළෙඳ මැස්සේ/ඉරි ඇඳි කොටසේ අංකය :.................................................................
වෙන්කර දුන් කාලය : 20...................................... දින සිට......................................... දින දක්වා
වෙන් කළ දින ගණන : දින 01/දින 07/මාස 01යි :........................................................................
අයකර ගනු ලැබූ ගාස්තුව : රුපියල් :..............................................................................................
නිකුත් කල දිනය :.............................................................................................................................

*අනවශ්‍ය වචන කපා හරින්න* *ගාස්තු එකතු කරන්නාගේ අත්සන.*

**දෙවන උපලේඛනය**

29 වැනි වගන්තිය

පොදු වෙළෙඳ පොළක වෙළඳ මැස්සක් පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට අය කරනු ලබන ගාස්තු චක්‍රය

| *වෙළඳ මැස්සේ ස්වභාවය* | *දින 01ක ගාස්තු රු.* | *දින 07ක ගාස්තු රු.* | *මාසයක ගාස්තුව රු.* |
|---|---|---|---|
| පොළොවෙන් ඉහළ ඉදිකළ වෙළඳ මැස්ස | ............................... | ............................... | ............................... |
| පොළොවෙන් මත ඉරි සලකුණු යොදා වෙන් කළ කොටස | ............................... | ............................... | ............................... |

*16 වැනි කොටස*

*කොණ්ඩා කපන ස්ථාන සහ බාබර් සාප්පු*

01. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොණ්ඩා කපන ස්ථාන, බාබර් සාප්පු සහ කොණ්ඩය සහ මුහුණු හැඩගැන්වීමට සම්බන්ධ රූපලාවන්‍ය මධ්‍යස්ථාන විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම සහ පාලනය කිරීම පිළිබඳව වූ අතුරු ව්‍යවස්ථාවයි.

02. සභාපතිවරයා විසින් තත්කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ කොණ්ඩා සැකසීමේ ස්ථානයක් හෝ බාබර් සාප්පුවක් සැලුන් හලක් හෝ රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

03. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනෙන් අවසන් විය යුතු ය.

04. (i) මෙම වගන්තියේ II සහ III ඡේදවල සඳහන් නියමයන් සම්පූර්ණ කර ඇත්තේ නම් මිස සභාපතිවරයා විසින් කවර හෝ කොණ්ඩා සැකසීමේ ස්ථානයක් හෝ බාබර් සාප්පුවක් හෝ සැලුන් හලක් හෝ රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

(ii) කොණ්ඩා සැකසීමේ ස්ථානය හෝ බාබර් සාප්පුව හෝ සැලුන්හල හෝ රූපලාවන්‍ය මධ්‍යස්ථානය පවත්වාගෙන යාමට අදහස් කරන ගොඩනැගිල්ල හෝ ගොඩනැගිල්ලේ කොටසෙ :

(අ) ශක්තිමත්ව නිමාකර තිබිය යුතු අතර එක් ගනුදෙනුකරුවෙකුට සේවා සැපයීම සඳහා වෙන් කරන ඉඩ ප්‍රමාණය අවම වශයෙන් වර්ග මීටර 1.5කට නොඅඩු වන සේ එකවර සේවා සපයන ගනුදෙනුකරුවන් සංඛ්‍යාවට අනුරූපිව ප්‍රමාණවත් ඉඩකඩ සපයා තිබිය යුතු ය ;

(ආ) සේවා සපයා ගැනීමට බලාපොරොත්තුවෙන් පැමිණෙන කිසියම් ගනුදෙනුකරුවෙකුට සේවා ලබා ගන්නා ගනුදෙනුකරු ස්ථානගත කර ඇති ස්ථානයේ සිට අවම වශයෙන් මීටර් 1.5ක් දුරින් වන සේ පහසුවෙන් අසුන්ගෙන රැඳී සිටීමට ප්‍රමාණවත් ඉඩකඩ සපයා තිබිය යුතු ය ;

(ඇ) ඇතුලත් වන බිත්ති ශක්තිමත් ද්‍රව්‍යවලින් තනා තිබිය යුතු අතර තීන්ත ආලේපකර තිබිය යුතු ය ;

(ඈ) ඇතුලත් වන වහලය ලී හෝ වෙනත් ශක්තිමත් ද්‍රව්‍යයකින් තනා තිබිය යුතුවාක් හැර අවම වශයෙන් පොළොව මට්ටමේ සිට මීටර් 2.25න් උස සිවිලිමකින් යුක්ත විය යුතු ය. තවද සිවිලිම සුදු පාටින් පින්තාරු කර තිබිය යුතු ය ;

(ඉ) ඇතුළත පොළොව සිමෙන්තියෙන් මැද හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු අතර බිත්තිය සහ පොළොව සම්බන්ධ වන ස්ථානය පිරිසිදු කිරීමට පහසු වන සේ වටකුරු හැඩයට සකස් කර තිබිය යුතු ය ;

(ඊ) ඇතුළත වායු සමීකරණය කර නොමැති ගොඩනැගිල්ලක් වන විට එහි භූමියේ වර්ග ප්‍රමාණයෙන් පහලොවෙන් එකකට නොඅඩු වා කවුළු සවිකර තිබිය යුතු අතර ප්‍රමාණවත් ආලෝකය ලැබීමට සලස්වා තිබිය යුතු ය ;

(උ) ඇතුළත වායු සමීකරණය කර ඇති ගොඩනැගිල්ලක් වන විට ප්‍රමාණවත් විදුලි ආලෝකය සපයා තිබිය යුතු ය

(ඌ) ගනුදෙනුකරුවන්ට සේවා සැපයීමේ දී සේදීම සඳහා ජලය භාවිතා කරන්නේ නම් සෝදන බේසම් සවිකර තිබිය යුතු අතර පාවිච්චි කළ අප ජලය ගලායාමට ප්‍රමාණවත් නළ සවිකර තිබිය යුතු ය ;

(එ) ඇතුළත භාවිතා කර බැහැර කරන අප ජලය උරා ගැනීමේ වළකට ගලායාමට සලස්වා තිබිය යුතු අතර පොදු ජල අපවහන මාර්ගයකට ගලායාමට සැලැස්වීම නොකළ යුතු ය ;

(ඒ) ඇතුළත හෝ පරිශ්‍රය ඇතුළත ජලමුද්‍රිත වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතු ය ;

(ඔ) ඇතුළත නිවාසයක කාර්යය සඳහා යොදා ගැනීම නොකළ යුතු අතර නිවාස සඳහා යොදා ගන්නා කොටස බිත්තිවලින් වෙන්කර තිබිය යුතු ය ;

(iii) කොණ්ඩා සැකසීමේ ස්ථාන බාබර් සාප්පුව හෝ සැලුන් හල හෝ රූපලාවන්‍ය මධ්‍යස්ථාන තුල :

(අ) ගනුදෙනුකරුවන් සඳහා විවෘතව තබන සෑම අවස්ථාවකදී ම ප්‍රමාණවත් ජල සම්පාදනයක් ;

(ආ) පවත්වාගෙන යාමේදී පාවිච්චි කරන උපකරණ සහ මෙවලම් ජීවානුහරණය සඳහා ප්‍රමාණවත් වන ජලය උතුරවන ක්‍රමයක් හෝ ජීවානුහරණය ක්‍රමයක් සහ ජීවානුහරණය සඳහා භාවිතා කෙරෙන බඳුන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ;

(ඇ) ඇතුළත සේවා සපයන්නන්ට ඔවුන්ගේ වැඩ කරගෙන යාමේ දී අත් සෝදා ගැනීමේ පහසුකම් සහිත බේසම් සහ සබන් හෝ සබන් දියර ;

(ඈ) ගනුදෙනුකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා සුදු පැහැයෙන් හෝ වෙනත් ලා පාටකින් යුක්ත වන එහෙත් තද පාටින් යුක්ත නොවන තුවා සහ උඩුකය ආවරණය වැස්ම ප්‍රමාණවත් සංඛ්‍යාවක් ;

(ඉ) ඇතුළත දී කපන ලද කෙස් සහ වෙනත් අප ද්‍රව්‍ය දැමීම සඳහා හොඳින් වැසෙන පියනකින් යුත් එහා මෙහා ගෙන යා හැකි භාජනයක් ;

(ඊ) ඇතුළත විදුලියෙන් ක්‍රියාත්මක කරන උපකරණ යොදා ගන්නේ නම් එක් ගනුදෙනුකරුවෙකුගේ මේසයට අවම වශයෙන් එකක් බැගින් වනසේ ආරක්ෂිත විදුලි පේනු එකක් බැගින් ;

(උ) ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් ප්‍රමාණවත් ප්‍රථමාධාර උපකරණ හා ඖෂධ සහිත ප්‍රථමාධාර පෙට්ටියක් ස්ථාපනය කර හෝ සපයා තිබිය යුතු ය.

05. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් ලත් සෑම ස්ථානයක ම සේවයේ යොදවා ඇති තැනැත්තෙකුටම ප්‍රාදේශීය සභාව විසින් නිර්දේශ කරනු ලබන ප්‍රමාණයේ ප්‍රථමාධාර පුහුණුවක් හා අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් බැගින් වන ප්‍රථමාධාර පුහුණුවක් හා අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් බැගින් වන ප්‍රථමාධාර පෙරහුරුවක් ලබා දී තිබිය යුතුය.

06. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් ලත් සෑම තැනැත්තෙකු ම විසින් 4 වැනි වගන්තියේ 1 ඡේදයේ සඳහන් ආකාරයට බලපත්‍රයක් ස්ථානයේ තීන්ත ආලේප කර තිබිය යුතු යයි නියම කර ඇති ස්ථාන අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් බැගින් තීන්ත ආලේප කළ යුතු ය.

07. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් ලත් සෑම තැනැත්තෙකුම විසින් බලපත්‍රයේ ස්ථානයේ ගෙබිම අවම වශයෙන් මාස තුනකට වරක් වත් විෂබීජ නාශක යොදා සෝදා හැරීම කළ යුතු ය.

08. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් ලත් ස්ථානයක ඇතුළත දිවා කාලයේ හෝ රාත්‍රි කාලයේ නිදාගන්නා හෝ ආහාර ගන්නා ස්ථානයක් ලෙස පාවිච්චි නොකළ යුතු අතර වෙනත් යම් තැනැත්තෙකුට එසේ පාවිච්චි කිරීමට ඉඩ නොදිය යුතු ය.

09. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් ලත් ස්ථානයක ඇතුළත ආහාර පිසීම හෝ ආහාර විකිණීම හෝ විකිණීම සඳහා ආහාර ප්‍රදර්ශනය කිරීම හෝ නොකල යුතු ය.

10. (i) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතක දී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු, එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ii) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකල යුතු ය.

(iii) බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

11. කවර හෝ ආකාරයක හෝ ආසාදන හෝ ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන නැතහොත් එවැනි රෝගයකින් පෙළෙන තැනැත්තෙකුට මෑත දී උපස්ථාන කළ කිසියම් ගනුදෙනුකරුවෙකුට සේවා සැපයීමෙන් අනතුරුව :

(i) එකී සේවා සැපයීම කළ තැනැත්තා යම් විෂබීජ නාශක ද්‍රව්‍යයක් යොදා තමාගේ දෑත් පිරිසිදු කරගෙන ඇත්තේ නම් මිස වෙනත් යම් ගනුදෙනුකරුවෙකුට සේවය කිරීම හෝ සේවය කිරීමට ඉඩදීම හෝ නොකළ යුතු ය ;

(ii) එකී ගනුදෙනුකරුවා සඳහා පාවිච්චි කළ කවර හෝ උපකරණයක් ජීවානුහරණය කර ඇත්තේ නම් මිස පාවිච්චි කළ තුවා සහ උඩුකය ආවරණ වැස්ම විෂබීජ නාශක සහ සබන් යොදා සෝදා ඇත්තේ නම් මිස වෙනත් යම් ගනුදෙනුකරුවෙකු වෙනුවෙන් පාවිච්චි කිරීම හෝ එසේ කිරීමට ඉඩදීම හෝ නොකළ යුතු ය ;

12. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත කර ඇති සෑම සේවකයෙකුම :

(i) දිනපතා දිය නෑමෙන් හෝ ඇඟ සෝදා ගැනීමෙන් අනතුරුව පමණක් සේවයේ නියුක්ත වන බවට ;

(ii) අඳිනු ලබන ඇඳුම් හා පැළඳුම් පිරිසිදුව සහ සෞඛ්‍යාරක්ෂිත තත්ත්වයෙන් වන බවට ;

(iii) නියපොතු කොටට කපා කුණුවලින් තොරව තබා ගන්නා බවට ; සහ

(iv) එක් එක් ගනුදෙනුකරු සඳහා සේවය කිරීමට පෙරාතුව සබන් ගා අත් සෝදා ගන්නා බවට,

සහතික වීම බලපත්‍රලාභියාගේ කාර්යය වන්නේය.

13. බලපත්‍රලත් ස්ථානයේ පාවිච්චියට ගන්නා :

(i) උපකරණ පාවිච්චි කරන එක් එක් වතාවට පසුව ජීවානුහරණය කිරීම ;

(ii) බුරුසු සහ පනා සෑම දිනකම පාවිච්චියට ගැනීමට පෙර හොඳින් සෝදා පිරිසිදු කර ජීවානුහරණය කිරීම ;

(iii) සියලුම පුකුරු, කෝප්ප සහ සබන් බුරුසු ඒවා ප්‍රයෝජනයට ගන්නා එක් එක් වතාවෙන් පසුව උණුවතුරෙහි ගිල්වා සෝදා හැරීම,
කරන බවට බලපත්‍රලාභියා සහතික විය යුතුය.

14. බලපත්‍රලත් ස්ථානයේ සේවය ලබා ගන්නා එක් එක් ගනුදෙනුකරුගේ :

(i) කොණ්ඩය හෝ රැවුල කැපීමෙන් ඉවත් කරන කෙස් කැබලි හෝ වෙනත් අප ද්‍රව්‍ය අතුගෑමෙන් හෝ විදුලි බලයෙන් ක්‍රියාකරන උරා ගන්නා යන්ත්‍රයක් මගින් හෝ එකතු කර ඒ සඳහා වෙන්කළ භාජනයට දැමීම කරන බවට සහ ;

(ii) කොණ්ඩය හෝ රැවුල කැපීමට උපයෝගී කරගන්නා තල මාරු කළ හැකි දැලි පිහියේ තලය මාරු කරන බවට, බලපත්‍රලාභියා සහතික විය යුතුය.

15. දෛනික කටයුතු අවසානයේ හෝ අවශ්‍ය වන්නේ නම් දිනකට කිහිප වතාවක් බැගින් ඉවත් කරන කෙස් කැබලි ඇතුළත් බඳුනේ ඇති අප ද්‍රව්‍ය අවම වශයෙන් පොළොවෙන් මීටර් එකකට නොඅඩු ගැඹුරකින් වළ දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කර්යය වන්නේය. එසේම ඉවත දමන කෙස් කැබලි හෝ වෙනත් අප ද්‍රව්‍ය සුළඟේ ගසාගෙන යාම හෝ පරිශ්‍රය තුළ යම් පොදු ස්ථානයක විසිරියාම වැළැක්වීමට ක්‍රියාකිරීම ද බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

16. බලපත්‍රලත් ස්ථානයේ රැස්කරන කෙස් කැබලි සහ වෙනත් අපද්‍රව්‍ය 15 වැනි වගන්තියේ සඳහන් ආකාරයට බැහැර කිරීමට නොහැකි වන අවස්ථාවකදී ප්‍රාදේශීය සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩපිළිවෙල යටතේ නියම කරනු ලබන ආකාරයෙන් ප්‍රාදේශීය සභාවේ කසළ රැස් කිරීමේ වාහනයට භාරදීමට ක්‍රියා කළ යුතුය.

17. බලපත්‍රලත් ස්ථානයේ පාවිච්චියට ගන්නා අපද්‍රව්‍ය රැස්කිරීමේ භාජනය හිස් කිරීමෙන් පසු පිරිසිදු කර විෂබීජ නාශක යෙදීමට සැලැස්වීමට බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

18. කවර හෝ බලපත්‍රලත් ස්ථානයක :

(i) කවර ආකාරයෙන් හෝ ලේ නවත්වන පැන්සල් වර්ගයක් හෝ පියරු මල් හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් හෝ ;

(ii) යම් ලේ ගැනීමක් නතර කිරීමේ කාර්යය සඳහා සීනක්කාරම් හෝ වෙනත් ද්‍රව්‍යයක්, එය කුඩු වශයෙන් හෝ ද්‍රව වශයෙන් ඇත්නම් මිස කිසිම ගනුදෙනුකරුවෙකු සඳහා පාවිච්චි කිරීම හෝ පාවිච්චි කිරීමට ඉඩදීම හෝ, නොකළ යුතුය.

19. කවර හෝ බලපත්‍රලත් ස්ථානයක බලපත්‍රලාභියා විසින් පිරිසිදු තත්ත්වයෙන් නොමැති උඩුකය ආවරණය වැස්මක් හෝ සෝදනු ලැබීමෙන් පසු පළමුවරට පාවිච්චි කරන තුවායක් නොවන කිසියම් තුවායක් හෝ කවර හෝ ගණුදෙනුකරුවෙකුගේ ප්‍රයෝජනය සඳහා යොදා ගැනීම නොකළ යුතුය.

20. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රලත් ස්ථානයකට නිකුත් කරන ලද බලපත්‍රයේ සඳහන් කාර්යයන් හැර වෙනත් කවර හෝ කාර්යයක් සභාපතිවරයාගේ ලිඛිත අවසර ඇත්තේ නම් මිස නොකළ යුතුය.

21. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසා කාලය යන්නට එකී ස්ථානයේ ගණුදෙනුකරුවන්ට සේවා සැපයීම කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

22. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් ස්ථානයක් 4 වැනි වගන්තියේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීමට අවසාන වුවහොත් හෝ මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර සියලු දේ ඉටු කරන ලෙසට ලිඛිත නියෝගයක් බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතුය.

23. 22 වැනි වගන්තියේ සඳහන් ආකාරයේ නියෝගයක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී නියෝගයෙහි නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ නියෝගයෙහි නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතුය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී නියෝගයෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට සභාපතිවරයාට බලය තිබිය යුතුය. එසේ වුවද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතුය.

24. 23 වැනි වගන්තියේ සඳහන් ආකාරයේ නියෝගයක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියකු විසින් එකී නියෝගයෙහි නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ නියෝගයෙහි නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය සභාපතිවරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතුය.

25. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ නියමයක්, නොකළහැරීම හෝ පැහැර හැරීම වරදක් වන අතර, ඒ සඳහා නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීමෙන් අනතුරුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (2) වගන්තියෙහි සඳහන් දණ්ඩනයන්ට යටත් විය යුතුය.

26. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල ;

"උඩුකය ආවරණය වැස්ම" යන්නෙන් බලපත්‍රලත් ස්ථානයේ සේවය ලබා ගන්නා කිසියම් ගණුදෙනුකරුවෙකුගේ උඩුකය ආවරණය කිරීමට පාවිච්චි කරන කිසියම් ආවරණ රෙද්දක් අදහස් වේ ;

"කොණ්ඩා කපන ස්ථාන" හෝ "බාබර් සාප්පු" යන්නෙන් ස්ත්‍රීන්ගේ හෝ පුරුෂයන්ගේ කොණ්ඩා කැපීම, රැවුල කැපීම, රැවුල හෝ කොණ්ඩා සැකසීම, කොණ්ඩ පීරීම හා මුහුණ හා කෝණ්ඩය ආශ්‍රිත සැකසීම සහිතව රූපලාවන්‍ය හැඩ ගැන්වීම කරනු ලබන ඕනෑම ස්ථානයක් අදහස් වේ.

### *17 වැනි කොටස*

### *ප්‍රචාරක දැන්වීම්*

01. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් මාවතක හෝ ප්‍රසිද්ධ ස්ථානයක සිට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කර ඇති හෝ විදහා පා ඇති ප්‍රචාරක දැන්වීම් විධිමත් කිරීම, පාලනය කිරීම හා ඒ සම්බන්ධ ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවයි.

02. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා ඉඩදෙනු ලබන ප්‍රදේශ කවරේද යන්න ප්‍රදේශීය සභාව කලින් කල නීර්ණය කරනු ලැබිය හැකිය. ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා ඉඩදෙනු ලබන ප්‍රදේශ පිළිබඳ කලින් කල ප්‍රාදේශීය සභාව විසින් ගනු ලබන තීරණ පිළිබඳ නිවේදනයක් *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කිරීමට සැලැස්වීම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ කාර්ය වන අතර, එකී නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වන දින හෝ එහි නිශ්චිතව දැක්වෙන යම් ඉදිරි දිනයක සිට ක්‍රියාත්මක විය යුතුය.

03. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් නිකුත් කරන ලද තත්කාර්ය සඳහා මෙහි පළමුවන උපලේඛනයේ දැක්වෙන ආකෘතියට සාරානුකූලව පිළියෙල කර නිකුත් කරන ලද වලංගු අවසර පත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් සභා බල ප්‍රදේශය තුළ මංමාවතක හෝ ප්‍රසිද්ධ ස්ථානයක සිට බැලූවිට පෙනෙන පරිදි කවර හෝ ආකාරයක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම හෝ නොකළ යුතුය.

04. ප්‍රදර්ශනය කිරීම සඳහා වලංගු අවසර පත්‍රයක් ලබා ඇත්තේ වුවද කවර වූ හෝ ප්‍රචාරක දැන්වීමක් යම් මාවතක හෝ ප්‍රසිද්ධ ස්ථානයක සිට බැලූ විට පෙනන පරිදි අදාල අවසර පත්‍රයේ නිශ්චිතව සඳහන් කර ඇති ස්ථානයක හෝ ස්ථානවල හැර වෙනත් කවර හෝ ස්ථානයක ප්‍රදර්ශනය කිරීම හෝ එසේ කිරීමට සැලැස්වීම හෝ නොකළ යුතුය.

05. මෙම කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම අවසර පත්‍රයක්ම කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ අවසර පත්‍රයේ නිශ්චිතව සඳහන් කර ඇති කාල සීමාව සඳහා පමණක් වලංගු විය යුතුය.

06. කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර පත්‍රයක් අවශ්‍ය කරන සෑම තැනැත්තෙක්ම විසින් අවම වශයෙන් එකී ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනට වැඩ කරන දින 7කට පෙර මෙහි දෙවන උපලේඛනයේ සඳහන් ආකෘතියට සාරානුකූලව පිළියෙල කර ගත් අයදුම්පත්‍රයක් ප්‍රාදේශීය සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

07. මේ අතුරු ව්‍යවස්ථාවේ පහත සඳහන් නියමයන් ඒ ආකාරයෙන්ම ඉල්ලුම්කරු විසින් සම්පූර්ණ කර ඇත්තේ නම් මිස සභාපතිවරයා විසින් කවර හෝ ආකාරයක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර පත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතුය :-

(i) දෙවන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට සභාව විසින් කලින් කල නිර්ණය කරනු ලැබූ කලාපයක් තුළට අයත් ස්ථානයක ප්‍රදර්ශනය කිරීමට වන ඉල්ලීමක් විය යුතුය ;

(ii) දැන්වීම ප්‍රදර්ශනය කිරීමට ඉල්ලා සිටින ස්ථානය සඳහා වෙනත් තැනැත්තෙකුට කලින් නිකුත් කල අවසර පත්‍රයක වලංගු කාල සීමාව අවසන් වී තිබිය යුතුය. එසේ වුවද කලින් නිකුත් කල හා තවදුරටත් වලංගු අවසර පත්‍රයක් යටතේ ප්‍රදර්ශනය කරනු ලබන කිසියම් දැන්වීම් පුවරුවක සඳහන් දැන්වීම දර්ශනය වීමට බාධාවක් නොවන පරිදි ඊට ආසන්නයේ දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කිරීමට අවසර පත්‍රයක් නිකුත් කිරීමට මේ විධිවිධාන බාධාවක් නොවිය යුතුය ;

(iii) ප්‍රදර්ශන අවසර පත්‍රය ඉල්ලා සිටින දැන්වීම් අසභ්‍ය හෝ පිළිකුල් සහගත හෝ සදාචාර සම්පන්න නොවන හෝ කිසියම් සංස්කෘතියකට හානිකර හෝ කවර හෝ ආගමකට හෝ ජන වර්ගයකට හෝ ජන කොට්ඨාසයකට හානිවන හෝ එවැනි තත්වයක් ඇති වීමට ඉඩ තිබෙන හෝ ආකාරයේ දර්ශන හෝ වදන් හෝ ඇතුලත් වන ආකාරයේ දැන්වීමක් නොවිය යුතුය ;

(iv) කවර හෝ ලිඛිත නීතියකින් තහනම් කර හෝ සීමා කර ඇති ආකාරයේ ප්‍රචාරක දැන්වීමක් හෝ ප්‍රදර්ශනය කිරීමක් නොවිය යුතුය ;

(v) අවසර පත්‍රයක් ලබා ගැනීමට ඉදිරිපත් කරන සෑම ඉල්ලුම්පත්‍රයක්ම සමඟ මිලිමීටර් 210 x මිලිමීටර් 297 ප්‍රමාණයේ කඩදාසියක 1:1000 පරිමාණයට අනුව පිළියෙක කල දැන්වීමේ ආදර්ශයක් සහ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන ස්ථානයේ හෝ ස්ථානවල මිලිමීටර් 210 x මිලිමීටර් 297 ප්‍රමාණයේ කඩදාසියක 1:1000 පරිමාණයට අඳින ලද භූමි සැලැස්මක් ද ඉදිරිපත් කර තිබිය යුතු අතර, ප්‍රචාරක දැන්වීමේ නියම දිග හා පළල එහි සටහන් කර තිබිය යුතුය ;

(vi) ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානයක් ;

ඉල්ලුම්කරු නොවන වෙනත් යම් තැනැත්තෙකුට හෝ යම් අධිකාරියකට අයත් ස්ථානයක් වන විට ඒ තැනැත්තාට හෝ ඒ අධිකාරිය විසින් එකී ප්‍රචාරක දැන්වීම ඒ ස්ථානයේ ප්‍රදර්ශනය කිරීමට අවසර දී ඇති බව තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර තිබිය යුතුය.

08. ප්‍රචාරක දැන්වීම අසලින් ගමන් ගන්නා කවර හෝ තැනැත්තෙකුට හෝ වාහනයකට හෝ අවහිර වීමක් හෝ අනතුරක් සිදුවන ආකාරයෙන් කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් ප්‍රචාරක දැන්වීමක් සවි නොකළ යුතුය. එසේම වාහන පදවාගෙන යනු ලබන කිසියම් රියැදුරෙකුගේ අවධානය වෙනස් කරන ආකාරයෙන් හෝ ඔහුගේ දර්ශනයට අවහිරවන ආකාරයෙන් විදුලි ආලෝකධාර සවිකිරීම හෝ ප්‍රතිදීප්ත කිරීම නොකළ යුතුය.

09. ඉදිරිපත් කරනු ලැබ ඇති කිසියම් ඉල්ලුම් පත්‍රයක් වෙනුවෙන් මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ අවසර පත්‍රයක් නිකුත් කිරීමට අවශ්‍ය නියමයන් සම්පූර්ණ කර ඇති විටක ඒ බව සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් ඉල්ලුම්කරුට දැන්විය යුතුය. ඉල්ලුම්කරුට එකී දැන්වීම ලැබීමෙන් අනතුරුව ඔහු විසින් 10 වැනි වගන්තියේ සඳහන් ආකාරයේ අවසර පත්‍ර ගාස්තුව සහ II වගන්තියේ සඳහන් ඇප මුදල මෙම සභාව වෙත ගෙවනු ලැබීමෙන් පසුව අදාළ අවසර පත්‍රය නිකුත් කිරීම සභාපතිවරයාගේ හෝ බලයලත් නිලධාරියාගේ කාර්යය විය යුතුය.

10. (i) මෙම කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලබන සෑම අවසර පත්‍රයක් මත මෙම සභාව වෙත ගෙවනු ලැබිය යුතු අවසර පත්‍ර ගාස්තුව ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කර *රජයේ ගැසට් පත්‍රය* මඟින් ප්‍රකාශයට පත් කරන ගාස්තුවක් විය යුතු වේ ;

(ii) කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය සඳහා නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයේ කාලය අවසන්වීමෙන් අනතුරුව අනුගාමී කාලයක් තුලදී ද එකී ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය වන අවස්ථාවක ඒ අනුගාමී කාලය සඳහා එකී දැන්වීම ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් නව අවසර පත්‍රයක් ලබාගත යුතුය ;

(iii) මේ අතුරු ව්‍යවස්ථාවේ කුමක් සඳහන්ව තිබුණද කිසියම් ආගමික කාර්යයක්, දේශපාලන මහජන රැස්වීමක් හෝ මුදල් අයකිරීමකින් තොරව පවත්වනු ලබන යම් සංස්කෘතික කාර්යයක් සම්බන්ධ ප්‍රචාරක දැන්වීමක් ලබන ශුද්ධ මුදල් ප්‍රමාණය පුණ්‍ය කටයුතු සඳහා යොදවන යම් ප්‍රසංගයක දැන්වීමක් අවසර පත්‍ර ගාස්තුවෙන් නිදහස් විය යුතුය : එසේ වුවද එවැනි ප්‍රචාරක දැන්වීමක් සඳහා මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල අනෙකුත් විධිවිධාන ඒ ආකාරයෙන් ම අදාළ විය යුතුය ;

11. (i) ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන කිසියම් ඉල්ලුම්පත්‍රයක් වෙනුවෙන් අවසර පත්‍රයක් නිකුත් කිරීමට තීරණය කර ඇති අවස්ථාවක, මෙම සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ප්‍රමාණයේ ඇප මුදලක් ඉල්ලුම්කරු විසින් මෙම සභාවේ තැන්පත් කරනු ලබන තෙක් සභාපතිවරයා විසින් එකී ඉල්ලුම්පත්‍රයට අවසර පත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතුය ;

(ii) කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර පත්‍රයක් නිකුත් කිරීමට පෙර මෙම සභාවේ තැන්පත් කළ යුතු ඇප මුදල් ප්‍රමාණය පිළිබඳව මෙම සභාව විසින් ගනු ලබන තීරණය ගැසට් පත්‍රයේ නිවේදනය කිරීම සභාපතිවරයාගේ කාර්යය විය යුතුය.

12. ප්‍රදර්ශනය කරනු ලබන සෑම දැන්වීමක් සඳහා නිකුත් කළ අවසර පත්‍රයේ අංක ඒ දැන්වීම හෝ දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට පෙර එක් එක් දැන්වීමේ දකුණු පස පහළ කෙළවරේ සටහන් කිරීම අවසරපත්‍ර ලාභියාගේ කාර්යය විය යුතුය.

13. (i) කිසියම් ප්‍රචාරක දැන්වීමක් සවිකිරීම සඳහා යොදා ගනු ලබන කවර අන්දමේ හෝ දැකුම් පැළැල්ලක්, ආධාරකයක්, ඉදිකිරීමක් හෝ සවිකිරීමක් පරිසරයට හානි වන ආකාරයේ හෝ කිසියම් තැනැත්තෙකුට හෝ යම් තැනැත්තෙකුගේ දේපලකට අන්තරායදායක වන හෝ හානි වන ආකාරයේ පවතින අවස්ථාවක එය නිශ්චිත කාලයක් ඇතුළත යථා තත්ත්වයට පත්කරන ලෙස අවසරපත්‍ර ලාභියාට යොමු කරන දැන්වීමක් මඟින් නියම කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිළධාරියාට බලය තිබිය යුතුය.

(ii) ඉහත I ඡේදය යටතේ වන දැන්වීමක් ලැබූ කවර හෝ තැනැත්තකු එකී දැන්වීමේ සඳහන් කාලය තුළ ඒ දැන්වීමේ සඳහන් නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක දී සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් එකී ප්‍රචාරක දැන්වීම සඳහා නිකුත් කළ අවසර පත්‍රය අවලංගු කිරීම සහ ඒ ප්‍රචාරක දැන්වීම ගලවා ඉවත් කිරීම නීත්‍යානුකූල විය යුතුය.

(iii) ඉහත II ඡේදයේ විධිවිධාන යටතේ කිසියම් බලපත්‍රයක් අවලංගු කර ඇති අවස්ථාවක එකී ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම සඳහා මෙම සභාවේ තැන්පත් කරනු ලැබ ඇති ඇප මුදල මෙම සභාව සතු විය යුතු වුවාත් හැර ඒ ඇප මුදල් ඉල්ලා සිටීමට වෙනත් කවර හෝ තැනැත්තෙකුට අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

14. ප්‍රදර්ශනය සඳහා වලංගු බලපත්‍රයක් ලබාගෙන ප්‍රදර්ශනය කරන කවර හෝ දැන්වීමකට සිදුවන යම් හානියක් හෝ විකෘති කිරීමක් හෝ ඉවත් කිරීමක් සම්බන්ධයෙන් මෙම සභාව කවර ආකාරයක හෝ වගකීමකට යටත් නොවිය යුතුය.

15. මෙම කොටසේ අතුරු ව්‍යවස්ථාවල කවර හෝ නියමයක් කඩකර ඇති අවස්ථාවක, ඒ කඩකිරීම පිළිබඳව අවධානය යොමුකරන නිවේදනයක් සමඟ නිකුත් කරනු ලැබූ කිසියම් අවසර පත්‍රයක් අවලංගු කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියාට බලය තිබිය යුතුය.

16. කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක් මඟින් එකී ප්‍රචාරක දැන්වීමේ සඳහන් අර්ථය හෝ ප්‍රකාශිතය ඉදිරිපත් කිරීම සඳහා දෙනු ලැබූ නීතිමය අවසරයක් ඇතුළත් වූ ලෙස නොසැලකිය යුතු අතර, එලෙස තේරුම් ගැනීම ද නොකළ යුතුය.

17. කිසියම් ප්‍රචාරක දැන්වීමක් ඉදිකිරීම සඳහා පාවිච්චි කරන කවර හෝ ඉදිකිරීමක ආධාරකයක්, සවිකිරීමක් හෝ ඒ සඳහා පාවිච්චි කරන වෙනත් යම් කිසිවක් හෝ එකී ප්‍රචාරක දැන්වීමෙන් ප්‍රකාශිත අර්ථය හෝ ගම්‍ය වන අන්‍යාර්ථයක් හේතුවෙන් කිසියම් පාර්ශවයකට සිදුවන හෝ සිදුවීමට ඉඩ ඇති කිසියම් අලාභයක් හෝ හානියක් සම්බන්ධයෙන් අවසරපත්‍ර ලාභියා වගකීමට යටත් විය යුතුය.

18. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ අවසර පත්‍රයක් ලබා ගැනීමට ඉදිරිපත් කළ ඉල්ලුම්පත්‍රයේ සඳහන් කරන ලද ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කරනු ලබන අවසාන දිනයෙන් පසුව පැය හතලිස් අටක් ගතවීමට මත්තෙන් එකී ප්‍රචාරක දැන්වීම හා ඊට යොදාගත් වෙනත් සියලුම ද්‍රව්‍ය කොටස් ඒ ස්ථානයෙන් හෝ ස්ථානවලින් ඉවත් කරවීමට සැලැස්වීම එකී අවසරපත්‍ර ලාභියාගේ කාර්යය විය යුතුය.

19. (i) 18 වන වගන්තියේ සඳහන් ආකාරයෙන් ක්‍රියා කිරීමෙන් අනතුරුව සභාපතිවරයා වෙත ලිඛිතව කරනු ලබන ඉල්ලීමක් මත අදාළ අවසර පත්‍රය නිකුත් කිරීමට පෙර සභාවේ තැන්පත් කරනු ලැබූ තැන්පත් මුදල් ආපසු ලබා ගැනීමට අවසර පත්‍රලාභියාට හැකිය.

(ii) ඉහත I ඡේදයේ සඳහන් ආකාරයට ලිඛිත ඉල්ලීමක් ලැබීමෙන් අනතුරුව එකී තැන්පත් මුදල් අවසරපත්‍රලාභියා වෙත නිදහස් කිරීමට පෙර :

(අ) 18 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් අවසර පත්‍රලාභියා විසින් නිසි ආකාරයෙන් ඉටු කර තිබේද යන බව සනාථ කළ යුතුය ;

(ආ) අවසර පත්‍රලාභියා විසින් 18 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට ක්‍රියාකර ඇති බව සහ මෙම සභාවේ දැකුම් පැළැල්ලට හානියක් සිදුවී නොමැති බව සභාපතිවරයා සෑහීමකට පත්වන්නේ නම් මිස එකී තැන්පත් මුදල අවසර පත්‍රලාභියා වෙත සම්පූර්ණයෙන් නිදහන් කිරීම නොකළ යුතුය. කිසියම් අවසර පත්‍රලාභියෙකු විසින් 17 වන වගන්තියේ සඳහන් ආකාරයට ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක හෝ මෙම සභාවේ දැකුම් පැළැල්ලට හානියක් සිදුවී ඇති විට, අවස්ථානෝචිත පරිදි ඒ කාර්යය කිරීම හෝ දැකුම් පැළැල්ල අලුත්වැඩියා කිරීම හෝ ඒ කාර්යයන් දෙකම සඳහා මෙම සභාවට දරන්නට සිදුවන වියදම තැන්පත් මුදලෙන් අඩු කරගත යුතු අතර, ඉතිරිවන යම් මුදල් ප්‍රමාණයක් වේ නම් ඒ මුදල පමණක් අවසර පත්‍රලාභියාට ආපසු ගෙවිය හැකිය ;

(ඇ) (ආ) ඡේදය සඳහන් ආකාරයට ක්‍රියා කිරීමේ දී මෙම සභාවට අයකර ගත යුතු මුදල තැන්පත් කරනු ලැබූ ඇප මුදලට වඩා වැඩිවන අවස්ථාවක එසේ වැඩිවූරටත් අයවිය යුතු මුදල අවසරපත්‍රලාභියා විසින් මෙම සභාවට ගෙවිය යුතුය.

20. මෙම සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන කිසියම් ව්‍යාපාරික ස්ථානයක හෝ කර්මාන්ත ශාලවක නාමය, ලිපිනය සහ එකී ව්‍යාපාරික ස්ථානයේ කරනු ලබන ව්‍යාපාරයේ ස්වභාවය හෝ කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදනවල ස්වභාවය හෝ පෙන්නුම් කෙරෙන දැන්වීම් පුවරු එකක් පමණක් එකී ව්‍යාපාරික ස්ථානයේ හෝ කර්මාන්ත ශාලාවේ ඉදිරිපස ප්‍රදර්ශනය කිරීම, කිසියම් ප්‍රසංගයක් පවත්වනු ලබන ස්ථානයක ඒ ප්‍රසංගයට අදාළ ප්‍රදර්ශනය කෙරෙන ප්‍රචාරක දැන්වීම, ගෘහ නාම පුවරු, නිල නාමපුවරු සහ කිසියම් දේපලක් බදුදීමට හෝ විකිණීමට හෝ කුලියට දීමට හෝ එකී දේපළ මත ප්‍රදර්ශන කරනු ලබන "බදුදීමට තිබේ" හෝ "විකිණීමට තිබේ" හෝ "කුලියට දීමට තිබේ" යනුවෙන් සඳහන් වන ප්‍රචාරක දැන්වීම් එකක් පමණක් සඳහා මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන අදාළ නොවිය යුතුය. එසේ වුව ද ඒ ආකාරයේ දැන්වීම් පුවරු එකකට වැඩි ප්‍රමාණයක් ප්‍රදර්ශනය කරන යම් අවස්ථාවක එසේ වැඩිවන සෑම දැන්වීම් පුවරුවක් ම සඳහා මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන බලපැවැත්විය යුතු ය.

21. රජය හෝ පළාත් සභාව හෝ මෙම සභාව විසින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීමක් සම්බන්ධයෙන් මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන අදාළ නොවිය යුතුය.

22. කිසියම් ව්‍යාපාරික ස්ථානයක නාමය, අංකය සහ හෝ ලිපිනය සමඟ වෙනත් කිසියම් වෙළෙඳ භාණ්ඩයක හෝ සේවාවක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කරනු ලැබ ඇති අවස්ථාවක සහ කිසියම් නිවාසයක කවර හෝ ආකාරයේ වෙළෙඳ භාණ්ඩයක හෝ සේවාවක ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කර ඇති අවස්ථාවක, ඒ ප්‍රචාරක දැන්වීම හෝ ප්‍රචාරක දැන්වීම් මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට යටත් විය යුතුය. මේ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන සම්බන්ධයෙන් අවසර පත්‍ර ලබාගත යුතු තැනැත්තා ලෙස එකී ව්‍යාපාරික ස්ථානයේ හෝ නිවාසයේ හිමිකරු, කළමණාකරු, හෝ ඒ අවස්ථාවේ එහි පාලනය භාරව සිටින කවර හෝ තැනැත්තෙකු අදහස් විය යුතුය.

23. කිසියම් තැනැත්තෙකු විසින් :

(i) යම් වීදියක පාරක හෝ අඩිපාරක රිය මඟට උඩින් හෝ හරහා හෝ නෙරා සිටින ආකාරයට ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ ;

(ii) පොලවේ සිට මීටර් 12ක් ඉක්ම වන උසකින් ඇති යම් පුවරුවක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ ;

(iii) කිසියම වීදියකට හෝ පාරකට මුහුණලා යම් පිහිටි ගොඩනැගිලි මුහුණතෙහි හෝ වෙළඳසැල් නාම පුවරුවක හෝ ඒ ගොඩනැගිලි මුහුණතෙහි සීමාව ඉක්මවා යන දිගකින් යුත් ප්‍රචාරක දැන්වීමක් සවිකොට නැතහොත් එල්ලා තැබීම ;

(iv) ගුවන් නාම පුවරුවක ස්වරූපයේ ප්‍රචාරක දැන්වීමක් ප්‍රාදේශීය සභාවේ පූර්ව අනුමැතිය ලබානොගෙන යම් ආකාරයකට තැබීම හෝ ඉදිකිරීම නොකළ යුතුය.

24. කිසියම් තැනැත්තෙකු විසින් පෞද්ගලික හෝ පොදු ගොඩනැඟිල්ලක පොදු පූජනීය ස්ථානයක, පොදු උද්‍යානයක හෝ යම් පාලමක හෝ පාර හරහා ඇති එකී පාලමක, දුරකථන හෝ විදුලි රැහැන් කණුවක පැතිබැම්මක, වේල්ලක, අමුණක, බෝක්කුවක, පර්වතයක, ඉවුරක හෝ ගසක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය නොකළ යුතුය.

25. යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා නියමිත අවසර පත්‍රයක් ලබාගෙන ඇති බව පෙන්වීම යම් ප්‍රචාරක දැන්වීමක ප්‍රාදේශීය සභාව විසින් ඇතුලත් කර ඇති යම් ලාංඡනයක්, සලකුණක්, අක්ෂයක්, වචනයක් හෝ ඉලක්කමක් කිසියම් තැනැත්තෙකු විරූපී කිරීම හෝ නොකල යුතුය.

26. මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් කවර හෝ විධිවිධානයක් වුවද උල්ලංඝනය කිරීම වරදක් වන අතර, එම තැනැත්තා නිසි බලය ඇති අධිකරණයක් ඉදිරියේ එම වරදට වදරකරු කරනු ලැබූ විට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) වගන්තියේ සඳහන් සීමාවන්ට අනුකූල වන දඩයකට යටත් විය යුතුය.

27. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල

"කටවුට්" යන්නෙන්, ලී හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් යොදා ගනිමින් සකස් කල කිසියම් රාමුවක අලවන හෝ සවිකරන ලද ප්‍රචාරක දැන්වීමක් ද ;

"දැකුම් පැළැල්ල" යන්නෙන් ජනතාවගේ දැනගැනීම හෝ අවධානය සඳහා ප්‍රදර්ශනය කරනු ලබන කිසියම් ප්‍රචාරක දැන්වීමක් සවිකිරීම හෝ රඳවා තැබීම පිණිස ඉදිකරනු ලබන කවර හෝ ආකාරයක ස්ථිර පුවරුවක් ද ;

"ප්‍රචාරක දැන්වීමක්" යන්නෙන්, කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් ඉඩමක හෝ ගොඩනැගිල්ලක හෝ නිර්මිතයක ප්‍රදර්ශනය කරනු ලබන හා ජනතාවගේ දැනගැනීම හෝ අවධානය පිණිස ප්‍රදර්ශනය කරන, අලවන, සවිකරන, ඉදිකරන, එල්ලා තබන හෝ වෙනත් ආකාරයකින් ස්ථානගත කරනු ලබන ප්‍රචාරක කාර්යය සඳහා යොදා ගනු ලබන හෝ කිසියම් අක්ෂර හෝ වචන හෝ රූප සටහන් හෝ ඇතුළත් වන ප්‍රචාරක දැන්වීමක් හෝ බැනරයක් හෝ කටවුට් එකක් හෝ කිසියම් ආකාරයක අනුරුවක් හෝ දැන්වීමක් හෝ නිවේදනයක් හෝ වෙළෙඳ දැන්වීමක් ද, විද්‍යුත් හෝ විදුලි බලය භාවිතයෙන් ප්‍රදර්ශනය කරන දැන්වීමක්ද අදහස් වේ.

**පළමු වන උපලේඛනය**

03 වන වගන්තිය

**.......................................................... සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා වන බලපත්‍රය**

ගෙවන ලබ බලපත්‍ර ගාස්තුව රු. ........................................................... බලපත්‍රයේ අනුක්‍රමික අංකය : ..................................................

ඇප මුදලේ ප්‍රමාණය රු. ........................................................................................

............................................................................හි පදිංචි, ජාතික හැඳුනුම් පත්‍රය හිමිකරු වන .................................................. යන අයට ප්‍රචාරක දැන්වීම් විධිමත් කිරීම, අධීක්ෂණය හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල නියමයන්ට යටත්ව 20...................මස ........................ වන දින ................................ සිට 20..................... මස ................................. වන දින දක්වා වන කාලය ඇතුළත........................................ සභා සීමාවේ පහත සඳහන් ස්ථානයේ/ස්ථානවල ප්‍රචාරක දැන්වීම්/ දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට මෙයින් බලය දෙනු ලැබේ.

ප්‍රචාරක දැන්වීම/දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට බලය ලබා දී ඇති ස්ථානය/ස්ථාන

01. ..............................................................................................................
02. ..............................................................................................................
03. ..............................................................................................................

දිනය : ..........................................

..........................................................................
බලයලත් නිලධාරියා.

...................................................................
සභාව.

**දෙවන උපලේඛනය**

06 වන වගන්තිය

**ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය සඳහා අයදුම් පත්‍රය**

01. අයදුම්කරුගේ නම : ....................................................................................................

02. ලිපිනය : ....................................................................................................................

03. ජාතික හැඳුනුම් පත්‍රයේ අංකය : .........................................................................

04. දුරකථන අංකය : ........................................................................................

05. ඊමේල් ලිපිනය : ........................................................................................

06. ප්‍රචාරක දැන්වීම් පිළිබඳ විස්තරය :

(i) දැන්වීමේ ප්‍රමාණය : දිග සෙ.මී. ................................................ පළල ............................................

(ii) දැන්වීම් සංඛ්‍යාව : ....................................................................

(iii) දැන්වීම් අන්තර්ගතය : ....................................................................

(iv) ස්ථානගත කරන අන්දම : ....................................................................

(v) ස්ථානගත කරන තැන් : ....................................................................

(7 වන අතුරු ව්‍යවස්ථාවේ (v) වන ඡේදයේ සඳහන් ආකාරයේ ආර්ශයක් අමුණන්න.)

07. ඉල්ලා සිටින අවසර පත්‍රය වලංගු වන කාලසීමාව :

| | | | | | |
|---|---|---|---|---|---|
| ආරම්භක දිනය | 20 .......................... | මස | ................................ | දින |
| අවසන් වන දිනය | 20 .......................... | මස | ................................ | දින |

ප්‍රචාරක දැන්වීම විධිමත් කිරීම, අධීක්ෂණය හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල නියමයන් සියල්ලම පිළිපදින බවටත්, බලපත්‍රයේ වලංගු කාලය අවසන් වී දින 02ක් ගතවීමට මත්තෙන් බලපත්‍රයට අදාළ ප්‍රචාරක දැන්වීම/දැන්වීම් හා ඊට යොදගෙන ඇති සියලු ද්‍රව්‍යයන් මාගේ වියදමින් එකී ස්ථානයේ/ස්ථානවලින් ඉවත් කිරීමටත් ක්‍රියා කරන බවට මෙයින් පොරොන්දු වෙමි.

දිනය : ....................................................  ..................................................................,

ඉල්ලුම්කරුගේ අත්සන.

***18 වැනි කොටස***

*හෝටල්*

01. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ හෝටල් පවත්වාගෙන යාම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම, පාලනය කිරීම සහ ඒ සඳහා බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව වූ අතුරු ව්‍යවස්ථාවයි.

02. සභාපති විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ හෝටලයක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

03. මේ කොටස අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ඉල්ලා සිටින කවර හෝ තැනැත්තෙකු විසින් මේ කොටසේ ''අ'' උපලේඛනයේ සඳහන් ආකෘතියට අනුකූලව පිළියෙල කරන ලද ඉල්ලුම්පත්‍රයක් සභාපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

04. මේ කොටසේ 02 වැනි වගන්තියේ සඳහන් වාර්ෂික බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය සභාව අනුමත කර ඇති ගාස්තුවක් බලපත්‍රය ලබා ගැනීමට ප්‍රථම ගෙවිය යුතු ය. එකී ගාස්තු සෑම වර්ෂයක් වෙනුවෙන්ම රජයේ ගැසට් පත්‍රයෙහි සභාව විසින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි විය යුතු ය.

05. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක්වන දිනෙන් අවසන් විය යුතු ය.

06. මේ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස සභාපතිවරයා විසින් කවර හෝ හෝටලයකට බලපත්‍රයක් නිකුත් කිරීම නොකල යුතු ය.

(i) ස්ථානය මනා අලුත්වැඩියා තත්වයකින් පවත්වාගෙන යා යුතුය ;

(ii) ස්ථානයේ සෑම කාමරයකම බිත්ති මීටර් 3කට නොඅඩු උසකින් යුක්ත විය යුතු අතර, එහි බිත්ති ගඩොලෙන්, සිමෙන්ති ගලෙන් හෝ කබොක් ගලෙන් තනා තිබිය යුතු අතර, දෙපැත්තම කපරාරු කර තීන්ත ආලේප කර තිබිය යුතු ය. එසේ වුව ද මුළුතැන්ගේ හැර වෙනත් කාමර ලීයෙන් හෝ කිසියම් ලෝහ තහඩු වර්ගයකින් හෝ ලී හා කිසියම් ලෝහ තහඩු වර්ගයකින් තනා තීන්ත ආලේප කර තිබීම මේ නියමයට අනුකූලව වන ලෙස සැලකිය යුතු ය ;

(iii) ස්ථානයේ සෑම කාමරයකම සිවිලිමක් බැගින් සවිකර තිබිය යුතු අතර එකී සිවිලිම පොළව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 03කට නොඅඩු උසකින් තිබිය යුතු ය ;

(iv) සෑම කාමරයකම විවෘත කල හැකි ජනේල සවිකර තිබිය යුතු අතර ඒ එක් එක් කාමරයේ ජනේල විවෘත කල විට ඒ ජනේල කවුළුවල වර්ගඵලය කාමරයේ බිම වර්ග ඵලයෙන් 1/15කට නොඅඩු විය යුතු ය. එසේ වුවද කිසියම් කාමරයක් වායු සමනය කර ඇති අවස්ථාවකදී මේ නියම අදාළ නොවිය යුතු ය ;

(v) වහල කිසියම් ස්ථිර ද්‍රව්‍යකින් තනා තිබිය යුතු ය ;

(vi) පියසි කෙලවරවල් පොළව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.5කට උසින් පිහිටා තිබිය යුතු අතර අගු වාසිය අවම වශයෙන් මීටර් 1.5ක් විය යුතු ය ;

(vii) සෑම කාමරයකම බිම සිමෙන්ති දමා කපරාරු කර සිමෙන්තියෙන් මැද හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය ;

(viii) ස්ථානය තුළ ජනනය වන කසල රැස්කිරීම සඳහා කසල භාජන තබා තිබිය යුතු අතර, මුළුතැන්ගෙය තුළ තබන කසල භාජන සඳහා මැස්සන් හෝ වෙනත් කෘමි සතුන්ට ඇතුල්විය නොහැකි වන ආකාරයෙන් වසා තැබිය හැකි පියන් තිබිය යුතු ය ;

(ix) ස්ථානය තුළ ජනනය වන කසල අපහරණය කිරීම සඳහා 24 වන වගන්තියෙහි නියමයන් අනුව ක්‍රියාකල හැකි ආකාරයට අවශ්‍ය විධිවිධාන සලස්වා තිබිය යුතු ය ;

(x) ස්ථානයේ මුළුතැන්ගෙය තුළ පාවිච්චියට ගනු ලබන සෑම මේසයක්ම :

(අ) ලීයෙන් තනා ඇති විට එහි පාද ඔපදමා තීන්ත ආලේප කර තිබිය යුතු අතර එහි මේසය මතුපිට ඔපදමා අපාරගම්‍ය ද්‍රව්‍යකින් හෝ මල නොබැඳෙන පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය ;

(ආ) යකඩ හෝ වානේ හෝ වෙනත් කිසියම් ලෝහයකින් තනා ඇති විට එහි පාද තීන්ත ආලේප කර තිබිය යුතු අතර මතුපිට ඔපදමා අපාරගම්‍ය ද්‍රව්‍යකින් හෝ මල නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය.

(xi) ස්ථානයේ ගනුදෙනුකරුවන්ගේ පාවිච්චියට තබා ඇති සෑම මේසයක්ම :

(අ) ලීයෙන් තනා ඇති විට එහි පාද ඔපදමා තීන්ත ආලේප කර තිබිය යුතු අතර එකී මේසය මතුපිට වීදුරු තහඩුවකින් හෝ ඔපදැමූ අපාරගම්‍ය ද්‍රව්‍යකින් හෝ මල නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය ;

(ආ) යකඩ හෝ වානේ වෙනත් කිසියම් ලෝහයකිනන් තනා ඇති විට එහි පාද තීන්ත ආලේප කර තිබිය යුතු අතර විදුරු තහඩුවකින් හෝ මතුපිට ඔපදැමූ අපාරගම්‍ය ද්‍රව්‍යකින් හෝ මල නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය.

(xii) ස්ථානයේ පාවිච්චියට ගන්නා ජලය මනුෂ්‍ය පරිභෝජන සඳහා සුදුසු වන බවට ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ තත්ත්ව සහතිකයක් ලබා තිබිය යුතුවාත් හැර අවම වශයෙන් සෑම මාස 06කට වරක් බැගින් මෙම තත්ව සහතිකය ගැනීම කළ යුතු ය. ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය ස්ථානයේ පාවිච්චිය සඳහා යොදා ගන්නේ නම් එකී තත්ත්ව සහතිකය ලැබී ඇති සේ සලකනු ලැබිය යුතු ය ;

(xiii) ස්ථානයේ කාර්යයන්ට යොදා ගන්නා ජලය ගබඩා කර තබන්නේ නම් එසේ ගබඩාකර තබන ජලය අපවිත්‍ර වීමෙන් වලක්වා ගැනීමට ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන සලස්වා තිබිය යුතු ය ;

(xiv) ගණුදෙනුකරුවන් විසින් පාවිච්චියට ගනු ලැබූ භාජන සේදීම සඳහා වෙනම කොටසක් ස්ථානයේ පවත්වාගෙන යා යුතු ය ;

(xv) ගණුදෙනුකරුවන්ගේ සහ සේවකයන්ගේ පාවිච්චිය සඳහා අවම වශයෙන් සෑම දහදෙනෙකුට එකක් බැගින් වන සේ ස්ත්‍රී හා පුරුෂ දෙපාර්ශ්වයට වෙන් වෙන් වශයෙන් වන වැසිකිළි හා කැසිකිළි තනා තිබිය යුතු ය :

(xvi) සෑම වැසිකිලියක හා කැසිකිලියකම බිත්ති ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන්, කබොක් ගලෙන් හෝ මල නොබැඳෙන ලෝහ තහඩුවලින් තනා බිම සිමෙන්තියෙන් කපරාරු කර සිමෙන්තියෙන් ඔප දමා හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය. එසේම තවදුරටත් ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබොක් ගලෙන් තැබූ බිත්ති වන විට ඒවා කපරාරු කර සිමෙන්තියෙන් ඔප දමා හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු වන අතර මල නොබැඳෙන ලෝහ තහඩුවලින් තැනූ බිත්ති වන විට ඒවා මතුපිට තීන්ත ආලේප කර තිබිය යුතු ය ;

(xvii) ස්ථානයේ සේවය නියුක්ත තැනැත්තන් පාවිච්චිය සඳහා නාන කාමර ප්‍රමාණවත් සංඛ්‍යාවක් තනා තිබිය යුතු අතර (xvi) වැනි ඡේදය සඳහන් වැසිකිළිවලට අදාළ නියමයන් එකී නාන කාමරවල බිමට සහ බිත්තිවලට අදාළ විය යුතු ය ;

(xviii) ස්ථානයේ ගණුදෙනුරුවන්ගේ පාවිච්චියට වෙන්කළ කොටස තුළ, ගණුදෙනුකරුවන්ගේ අත්සේදීමට මල නොබැඳෙන ලෝහ තහඩුවලින් හෝ පිඟන් මැටියෙන් තනා ඔපදැමූ හෝ ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් බැඳ පිඟන් ගඩොල් ඇල්ලූ බේසම් තනා තිබිය යුතු ය ;

(xix) ස්ථානයේ කවර හෝ කොටසක පාවිච්චියෙන් පසු බැහැර කරන අප ජලය අවහිරයකින් තොරව ගලා යාමට සුදුසු කාණු පද්ධතියක් ඇති කර තිබිය යුතු ය ;

(xx) ප්‍රාදේශීය සභාව විසින් අප ජලාපවහන පද්ධතියක් පවත්වා ගෙන යනු ලබන්නේ නම් ස්ථානයේ බැහැර කරන අපජලය ප්‍රාදේශීය සභාව විසින් නියම කරනු ලබන ආකාරයෙන් එකී අප ජලාපවාහන පද්ධතියට ගලා යාමට සැලැස්විය හැකි අතර එසේ නොවන අවස්ථාවක එකී අප ජලය උරා ගන්නා වලකට ගලා යාමට සලස්වා තිබිය යුතු ය ;

(xxi) ස්ථානයේ සාමාන්‍ය ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු අතර ස්ථානයට විදුලිය සම්බන්ධතාව ලබාගෙන ඇතිනම් අතිරේක වශයෙන් විදුලි ගිනි නිවීමේ උපකරන සපයා තිබිය යුතු ය ;

(xxii) ස්ථානයේ තේ, කෝපි හෝ කිරි පිළියෙළ කරනු ලබන කොටස පිරිද්දුම් නැති මල නොබැඳෙන ලෝහ තහඩුවකින් හෝ පිඟන් ගඩොල් අල්ලා හෝ වෙනත් අපාරගම්‍ය ද්‍රව්‍යකින් ආවරණය කර තිබිය යුතු ය ;

(xxiii) ස්ථානයේ ගණුදෙනුකරුවන්ට හා සේවකයින්ට නිදා ගැනීමට වෙන්කළ නිදන කාමරවල එක් තැනැත්තෙකුට නිදා ගැනීමට වෙන්කළ ඉඩ ප්‍රමාණය අවම වශයෙන් වර්ග මීටර් 04 කට නොඅඩු විය යුතු අතර සෑම නිදන කාමරයකම ඇඳුම් තැබීමට අල්මාරියක් හෝ කැබිනෙට්ටුවක්, තුවා රාක්කයක්, නවැතැන්කරුගේ හෝ නවාතැන්කරුවන්ගේ භාණ්ඩ තැබීමට මේසයක් හා වැසිකිළියක් සහිත නාන කාමරයක් තිබිය යුතු ය ;

(xxiv) කිසියම් බලපත්‍ර ලත් ස්ථානයක ඇති නිදන කාමර ඇතුළත කවර හෝ අවස්ථාවක -

(අ) තනි කාමරයක එක් ඇඳකට වැඩියෙන් ;

(ආ) යුගල කාමරයක ද්විත්ව ඇඳක් හෝ තනි ඇඳන් දෙකකට වැඩියෙන් ද ;

(ඇ) ත්‍රිත්ව කාමරයක ද්විත්ව ඇඳක් හා තනි ඇඳකට හෝ තනි ඇඳන් තුනකට වැඩියෙන් ද ;

(ඈ) පවුල් කාමරයක ද්විත්ව ඇඳන් දෙකක් හා තනි ඇඳක් හෝ ද්විත්ව ඇඳන් එකක් හෝ තනි ඇඳන් තුනක් හෝ තනි ඇඳන් පහකට වැඩියෙන් ද ;

තැබීම නොකළ යුතු ය.

07. තීන්ත ආලේප කර තිබිය යුතුයැයි සහ 4 වැනි වගන්තියෙහි නියම කර ඇති සෑම කොටසකම අවම වශයෙන් අවුරුද්දකට එක් වරක් බැගින් තීන්ත ආලේප කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

08. බලපත්‍රලත් ස්ථානය අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් ඇමදීම කළ යුතු අතර, අපජලය බැස යන කාණු අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් පිරිසිදුකර ජලයෙන් සෝදා හැරීම කළ යුතු ය.

09. බලපත්‍රලත් ස්ථානයේ නිදන කාමරයේ නිශ්චිතව වෙන්කර ඇති කාමරයක හැර වෙනත් කිසියම් කාමරයක කවර හෝ තැනැත්තකු නිදා ගැනීමට ඉඩදීම නොකළ යුතු ය.

10. 6 වැනි වගන්තියෙහි (xxiii) වැනි ඡේදයේ සඳහන් අවම ඉඩ ප්‍රමාණයට නොසැසඳෙන තැනැත්තන් සංඛ්‍යාවක් යම් නිදන කාමරයක නිදා ගැනීමට බලපත්‍රලාභියා විසින් ඉඩදීම නොකළ යුතු ය.

11. කිසියම් හෝටලයක තනි කාමරයක එක් තැනැත්තෙකුට වැඩියෙන් හෝ යුගල කාමරයක දෙදෙනෙකුට වැඩියෙන් හෝ ත්‍රිත්ව කාමරයක තුන්දෙනෙකුට වැඩියෙන් හෝ නිදා ගැනීමට ඉඩදීම බලපත්‍රලාභියා විසින් නොකළ යුතු ය. එසේ වුවද මේ කිසියම් කාමරයක නිදා ගන්නා යම් තැනැත්තෙකු වයස අවුරුදු දොළහට අඩු අයකු වනවිට මේ අතුරු ව්‍යවස්ථාවේ කාර්ය සඳහා ඔහු එක් අයකු ලෙස සැලකීම නොකළ යුතු ය.

12. බලපත්‍රලත් ස්ථානයේ රාත්‍රිය නතරවී සිටීමට පැමිණෙන එක් එක් තැනැත්තාගේ නම, ලිපිනය සහ අනන්‍යතාවය සටහන් කරන ලේඛනයක් සෑම බලපත්‍රලත් ස්ථානයකම පවත්වාගත යුතු අතර, සභාපතිවරයා බලයලත් නිලධාරියා හෝ කිසියම් පොලිස් නිලධාරියකු විසින් පරීක්ෂා කිරීමට ඉල්ලා සිටින අවස්ථාවකදී එකී ලේඛනය පරීක්ෂා කිරීමට ඉඩදීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

13. කිසියම් හෝටලයක නවාතැන් ගන්නා සෑම තැනැත්තෙකු ම තම අනන්‍යතාව බලපත්‍රලාභියා වෙත ඉදිරිපත් කළ යුතු අතර නවාතැන්පොළෙහි පවත්වාගෙන යනු ලබන අමුත්තන්ගේ ලේඛනයෙහි තමාගේ තොරතුරු ඇතුළත් කරන තීරුවෙහි අත්සන් කළ යුතු ය. එසේම තම අනන්‍යතාව ඉදිරිපත් නොකරන කවර හෝ තැනැත්තෙකුට බලපත්‍රලත් ස්ථානයේ කවර හෝ කොටසක නවාතැන් ගැනීමට සැලැස්වීම බලපත්‍රලාභියා විසින් නොකළ යුතු ය.

14. කවර හෝ හෝටලයක කිසිම කොටසක් සදාචාර විරෝධී කාර්යයන් සඳහා යොදා ගැනීමට ඉඩ නොදීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු අතර කවර හෝ තැනැත්තෙකු විසින් හෝටලයෙහි වෙනත් නවාතැන්කරුවන්ගේ හෝ හෝටලය ආසන්නයේ පදිංචිකරුවන්ට බාධාවක් වන ආකාරයෙන් ගීත ගායනා කිරීම හෝ තැටි වාදන යන්ත්‍ර ක්‍රියාකරවීම හෝ අනවශ්‍ය ආකාරයේ ශබ්ද ඇති කිරීමට ඉඩ නොදීම ද බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

15. බලපත්‍රලත් ස්ථානයේ සෑම නිදන කාමරයකම එක් ගණුදෙනුකරුවකු විසින් පාවිච්චි කරනු ලැබීමෙන් අනතුරුව තවත් ගණුදෙනුකරුවකුගේ පාවිච්චියට ඉඩ දීමට පෙර එකී නිදන කාමරයේ ඇඳ ඇතිරිලි, කොට්ටඋර, පොරෝනා, තුවා හා පාවිච්චිකළ වෙනත් රෙදි සෝදා පිරිසිදු කිරීමෙන් අනතුරුව මිස අන් ගණුදෙනුකරුවකුගේ පාවිච්චියට සැලැස්වීම නොකළ යුතුවාත් හැර පසුව පැමිණෙන ගණුදෙනුකරුවාට එකී කාමරය පාවිච්චි කිරීමට ඉඩදීමට පෙර එකී කාමරයේ ජනේල අවම වශයෙන් පැය 04 ක් වත් සම්පූර්ණයෙන් විවෘත කර තැබීමට සැලැස්විය යුතු ය.

16. සෑම බලපත්‍රලත් ස්ථානයකම සෑම කාමරයක්, හිණිපෙළක්, ආලින්දයක්, කාණුවක් සහ එකී ස්ථානයට අයත් ඉඩම ද සෑම දිනකම මධ්‍යහ්නයට පෙර අතුගෑමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය වන්නේය.

17. බලපත්‍රලත් ස්ථානයේ කිසියම් නිදන කාමරයක, ආහාර පිළියෙල කරනු ලබන ස්ථානයක හෝ ආහාර ගැනීමට වෙන්කල කිසියම් කොටසක කවර හෝ සත්වයෙකු තබා ගැනීම නොකළ යුතු ය.

18. බලපත්‍රලත් ස්ථානයේ ඇති වැසිකිළි හා කැසිකිළි අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් පිරිසිදු කර විෂබීජ නාශක යෙදවීම කළ යුතු අතර, දුර්ගන්ධය වහනය වීමෙන් තොරව පවත්වා ගත යුතු ය. එසේ වුවද ගණුදෙනුකරුවන්ගේ නවාතැන් ගන්නා කිසියම් කාමරයක වැසිකිළි දිනකට එක්වරක් පිරිසිදු කිරීම ප්‍රමාණවත් ලෙස සැලකිය යුතු ය.

19. බලපත්‍රලත් ස්ථානයේ ආහාරපාන පිළියෙල කිරීමට, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීමට හා ගණුදෙනුකරුවන්ගේ පාවිච්චියට ගනු ලබන භාණ්ඩ, භාජන සහ උපකරණ සෑම එකක්ම ඒවා පාවිච්චියට ගැනීමට පෙර පිරිසිදු ජලයෙන් සෝදා ගත යුතු අතර පාවිච්චි කිරීමෙන් පසුව සෝදා පිරිසිදු කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

20. බලපත්‍රලත් ස්ථානයේ ඒ ඒ කොටසේ එකතුවන සියලුම කසල 24 වැනි අතුරු ව්‍යවස්ථාවේ නියමකර ඇති ආකාරයෙන් වර්ග කර අපාරගම්‍ය ද්‍රව්‍යයකින් තැනූ භාජනයකට වහාම දැමීම සැලැස්විය යුතු අතර එකී කසල අවම වශයෙන් එක් වරක් හෝ

අවශ්‍ය වන්නේ නම් ඊට වැඩි වාර ගණනකින් ඒ ස්ථානයෙන් ඉවත් කිරීමට සැලැස්විය යුතු අතර එකී භාජනවලට කසල බහාලන අවස්ථාවේ දී හා ඉවත් කිරීමේදී හැර අන් සියලු වේලාවන්වලදී එම භාජනය හොඳින් වසා තැබිය යුතු ය.

21. බලපත්‍රලත් ස්ථානයෙන් ඉවත දමන කසල කවර හෝ අවස්ථාවක ස්ථානයේ බිම හෝ තැනින් තැන දැමීම නොකළ යුතු ය.

22. (අ) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අප ද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අපද්‍රව්‍ය -

(i) ජෛවභායන අපද්‍රව්‍ය ;

(ii) වීදුරු ;

(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය ;

(iv) පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය ;

(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස් ;

(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍යවලින් නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස් ;

(vii) අන්තරායකර අපද්‍රව්‍ය -
යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙළකර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(ආ) ඉහත (අ) ඡේදයේ සඳහන් ආකාරයට වර්ගකර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාවේ අප ද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස සභාපතිවරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරවීම කළ යුතු ය ;

23. සෑම බලපත්‍රලත් ස්ථානයක් ම මීයන්ගෙන්, මැස්සන්ගෙන් හෝ වෙනත් කෘමීන්ගෙන් තොරව පවත්වාගත යුතු අතර, එකී ස්ථානයේ තබාගන්නා ආහාර හෝ පාන පිළියෙල කිරීමට යොදා ගන්නා ද්‍රව්‍ය හා පිළියෙලකළ ආහාර හෝ පාන එකී සතුන්ගෙන් දූෂණය වීම වැළැක්වීමට අවශ්‍ය සියලුම විධිවිධාන සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

24. ගණුදෙනුකරුවන්ට ආහාර පිළිගැන්වීමේ දී ඒවා අතින් ඇල්ලීම නොකළ යුතු අතර, එකී ආහාර පිළිගැන්වීම සඳහා හැන්දක් හෝ ගැරුප්පුවක් හෝ වෙනත් ආකාරයක උපකරණයක් යොදා ගත යුතු ය.

25. කවර බලපත්‍රලත් ස්ථානයක බාලකළ කිරි කිසිවක් තබාගැනීම හෝ නොකළ යුතු ය. මේ අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා බාලකළ කිරි යන්නෙන් ජලය හෝ වෙනත් බාහිර ද්‍රව්‍යයක් හෝ ද්‍රවයන් එකතු කළ කිරි හෝ මේද නොවන කිරි ඝන ද්‍රව්‍ය සියයකට 85කට අඩු හෝ කිරි මේද සියයට 35කට අඩු එළකිරි හෝ මේද නොවන කිරි ඝනද්‍රව්‍ය සියයට 9කට හෝ කිරි මේද සියයට 7කට අඩු මීකිරි අදහස් වේ.

26. (අ) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතකදී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාලසීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය ;

(ආ) හොඳින් සෝදා පිරිසිදුකළ ඇඳුම් ඇඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ඇ) බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

27. බලපත්‍රලත් ස්ථානයේ ආහාර හෝ පාන වර්ග පිළියෙල කිරීම නියුක්ත සෑම සේවකයෙකු වෙතම පිළිවැසුම් සපයා තිබීමත්, එකී සේවකයන් කාර්යයේ නියුක්ත වන සෑම අවස්ථාවකම එකී පිළිවැසුම් පැළඳ සිටිය බවට සහතිකවීමක් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

28. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත සෑම සේවකයෙකු සඳහාම පිරිසිදු ජලය, පිරිසිදු තුවා, නියපොතු පිරිසිදු කිරීමට ඇති බුරුසු සහ සබන් හෝ සබන් දියර සපයා තිබිය යුතු ය.

29. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට ස්ථානය තුළ ව්‍යාපාරික කටයුතු කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

30. සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියකු විසින් කිසියම් බලයලත් ස්ථානයක පිළියෙල කරන හෝ විකිණීමට තබා ඇති යම් කෑම වර්ගයකින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබාගැනීමට නිත්‍යානුකූල විය යුතුවාක් හැර කවර හෝ බලපත්‍රලාභියකු විසින් එකී මිලදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතුය.

31. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් හෝටලයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 6 වන වගන්තියේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මෙම අතුරු ව්‍යවස්ථාවල හෝ කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනිවන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනකට පෙර එකී ස්ථානය ඒ නියමයන්ට අනුකූල තත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක්; සභාපතිවරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතුය.

32. ඉහත 31 වන වගන්තියෙහි සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියමකර ඇති ආකාරයට ක්‍රියා කළ යුතුය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට සභාපතිවරයාට බලය ලැබිය යුතුය. එසේ වුවද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින 14කට නොවැඩි විය යුතුය.

33. ඉහත 31 වන වගන්තියෙහි සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය සභාපතිවරයා විසින් අවලංගු කරනු ලැබීම නිත්‍යානුකූල විය යුතුය.

34. මෙම අතුරු ව්‍යවස්ථාවේ වගන්තිවලින් කවර හෝ වගන්තියක් හෝ වගන්තියක දැක්වෙන නියමයන් හෝ විධි විධානයක් කඩකිරීම හෝ උල්ලංඝනය කිරීම හෝ පිළිනොපැදීම වරදක් විය යුතුය.

35. ඉහත 34 වන වගන්තියෙහි සඳහන් කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට වරදකරු කරනු ලැබීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තියෙහි (2) වන උප වගන්තියේ සඳහන් රුපියල් හත්සිය පනහක් නොවැඩි දඩයකට යටත් විය යුතුය.

36. ඉහත 34 වන වගන්තියෙහි සඳහන් කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට වරදකරු කරනු ලැබීමෙන් අනතුරුව, 35 වන වගන්තියෙහි සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරනු ලද හෝ එම උල්ලංඝන ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලය ලත් වෙනත් නිලධාරියකු විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම තවදුරටත් කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම ඉහත කී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (2) උප වගන්තියෙහි සඳහන් අතිරේක දඩයකටද යටත් විය යුතුය.

37. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍යවන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

(i) "හෝටලය" යන්නෙන්, විකිණීම සඳහා පිසූ බත් සහ ව්‍යංජන පිළියෙල කරන හෝ තබා ගන්නා ප්‍රදර්ශනය කරන ස්ථානයක්, ආහාර වේලක් සඳහා කෑමට සුදුසු වෙනත් කවර හෝ පිළියෙල කළ ආහාර වර්ගයක් හෝ කිසියම් කෙටි ආහාර වර්ගයක් විකිණීම සඳහා පිළියෙළ කරන හෝ තබා ගන්නා හෝ ප්‍රදර්ශනය කරන ස්ථානයක් හෝ එකී කාර්යයන් සමග ගණුදෙනුකරුවන්ට නවාතැන් ගැනීමට ඉඩකඩ සලස්වා ඇති ස්ථානයක් අදහස් වේ ;

(ii) "බලපත්‍රලාභියා" යන්නට මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රලත් හෝටලේ කළමනා කටයුතු කරගෙන යන තැනැත්තෙකුද අදහස් වේ ;

(iii) "පොලිස් නිලධාරියා" යන්නෙන්, පොලිස් පරීක්ෂක නිලයට පහළින් නිලයක් දරන ශ්‍රී ලංකා පොලිස් සේවයේ පොලිස් නිළධාරියකු අදහස් වේ ;

(iv) "පවුල් කාමරය" යන්නෙන්, එකවර තැනැත්තන් තුන්දෙනෙකුට නවාතැන් ගැනීමට ප්‍රමාණවත් ඉඩ කඩක් සහ ද්විත්ව ඇඳන් දෙකක් හා තනි ඇඳන් හෝ ද්විත්ව ඇඳන් එකක් හා තනි ඇඳන් තුනක් හෝ තනි ඇඳන් 05ක් සහිත කාමරයක් ;

(v) "තනි ඇඳ" යන්නෙන්, අවම වශයෙන් දිග සෙන්ටි මීටර් 200ක් හා පළල සෙන්ටි මීටර් 95ක් වූ මෙට්ටයක් සහිත ඇඳක් ද;

(vi) "තනි කාමරය" යන්නෙන්, එක් තැනැත්තෙකු පමණක් නවාතැන් ගැනීමට ප්‍රමාණවත් ඉඩක් සහ එක් ඇඳක් සහිත කාමරයක් ;

(vii) "ත්‍රිත්ව කාමර" යන්නෙන්, එක් තැනැත්තන් තුන් දෙනෙකුට නවාතැන් ගැනීමට ප්‍රමාණවත් ඉඩ කඩක් සහ ද්විත්ව ඇඳක් හා තනි ඇඳක් හෝ තනි ඇඳන් තුනක් සහිත කාමරයක් ද ;

(viii) "යුගල ඇඳ" යන්නෙන්, අවම වශයෙන් දිග සෙන්ටිමීටර් 200ක් හා පළල සෙන්ටිමීටර් 125ක්වූ මෙට්ටයක් සහිත ඇඳක් ද ;

(ix) "යුගල කාමරයක්" යන්නෙන්, එක්වර තැනැත්තන් දෙදෙනෙකුට නවාතැන් ගැනීමට ප්‍රමාණවත් ඉඩකඩක් සහ ද්විත්ව ඇඳක් හෝ තනි ඇඳන් දෙකක් සහිත කාමරයක් ද අදහස් වේ.

**"අ" වන උපලේඛනය**

3 වන වගන්තිය

**හෝටලයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමේ ඉල්ලුම්පත්‍ර**

1. ඉල්ලුම්කරුගේ නම :
2. ඉල්ලුම්කරුගේ ස්ථිර ලිපිනය :
3. හෝටලයේ නම :
4. දේපළ අයිතිකරුගේ නම හා ලිපිනය :
5. හෝටලය පවත්වාගෙන යන ස්ථානයේ ලිපිනය :
6. වරිපනම් අකංය : වීදිය/පාර :
7. ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය :
8. හෝටලය පවත්වාගෙන යන ස්ථානය අයත් ග්‍රාම නිලධාරි කොට්ඨාසය :
9. හෝටලය සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්නම් එහි අංකය :
10. හෝටලය ආරම්භ කල දිනය :
11. හෝටලය කලින් ආරම්භ කරන ලද්දේ නම් හෝටලයෙන් පසුගිය වර්ෂය තුළ ලැබූ ආදායම :
12. කළමණාකරුගේ/භාරකරුගේ නම :
13. දුරකථන අංකය :
14. බලපත්‍රය ඉල්ලා සිටින වර්ෂය :
15. හෝටලයෙහි -
    - (i) තනි කාමර සංඛ්‍යාව :
    - (ii) යුගල කාමර සංඛ්‍යාව :
    - (iii) ත්‍රිත්ව කාමර සංඛ්‍යාව :
    - (iv) පවුල් කාමර සංඛ්‍යාව ;
    - (v) එකවර නවාතැන් ගත හැකි සම්පූර්ණ සංඛ්‍යාව :
16. හෝටලයෙහි නියුක්ත සේවක සංඛ්‍යාව (කළමණාකරු ද සමඟ) :
17. වැසිකිළි -
    - (i) පිරිමි සේවක වැසිකිළි සංඛ්‍යාව :
    - (ii) පිරිමි සේවක කැසිකිළි සංඛ්‍යාව :
    - (iii) ගණුදෙනුකාර පිරිමි වැසිකිළි සංඛ්‍යාව :
    - (iv) ගණුදෙනුකාර පිරිමි කැසිකිළි සංඛ්‍යාව ;
    - (v) ගණුදෙනුකාර කාන්තා වැසිකිළි සංඛ්‍යාව :
18. නාන කාමර -
    - (i) පිරිමි නාන කාමර :
    - (ii) කාන්තා නාන කාමර :

19. මුළුතැන් ගෙවල් සංඛ්‍යාව :
20. ජල සම්පාදන ප්‍රභවය :
21. ඝණ අපද්‍රව්‍ය අවසන් බැහැර කිරීම සිදුකරන ක්‍රමවේදය :
22. රාත්‍රි ආලෝකය සැපයීම පිළිබඳ විධි විධාන :

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. හෝටලය විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා වල නියමයන් පිළිපැදීමට එකඟ වෙමි. එකී අතුරු ව්‍යවස්ථා යටතේ ඉහත නම් සඳහන් හෝටලය පවත්වා ගෙන යාම සඳහා ....................................... වර්ෂය වෙනුවෙන් බලපත්‍රයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිමි.

දිනය : අයිතිකරු/කළමනාකරු/භාරකරුගේ අත්සන.

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

---

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි,
මෙම අයදුම්පතේ සඳහන් හෝටලය පරීක්ෂා කර වාර්තාවන් එවන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

.................................................

දිනය : සභා ලේකම්.

---

ගරු සභාපතිතුමා,

ප්‍රාදේශීය සභාව,

මෙම අයදුම්පතේ විස්තර සඳහන් හෝටලය සඳහා බලපත්‍ර ලබාදීම නිර්දේශ කරමි/නොකරමි.

......................................

දිනය : සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි.

---

ගරු සභාපතිතුමා,

මෙම අයදුම්පතේ විස්තර සඳහන් හෝටලය සඳහා .............................. වර්ෂයකට රුපියල් .......................................................ක බලපත්‍ර ගාස්තුවක් අය කිරීම නිර්දේශ කරමි.

.................................................

දිනය : අදායම් පරීක්ෂක/ආදායම් පරිපාලක.

---

ගරු සභාපතිතුමා,

බලපත්‍රය ලබා දීම නිර්දේශ කරමි/නොකරමි.

.................................................

දිනය : සභා ලේකම්.

---

බලපත්‍රය ලබා දීම අනුමත කරමි/නොකරමි.

.................................................

සභාපති.

අයකරන ලද බලපත්‍ර ගාස්තුව :

දිනය :

ලදුපත් අංකය :

බලපත්‍ර අංකය :

**19 වැනි කොටස**

**මස් විකිණීම**

01. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මස් විකිණීම සඳහා භාවිතා කෙරෙන ස්ථාන පරීක්ෂා කිරීම, විධිමත් කිරීම, පාලනය කිරීම සහ එම ස්ථානවලට බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාවයි.

02. කවර හෝ තැනැත්තෙකු විසින් සභාව විසින් ප්‍රකාශිත (පොදු වෙළඳ පොලක් නොවන) කවර හෝ ස්ථානයක සභාපතිවරයා විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් නොමැතිව මස් විකිණීමේ කාර්යය සඳහා යම් ස්ථානයක් පාවිච්චි නොකළ යුතු ය.

03. බලපත්‍රය ලබා ගැනීමට ඉල්ලුම් කරන වෙළඳ ස්ථානය මෙහි පහත දැක්වෙන කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස සභාපතිවරයා විසින් හෝ බලය පවරන ලද නිලධාරියා විසින් කවර හෝ තැනැත්තෙකුට මස් වෙළඳ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

(i) ගොඩනැගිල්ල සභාපතිවරයා විසින් අනුමත කරන ලද සැලැස්මකට අනුකූල වන සේ සාදනු ලැබිය යුතු ය ;

(ii) විකිණීම සඳහා මස් ප්‍රදර්ශනය කරනු ලබන කොටස පිඟන් ගඩොල් හෝ කපරාරු කළ සිමෙන්ති හෝ මළ නොබැඳෙන ලෝහ තහඩු හෝ යොදා තිබිය යුතුය ;

(iii) මස් විකිණීම සඳහා ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානයේ බිම සහ ගබඩා කිරීමේ ස්ථානයේ බිම සිමෙන්ති බදාමයෙන් මැදීම කර හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය ;

(iv) අප ජලය ගලායාම පහසු කිරීම සඳහා අවශ්‍ය බෑවුමක් සහිතව සිමෙන්තියෙන් මැදීම කරනු ලැබූ හෝ පිඟන් ගඩොල් ඇල්ලූ කානු තිබිය යුතු ය ;

(v) ඉහත IV වැනි ඡේදයේ සඳහන් කාණු තුළින් ගලාගෙන යන අප ජලය කිසියම් පොදු ජල මාර්ගයකට ගලායාම වැලැක්වීමට ප්‍රමාණවත් විධිවිධාන සලස්වා තිබිය යුතු අතර, එහි අප ජලය උරා ගන්නා වලකට ගලායෑමට ඉඩ සලස්වා තිබිය යුතු ය ;

(vi) අප ජලය ගලා යෑමට සලස්වන ලද උරා ගන්නා වාතයට (පරිසරයට) නිරාවරණය නොකළ යුතු ය ;

(vii) මස් වෙළඳ ස්ථානයෙන් බැහැර කරනු ලබන ජෛවහායනික අප ද්‍රව්‍ය බහාලීමට ප්‍රමාණවත් භාජන තබා තිබිය යුතු අතර, දෛනික වෙළෙඳාම් කටයුතු අවසානයේ එකී අපද්‍රව්‍ය පොළව මට්ටමෙන් අවම වශයෙන් මීටර් 1.5ක් ගැඹුරෙන් වල දැමීම හෝ සභාව විසින් කලින් තීරණය කර නියම කරනු ලබන නියමයන්ට අනුකූලව බැහැර කිරීමට කටයුතු කළ යුතු ය ;

(viii) වෙළඳ ස්ථානයේ සේවය කරන තැනැත්තන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රමාණවත් ජල මුද්‍රිත වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතු අතර, වැසිකිළි භාවිතයෙන් අනතුරුව පාවිච්චි කිරීමට සුදුසු සනීපාරක්ෂක ක්‍රම හා ද්‍රව්‍ය සපයා තිබිය යුතු ය.

04. ගෝ ඝාතක ආඥාපනතේ නියමයන් යටතේ විධිමත් බලපත්‍රයක් ලබාගෙන ඇති ගෝ ඝාතකාගාරයේ දී මරනු ලැබූ කිසියම් සතෙකුගේ මස් වන්නේ නම් මිස කවර හෝ මස් වෙළඳ ස්ථානයක අලෙවි කිරීම සඳහා හෝ අලෙවි කිරීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ කවර තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

05. මැස්සන් හෝ කෘමීන් හෝ වෙනත් කවර සතෙකුට ඇතුල්විය නොහැකි වන ආකාරයෙන් හොඳින් වසා තැබිය හැකි රථයක හෝ පෙට්ටියක හෝ වෙනත් යම් භාජනයක හෝ ආවරණය කර ප්‍රවාහනය කරන්නේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් කවර හෝ මසක් ප්‍රවාහනය නොකළ යුතුවාක් හැර එකී මස් ප්‍රවාහනය කිරීමෙන් පසුව ඒ මස් ප්‍රවාහනය කිරීම සඳහා පාවිච්චි කළ රථය හෝ පෙට්ටිය හෝ වෙනත් භාජන විෂබීජ නාශක යොදා හොඳින් සෝදා හැරීම කළ යුතු ය.

06. බලපත්‍රලත් කවර හෝ මස් වෙළඳ ස්ථානයක දෛනික කටයුතු අවසානයේ එකී ස්ථානයේ බිම ද බිත්තිවල පිඟන් ගඩොල් ඇල්ලූ හෝ සිමෙන්ති කපරාරු කළ කොටස් ද මස් කැපීම සඳහා ගන්නා කොටය ද, උපකරණ ද, මස් විකිණීම සඳහා ප්‍රදර්ශනයට තබන ස්ථාන විෂබීජනාශක දියර යොදා පිරිසිදු කිරීමට සැලැස්විය යුතු ය.

07. බලපත්‍රලත් කවර හෝ මස් වෙළඳ ස්ථානයක සහ එහි අවට ඇති කාණු ද, මස් ගබඩා කිරීම, සකස් කිරීම හෝ විකිණීම හා සම්බන්ධව පාවිච්චි කරන සියළු භාජන සහ උපකරණ ද මනා අලුත්වැඩියාවෙන් යුතුව සහ දුර්ගන්ධයකින් තොරව තබා ගැනීමට සැලැස්විය යුතුය.

08. බලපත්‍රලත් ස්ථානයේ දෛනික වෙළඳාම් කටයුතු අවසන් වීමෙන් අනතුරුව විකුණා ගැනීමට නොහැකි ශේෂ වන මස් අධි ශීතකරණයක ගබඩා කරනු ලැබ ඇත්තේ නම් හා එසේ ගබඩා කල අවස්ථාවේ සිට ඊළඟ දිනයේ මස් වෙළෙඳ සල විවෘත කරන අවස්ථාව දක්වා එකී අධිශීතකරණය නිසි ආකාරයෙන් ක්‍රියාත්මකව පැවති තිබුණේ නම් මිස ශේෂ වන කවර හෝ මසක් ඊළඟ දිනයේ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ අධි ශීතකරණයේ හෝ බලපත්‍රලත් ස්ථානයේ තබා ගැනීම නොකළ යුතු ය.

09. කවර හෝ ඝාතකාගාරයක් තුල කිසියම් දිනයක දී මස් පිණිස සතුන් මැරීම තහනම් කරමින් ගෝ ඝාතක ආඥාපනතේ 17 වැනි වගන්තියේ බලතල ප්‍රකාර නිසි අධිකාරය විසින් නියමයන් *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කර ඇති අවස්ථාවක කවර හෝ මස් කඩයක වෙළෙඳාම් පිණිස මස් තබා ගැනීම හෝ වෙළෙඳාම් පිණිස මස් ප්‍රදර්ශනය කිරීම හෝ ගබඩා කිරීම නොකළ යුතු ය.

10. බලපත්‍රලත් කවර හෝ මස් වෙළෙඳ ස්ථානයක බල්ලන්, බළලුන්, මීයන්, කෘමීන් හෝ වෙනත් කවර හෝ සතුන්ගෙන් තොරව තබා ගත යුතු ය.

11. බලපත්‍රලත් ස්ථානයෙහි මස් දමා තැබීමට හෝ සකස් කිරීමට හෝ විකිණීමට පාවිච්චි කරන උපකරණ හෝ භාජන හැර කිසිම භාජනයක් හෝ ඇඳුමක් හෝ නිදා ගන්නා පැදුරක් හෝ වෙනත් කවර හෝ දෙයක් තබා ගැනීම නොකළ යුතු ය.

12. බලපත්‍රලත් ස්ථානයේ සේවය කරන තැනැත්තන්ගේ පාවිච්චියට ගැනීම සඳහා බීමට සුදුසු ජලය ප්‍රමාණවත් ප්‍රමාණයක් තබා ගැනීම කළ යුතු ය.

13. (අ) කිසියම් ආසාදිත ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතක දී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ මස් වෙළෙඳ ස්ථානයක කවර හෝ ආකාරයක වෙළෙඳාමෙහි හෝ එසේ වෙළෙඳාමේ නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්තවීමට ඉඩදීම නොකළ යුතු ය ;

(ආ) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් ඇඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් මස් වෙළෙඳ ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය ;

(ඇ) මස් වෙළඳ ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

14. මස් වෙළඳ ස්ථානයෙහි සේවයේ යෙදෙන සෑම සේවකයෙකුම වෙනම ආරක්ෂිත මුව වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබීමත්, එකී සේවකයන් මස් වෙළඳ ස්ථානයෙහි සේවයේ නියුක්ත වන සෑම අවස්ථාවකම එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවට සහතිකවීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

15. සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් මස් වෙළඳ ස්ථානයෙහි විකිණීම සඳහා ප්‍රදර්ශනය කර ඇති හෝ ඇතුළත ගබඩාකර ඇති යම් මස් වර්ගයකින් සාම්පලයක් එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතුවාක් හැර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී මිලදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

16. (අ) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියළුම අපද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අපද්‍රව්‍ය -

(i) ජෛවභායන අපද්‍රව්‍ය ;

(ii) වීදුරු ;

(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය ;

(iv) පොලිතින් හා ප්ලාස්ටික් හෝ පොලිතින් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය ;

(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස් ;

(vi) නිෂ්පාදනය සඳහා යොදාගනු ලබන වෙනත් අමුද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස් ;

(vii) අන්තරාදායක අපද්‍රව්‍ය

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර, ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

(ආ) ඉහත අංක (අ) ඡේදයේ සඳහන් ආකාරයට වර්ගකර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතු ය.

17. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 03 වැනි වගන්තියේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියළු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් සභාපතිවරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

18. ඉහත 17 වැනි වගන්තියෙහි සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමක නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට සභාපතිවරයාට බලය තිබිය යුතුය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දාහතරකට නොවැඩි විය යුතු ය.

19. ඉහත 18 වැනි වගන්තියෙහි සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

20. මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් කවර හෝ විධිවිධානයක් උල්ලංඝනය කිරීම වරදක් වන අතර, එම තැනැත්තාට නිසි බලය ඇති අධිකරණයක් ඉදිරියේ එම වරදට වරදකරු කරනු ලැබූ විට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) වගන්තියේ සඳහන් සීමාවන්ට අනුකූල වන දඩයකට යටත් විය යුතු ය.

21. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල මස් යන්නෙන් ගව මස්, ඌරු මස්, එළු මස් යන මස් වර්ග ද අදහස් වේ.

## 20 වැනි කොටස

### මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

01. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (IX) වැනි උපවගන්තියේ (ඒ) ඡේදයෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව ප්‍රාදේශීය සභාව විසින් මාළු විකිණීම පිළිබඳව වන මෙම අතුරු ව්‍යවස්ථාව මෙයින් පනවනු ලැබේ.

02. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ලෙස හැඳින්වේ.

03. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මාළු විකිණීම කරන ස්ථාන පරීක්ෂා කිරීම, විධිමත් කිරීම, පාලනය කිරීම සහ ඒ සඳහා බලපත්‍ර නිකුත් කිරීම උදෙසා මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

04. කවර හෝ තැනැත්තෙකු විසින් වෙළඳපොළක් නොවන වෙනත් කිසියම් ස්ථානයක සභාපතිවරයා විසින් වාර්ෂිකව නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් නොමැතිව මාළු විකිණීමේ කාර්ය සඳහා ස්ථානයක් පාවිච්චි නොකළ යුතු ය.

05. 04 වැනි වගන්තියේ සඳහන් බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් නියම කර ඇති වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් ගෙවිය යුතු අතර එකී ගාස්තු සෑම වර්ෂයක් වෙනුවෙන්ම රජයේ ගැසට් පත්‍රය මගින් සභාපතිවරයා විසින් ප්‍රකාශයට පත්කර ඇති පරිදි විය යුතු ය.

06. බලපත්‍රය ලබා ගැනීමට ඉල්ලුම්කරන වෙළඳ ස්ථානය මෙහි පහත දැක්වෙන කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස සභාපතිවරයා විසින් කවර හෝ තැනැත්තෙකුට මාළු වෙළෙඳ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

(අ) මාළු විකුණනු ලබන ස්ථානය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් අනුමත කරන ලද සැලැස්මකට අනුකූල වනසේ සාදනු ලැබිය යුතුය ;

(ආ) විකිණීම සඳහා මාළු ප්‍රදර්ශනය කරනු ලබන කොටස පිඟන් ගඩොල් හෝ කපරාරු කළ සිමෙන්ති හෝ මළ නොබැඳෙන ලෝහ තහඩු හෝ යොදා තිබිය යුතු ය ;

(ඇ) මාළු විකිණීම සඳහා ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානයේ බිම හා ගබඩා කිරීමේ ස්ථානය බිම සිමෙන්ති බදාමයෙන් මැදීම කර හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය ;

(ඈ) අප ජලය ගලා යාම පහසු කිරීම සඳහා අවශ්‍ය බෑවුමක් සහිතව සිමෙන්තියෙන් මැදීම් කරනු ලැබූ හෝ පිඟන් ගඩොල් ඇල්ලූ කාණු තිබිය යුතු ය ;

(ඉ) (ඈ) ඡේදයේ සඳහන් කාණු තුලින් ගලායන අප ජලය කිසියම් පොදු ජල මාර්ගයකට ගලා යාම වැලැක්වීමට ප්‍රමාණවත් විධිවිධාන සලස්වා තිබිය යුතු අතර, එකී අප ජලය උරා ගන්නා වලකට ගලායාමට ඉඩ සලස්වා තිබිය යුතු ය ;

(ඊ) අප ජලය ගලායාමට සළස්වන ලද උරා ගන්නා වල වාතයට නිරාවරණය නොකළ යුතු ය ;

(උ) මාළු වෙළඳ ස්ථානයෙන් බැහැර කරනු ලබන ජෛවභායන අපද්‍රව්‍ය බහාලීමට ප්‍රමාණවත් භාජන තබා තිබිය යුතු අතර, දෛනික වෙළඳාම් කටයුතු අවසානයේ එකී අපද්‍රව්‍ය පොළව මට්ටමෙන් අවම වශයෙන් මීටර් 1.5ක ගැඹුරෙන් වල දැමීම හෝ ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කර නියම කරනු ලබන නියමයන්ට අනුකූලව ප්‍රාදේශීය සභාවේ කසළ රැස් කිරීමේ වාහනයට බාර දිය යුතු ය ;

(ඌ) මාළු වෙළඳ ස්ථානයේ සේවය කරන තැනැත්තන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රමාණවත් ජල මුද්‍රිත වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතු අතර, වැසිකිළි භාවිතයෙන් අනතුරුව පාවිච්චි කිරීමට සුදුසු සනීපාරක්ෂක ක්‍රම හා ද්‍රව්‍ය සපයා තිබිය යුතු ය ;

(එ) මාළු විකුණනු ලබන සෑම විටකම එය මිලදී ගන්නා වෙත ලබා දීමේ දී සුදුසු ආවරණයක ඔතා හෝ අසුරනයක බහා නිකුත් කළ යුතු ය.

07. මැස්සන් හෝ කෘමීන් හෝ වෙනත් කවර හෝ සතෙකුට ඇතුළුවිය නොහැකි වන ආකාරයෙන් හොඳින් වසා තැබිය හැකි රථයක හෝ පෙට්ටියක හෝ වෙනත් යම් භාජනයක හෝ ආවරණය කර ප්‍රවාහනය කරන්නේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් කවර හෝ මාළු වර්ගයක් ප්‍රවාහනය නොකළ යුතුවාත් හැර එකී මාළු ප්‍රවාහනය කිරීමෙන් පසුව ඒ මාළු ප්‍රවාහනය කිරීම සඳහා පාවිච්චි කළ රථය හෝ පෙට්ටිය හෝ වෙනත් භාජන විෂබීජ නාශක යොදා හොඳින් සෝදා හැරීම කළ යුතුය.

08. බලපත්‍රලත් කවර හෝ මාළු වෙළඳ ස්ථානයක හා එහි අවට ඇති කාණුද, මාළු ගබඩා කිරීම, සකස් කිරීම හෝ විකිණීම හා සම්බන්ධව පාවිච්චි කරන සියලු භාජන හා උපකරණ ද මනා අලුත්වැඩියාවෙන් යුතුව දුර්ගන්ධයකින් තොරව තබා ගැනීමට සැලැස්විය යුතු ය.

09. බලපත්‍රලත් ස්ථානයේ දෛනික වෙළඳාම් කටයුතු අවසන් වීමෙන් අනතුරුව විකුණා ගැනීමට නොහැකිව ශේෂ වන මාළු අධිශීතකරණයක ගබඩා කරනු ලැබ ඇත්තේ නම්, එසේ ගබඩා කළ අවස්ථාවේ සිට ඊළඟ දිනයේ මාළු වෙළඳසැල විවෘත කරන අවස්ථාව දක්වා එකී අධිශීතකරණය නිසි ආකාරයෙන් ක්‍රියාත්මකව පැවත තිබුණේ නම් මිස ශේෂවන කවර හෝ මාළු වර්ගයක් ඊළඟ දිනයේ විකිණීම හෝ විකණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ අධිශීතකරණයේ හෝ බලපත්‍රලත් ස්ථානයේ තබා ගැනීම හෝ නොකළ යුතු ය.

10. බලපත්‍රලත් ස්ථානයේ මාළු දමා තැබීමට හෝ සකස් කිරීමට හෝ විකිණීමට පාවිච්චි කරන උපකරණ හෝ භාජන හැර කිසිම භාණ්ඩයක් හෝ ඇඳුමක් හෝ නිදාගන්නා පැදුරක් හෝ වෙනත් කවර හෝ දෙයක් තබා ගැනීම නොකළ යුතු ය.

11. බලපත්‍රලත් කවර හෝ මාළු වෙළඳ ස්ථානයක බල්ලන්, බළලුන්, මීයන් හෝ කෘමීන්ගෙන් තොරව තබාගත යුතු ය.

12 (අ) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතකදී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමේ යෙදී සිටි එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ මාළු වෙළඳ ස්ථානයක හෝ ආකාරයක වෙළඳාමේ නියුක්ත යම් තැනැත්තෙකු සහයකයෙකු වශයෙන් හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය ;

(ආ) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් ඇඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් මාළු වෙළඳ ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්තවීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය ;

(ඇ) මාළු වෙළඳ ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයන් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

13. මාළු වෙළඳ ස්ථානයේ සේවයේ යෙදෙන සෑම සේවකයෙකු වෙතම ආරක්ෂිත මුව වැසුම්, අත්වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබීමත්, එකී සේවකයන් මාළු වෙළඳ ස්ථානයෙහි සේවයේ නියුක්ත වන සෑම අවස්ථාවකම එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවට සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

14. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත සෑම තැනැත්තකු විසින් ප්‍රයෝජනයට ගැනීම පිණිස සබන් හෝ සබන් දියර තබා තිබීම බලපත්‍රලාභියාගේ කාර්ය විය යුතු ය.

15. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට මාළු වෙළෙඳ ස්ථානයේ මාළු වෙළෙඳාම් කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

16. (අ) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස - එකී ද්‍රව්‍ය -

(i) ජෛවභායන අපද්‍රව්‍ය ;

(ii) වීදුරු ;

(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය ;

(iv) පොලිතින් හෝ ප්ලාස්ටික් හෝ පොලිතින් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය ;

(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස් ;

(vi) නිෂ්පාදනය සඳහා යොදාගනු ලබන වෙනත් අමුද්‍රව්‍ය වලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේදී හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස් ;

(vii) අන්තරායකර අපද්‍රව්‍ය,

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර, ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට, ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්ය විය යුතු ය.

(ආ) ඉහත (අ) ඡේදයේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය, ප්‍රාදේශීය සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩපිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස සභාපතිවරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතු ය.

17. බලපත්‍රලාභියා විසින් දෛනිකව අවම වශයෙන් මාළු වර්ග දෙකක්වත් අලෙවිය සඳහා තැබිය යුතු අතර, මහජනතාවගේ දැනගැනීම සඳහා මිල ප්‍රදර්ශනය කළ යුතු ය.

18. සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියකු විසින් කිසියම් මාළු වෙළෙඳ ස්ථානයක විකිණීමට තබා ඇති හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කර ඇති හෝ ඇතුළත ගබඩා කර ඇති යම් මාළු වර්ගයකින් සාම්පලයක් එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතුවාක් හැර කවර හෝ බලපත්‍රලාභියකු විසින් ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

19. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලබන ඇති කිසියම් මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 03 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මෙම අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය, ඒ නියමයන්ට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් සභාපතිවරයා විසින් එකී බලපත්‍රධාරියාට භාර දීමට සැලැස්විය යුතු ය.

20. මාළු විකිණීමට අදාළ වූ මෙම අතුරු ව්‍යවස්ථාවල යම් අතුරු ව්‍යවස්ථාවක සෑම කඩකිරීමක්ම වෙනුවෙන් රුපියල් 750.00කට නොවැඩි දඩයකින්ද නොකඩවා කරන එවැනි වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කිරීමෙන් පසු හෝ ඒ කඩ කිරීම ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයාගෙන් හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරියකුගෙන් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසු නොකඩවා දිගටම වරද කරගෙන යෑම වෙනුවෙන් දිනක් සඳහා රුපියල් 250.00කට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

21. 19 වන වගන්තියේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියාකල යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට සභාපතිවරයාට බලය තිබිය යුතු ය. එසේ වුවද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින 14කට නොවැඩි විය යුතු ය.

22. 21 වන වගන්තියේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියමකර ඇති දිනය හෝ දීර්ඝකරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියාකිරීම පැහැර හැරි අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය සභාපතිවරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

23. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍යවන්නේ නම් මිස -

"ප්‍රාදේශීය සභාව යන්නෙන් ................................ ප්‍රාදේශීය සභාවද;

"සභාපතිවරයා" යන්නෙන් ................................ ප්‍රාදේශීය සභාවේ සභාපති වරයාද;

"බලය පැවරූ පුද්ගලයා සහ නිලධාරියා" යන්නෙන් ................................ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පැවරූ සභාවේ කිසියම් නිලධාරියක්ද;

අදහස් කෙරේ.

*21 වැනි කොටස*

*පීඩාකාරී හෝ අන්තරාදායක ව්‍යාපාර*

01. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායක ව්‍යාපාර, පීඩාකාරී හා අන්තරාදායකර ව්‍යාපාර, විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම හා පාලනය කිරීම සහ ඒ සඳහා බලපත්‍ර නිකුත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිළිබඳව වූ අතුරු ව්‍යවස්ථාවයි.

02. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් තත්කාර්ය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් දරන්නකු වේ නම් මිස, කිසිම තැනැත්තකු ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායකර ව්‍යාපාර, පීඩාකාරී හා අන්තරාදායකර ව්‍යාපාරයක් පවත්වාගෙන යාම නොකළ යුතු ය. එමෙන්ම කිසිම බලපත්‍රයක් වෙනත් අයකුට පවරා දෙනු ලැබියි නොහැකිය.

03. 02 වන වගන්තියේ සඳහන් බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් නියම කර ඇති වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් ගෙවිය යුතු අතර, එකී ගාස්තු සෑම වර්ෂයක් වෙනුවෙන්ම දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් විය යුතු ය.

04. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන සෑම බලපත්‍රයක්ම කළින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද ඒ වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් විය යුතු ය.

5. (i) ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන පරිශ්‍රය ප්‍රාදේශීය සෞඛ්‍ය නිලධාරි විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් ඒ සඳහා සුදුසු බවට නිර්දේශ කරන ලද්දේ නම් මිස ; සහ

(ii) එම පරිශ්‍රය එම ව්‍යාපාරයේ කාර්ය සඳහා භාවිතයට ගනු ලබන යම් ගොඩනැගිල්ලක් වේනම්, එම ගොඩනැගිල්ල පහත සඳහන් කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස කිසිදු තැනැත්තෙක් පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායකර ව්‍යාපාර, පීඩාකාරී හා අන්තරාදායකර ව්‍යාපාර කරගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට හිමිකමක් නොලබන්නේය :-

(අ) පරිශ්‍රය යහපත් ප්‍රතිසංස්කරණ තත්වයකින් හා මනා වාතාශ්‍රය හා ආලෝකය ලැබෙන පරිදි සකස් කර තිබිය යුතු අතර, සෑම කාමරයක්ම විවෘත කළ විට ගෙබිම් ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට (1/15) නොඅඩු ප්‍රමාණයේ ජනේල සවිකර තිබිය යුතු ය ;

(ආ) සෑම කාමරයකම බිත්තිවල සෑම කොටසකම උස මීටර් 2.15ට නොඅඩු විය යුතු අතර, ගඩොල්, කළුගල්, කබොක් හෝ සිමෙන්ති ගලින් සාදා තිබිය යුතු ය. බිත්තිවල ඇතුළ් පැති අවම වශයෙන් ගෙබිමේ සිට මීටර් දෙකක් උසට සිමෙන්ති බදාම හෝ හුණු බදාම යොදා කපරාදු කොට තිබිය යුතු ය ;

(ඇ) සෑම පියසි කෙළවරකම උස, ගෙබිමේ සිට මීටර් 2ට වැඩි උසකින් තිබිය යුතු ය ;

(ඈ) වහලය යම් ස්ථිර සෙවිලි ද්‍රව්‍යයකින් සාදා තිබිය යුතු ය ;

(ඉ) දැවමය කොටස් සියල්ල තෙල් සායම් ගා හෝ තීන්ත ආලේප කර තිබිය යුතු ය ;

(ඊ) සම්පූර්ණ ගෙබිම සිමෙන්තියෙන් හෝ අපරගම්‍යද්‍රව්‍යයකින් තනවා තිබිය යුතු ය ;

(උ) පරිශ්‍රය ප්‍රමාණවත් ජලවාහනයක් සිදුවන පරිදි ඉදිකර තිබිය යුතු ය ;

(ඌ) පරිශ්‍රයෙහි සනීපාරක්ෂක කසළ භාජන සහ ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතු ය.

06. සෑම බලපත්‍රධාරියකුම ව්‍යාපාර කරගෙන යාම සඳහා අවශ්‍ය වන සියලු ද්‍රව්‍ය දුගඳ දැමීම හෝ වෙනත් පීඩාවන් ඇතිවීම වැළැක්වෙන පරිදි ගබඩාකර තැබිය යුතු ය.

07. සෑම බලපත්‍රධාරියකුම, පීඩා ඇතිවීමට හෝ දුගඳහැමීමට ඉඩ ඇති ද්‍රව්‍ය පොදු ස්ථානයක හෝ මංමාවතක් ඔස්සේ රැගෙන යාමේ දී කිසිදු පීඩාවක් ඇතිවීම වැළැක්විය හැකි වන සේ ආවරණය කරන ලද උරා නොගන්නා භාජනවල දමා රැගෙන යා යුතු ය.

08. සෑම බලපත්‍රධාරියකුම දී යම් කිසි නිෂ්පාදන ක්‍රියාවලියක දී විමෝචනය වන පීඩාකාරී වාෂ්ප හෝ වායු, ඒවා විහිදී හානිකර හෝ පීඩාකාරී ප්‍රතිඵල හට ගැනීමට ඉඩ නොලැබෙන ආකාරයෙන් හා උසින් වායුගෝලයට මුදා හැරීම කළ යුතු ය. නැතහොත් ගින්දර හෝ ඝණීකරණ උපකරණයක් තුලින් පිටවීමට සැලැස්විය යුතු ය.

09. සෑම බලපත්‍රධාරියකුම, තම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ප්‍රමාණවත් කාණු තනවා මැනවින් නඩත්තු කළ යුතු අතර, ඒවා දිනපතා සේදීම කළ යුතු ය.

10. සෑම බලපත්‍රධාරියකුම, තම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ගෙබිම යම් අපරගම්‍යද්‍රව්‍යයකින් ඉදිකරවිය යුතු අතර, හොඳ ප්‍රතිසංස්කරණ තත්ත්වයෙන් නඩත්තු කිරීමත්, දිනපතා ශුද්ධ පවිත්‍ර කිරීමත් කළ යුතු ය.

11. සෑම බලපත්‍රධාරියකුම, තම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි බිත්ති අපවිත්‍ර දෑ උරා ගැනීමෙන් ආරක්ෂාවන පරිදි යහපත් තත්වයකින් තබා ගත යුතු අතර, වාර්ෂිකව ඒවායෙහි හුණු හා තීන්ත ආලේප කළ යුතු ය.

12. බලපත්‍රලාභියා විසින් බලපත්‍රලත් ස්ථානය දිවා හෝ රාත්‍රී කාලයෙහි නිදාගන්නා හෝ ආහාර ගන්නා ස්ථානයක් ලෙස පාවිච්චි කිරීම හෝ යම් තැනැත්තකුට එසේ පාවිච්චි කිරීමට ඉඩදීම නොකළ යුතු ය.

13. සෑම බලපත්‍රධාරියකුම, ව්‍යාපාරික කටයුතු වලදී භාවිතාකරනු ලබන උපකරණ හා භාජන ඇතුළු උපාංග පිරිසිදුව තැබිය යුතු අතර, දිනපතා පිරිසිදු කළ යුතු ය.

14. සෑම බලපත්‍රධාරියකුම, ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි කසළ අතුරා එකතු කරනු ලබන බොල් රොඩු සමග අපතේ ගිය ද්‍රව්‍ය හා අතුරු නිෂ්පාදන, ඒවා තවදුරටත් ව්‍යාපාර කටයුතු වලට යොදවන්නේ නම් මිස ආවරණය කරන ලද භාජනවල බහා දිනපතා ඉවත් කළ යුතු ය.

15. සෑම බලපත්‍රධාරියකුම, හම් හෝ වෙන් ද්‍රව්‍යයන් සේදීම හෝ පෙඟවීම සඳහා භාවිතාකරනු ලබන ටැංකි, දුගඳ හැමීම වැළැක්වීම සඳහා අවශ්‍ය වන පරිදි හිස්කර පවිත්‍ර කළ යුතු ය.

16. සෑම බලපත්‍රධාරියකුම, යම් ගංගාවක්, දිය පාරක්, ඇලක්, සොරොව්වක්, ළිඳක්, වැවක් හෝ යම් කාණුවක්, මුහුදක් හෝ යම් විවෘත ජල ප්‍රදේශයක් තුළට යම් අපවිත්‍ර, දුගඳ හමන හෝ පීඩාකාරී ජලය හෝ වෙනත් දියරයක් යැවීමෙන් හෝ ඒ තුළට ගලා යාමට සැලැස්වීමෙන් හෝ පීඩාකාරී ද්‍රව්‍යයන් සේදීමෙන් හෝ වෙනත් ආකාරයකින් හෝ එවැනි ගංගාවක්, දියපාරක් ඇතුළත් සොරොව්වක්, ළිඳක්, වැවක්, මුහුදක් හෝ විවෘත ජල ප්‍රදේශයක් අපවිත්‍ර කිරීම නොකළ යුතු ය.

17. සභාවේ සභාපතිවරයා විසින් තත්කාර්ය සඳහා ඔහු විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය පවරන ලද ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියකු විසින් සියළු සාධාරණ වේලාවන් තුළ දී පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායකර ව්‍යාපාර, පීඩාකාරී හා අන්තරාදායකර ව්‍යාපාර කරගෙන යනු ලබන පරිශ්‍රයට ඇතුළු වී පරීක්ෂා කර බැලීම නීත්‍යනුකූල වන්නේ ය. තව ද බලපත්‍රලාභියා හෝ එහි පාලනය භාර ගන්නා තැනැත්තා එවැනි පරීක්ෂණයක් කිරීම සඳහා ඉඩ දිය යුතු වන්නේ ය.

18. බලපත්‍ර ලත් පරිශ්‍රයක් මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් විධිවිධාන වලට අනුකූල නොවන බව පරීක්ෂණයකදී අනාවරණය වූ අවස්ථාවක යථෝක්ත පරිශ්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන වලට අනුකූල කරවීම සඳහා කළයුතු කාර්යන් නියමිත කාලයක් ඇතුළත දී ඉටුකරන ලෙස බලපත්‍රධාරියාට ලිඛිතව දැන්වීමට සභාපතිවරයාට බලය ඇත. නිවේදනය ලද වහාම යථෝක්ත දැන්වීමේ විධිවිධාන ප්‍රකාරව බලපත්‍රධාරියා විසින් ක්‍රියාකල යුතු ය.

19. ප්‍රාදේශීය සභාව විසින් නිශ්චය කරන ලද පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායකර ව්‍යාපාර, පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර, පිළිවෙලින් අංක I, II, III දරන උපලේඛන ඇතුළත් කරනු ලැබ ඇත. බලපත්‍ර නිකුත් කිරීම, ඉල්ලුම්කරුට දන්වා යැවීම සභාපතිවරයාගේ කාර්ය වන්නේය.

20. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ යම්කිසි ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීම පිණිස යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයක් තමා වෙත ලැබී දින 30ක් ඇතුළත පරිශ්‍රය මෙම ව්‍යවස්ථාවලට අනුකූල වන්නේ නම්, බලපත්‍ර නිකුත් කරන්නේ නම් හෝ ප්‍රතික්ෂේප කරන්නේ නම් හේතු සහිතව ඒ බව ඉල්ලුම්කරුට දන්වා යැවීම සභාපතිවරයාගේ කාර්ය වන්නේ ය.

21. මෙම අතුරු ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීම පිළිබඳව ඒ උල්ලංඝණය ස්ථාපිත වන යම් ක්‍රියාවක් හෝ නොකරහැරීමක් සඳහා රු. 750.00කට නොවැඩි දඩයකින් හා එම උල්ලංඝණය නොකඩවා තවදුරටත් කරගෙන යන විට නිසි බලය ඇති අධිකරණයක් විසින් ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝණය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව උල්ලංඝණය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනක් සඳහා ම රු. 250.00කට නොවැඩි අතිරේක දඩයකට යටත් විය යුතුය.

"බලපත්‍රධාරියා" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් ලැබීම සඳහා බලය ලැබී ඇති යම් තැනැත්තෙක් අදහස් වේ ;

"තැනැත්තා" සංස්ථාගත කරන ලද හෝ නොකරන ලද පුද්ගල මණ්ඩලයක් ද අදහස් වේ ;

"පාලනය භාර තැනැත්තා" යන්නට යම් භාරකරුවෙක්, ආරක්ෂකයෙක්, දේපල ආරක්ෂකයෙක්, කළමණාකරුවෙක් හෝ යම් ව්‍යාපාර සංවිධානයක පාලනය හෝ කළමණාකරණය පැවරී ඇති වෙනත් තැනැත්තෙක් ද අදහස් වේ.

**පළමුවන උපලේඛනය - පීඩාකාරී ව්‍යාපාර**

1. මිණිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කිරීම
2. පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබා ගැනීම
3. සම් පදම් කිරීම
4. සත්ත්ව පාලන (මස්, කිරි හෝ බිත්තර සඳහා) සතුන් ඇති කරන ස්ථාන පවත්වාගෙන යාම
5. උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ කිලෝග්‍රෑම් 50ට වඩා ගබඩා කිරීම
6. රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටී තබා ගැනීම
7. පාශු වෛද්‍ය ගිලන් හලක් පැවැත්වීම
8 තොග වශයෙන් විකිණීම සඳහා නරක් වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය තබා ගැනීම
9 සම් විකිණීමට තබා ගැනීම
10. කරවල, මාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 100ට වඩා වැඩි ප්‍රමාණයක් තබා ගැනීම
11. මාළු හෝ මස් ජාඩි දැමීම, හෝ වේලීම හෝ අයිස් දැමීම
12. පොල් කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම
13. දුම්කොළ වියළීම
14. සත්ත්ව ආහාර නිපදවීම
15. පුන්නක්කු නිපදවීම
16. සත්ත්ව මාංශ හෝ ලේ පැසවීම
17. සබන් නිෂ්පාදනය
18. සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම
19. ට්‍රන්ක් පෙට්ටි සෑදීම
20. අළුත් ලෝහ හෝ පරණ ලෝහ තබා ගැනීම
21. ලෝහ සුන්බුන් තබා ගැනීම
22. ගෘහ භාණ්ඩ නිපදවීම
23. වේවැල් භාණ්ඩ නිපදවීම
24. වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම
25. සිරප් හෝ පළතුරු බීම නිපදවීම
26. රස කැවිලි නිපදවීම
27. පොල් ලෙලි නිපදවීම හෝ (පල් කිරීම)
28. බුරුසු වර්ග නිපදවීම (දත්බුරුසු හැර)
29. දත් බුරුසු නිපදවීම
30. රා එකතු කිරීම
31. විනාකිරි නිපදවීම
32. දැව ඉරීම
33. පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම

34. සෝඩා නිපදවීම
35. කෙඳි සායම් කිරීම
36. සම් භාණ්ඩ නිපදවීම
37. පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම
38. කෝපි, ධාන්‍ය වර්ග පිටි කිරීම
39. බේකින් පවුඩර් නිපදවීම
40. ගෑස් මැන්ටල් නිපදවීම
41. කපුරු නිපදවීම
42. පොටි නිපදවීම
43. ඉටි පන්දම් නිපදවීම
44. ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම
45. රෙදි සෝදන නිල් නිපදවීම
46. ලාකඩ නිපදවීම
47. සුවඳ විලවුන් නිපදවීම
48. පාසල් රටහුණු නිපදවීම
49. ටයර් හෝ ටියුබ් නිපදවීම
50. ටයර් නැවත පිරවීම
51. ටයර් ටියුබ් වොල්කනයිසින් කිරීම
52. සිමෙන්ති නිපදවීම
53. සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටර් භාණ්ඩ නිපදවීම
54. වැලි කඩදාසි නිපදවීම
55. ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම
56. ගඩොල් පිළිස්සීම
57. යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම
58. අම්ල නිෂ්පාදනය කිරීම හෝ නැවත පිරවීම
59. උළු නිෂ්පාදනය
60. පොහොර, හුණු, පිටි හෝ වෙනත් ද්‍රව්‍යක් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම
61. යන්ත්‍රානුසාරයෙන් බ්ලොක් ගල් නිපදවීම
62. නිමි ඇඳුම් නිෂ්පාදනය කිරීම
63. කුකුළු වෙළඳසැලක් පවත්වාගෙන යාම
64. විෂබීජ නාශක නිපදවීම
65. ටයර්/ටියුබ්/අළුත්වැඩියා කිරීම
66. සපත්තු/බෑග්/සම්/භාණ්ඩ නිෂ්පාදනය
67. දුම්කොළ යොදා කරන සිගරට්, බීඩි, සුරුට්ටු නිපදවීම

## දෙවන උපලේඛනය - අන්තරාදායක ව්‍යාපාර

1. කළු ගල් තැනීම හෝ කැඩීම
2. සිසිල් බීම නිෂ්පාදනය
3. අයිස් නිෂ්පාදනය
4. එළවළු තෙල් නිෂ්පාදනය
5. පොල් තෙල් නිෂ්පාදනය
6. ගිණි පෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම
7. මෙතිලේටි ස්ප්‍රීත්තු නිෂ්පාදනය
8. තේ පෙට්ටි නිෂ්පාදනය
9. කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිෂ්පාදනය

10. කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ
11. පිදුරු තබා ගැනීම
12. පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම
13. ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අළුත් වැඩියාව
14. යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම
15. හිරිගල් හෝ හුණු ගල් කැණීම
16. යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පවත්වාගෙන යාම
17. හිස් ගෝනි හෝ හිස් බෝතල් තබා ගැනීම
18. පා පැදි හෝ යතුරු පැදි අළුත් වැඩියා කිරීම
19. පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර තබා ගැනීම
20. විසිතුරු පින්තාරු කිරීම
21. ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම
22. ලෝහ සංස්කාරක කර්මාන්ත ආයුධ (යන්ත්‍රෝපකරණ, ආයුධ, උපකරණ නිපදවීම)
23. වෑල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම.

### තුන්වැනි උපලේඛනය

*පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාරය :*

1. තලාතු මිනිරන් ශුද්ධ කිරීම
2. රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරදමුංගු, එනසල් හෝ කෙඳි වර්ග සකස් කිරීම
3. ඩ්‍රයික්ලීන් කිරීම
4. රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම
5. විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම
6. තෙල් හෝ සත්ත්ව මේද නිපදවීම
7. හුණුගල් හෝ හිරිගල් නිපදවීම
8. ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිපදවීම
9. මෝර තෙල් සකස් කිරීම
10. බෝට්ටු තැනීම
11. බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අළුත්වැඩියා කිරීම
12. ලෝහ වර්ග පෑස්සීම
13. මෝටර් වාහන අළුත්වැඩියාව
14. මෝටර් වාහන සේවා කිරීම
15. යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම
16. වාත්තු මඩුවක් පවත්වාගෙන යාම
17. බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම
18. මෝටර් වාහන බොඩි තැනීම
19. කෘමි නාශක, දිලීර නාශක, පැළෑටි හෝ පළිබෝධ නාශක නිපදවීම
20. විෂබීජ නාශක නිපදවීම
21. මදුරු දඟර නිපදවීම
22. දැව ආරක්ෂණ නිපදවීම
23. ගල් තාර හෝ බිටුමන්මය ද්‍රව්‍ය නිපදවීම
24. වීදුරු භාණ්ඩ නිපදවීම
25. වීදුරු කැඩපත් නිපදවීම
26. යකඩ තහඩු ගැල්වනයිස් කිරීම
27. පාස්සන ඊයම් නිපදවීම
28. ඇලුමිණියම් භාණ්ඩ නිපදවීම
29. කටු කම්බි නිපදවීම

30. කම්බි ඇණ නිපදවීම
31. කාබන් කඩදාසි හෝ යතුරු ලියන පටි (රිබන්) නිපදවීම
32. බෙලෙක් බඳුන්, වානේ පීප්ප හෝ කාබනික ටැංකි නිපදවීම
33. ජී. අයි. බාල්දි නිපදවීම
34. වායුසමීකරණ යන්ත්‍ර, ශීතකරණ හෝ අධි ශීතකරණ නිපදවීම
35. වායුසමීකරණ යන්ත්‍ර, ශීතකරණ හෝ අධි ශීතකරණ අළුත්වැඩියා කිරීම
36. බ්‍රේක් ලයිනර්, ක්ලච් ලයිනර් නිපදවීම
37. යන්ත්‍රෝපකරණ නිපදවීම
38. විදුලි භාණ්ඩ නිපදවීම
39. රබර් මිශ්‍රිත කෙඳි නිපදවීම
40. සංචායන බැටරි නිපදවීම
41. ට්‍රැක්ටර් රථ එකලස් කිරීම
42. රේඩියේටර් නිපදවීම
43. ඉලෙක්ට්‍රොනික් උපකරණ නිපදවීම හෝ අළුත්වැඩියා කිරීම
44. වියලි කෝෂ බැටරි නිපදවීම
45. වී මෝල්
46. මිනී පෙට්ටි තැනීම
47. දුරකථන නිපදවීම හෝ අළුත්වැඩියා කිරීම
48. විද්‍යුත් උපරකණ අළුත්වැඩියාව හෝ එකලස් කිරීම
49. පරිගණක හෝ තොරතුරු තාක්ෂණ උපකරණ එකලස් කිරීම හෝ අළුත්වැඩියාව

## 22 - මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරීම

(අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන)

01. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරීම පිණිස අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම සහ ඒ සඳහා ගාස්තු නියම කිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාවයි.

02. සභාපතිවරයා විසින් තත්කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් සභා ප්‍රදේශය තුළ අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වා ගෙන යාම නොකළ යුතු ය.

03. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම කළින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් තිස්එක් වන දිනෙන් අවසන් විය යුතු ය.

04. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස සභාපතිවරයා විසින් කවර හෝ අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයකට බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

(i) අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානයක් පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ලේ ඇතුළත මෘත දේහ සැකසීම පිණිස වෙන් වූ කාමරයක් තිබිය යුතු අතර, එකී කාමරයේ එක් පුද්ගලයකුගේ මෘත දේහයක් සැකසීම සඳහා අවම වශයෙන් වර්ග මීටර් නවයකට නොඅඩු ඉඩකඩක් තිබිය යුතු ය. එසේ කී කාර්යය කිරීමට භාවිතා කිරීමට ප්‍රමාණවත් කොන්ක්‍රීට් වේදිකාවක් තිබිය යුතු වන අතර, එය පිගන් ගඩොල් බැඳ මනා නිමාවකින් පැවතිය යුතු ය ;

(ii) මෘත දේහ සැකසීම කරනු ලබන කාමරය, සෑමවිටම අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානයේ ප්‍රදර්ශන ශාලාවෙන් හෝ ශාලාවලින් වෙන් වී තිබිය යුතු අතර, බාහිර පුද්ගලයන්ට අවසරයකින් තොරව ඇතුල්වීම වළක්වා තිබිය යුතු ය. ;

(iii) මෘත දේහ සැකසීම කරනු ලබක කාමරයේ අභ්‍යන්තරයට පිරිසිදු වාතාශ්‍රය ලැබෙන පරිදි භාවිත කාමරයේ වර්ගඵලයෙන් හතෙන් එකකට නොඅඩු ප්‍රමාණයකට වූ වාතයට විවෘත වන කවුළු සකසා තිබිය යුතු වන අතර, ඒ පිළිබඳ කාර්යයන් හි නියුක්තවීම කිසිදු බාහිර පුද්ගලයෙකුට නොපෙනෙන ආකාරයෙන් තිබිය යුතු ය. එකී කවුළු අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානය පිහිටි පරිශ්‍රයේ ආසන්න ඉඩම්වල ඇති නිවාස දෙසට එක එල්ලේ විවෘත නොවී තිබිය යුතු ය ;

(iv) මෘත දේහයක් සකස් කිරීමේ දී ඉවත් කරනු ලබන මෘත ශරීර කොටස් තාවකාලිකව බහාලීමට ප්‍රමාණවත් භාජන තිබිය යුතු වන අතර, එකී කාර්යය කරන අවස්ථාවේ දී මෘත ශරීරයෙන් බැහැරවන ලේ හෝ වෙනත් යම් දියර හෝ මෘත දේහය සේදීම කරනු ලබන්නේ නම් එකී අප ජලය රැස්කර ගැනීම සඳහා අපාරගම්‍ය හා මැස්සන්, මීයන් හෝ වෙනත් සතුන්ට ප්‍රවේශ විය නොහැකි වන සේ හොඳින් වසා තැබිය හැකි ආකාරයෙන් භාජන තබා තිබිය යුතු ය ;

(v) (අ) බලපත්‍රලත් ස්ථානයේ මහජන ගෞරවය පිණිස මෘත දේහ තබා ගැනීමට ඉඩ සලසා ඇතිවිට කිසියම් මෘත දේහයකට අවසන් ගෞරව දැක්වීමට පැමිණෙන තැනැත්තන්ගේ පහසුව පිණිස ප්‍රමාණවත් ආසන සංඛ්‍යාවක් තැබීමට හා එසේ පැමිණෙන අයගේ වාහන නැවතීමට ප්‍රමාණවත් ඉඩකඩ වෙන්කර තිබිය යුතු ය ;

(ආ) ගෞරවය සඳහා මෘත දේහයන් තැන්පත් කර තිබෙන ස්ථානය, ඒ අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානයේ ප්‍රදර්ශන ශාලාවෙන් හා මෘත දේහ සැකසීම කරනු ලබන කාමරයෙන් වෙන්කර තිබිය යුතු ය ;

(ඇ) අවමංගල්‍යය සේවා ස්ථානයක් සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය සෑම තැනැත්තෙකුම විසින් මේ කොටසේ පළමුවන උපලේඛනයේ සඳහන් ආකෘතියට සාරානුකූලව පිළියෙල කරගත් අයදුම්පතක් සභාපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය ;

(ඈ) බලපත්‍රය අයදුම් කරන්නා විසින් ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කර රජයේ *ගැසට් පත්‍රය* මගින් වාර්ෂිකව ප්‍රසිද්ධ කරනු ලබන බලපත්‍ර ගාස්තු සභාවට ගෙවිය යුතු ය.

06. මෘත දේහයන් සැකසීමේ දී ඉවත් කරනු ලබන හෝ ඉවත් වන මෘත ශරීර කොටස්, මහෙස්ත්‍රාත්වරයෙකු හෝ හදිසි මරණ පරීක්ෂකවරයෙකු හෝ විසින් ඒ පිළිබඳ ලබා දී ඇති නියෝගයන් නොමැති නම්, එකී කොටස් ඒ කාර්යය අවසන් වී පැය හයක් ගත වීමට මත්තෙන් පොළොවේ මතුපිට සිට මීටර් 1.5ක් ගැඹුරු වලක වල දමා මැනවින් වසා දැමිය යුතු ය.

07. මෘත දේහයක් සැකසීමේ දී ඉවත් කරනු ලබන මෘත ශරීර කොටස් පිළිබඳව මහෙස්ත්‍රාත්වරයෙකු හෝ හදිසි මරණ පරීක්ෂකවරයෙකු හෝ විසින් නියෝගයක් කර ඇති විටෙක, ඒ නියෝගයට අනුව ක්‍රියා කිරීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

08. 6 වන වගන්තියේ සඳහන් කාර්යයන් සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානයේ නොමැති විටෙක, සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ගාස්තුවක් ගෙවීමෙන් පසුව එකී කාර්යය ප්‍රාදේශීය සභාවේ පොදු සුසාන භූමිය ඇතුළත් අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති ගැඹුරක් සහිත වලක වල දමා වසා දැමිය යුතු ය.

09. මෘත දේහ සැකසීම කරන කාමරය නිරන්තරයෙන් විෂබීජ නාශක යොදා පිරිසිදුව පවත්වා ගැනීම කළ යුතු ය. එසේම අවශ්‍ය අවස්ථාවක දී කාර්යය මණ්ඩලයේ ප්‍රයෝජනයට ලබා ගත හැකි වන පරිදි එකී ස්ථානයේ ප්‍රමාණවත් ප්‍රථමාධාර හා වෙනත් උපකරණ තිබිය යුතු ය.

10. අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානයේ සේවයේ නියුක්ත කාර්ය මණ්ඩල සාමාජිකයන් පිළිබඳ වාර්තා පවත්වා ගැනීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

11. මෘත දේහ සැකසීම කරනු ලබන කාමරවල වැඩ කරන සියළුම සේවකයින්ට ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් නිර්දේශ කරනු ලබන ආකාරයේ ආරක්ෂිත ඇඳුම්, මුව වැසුම් හා අත්වැසුම් ලබා දීම හා මෘත දේහ සැකසීම කරනු ලබන අවස්ථාවේ දී එකී සේවකයින් ඒ ඇඳුම්වලින් හා පැළඳුම්වලින් සැරසී අදාළ කාර්යයේ නියුක්ත වන බවට වගබලා ගැනීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

12. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියළුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

13. මෘත දේහ ප්‍රවාහනය කරනු ලබන රථය හෝ රථ ඇතුළත, අවම වශයෙන් දිනකට එක් වතාවක් බැගින් රික්ත ශෝධක මගින් පිරිසිදු කර විෂබීජ නාශක යොදා තිබිය යුතු ය.

14. අධික වශයෙන් හානි සිදුවීම හේතුවෙන් හෝ වෙනත් යම් හේතුවක් නිසා සැකසීම කළ නොහැකි අන්දමින් පවතින මෘත දේහ හැර වෙනත් මෘත දේහ තැන්පත් කරනු ලබන පෙට්ටියක ඇතුළත හෝ මෘත දේහ සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් හෝ ආවරණය කිරීම පිණිස පොලිතින් හෝ දිරාපත් නොවන වෙනයම් ද්‍රව්‍යයක් හෝ භාවිතා නොකළ යුතු ය.

15. සෑම බලපත්‍රලාභියෙකු විසින් ම යථා පරිදි බලය පවරනු ලැබූ තැනැත්තෙකු හැර වෙනත් කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් මෘත දේහයක් සැකසීම හෝ මෘත දේහයක් ප්‍රවාහනය කිරීම හෝ නොකළ යුතු ය.

16. ප්‍රාදේශීය සෞඛ්‍ය අධක්ෂවරයා විසින් නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව ඔහු විසින් ඒ වෙනුවෙන් බලපත්‍රලාභියාට දෙන ලද ලිඛිත අවසරයක් ඇත්තේ නම් මිස කොළරාව, මහාමාරිය, වසූරිය, කහඋණ හෝ ඒඩ්ස් රෝගයෙන් මියගොස් ඇති බවට සැලකෙන කිසියම් තැනැත්තෙකුගේ මෘත දේහයක් බලපත්‍රලත් ස්ථානය වෙත ගෙන ඒම හෝ ගෙන ඒමට ඉඩදීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

17. කිසියම් මෘත දේහයනක් සැකසීමට සහ අවමංගල්‍යය කටයුතු සංවිධානය පිණිස භාර ගැනීමට පෙර එකී මරණය සම්බන්ධයෙන් මරණ ලියාපදිංචි කිරීමේ ලේකම්වරයා විසින් නිකුත් කරනු ලැබූ විධිමත් මරණ සහතිකයක් තමා වෙත ඉදිරිපත් කර ඇත්තේ නම් මිස, එකී කාර්යයන් සඳහා මෘත දේහයක් භාර ගැනීම බලපත්‍රලාභියා විසින් නොකළ යුතු ය.

18. කිසියම් මෘත ශරීරයකට අදාළ මරණය හදිසි මරණයක් වන විටක හෝ එකී මරණය සැක සහිත වන විටක මහෙස්ත්‍රාත්වරයෙකු විසින් හෝ හදිසි මරණ පරීක්ෂකවරයෙකු විසින් කරනු ලැබූ හදිසි මරණ පරීක්ෂණයකින් අනතුරුව නිකුත් කරනු ලැබූ වාර්තාවක් තමා වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ නම් මිස, එකී මෘත ශරීරය සැකසීම හෝ සැකසීම සඳහා භාර ගැනීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

19. මහෙස්ත්‍රාත්වරයෙකු විසින් හෝ හදිසි මරණ පරීක්ෂකවරයෙකු විසින් කරනු ලැබූ හදිසි මරණ පරීක්ෂණයකින් අනතුරුව නිකුත් කරනු ලැබූ වාර්තාවක් මගින් එකී මෘත දේහයේ අවසන් කටයුතු සම්බන්ධයෙන් දෙනු ලැබ ඇති කිසියම් නියෝගයක් වේ නම් බලපත්‍රලාභියා විසින් එකී නියෝගයේ විධිවිධාන පිළිපැදිනු ලැබිය යුතු ය.

20. බලපත්‍රලත් ස්ථානයේ දී හෝ වෙනත් කිසියම් බාහිර ස්ථානයක දී හෝ සිදු කරනු ලබන සෑම මෘත දේහ සැකසීමක් ම සහ අවමංගල්‍යය සේවා සැපයීමක් ම පිළිබඳව මේ කොටසේ දෙවන උපලේඛනයෙහි දැක්වෙන ආකෘතියට සාරානුකූලව පිළියෙල කරගත් ලේඛනයක් පවත්වා ගෙන යාම සහ එකී ලේඛනය සභාපතිවරයා විසින් හෝ බලයලත් නිලධාරියෙකු විසින් හෝ කිසියම් නිලධාරියෙකු විසින් ඉල්ලා සිටිනු ලබන අවස්ථාවක දී පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කිරීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

21. මහජන ගෞරවය පිණිස මෘත දේහ තබා ගැනීමේ සේවාවක් පවත්වා ගෙන යනු ලබන ස්ථානයක් සම්බන්ධයෙන් වන විට එකී ස්ථානයේ තැන්පත් කර තබන කිසියම් මෘත දේහයකට සහ එකී මෘත දේහයකට සහ එකී මෘත දේහයේ භාරකරුවන්ට නිසි ගෞරව ලැබෙන අයුරින් එකී මෘත දේහය ප්‍රදර්ශනය කිරීම කළ යුතු ය.

22. මහජන ගෞරවය පිණිස මෘත දේහයක් තබනු ලබන ස්ථානය පිරිසිදුව හා සෞඛ්‍යාරක්ෂිතව පවත්වා ගැනීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

23. අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානය ආසන්නයේ පදිංචිකරුවන්ට කරදරකාරී වන්නා වූ හෝ පීඩාකාරී වන්නා වූ හෝ කවර හෝ කාර්යයක් අවමංගල්‍ය සේවා ස්ථානයේ පරිශ්‍රය තුළ දී සිදු කිරීමට හෝ එසේ කිරීමට ඉඩදීම හෝ කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

24. (අ) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අප ද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස, එකී අපද්‍රව්‍ය -

(i) ජෛවභායන අපද්‍රව්‍ය ;

(ii) වීදුරු ;

(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය ;

(iv) පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය ;

(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස් ;

(vi) අන්තරායකර අපද්‍රව්‍ය.

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු වන අතර, ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

(ආ) ඉහත අ ඡේදයේ (i) අනුඡේදයේ සිට (vi) අනුඡේදය දක්වා වන අපද්‍රව්‍ය යන්නට කිසියම් මෘත ශරීර කොටස් ඇතුළත් නොවිය යුතු වන අතර, මෘත දේහයෙන් ඉවත් කරනු ලබන කිසියම් මෘත ශරීර කොටසක් හෝ කොටස් අවස්ථාවෝචිත පරිදි 6 වන හා 8 වන වගන්තිවල සඳහන් ආකාරයට බැහැර කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

(ඇ) ඉහත අ ඡේදයේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩපිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස, සභාපතිවරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතු ය.

25. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට බලපත්‍රලත් ස්ථානයේ මෘතදේහ සැකසීම කරනු ලබන හෝ කිසියම් මෘත ශරීරයක් මහජන ගෞරවය පිණිස තබා ඇති ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

26. මේ කොටස් අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලැබ ඇති කිසියම් අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානයක් පවත්වා ගෙන යනු ලබන ස්ථානය 4 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයන්ට අනුකූල තත්ත්වයකට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ කරන ලෙසට නියම කරන දැන්වීමක් සභාපතිවරයා විසින් එකී බලපත්‍රලාභියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

27. 26 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර, ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට සභාපතිවරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතු ය.

28. 27 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්විමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය සභාපතිවරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

29. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ නියමයක්, නොකර හැරීම හෝ පැහැර හැරීම වරදක් වන අතර, ඒ සඳහා නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබුවේ නම්, රු. 750කට නොඅඩු දඩයකට එම වරද කරන තැනැත්තා යටත් විය යුතු ය. එම වරද දිගින් දිගටම සිදු කරන්නේ නම්, දිනකට රු. 250ක් බැගින් වූ අතිරේක දඩයක් ගෙවීමට යටත් වන්නේ ය.

30. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල :

(1) "අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානය" යන්නෙන් කිසියම් මෘත ශරීරයක් කල්තබා ගත හැකි වන පරිදි සැකසීම කරනු ලබන හෝ මෘත ශරීරයක් අවසන් කටයුතු සඳහා සැකසීම කරනු ලබන හෝ අවසන් කටයුතු කිරීමට සුසාන භූමියක් දක්වා ගෙනයනු ලබන තෙක් කිසියම් මුදලක් අයකර මහජන ගෞවරය පිණිස තබා තිබෙන ස්ථානයක් ද ;

(2) "මෘත දේහ සැකසීම" යන්නෙන් මියගිය පුද්ගලයෙකුගේ මෘත දේහයක් අවසන් ගෞරව පිණිස කල් තබා ගත හැකි වන ආකාරයට පිළියෙල කිරීම, එකී මෘත දේහයට ඇඳුම් ඇන්දවීම, මෘත දේහය යම් පෙට්ටියක තැන්පත් කිරීම හා එකී කාර්යය සඳහා අවශ්‍ය වන වෙනත් ඕනෑම කාර්යයක් සිදු කිරීම ද ;

(3) "මෘත ශරීර කොටස්" යන්නෙන් මියගිය පුද්ගලයෙකුගේ මෘත දේහයෙන් ඉවත් කරනු ලබන යම් ශරීර අවයවයක් හෝ ඉන් කොටසක් හෝ අභ්‍යන්තර කොටසක් හෝ මෘත ශරීරයෙන් බැහැර වන හෝ බැහැර කරන ලේ හෝ වෙනත් යම් දියරයක් හෝ මියගිය අය ඒ අවස්ථාවේ දී හැඳ සිටි යම් ඇඳුමක් හෝ ඇඳුම් හෝ ඉන් කොටසක්, මියගිය අයගේ ශරීරයේ තිබූ කිසියම් අභ්‍යන්තයේ තිබූ හෝ තිබෙන වෙලුම්පටි, පුළුන් හෝ වන යම් ද්‍රව්‍යයක් ද අදහස් වේ.

*පළමුවන උපලේඛනය*

*5 වන වගන්තිය*

අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට ඉල්ලුම් කිරීම

01. අයදුම්කරුගේ නම : ..............................................................................................................................................

02. ජා.හැ. පත් අංකය : ..........................................................................................................................

03. අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානයේ ව්‍යාපාරික නාමය සහ එකී ස්ථානයේ ලිපිනය : ................................................................. ........................................................................................................................

04. එක වරකදී සැකසීම පිණිස තබාගත හැකි මෘත දේහ සංඛ්‍යාව : ..........................................................................................

05. ආයතනය සතු අවමංගල රථ සංඛ්‍යාව : ....................................................................................

06. මෘත දේහ සැකසීමට පෙර ප්‍රවාහනය පිණිස යොදවා ඇති වාහන සංඛ්‍යාව : ..................................................................

07. ඉවත් කරනු ලබන මෘත ශරීර කොටස් අපහරණය කරනු ලබන ආකාරය : ..................................................................

08. ගෞරව දැක්වීම පිණිස මෘත දේහය තැන්පත් කර තැබීම භාරගනු ලබන්නේ නම් -

(i) එකවර තැන්පත් කර තැබිය හැකි මෘත දේහ සංඛ්‍යාව : ..................................................................................

(ii) ගෞරව දැක්වීමට පැමිණෙන අයගේ වාහන කොපමණ ප්‍රමාණයක් එකවර නවතා තැබිය හැකි ද ? .........................
.........................................................

09. ස්වභාවික මල් තබා ගැනීම හා විකිණීම කරනු ලබන්නේ ද? ඔව්/නැත

10. ඉවතලන ස්වභාවික මල් හෝ ශාඛ කොටස් ඉවත් කරනු ලැබීමට අපේක්ෂා කරන ආකාරය : ...............................................
..............................................................................................................................................

11. ආයතනයේ සේවය කරන සේවක සංඛ්‍යාව : ....................................................................

12. කළමනාකරුවෙකු පත්කර ඇත්නම් ඔහුගේ

(i) නම : .......................................................................................

(ii) ජාතික හැඳුනුම්පත් අංකය : .................................................

13. අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථාන විධිමත් කිරීම අධීක්ෂණය කිරීම හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන ඒ අයුරින්ම පිළිපැදීමට හා කලින් කල ප්‍රාදේශීය සභාව විසින් නියම කරනු ලබන වෙනත් සෞඛ්‍යාරක්ෂක නියමයන් පිළිපැදීමටත් එකඟ වන බව මෙහි අත්සන් කිරීමෙන්ම පිළිගනිමි.

දිනය : ..................................................................

..................................................................,
අයදුම්කරුගේ අත්සන.

*දෙවන උපලේඛනය*

*20 වන වගන්තිය*

01. මියගිය තැනැත්තාගේ විස්තර :

(අ) නම : ..........................................................................................................

(ආ) ස්ත්‍රී පුරුෂභාවය : .........................................................................................

(ඇ) මියගිය දිනය : ..............................................................................................

(ඈ) මරණය සිදු වූ ස්ථානය : ..................................................................................

02. මරණ සහතිකයේ විස්තර :

(අ) අංකය සහ දිනය : .......................................................................................................

(ආ) සහතිකය නිකුත් කළ නිලධාරියාගේ
නිල නාමය සහ ලිපිනය : ......................................................................................

(ඇ) විශේෂ නියෝග විස්තර : ......................................................................................

03. මෘත දේහ භාර දුන් අයගේ විස්තර :

(අ) නම : ..........................................................................................................

(ආ) ලිපිනය : ...........................................................................................

(ඇ) ජා.හැ.අ. : ...................................................................................................

(ඈ) මියගිය අයට ඇති සබඳකම : .....................................................................................

04. මෘත දේහය පිළිබඳ විස්තර :

(අ) සැකසුම් ස්ථානයට භාරගත් දිනය/වේලාව: .................................................................................................

(ආ) ස්ථානයෙන් බැහැර කළ දිනය/වේලාව : ...........................................................................................

(ඇ) රැගෙන ගිය සුසාන භූමිය/ආදාහනාගාරය : ..................................................................................

(ඈ) අවසන් කටයුතු කළ දිනය : ..............................................................................................

*23 වන කොටස*

*සංචාරක වෙළෙඳාම*

01. ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ සංචාරක වෙළෙන්දන් අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ එම කාර්යය සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම, නියමිත භාණ්ඩ විකිණීම, නියමිත ස්ථානයක හෝ ප්‍රදේශයක භාණ්ඩ විකිණීම විධිමත් කිරීම හෝ තහනම් කිරීම පිළිබඳව වූ අතුරු ව්‍යවස්ථාවයි.

02. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් හා හැඳුනුම්පතක් නොමැති කිසිම තැනැත්තකු යම් වීථියක හෝ මාවතක හෝ පොදු පිට්ටනියක හෝ පොදු උද්‍යානයක හෝ කරත්තයක හෝ මෝටර් වාහන නවතා තැබීම සඳහා වෙන්කර ඇති හෝ ප්‍රයෝජනයට ගනු ලබන යම් පොදු වාහන නැවතුම්පළක හෝ පොදු බස් නැවතුම්පළක හෝ මහජනයා එක්රැස්වන පොදු ස්ථානයක කවර හෝ භාණ්ඩයක් විකිණීම, විකිණීම සඳහා තැබීම හෝ විකිණීම සඳහා මහජනයා එක්රැස්වන පොදු ස්ථානයක කවර හෝ භාණ්ඩයක් විකිණීම, විකිණීම සඳහා තැබීම හෝ විකිණීම සඳහා එහා මෙහා රැගෙන යාම නොකල යුතු ය.

03. ඉහත 2 වගන්තියෙහි සඳහන් බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් නියම කර ඇති බලපත්‍ර ගාස්තුවක් ගෙවිය යුතු අතර, එකී ගාස්තුව සෑම වර්ෂයක් වෙනුවෙන්ම රජයේ *ගැසට් පත්‍රය* මගින් සභාව විසින් ප්‍රකාශයට පත්කර ඇති පරිදි විය යුතු ය.

04. නිකුත් කරණු ලබන සෑම බලපත්‍රයකම භාණ්ඩ විකිණීමට නියමිත ස්ථාන හෝ ප්‍රදේශ සහ විකිණීමට නියමිත භාණ්ඩ පිළිබඳ කොන්දේසි ඇතුළත් කිරීමට සභාපතිවරයාට බලය ඇත.

05. නිසි අධිකරණයක් මගින් බලපත්‍රය අවලංගු කරනු ලැබූ විට යථෝක්ත බලපත්‍රය නොපමාව සභාපතිවරයා වෙත ආපසු භාර දිය යුතු ය.

06. නිසි අධිකරණයක් මගින් අවලංගු කරන ලද්දේ නම් මිස, සෑම බලපත්‍රයක්ම, එය නිකුත් කරන ලද්දේ කවර වර්ෂයක් වෙනුවෙන් ද එම වර්ෂයේ දෙසැම්බර් 31 වෙනි දින දක්වා වලංගුව පවතී.

07. ඉහත 06 වන වගන්තියේ කුමක් සඳහන් වුවද මහජනතාව එක්රැස්වන කවර හෝ ආකාරයක ජන ඒකරාශිවීමක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සිදුවන අවස්ථාවකදී සංචාරක වෙළෙඳාම සඳහා තාවකාලික බලපත්‍රයක්, එය අවසන්වන කාල වකවානු සඳහන් කරමින් සභාපතිවරයා විසින් නිකුත් කල හැකි ය.

08. සෑම සංචාරක වෙළෙන්දකුම ව්‍යාපාරික කටයුතුවල නිරතවී සිටින වේලාවන්හි දී සභාපතිවරයා විසින් නිකුත් කර ඇති හැඳුනුම්පත පැහැදිලිව පෙනෙන සෝ පැළැඳ සිටිය යුතු ය.

09. සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් තම බලපත්‍රය හා හැඳුනුම්පත ඉදිරිපත් කරන ලෙස දන්වනු ලැබූවිට එම ලියකියවිලි වහාම ඉදිරිපත් කිරීම සංචාරක වෙළෙන්දකුගේ කාර්යය විය යුතු ය.

10. බලපත්‍රලාභී සංචාරක වෙළෙන්දෙක්, පෙ.ව. 6.00 සිට ප.ව. 10.00 දක්වා කාලය තුළ සිය ව්‍යාපාරික කටයුතුවල නිරතවීමට හිමිකම් ලබයි. එසේ වුව ද සභාපතිවරයා විසින් එකී කාලසීමාවෙන් බැහැරව වෙළෙඳාමේ නිරතවීම සඳහා අවසර දෙනු ලදුව ඒ බව බලපත්‍රයේ සඳහන් කර තිබේ නම්, එසේ සඳහන් කර ඇති කාලය තුළ වෙළෙඳාම් කිරීමට බලපත්‍රලාභියකුට හිමිකම් තිබේ.

11. බලපත්‍රලාභියා බෝවන, රෝගයකින් පෙළෙන්නේ නම් ව්‍යාපාරික කටයුතුවල යෙදීමෙන් වැළකිය යුතු ය.

12. ආහාරපාන විකිණීමේ ව්‍යාපාරයෙහි නිරතව් සිටින සෑම සංචාරක වෙළෙන්දකුම පහත සඳහන් විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු ය :

(i) විකිණීමට රැගෙන යන ආහාරපානවලට මැස්සන් වැසීම වැළැක්වීමට සහ දූවිල්ල, අපද්‍රව්‍ය, දුර්ගන්ධය එකතුවීම වැළැක්වීමට හැකිවන සේ තබාගත යුතු අතර, එම ආහාර පුද්ගලයින්ට ස්පර්ශ කිරීමටද ඉඩ නොදිය යුතු ය ;

(ii) ආහාර පාන තබාගන්නා වාහනය, පා පැදිය, කරත්ත, භාජන හා තැටි ආදිය සහ ආහාර සමග ස්පර්ශ වන සියලු උපකරණ හා උපාංග නිතිපතා පිරිසිදුව තබාගත යුතු ය ;

(iii) ආහාර එතීම සඳහා පාවිච්චි කරනු ලබන කඩදාසි හෝ ඇසුරුම් ද්‍රව්‍ය පිරිසිදු හා ඒ සඳහා සුදුසු තත්ත්වයක පැවතිය යුතු ය ;

(iv) ආහාරපාන ස්පර්ශ කිරීම සඳහා පිරිසිදු උපකරණ හා මෙවලම් පාවිච්චි කළ යුතු ය, අතින් අල්ලා ආහාර පාන විකිණීම නොකල යුතු ය ;

(v) ආහාර විකිණීමේ කටයුතු සඳහා බෝවන රෝගයකින් පෙළෙන තැනැත්තකු නොයෙදිය යුතු ය ;

(vi) යම්කිසි පුද්ගලයකුට හෝ පුද්ගලයින්ට අන්තරායදායක වනසේ හෝ පීඩාකාරී වනසේ ගින්දර පාවිච්චි නොකල යුතු ය ;

(vii) අපද්‍රව්‍ය හෝ අප ජලය පොදු ස්ථානවල නොදැමිය යුතු අතර, ඒවා සෞඛ්‍ය ආරක්ෂිත ආකාරයට ඉවත් කිරීම සභාපතිවරයා සෑහීමකට පත්වන ආකාරයට විධිවිධාන සලසා තිබිය යුතු ය ;

(viii) මිලදී ගන්නා අවස්ථාවේදීම පරිභෝජනය සඳහා ආහාර පාන විකිණීම කරනු ලබන්නේ නම්, ඒ සඳහාමස වෙන්වූ භාජන සපයා තිබිය යුතු ය ;

(ix) මිලදී ගන්නා අය විසින් පරිභෝජනයෙන් පසුව ඉතිරි කරන ආහාර පාන කොටස් බහාලීම සඳහා පියන් සහිත හොඳින් වැසිය හැකි වෙන්වූ භාජන සපයා තිබිය යුතු ය.

13. ගෝ ඝාතක ආඥාපනතේ සඳහන් කර ඇති සතකුගේ හෝ සතුන්ගේ මස් සංචාරක වෙළෙන්දකු විසින් විකිණීම නොකල යුතු ය.

14. සංචාරක වෙළෙන්දකු විසින් කිසියම් වසංගත රෝගයක් හෝ බෝවන රෝගයක් පැතිරෙමින් පවතින හෝ පැතිර ඇති ප්‍රදේශයක පිසින ලද ආහාර ද්‍රව්‍ය විකුණනු ලැබීම සභාපතිවරයා විසින් තහනම් කළ යුතු ය.

15. පොදු වෙළෙඳපල පරිශ්‍රය තුළ සංචාරක වෙළෙඳාම තහනම්ය.

16. කිසියම් ස්ථානයක දීර්ඝ වේලාවක් රැඳී සිට වෙළෙඳාම් කිරීම කිසිදු බලපත්‍රලාභියකු නොකල යුතු ය.

17. මෙම අතුරු ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීම පිළිබඳව, ඒ උල්ලංඝණය සංස්ථාපිත වන යම් එක් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සඳහා රුපියල් හත්සිය පනහකට නොවැඩි දඩයකින් සහ එම උල්ලංඝණය නොකඩවා තවදුරටත් කරගෙන යනවිටක නිසි බලය ඇති අධිකරණයක් විසින් ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝණය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව උල්ලංඝණය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනක් සඳහාම රුපියල් දෙසීය පනහකට නොවැඩි අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.

18. සංචාරක වෙළෙන්දන් විසින් කිසිදු අවස්ථාවක මාර්ගයක හෝ මාර්ග දෙපස හෝ ගොඩනැගිලි ඉදිරිපිට හෝ වෙනත් තැනක බිම තබා හෝ බිම මත එලන ලද අතුරනයක් මත තබා භාණ්ඩ විකිණීම හෝ ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු ය.

19. ආහාර පාන නොවන ද්‍රව්‍ය අලෙවිකරණු ලබන වෙළෙන්දන් විසින් ඇසුරුමක බහා අලෙවි කළ හැකි සියලුම ද්‍රව්‍ය ඇසුරුමක බහා අලෙවි කල යුතු ය.

20. සංචාරක වෙළෙඳාමේ යෙදෙන කවර හෝ තැනැත්තකු විසින් කිම මංමාවතක ධාවනය කෙරෙන වාහනවලට හෝ ගමන් ගන්නා මගීන් හෝ යම් පොදු ස්ථානයක ගැවසෙන ජනතාවට බාධාකාරී හෝ අනතුරුදායක නොවන ආකාරයෙන් වෙළෙඳාම කරගෙන යා යුතු ය. එබඳු බාධාවක් සිදුවන බව පොලීසියේ නිලධාරියකු විසින් හෝ පොදු ස්ථාන අධිපතීන් විසින් හෝ සභාවේ නිලධාරියකු විසින් දැනුම් දුන් වහාම වෙළෙඳාම් කටයුතු අත්හිටුවා, එම ස්ථානයෙන් ඉවත්විය යුතු ය.

21. සංචාරක වෙළෙඳාම කරන්නෙකු විසින් විධිමත් අවසරයක් රහිතව සිය භාණ්ඩ ප්‍රචාරය සඳහා ශබ්ද විකාශන යන්ත්‍ර, රේඩියෝ කැසට් යන්ත්‍ර හෝ පොදු ඇමතුම් පද්ධති යොදා නොගත යුතු ය.

22. (i) මෙම අතුරු ව්‍යවස්ථාවල පද සම්බන්ධය සඳහා ගනු ලබන"ආහාර පාන" යන්නෙන් මනුෂ්‍ය පරිභෝජනය සඳහා ගනු ලබන සකස් කරන ලද ආහාර සහ පාන වර්ග, පළතුරු, තැඹිලි හෝ කෑමට ගනු ලබ සියලුම වර්ග අදහස් වේ.

(ii) "සංචාරක වෙළඳාම" යන්නෙන්, තමා විසින් හෝ සතකුගේ ආධාරයෙන් හෝ වාහනයකින් හෝ ද්‍රව්‍ය රැගෙන එමින් කරනු ලබන වෙළෙඳාමක් අදහස් වන අතර, නැවත විකිණීම උදෙසා පුද්ගලයකු විසින් කරනු ලබන තොග වෙළෙඳාම එයට ඇතුළත් නොවේ.

07 - 390

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.